# HANTHANA PHILOSOPHY CIRCLE

## E-JOURNAL
## VOLUME II



DEPARTMENT OF PHILOSOPHY, FACULTY OF ARTS, UNIVERSITY OF PERADENIYA, SRI LANKA

# Hanthana Philosophy Circle

# E-Journal

Department of Philosophy

Faculty of Arts

University of Peradeniya

Sri Lanka

© Hanthana Philosophy Circle, Department of Philosophy, University of Peradeniya

**All rights reserved**

**No part of the e-journal may be reproduced in any form without written permission of the respective authors and the publisher.**

**Published by:**

Hanthana Philosophy Circle

Department of Philosophy

Faculty of Arts

University of Peradeniya

Sri Lanka

ISSN 2950- 6867

Barcode: 9 772950 686009

Disclaimer

The opinions expressed in this publication are those of the authors and they do not purport to reflect the opinions or views of the Editorial Board or its members.

## The Message of the Dean, Faculty of Arts, University of Peradeniya

As the Dean of the Faculty of Arts at the University of Peradeniya, I take great pleasure in extending this message on the occasion of the launch of the Hanthana Philosophy Circle e-journal. Situated within one of the most esteemed academic institutions, the decision to embark on this foray into the global landscape through the utilization of contemporary technology is deserving of commendation. This innovative platform facilitates the seamless dissemination of scholarly insights and research findings among the global academic and student community. I extend my utmost wishes for your continued achievements in the days to come and wish the Department of Philosophy, which has consistently contributed significantly to the realm of academic writing and literature, continued success and good fortune in all its endeavours.

***Dr. E.M.P.C.S. Ekanayake,***

*The Dean, Faculty of Arts, University of Peradeniya*

## The Message of the Head, Department of Philosophy, Department of Philosophy, University of Peradeniya

I am honored to convey this message in my capacity as the Head of the Department of Philosophy at the University of Peradeniya. Philosophy, as a discipline, holds the profound capacity to provide inspiration and meaning to human existence. The Department of Philosophy, an illustrious entity within the Faculty of Arts at the University of Peradeniya, bears the distinction of being one of the trailblazers in the academic landscape. Over the years, it has nurtured a multitude of scholars whose contributions have extended not only to the local domain but have also resonated on the global stage.

Through the dedicated endeavors of its esteemed faculty, the Department has expanded its purview to encompass a comprehensive spectrum of academic pursuits within its programmatic initiatives. Consequently, the advent of the Hanthana Philosophy Circle e-journal, conceived and launched by the Department of Philosophy, University of Peradeniya, marks a pioneering and innovative stride in the global dissemination of scholarly contributions to the academic community.

I extend my heartfelt congratulations to all those involved in this laudable undertaking, as you ascend the ladder of academic achievement. May you continue to demonstrate the mettle and courage required to sustain this noble endeavor. I extend my sincere appreciation to all contributors who, despite constraints in resources and time, have collectively contributed to the resounding success of this endeavor.

***Prof. Namali Kumari Handegama***

*The Head, Department of Philosophy, University of Peradeniya*

# THE EDITORIAL BOARD

**Senior Lecturer Mr. B.A.J. Bogoda – Chief Editor**

*MPhil, MA, BA (Peradeniya), Postgraduate Diploma in Counseling*

**Mr. H.A.T.P.C. Hettiarachchi- Co-editor**

*Lecturer (Probationary), MA, BA (Peradeniya)*

**Ms. S.S. Hewawasam- Co-editor**

*Lecturer (Probationary), MA, BA (Peradeniya)*

**Ms. E.M.S.P. Rathnayake**

*Temporary Lecturer, MPhil Reading, BA (Peradeniya)*

**Ms. K.G.L.M. Kaluarachchi**
*Temporary Lecturer, MA Reading, BA (Peradeniya)*

**Ms. A. Murugathas Shambavi**
*Temporary Lecturer, MA Reading, BA (Peradeniya)*

**Mr. A.M. Ekraam**
*Temporary Lecturer, MPhil Reading, BA (Peradeniya)*

**Mr. R.P.C.H. Perera**
*Temporary Lecturer, MA Reading, BA (Peradeniya)*

# The Message of the Editorial Board

It is a great pleasure to publish the second volume of '*The Hanthana Philosophy circle e-Journal*' as an electronic version with the expectation that our initiative would reach a greater number of audiences who are interested in engaging in discussions on a variety of philosophical themes. On the other hand, as the Editorial Board, we believe, this is also a great opportunity for those who have creative and innovative ideas, views, and different insights to get them published and also to make them more open through an academic platform like this. This present volume, therefore, is the third of its kind since its initiation in 2022 by Hanthana Philosophy Circle, Department of Philosophy, Faculty of Arts, and University of Peradeniya.

Like the previous volume, the present volume also consists of articles written in three mediums in different categories of topics, among them, there are 12 Sinhala medium articles, 06 Tamil medium articles, and 13 English medium articles on selected philosophical themes. In the meantime, these articles were blind reviewed by experts in the relevant disciplines and the respective authors were informed accordingly of further major and minor revisions before publishing them. Hence, the result on your hands is a careful commitment of authors, reviewers, and the editorial board finally.

Therefore, the editorial board wishes to extend their first and foremost appreciation for all the authors who have contributed and permitted their ideas to be presented here. We are grateful for the panel of reviewers Venerable Dr. Muthukeliyawe Indarathana thero and Dr. Kasun Dharmasiri, Department of Pali and Buddhist Studies, University of Peradeniya, Prof. P.M. Jamahir, Prof. M.S.M. Anes, Dr. Saman Pushpakumara, Senior lecturer Mr. Samantha Ilangakoon, Department of Philosophy, University of Peradeniya in contributing to make this a success.

Our thanks are also due for the precious time enthusiastically devoted by the all-academic experts who have contributed to reviewing the articles. All in all, our thanks must also go to all academic staff members and non-academic staff members of the Department of Philosophy who were behind this productive endeavour.

## PUBLICATION ETHICS

Authors should submit their articles following the author guidelines as prescribed by the Hanthana Philosophy Circle. Articles to be submitted for publication should not be previously published nor considered to another publication elsewhere. The author should declare the originality of the work which had never been accepted for other journals. Copying of another's work without citing the original source and considering it as one's work is an unethical practice and in the field of research and professional practice, this is completely unacceptable. The corresponding author shall be responsible for communicating with the Editorial Board to accomplish the copyright form and inform the co-authors regarding the status of the article submitted and accepted to HPCJ to avoid multiple submissions of paper to other journals at the same time. If the paper is rejected for publication to HPCJ, which is the right time to submit the article to other journals. The corresponding author is also responsible for the accuracy of the content of the article particularly the complete list of the names of the co-authors, updated affiliations, and email addresses.

### Corrections and Retraction Policy

Article retraction may be done in the case of stating unreliable findings in the conclusion, infringements of professional ethical codes such as plagiarism, multiple submissions to other journals or publications, fraudulent use of data or information, and the like.

## POLICIES

Refereeing System

The refereeing system shall adopt a three-stage evaluation process: Initial Appraisal, Double-Blind Peer Review, and Editorial Board evaluation. Upon receipt, the submitted manuscript will be subjected to an appraisal by the Editorial Board. This initial appraisal will include a plagiarism check using the plagiarism detection software Grammarly. This process shall ensure that each manuscript fits the objectives, scope, and standards of the HPCJ. It will likewise establish the significance, technical soundness, and originality of the article. The result of the initial appraisal shall determine whether the manuscript will be endorsed for an external review or be returned to the author/s for revision. An author accepts the responsibility of preparing the article for evaluation by independent reviewers and revising it prior to submission.

Reviewers and editors are responsible for providing a constructive and prompt evaluation of the submitted article based on the significance of its contribution and the rigors of analysis and

presentation using a standard Peer Review Evaluation Form provided by the HPC. Accepted manuscripts will be sent to expert reviewers following the double-blind review process. The author/s will be informed of the reviewers' comments and acceptance or rejection of the manuscript. After the author/s revise the manuscript based on the reviewers' comments, suggestions, and recommendations the Editorial Board of HPCJ will do the final review. Articles accepted would be copy-edited for grammar, punctuation, print style, and format.

**Peer Review System**

HPC strictly observes the double-blind peer review process. It is the responsibility of the reviewer to provide substantial comments and suggestions. The reviewer shall take the evaluation of the general content in terms of the academic significance of the article, its contribution to the community, technical novelty, quality of information, and language usage. The article will be sent to expert reviewers and they will decide to publish the paper unaltered, accept after revision suggested in the review, review again after major changes or reject.

**DUTIES OF EDITORIAL BOARD/PEER REVIEWERS**

Duties of Reviewers

Standards of Objectivity

Reviews should be conducted objectively. Personal criticism of the author is inappropriate. Referees should express their views clearly with supporting arguments.

Confidentiality

Any manuscript received for review must be treated as confidential documents. Since the double-blind peer review process is being observed by the HPC, the anonymity of both parties (author/s and reviewers) will remain confidential.

Promptness

Any selected reviewer who feels unqualified to review the article reported in a manuscript or knows that its prompt review will be impossible should notify the editor and excuse himself from the review process.

Acknowledgment of Sources

Reviewers should identify relevant published work that has not been cited by the authors. Any statement that an observation, derivation, or argument had been previously reported should be accompanied by the relevant citation.

Editorial Responsibilities

Submitted papers will be evaluated based on their scientific and systematic research method. The fair decision will be observed by the Editorial Board regardless of race, culture, origin, gender, or citizenship of the author/s.

**Publication Fee**

Publication in HPCJ is FREE. Thus, it does not require any payment of page or publication charges by authors. HPCJ is an open-access journal that all contents are freely available over the internet to any reader.

**Licensing**

Hanthana Philosophy Circle e-Journal (HPCJ) is an electronic that is freely available.

**Open Access Statement**

HPCJ provides immediate open access to its content on the principle that making articles freely available to the public supports a greater global exchange of knowledge. Users are not allowed to copy, distribute, print, to full-text articles in this HPCJ without asking prior permission from the publisher or author.

**Copyright**

By submitting the manuscript, it is believed that the author/s will be responsible for any disputed content in the respective paper/article and the author/s provide formal consent to HPCJ/publisher and transfer of copyright. The Publisher, Editorial Board Members, and Peer-Reviewers of HPCJ cannot be held responsible for any errors, controversies, or any consequences from the use of the information contained in the HPCJ. It is also accepted by the manuscript submitted that he/she shall never challenge the Editorial Board/Publisher in any court of law for any issue. The concepts and views expressed in the research papers/articles in the HPCJ do not essentially correspond to the views of the publisher/Editorial Board. The Editorial Board/Publisher of the HPCJ is not liable for errors or any consequences arising from the exercise of information contained in it.

# CONTENTS


1.ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මට්ටමේ උසස් අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශය **(Initiation and Establishment of Sri Lankan University, Higher Education and the Department of Philosophy, University of Peradeniya)** *Prof. Namali Kumari Handegama* *01-06*

2. මධ්‍යකාලීන දර්ශනයේ ආරම්භය හා විකාශනය පිළිබඳ දාර්ශනික අධ්‍යනයක් **(A Philosophical Study of the Origin and Evolution of Medieval thought)** *V. Erandi kawshalya Madushani* *07-22*

3. නිවන පිළිබඳ ථෙරවාද විවරණය සහ බෞද්ධ විමුක්ති සංකල්පයෙහි සුවිශේෂිතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් **(An Investigative Study of the Theravada Commentary on Nirvana and the Peculiarites of the Buddhist Concept of Liberation)**
*S.U.Dissanayaka* *23-32*

**4.** බෞද්ධ ආගමික ස්ථානයක් මගින් සමාජයට සිදුකෙරෙන කෘත්‍යයන් පිළිබඳව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් **(A Sociological Analysis of the Functions Performed by Buddhist Religious Institutions to the Society)**

*P.K.G.I.L. Ranasinghe* *33-48*

**5.** මහායාන බෞද්ධ දර්ශනයෙහි එන දශ භූමි පිළිබඳව අධ්‍යයනයක් **(A Study about Dasabhumi of Mahayana Buddhism)** *K.W.D. Nujitha* *49-54*

**6.** ප්‍රත්‍යක්ෂය, අනුමානය, සහ සංවාක්‍යය පිළිබඳ විමසුමක් **(An Analysis of Perception, Inference and Syllogism)** *Janaka Priyadarshana Dissanayaka* *55-62*

**7.** ශූන්‍යත්වයේ දාර්ශනිකත්වය පිළිබඳ මාධ්‍යමකයන්ගේ දෘෂ්ටිය පිළිබඳ විමසුමක් **(An Analysis of the View of Madyamika Tradition on Philosophy of Sunyatha)**

*S.A.S.Chathurika* *63-68*

**8.** කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ දේශපාලන දර්ශනය පිළිබද විමසුමක් **(An Inquiry into the Political Philosophy of King Keerthi Nishshankamalla)**

*S.WS.G.Wijerathna and P.W.P.H.Samaranayaka* *69-80*

**9.** ඉන්දියානු දර්ශනයේ එන උපනිෂද් දර්ශනය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් **(A Brief Analysis of Upanishad Philosophy in Indian Philosophy)** *81-90*

*D.K.G.Harsha Nilan Nawarathna*

**10. ධර්මකීර්තිපාදයන්ගේ ජීවන චරිතය සහ බෞද්ධ තර්ක ශාස්ත්‍රීය දායකත්වය (Ven.Dharmakirti's Life and his Contribution to Buddhist Logic)**

*H.A.C.N.Wijerathna* 91-103

**11 .ගැඩමරියානු අර්ථ විවරණය සහ මහා වංශය (Gadamerian Hermeneutics and Mahawamsa)**
*Darshana Ashoka Kumara* 104-122

**12. බුදු සමයෙන් නිරූපිත දාර්ශනික පැතිකඩ පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් (A Brief Analysis of the Philosophical Aspects of the Buddha from time to time)**

*K.I.Hasara* 123-134

**13. *'Nibbāna'* and Ethical Formation in Buddhism**

*H.M.L.M. Munasinghe* 135-143

**14. How binding in the Brain could relate to Consciousness and the Mind-Body Problem?**

*S.C.Shanoli Deepashika* 144-152

**15. The Concept of Crisis: A Philosophical Dialogue**

*Mohomed Ibrahim Mohamed Thowfeek* 153-158

**16. Buddhist aspects of Wrong Livelihood and Right Livelihood mainly based on the *Mahācattārisakasutta***

*Chanda Sara Sraman* 159-168

**17. Love Relatives and Love Self: A Comparative Study of Mencius And Buddha's Views on Love**

*Ven .Sandamadulle Sumanasara Thero* 169-178

**18. Social Philosophy Reflected in Buddhism: Buddhist Scholars' Perspectives toward Buddhist Social Work**

*Dr. Omalpe Somananda* 179-195

**19. Positive Psychology; How it can be used to change Minds, Emotions and Cnsciousness" According to the View of an Undergraduate in Sri Lanka**

*A.K.D.P.P. Amarasinghe* 196-202

**20. Is Buddhism a Philosophy?**

*Ven.Bulugahpitiye Nandabodhi* 203-224

**21. Interrogating the Philosophical Foundations: A Comprehensive Analysis of Western and Indian Philosophical Traditions**

*Rev. Bingiriye SunandaBodhi* 225-241

**22. Was Philosophy and Church independent in the Middle Ages?**

*B.O.K. Rathnabharathi* 242-248

**23. Milesian Philosophy**

*J.A.S.S. Jayasooriya* 249-256

**24. Indian Philosophy**

*K.M.T.P.Deepaloka* 257-266

**25. Relationship between Religion and Philosophy**

*B.V.J.K.Jayawardhana* 267-276

**26. சீன மெய்யியலில் தாவோயிசம் மற்றும் கன்பூசியனிசத்தின் வகிபங்கு**

**(The Role of the Confucianism and Taoism in Chinese Philosophy)**

*Pulenthiran Nesan* 277-280

**27. இ]லாமிய மெய்யியல் ஆய்வுப் பரப்பில் இமாம் கஸ்ஸாலியின் அணுகுமுiறகள்**

**(Imam Ghazali's Contribution to Islamic philosophy)**

*A.M. Ekraam* 281-292

**28. பிறர் மனதை ஆராய்வதில் ஏற்படும் பிரச்சினைகள்: ஒரு மனமெய்யியல் நோக்கு**

(**Problems in exploring the Minds of others: a Psychological Perspective**)

*Priska. F* 293-302

**29.** **பிளேட்டோவின் 'குடியரசு' கூறும் அறிவுக் கோட்பாடு**

**(Theory of Knowledge in Plato's Republic)**

*S. Nirosan* *303-311*

30. முன்னைய மார்க்சின் சிந்தனைப்பாரம்பரியம் **(The Thought Tradition of Early Marx)**

*Tharmika Sivalingam* *312-315*

31. அறிவாராய்ச்சியல் பற்றிய அறிமுகம் **(Introduction to Epistemology)**

*ML.Lathfan Rosin* *316-323*

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල මට්ටමේ උසස් අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශය

## Initiation and Establishment of Sri Lankan University Higher Education and the Department of Philosophy, University of Peradeniya

*Prof. Namali Kumari Handegama*

*The Head, Department of Philosophy, Faculty of Arts, University of Peradeniya*

විශ්වවිද්‍යාල මට්ටමින් උසස් අධ්‍යාපන කටයුතු ශ්‍රී ලංකාවෙහි ආරම්භ වන්නේ වර්ෂ 1921 පමණ සිට ය. එනම් වර්ෂ 1921 ජනවාරි මස 21 දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලීජිය යටතේ ය. (Ceylon University College) නමුත් ක්‍රි.වර්ෂ 337 පමණ එනම් අනුරාධපුර යුගයේ සිටම පිරිවෙන් අධ්‍යාපනය ඇතුළුව නොයෙකුත් මට්ටමේ අධ්‍යාපන ආයතන ලංකාවේ පැවතුන බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලීජියේ ආරම්භක විදුහල්පතිවරයා හෙවත් වර්තමානයේ නම් උපකුලපතිවරයා වශයෙන් සඳහන් වන්නේ මහාචාර්ය රොබට් මාස් ය. (Professor Robert Marrs – Principle of Sri Lanka University Collage) ඒ අනුව වර්ෂ 1921 සිටම මහාචාර්ය රොබට් මාස්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලීජියේ උසස් අධ්‍යාපන කටයුතු සිදු කෙරුණ අතර සියළුම අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සිදු වුයේ මහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ නීතිරීතිවලට අනුකූලව ය. විශේෂයෙන්ම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලීජියේ උපාධිය පිරිනැමුනේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ (University of London) බාහිර උපාධියක් ලෙස ය.

ඒ අනුව 1942 වර්ෂය වන තෙක්ම ලාංකේය සිසුන් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි සිසුන් ලෙස ලියාපදිංචි වී බාහිර විභාග පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතු වූ අතර එම පරීක්ෂණ සඳහා අවශ්‍ය අධ්‍යයන පාඨමාලා ලංකාවේදී සම්පූර්ණ කළ යුතු විය. ඒ සඳහා ස්වභාවික විද්‍යා, සමාජ විද්‍යා විෂයයන් යටතේ උපාධි පරීක්ෂණ පැවැත්වුණු අතර එම විෂය ධාරාවන් යටතේ අධ්‍යයන කටයුතු සිදුකළ හැකි විය. සමාජ විද්‍යා විෂය ධාරාවෙන් උපාධියට පෙනී සිටි සිසුන් අධ්‍යයන කළ යුතු විෂයන් වූයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා විෂයන් සහ පෙරදිග අධ්‍යයන විෂයන් ය. ඒ අනුව සමාජ විද්‍යා විෂයයන් යටතේ ඉතිහාසය, භූගෝල විද්‍යාව සහ බටහිර දර්ශනයද, මානව ශාස්ත්‍ර විෂයන් යටතේ ඉංග්‍රීසි, බටහිර සම්භාව්‍ය සංස්කෘතිය සම්බන්ධ අධ්‍යයන කටයුතු සිදුකෙරුන අතර, පෙරදිග අධ්‍යයනයන් යටතේ ඉන්දු ආර්ය විෂයන් සහ ඒ සමගාමීව සංස්කෘත, පාලි, සිංහල, දෙමළ භාෂාවන් පිළිබඳව අධ්‍යයන කටයුතු සිදුකෙරිණි.

ස්වභාවික විද්‍යා විෂයයන් යටතේ ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව වැනි විෂයන් අධ්‍යයන කළයුතු වූ අතර එම විෂයන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා මරදාන තාක්ෂණික විද්‍යාලයේ විද්‍යාගාර පහසුකම් සපයන ලදි. මෙම අධ්‍යයන පාඨමාලාවන්හි විශේෂත්වය වූයේ ලාංකේය සිසුන් අධ්‍යයන කළ සියලුම පාඨමාලාවන් සම්පාදනය කෙරුනේ ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් එම විශ්වවිද්‍යාලයට ආවේණික

පාඨමාලාවන් වීම ය. ඒ අනුව ලාංකේය සිසුන්ට භූගෝල විද්‍යාව යටතේ අධ්‍යයනය කරන්නට සිදුවූයේ එංගලන්තය සහ යුරෝපය සම්බන්ධ භූගෝල විද්‍යාව වූ අතර ඉතිහාසය විෂය යටතේ අධ්‍යයනය කළ යුතු වූයේ එංගලන්ත ඉතිහාසය වීම ය. අධ්‍යයන කටයුතු අවසානයේ මෙම පාඨමාලාවන් සඳහා ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අපේක්ෂයකයන් ලෙස පරීක්ෂණ සඳහා පෙනීසිටිය යුතු වූ අතර ඒ සඳහා විභාග පැවැත්වූයේ පිළිතුරු පත්‍ර ඇගයීම් සිදුකළේ සහ ප්‍රතිඵල නිකුත් කළේ ද ලන්ඩන් විශ්වවිද්‍යාලය යටතේ ම විය. ලංකා විශ්වවිද්‍යාල කොලිජියේ බටහිර සහ සම්භාව්‍ය සංස්කෘතිය විෂයන් සඳහා වෙනමම මහාචාර්යවරු දෙදෙනෙක් සහ අධ්‍යයන දෙපාර්තමේන්තු දෙකක්ද පැවතුන බව සඳහන් වන අතර ඉන්දු ආර්ය විෂයන් සඳහා සිටියේ එක මහාචාර්යවරයෙක් පමණක් බව සඳහන් ව ඇත.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජියේ ආරම්භක විදුහල්පතිවරයාව සිටි මහාචාර්ය රොබට් මාස් වසර දහනමයක සේවා කාලයකින් පසුව වර්ෂ 1939 දී විශ්‍රාම ගැනීම සිදුවිය. මහාචාර්ය රොබට් මාස්ගේ විශ්‍රාම ගැනීමෙන් හිස්වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජියේ නව විදුහල්පතිවරයා ලෙස 1940 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුව සිටි සර් විලියම් අයිවර් ජෙනින්ස් (Sir William Ivor Jennings) පත් වන අතර 1941 මාර්තු මස දී එතුමන් ශ්‍රී ලංකාවට පැමිණියේ ය. එතැන් සිට ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඉතිහාසයේ සුවිශේෂම පෙරළිය සිදු වූ බව කිව හැකිය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජිය අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීමේ වගකීම දරාගනිමින් වර්තමානයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය ලෙස නම් කර ඇති ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පළමු උපකුලපතිවයා වශයෙන් සර් විලියම් අයිවර් ජෙනිංග්ස් ශ්‍රීමතාණන් ඒ වෙනුවෙන් සිදුකළ අප්‍රමාණ කැප කිරීම වර්මාන පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉමහත් ගෞරවයෙන් සහ කෘතවේදීත්වයෙන් යුතු ව සිහිපත් කරනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය බිහිවීමේ ඉතිහාසය තුළ පළමු උපකුලපතිතුමාට අමතරව ගෞරවයෙන් සිහිපත් කළ යුතු පුද්ගලයන් කිහිප දෙනෙකි. ශ්‍රී ලංකාවේ ඉදිවන පළමු අංග සම්පූර්ණ විශ්ව විද්‍යාලය කෙසේ විය යුතුද යන්න පිළිබද සාකච්ඡා කළ අක්බාර් කමිටුව ඒ අතර විශේෂයෙන් සඳහන් කළ යුතුය. එනම් වර්ෂ 1926 සිටම සුප්‍රකට අගවිනිසුරුවරයෙකු වූ එම්.ජේ. අක්බර්ගේ (M.J. Akbar) ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ අංග සම්පූර්ණ නේවාසික විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කළ යුතුය යනුවෙන් සාකච්ඡාවන් සිදුවන අතර එය කොළඹින් බැහැරව ස්ථාපිත කළ යුතුය යනුවෙන් එම කමිටුවෙන් තීරණය කරන ලදී. අවසානයේ දීර්ඝ සංවාදයන්ගෙන් හා ස්ථාන කීපයක් පිළිබද යෝජනා සලකා බැලීමෙන් පසුව එය පේරාදෙණිය මෙම මහවැලි නිම්නයේ ඉදිකළ යුතු බවට ස්ථිරවම තීරණය කළහ. නව විශ්වවිද්‍යාලය පේරාදෙණියේ මෙම අති සුන්දර මහවැලි නිම්නයේ ඉදිරිකළ යුතුය යන එම සුවිශේෂ තීරණය ලබාදෙන ලද්දේ ආචාර්ය පවුල් (S.C. Paul) සහ ඇන්ඩ්‍රියස් නෙල් (Andrew Nell) යන විද්වතුන් වන අතර එම අසහාය තීරණය ලබාදුන් ඔවුන් දෙපළ පේරාදෙණිය විශ්වවිද්‍යාල ඉතිහාසය පුරා කෘතවේදීව සිහිපත් කළ යුතුය. එමෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දැවැන්තම ශිෂ්‍ය නේවාසිකාගාරයන් වූ අක්බාර් නෙල් (Akbar & Nell) ශාලාවන් ඒ පිළිබඳව නිහඬවම සාක්ෂි දරනු ඇත.

එවකට පැවති රජය විසින් 1938 දී විශ්වවිද්‍යාලය ඉදිකිරීම සඳහා හෙක්ටයාර 820 ප්‍රමාණයක් මිලදී ගන්නා අතර ඉන් හෙක්ටයාර 150 නව විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වෙන්කරන ලද අතර ඉතිරි ඉඩම් උද්‍යාන අලංකරණය සහ අනෙකුත් පාරසරික අවශ්‍යතා සඳහා වෙන් කර ඇත. 1942 ජූලි මස පේරාදෙණිය මහවැලි නිම්නයේ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම සිදුවුන අතර සර් විලියම් අයිවර්

ජෙනින්ස් එහි ප්‍රථම උපකුලපතිවරයා විය. එතුමන්ගේ මගපෙන්වීම, කැපවීම සහ අසහාය නායකත්වය යටතේ සර් පැට්‍රික් ඇබකොම් (Sir Patrick Abecombie) සහ ක්ලිෆඩ් හොලිඩේ (Clifford Holliday) යන අසහාය ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ දායකත්වයෙන් අංගසම්පූර්ණ නේවාසික විශ්වවිද්‍යාලයක් සැලසුම් කිරීමේ, ගොඩනැගීමේ භාරදූර කාර්යභාරය සිදු කෙරී ඇත. ඒ අනුව 1942 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජිය සහ ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලය ඇතුළුව අධ්‍යයන පීඨ පහකින් සමන්විත ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු ආරම්භ කෙරුන අතර ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොවීම, දෙවන ලෝක යුද්ධය ඇතුළු රටේ පැවති අවුල්සහගත දේශපාලන හා සමාජ වාතාවරණය නිසා 1949 වන තෙක් පේරාදෙණියේදී අධ්‍යයන කටයුතු ආරම්භ නොවූ බව සඳහන් ය.

පළමුවරට 1949 නීති අධ්‍යයන අංශය සහ කෘෂිවිද්‍යා පීඨය පේරාදෙණියේදී අධ්‍යයන කටයුතු ආරම්භ කළ අතර එතෙක් කොළඹ සිට අධ්‍යයන කටයුතු සිදුකළ පශු වෛද්‍ය පීඨයේ සිව්වන වසර කණ්ඩායමද ඒ සමඟ පේරාදණියට හුවමාරු වෙන ලදි. මේ අතර කාලයේ සිදු වූ සුවිශේෂම සිදුවීම වූයේ 1921 සිට කොළඹ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජිය යටතේ පැවති ශාස්ත්‍ර සහ පෙරදිග අධ්‍යයන පීඨය, විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය සහ විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු යන සියල්ලම 1952 ඔක්තෝම්බර් මස 06 වන දින පේරාදෙණියෙහි නව විශ්වවිද්‍යාල භූමියේ ස්ථාපිත කිරීම ය. ඒ අනුව අංග සම්පූර්ණ නේවාසික විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය වර්ෂ 1952 දී පේරාදෙණියේදී අධ්‍යයන කටයුතු සිදුකිරීම ආරම්භ කළ අතර එය නිළ වශයෙන් විවෘත වන්නේ 1954 අප්‍රේල් 20 දින එංගලන්තයේ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල නායිකාව වූ දෙවන එළිසෙබෙත් මහ රැජිණ සහ එඩිංබරෝ ආදිපාදවරයාගේ ප්‍රධානත්වයෙනි. මෙසේ 1942 ආරම්භ කෙරුන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ නාමය රාජ්‍ය පාලනයේ සිදු වූ වෙනස්කම් මත අවස්ථා කීපයකදීම වෙනස්වීම්වලට ලක් ව ඇත. ඒ අනුව, 1942-1952 දක්වා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය, 1952-1972 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය - පේරාදෙණිය, 1972-1978 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණිය කැම්පස් ලෙසද අවසන් වශයෙන් 1979 සිට අද දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව ලෙස භාවිතා වී ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භ වී වර්ෂ 81 සම්පූර්ණ වන 2023 වන වර්තමානය වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කෘෂිකර්ම විද්‍යා පීඨය, පශු-වෛද්‍ය විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, දන්ත වෛද්‍ය පීඨය, ඉංජිනේරු පීඨය, ශාස්ත්‍ර පීඨය, විද්‍යා පීඨය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය සහ කළමණාකරණ පීඨය වශයෙන් පීඨ නමයකින් සමන්විත වී ඇත. විසි දහසකට ආසන්න පළමු හා පශ්චාත් උපාධි මට්ටමේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාන කටයුතු සඳහා ප්‍රධාන පුස්තකාලයට අමතරව අධ්‍යාන පීඨ නමයට අදාළව පීඨ පුස්තකාලයන්ගෙන්ද යුක්තය. එමෙන්ම අංග සම්පූර්ණ ක්‍රීඩාගාරයක්, පිහිනුම් තටාකයක්ද ඇතුළු ක්‍රීඩා පිටි සංකීර්ණයක් ද අති නවීන උපකරණයන්ගෙන් සමන්විත විද්‍යාගාර, පරිඝණක මධ්‍යස්ථානයන් මෙන්ම නේවාසිකාගාර විස්සකට වැඩි ප්‍රමාණයක් ද ඇත. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂයාවන් මෙන්ම අධ්‍යාන-අනධ්‍යාන කාර්යමණ්ඩල හා සියලු සේවක මහත්ම මහත්මින්ගේ පහසුව සඳහා විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානයක් මෙන්ම පන්සල්, පල්ලි, කෝවිල් ඇතුළු ආගමික මධ්‍යස්ථාන ගනණාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ම පිහිටුවා ඇත.

# දර්ශන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජීය ආරම්භ කළ 1921 වර්ෂයේ සිටම දර්ශන විෂය අධ්‍යයන පාඨමාලාවක් ලෙස පැවතුන අතර ආරම්භක අවස්ථාවේදී සම්භාව්‍ය භාෂා සහ දර්ශනය එකම අධ්‍යයන දෙපාර්තමේන්තුවක් යටතේ පැවතිණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොලිජියේ විදුහල්පතිවරයා වූ මහාචාර්ය රොබට් මාස් (Prof. Robert Marrs) යටතේ දර්ශන අධ්‍යයන අංශය පවත්වාගෙන යන ලදි. ආරම්භයේදී ජේ.වි.ධර්මරාජා (J.V. Dharmaraja) මහතා ආරාධිත කථිකාචාර්ය වරයෙකු ලෙස දර්ශන අධ්‍යයන අංශයේ සේවය කරන ලද අතර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලාවක් සඳහා දර්ශන විෂය යටතේ තර්ක ශාස්ත්‍රය සහ ආචාරධර්ම විෂයන් ඉගැන්විණි. 1927 දී දර්ශනය විෂය වෙනම ම අධ්‍යයන දෙපාර්තමේන්තුවක් යටතට පත්කරන ලදි. කෙසේ වුවද ආරම්භයේ සිට 1942 දක්වා දර්ශන අධ්‍යයන අංශයේ සේවයට සිටියේ එක් ආචාර්යවරයෙකු පමණක් ම බව සදහන්ව ඇත.

අනතුරුව 1946-1947 කේ. මතියපරනම් මෙනවිය -(Ms. Mathiyaparanam) සහ ආචාර්ය ඒ.කේ. සර්කර් (Dr. A.K. Sarkar) යන අය දර්ශන අධ්‍යයන අංශයේ ආචාර්යවරුන් ලෙස සේවය කරන ලදි. 1951 වර්ෂයේ දී K.N. ජයතිලක මහතා දර්ශන දෙපාර්තමේන්තුවේ සහය කථිකාචාර්යවරයෙකු ලෙස පත්විය. ඒ අනුව 1953/1954 කාලයේ දර්ශන අධ්‍යන අංශයේ ආචාර්ය මණ්ඩලය ලෙස T.V.R. මූර්ති (MA: Dlih Banars) කේ. මතියපරනම් මෙනවිය (MA: Madras) ආචාර්ය ඒ.කේ. සර්කර් (MA: PhD Rotna), K.N. ජයතිලක (BA Cey, BA (London), MA (Contab) PhD Londn) ප්‍රනාන්දු (BA Oxa) බැසිල් මෙන්ඩිස් (BA (Cey:), BA (London), යන අය සේවය කර ඇත.

වර්ෂ 1950 දී - Dr. T.V.R. Murthi මූර්ති මහතා දර්ශන අධ්‍යයන අංශයේ මහාචාර්ය ධූරයට සහ අංශාධිපති ධූරයට පත්වන ලදි. 1954 මහාචාර්ය මූර්ති පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස් වී බරණැස හින්දු විශ්වවිද්‍යාලයේ සේවය සදහා යන ලදි. මහාචාර්ය මූර්ති මහතා අංශාධිපති ධූරය දරන කාලයේ සම්පාදනය කරන ලද දර්ශන අධ්‍යයන අංශයේ විෂය මාලාවන් සංශෝධනයකින් තොරව 1960 දක්වාම භාවිතා කළ බව ද සඳහන්ව ඇත. 1960 දී ඒවා නැවත සංශෝධනය කර ඇත. දර්ශන විෂය මාලාවන් A සහ B යන කාණ්ඩ දෙකක් යටතේ පැවතුණ අතර A කාණ්ඩය යටතේ, දර්ශනයේ ඉතිහාසය, පැරණි සහ නූතන යන පාඨමාලාවන්ද ආචාරධර්ම, මනෝවිද්‍යාව, ඥාන විභාගය සහ තර්ක ශාස්ත්‍රය, ඉන්දියානු දර්ශනය යන අධ්‍යන පඨමාලාවන් ද, B කාණ්ඩය යටතේ තර්ක ශාස්ත්‍රය, අධිභෞතික විද්‍යාව, ආචාරධර්ම, දර්ශනයේ ඉතිහාසය (බටහිර සහ ඉන්දීය) සමාජ මනෝවිද්‍යාව යන විෂයන් පිළිබඳව අධ්‍යයන කටයුතු සිදුකෙරිණි.

1954 දි මහාචාර්ය මූර්තිගේ ඉල්ලා අස්වීමෙන් පසු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශාධිපති වශයෙන් කේ. මතියපරනම් මෙනවිය පත්වෙයි. නමුත් ඇයට මහාචාර්ය ධූරයක් හිමිවන්නේ නැත. ඒ වන විට අධ්‍යයන අංශයේ ආචාර්ය වරයෙකු ලෙස සේවය කළ කේ. එන්. ජයතිලකයන් වර්ෂ 1963 දී දර්ශන අධ්‍යයන අංශයේ මහාචාර්ය ධූරයට හා අංශාධිපතිත්වයට පත්විය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශයේ කීර්තිමත් ම අවදිය ලෙස සැලකෙන යුගය ආරම්භ වන්නේ ඉන් අනතුරුවයි. එතැන් සිට දර්ශන අධ්‍යයන අංශය ශාස්ත්‍රීය ලොව ඉමහත් කීර්තියක් ලැබ ඇති අතර දේශීයවත්, ජාත්‍යන්තරවත් ප්‍රසිද්ධියට පත්වන ලදි. මහාචාර්ය ජයතිලකයන් අංශාධිපතිධූරයට පත්වීම සමග භාෂා මාධ්‍ය තුනකින්

(සිංහල, දෙමළ, ඉංග්‍රීසි) අධ්‍යයන කටයුතු ආරම්භ කරන අතර ආචාර්ය මණ්ඩලයට නවක ආචාර්යවරුන් කීප දෙනෙකුම සම්බන්ධ වුහ. ඒ අය G.D.K. නානායක්කාර, A.D.P. කලන්සූරිය, S.V. කාසිනාදන්, ගුණපාල ධර්මසිරි, විජිත රාජපක්ෂ යන මහත්වරුන් ය. R.D. ගුණරත්න, රෙජින්ටන් රාජපක්ෂ යන අය 1967 ස්ථිර ආචාර්ය මණ්ඩල සාමාජිකයින් ලෙස සම්බන්ධ වී ඇත. එමෙන්ම 1967 දි කැළණිය විද්‍යාලංකාර විශ්ව විශ්වවිද්‍යාලයේ සේවය කරමින් සිට පශ්චාත් උපාධි සම්පූර්ණ කර පැමිණි ආචාර්ය පද්මසිරි ද සිල්වා මහතා ද අනතුරුව V. රාමක්‍රිෂ්ණන් (V. Ramakrishnan) මහතාද දර්ශන අධ්‍යයන අංශයයේ ආචාර්ය මණ්ඩලයට සම්බන්ධ වුහ.

අංශාධිපති මහාචාර්ය ජයතිලකයන්ගේ උපදෙස් සහ මඟපෙන්වීම මත 1970 පමණ වන විට ස්ථිර ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයින් බොහෝ පිරිසක් පශ්චාත් උපාධි සඳහා විදේශ ගතවීම සිදුව ඇත. 1970 ජූලි මස 23 දින දර්ශන අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයාව සිටි මහාචාර්ය කේ.එන්. ජයතිලක මහතා හෘදයාබාධයක් හේතුවෙන් හදිසියේ අභාවප්‍රාප්ත වන අතර එය දර්ශන අධ්‍යයන අංශයේ අසහාය ශක්තිය මෙන් ම දිදුලන පහන හා ආලෝකය නිවී ගියා සේ සඳහන්ව ඇත. (The beacon of light was gone, The Department in the Doll Drums again)

එතුමන් විසින් අධ්‍යන අංශයට පමණක් නොව දේශියවත්, ජාත්‍යන්තර වශයෙනුත් කළ අතිවිශාල ශාස්ත්‍රීය සේවය සලකා බැලීමෙන් එම අදහස සත්‍යක් බව කිව හැකිය. මහාචාර්ය ජයතිලකයන් බුදුදහම සහ බෞද්ධ ඥාණ විභාගය මෙන් ම තුලනාත්මක ආගම් පිළිබඳවත්, දර්ශන විෂය සම්බන්ධවත් හසල දැනුමකින් යුතු පෙර-අපර දෙදිගම විද්වතුන්ගේ ගෞරවාදරයට ලක් වූ අග්‍රගණ්‍යයේ පඬිරුවණකි. ඉතාමත් දක්ෂ ශිෂ්‍යයකු වශයෙන් වර්ෂ 1938 කේම්බ්‍රිජ් සීනියර් පරීක්ෂණයෙන් පළමු පෙළ සාමාර්ථයක් සහිතව සමත් වූ හෙතෙම 1940 දී ඉංග්‍රීසි, ගණිතය, සිංහල, පාළි විෂයන්ගෙන් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ මධ්‍යම පරීක්ෂණයෙන් සමත් ව ඇත. 1943 ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් පළමු පෙළ ගෞරව සාමාර්ථයක් සහිතව අවසාන ගෞරව උපාධිය සමත් ව ඇත. වසරක පමණ කාලයක් මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ ප්‍රධානාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළ ඒ මහතා, 1945 දී පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා එංගලන්තයට ගොස් ඇත. ඒ සඳහා ලංකා විශ්වවිද්‍යාල ශිෂ්‍යත්වයද, ලංකාණ්ඩුවේ ශිෂ්‍යත්වයද ලබා ඇත. 1948 දී ආචාර විද්‍යාව සම්බන්ධ විශිෂ්ඨ සාමාර්ථයක් ලැබූ ඒ මහතා ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් අපරදිග දර්ශනය පිළිබඳ උපාධි පරීක්ෂණයෙන් ඉහළ පෙළේ සාමාර්ථයක් ලබා ඇත.

1951 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සේවයට එක්වුණ ජයතිලක මහතා 1960 වර්ෂයේදී මානව ධර්ම පිළිබඳ නෆීල්ඩ් ශිෂ්‍යත්වයක් දිනා ඇති අතර මුල් බුදුසමයේ ඥාණ විභාගවාදය (Early Buddhist Theory of Knowledge) යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ ආචාර්ය උපාධි නිබන්ධනය යටතේ වර්ෂ 1961 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද (ආචාර්ය) උපාධිය දිනාගෙන ඇත. කථිකාචාර්යවරයෙකු වශයෙන් විශ්වවිද්‍යාල සේවයට බැඳීමෙන් අනතුරුව මහාචාර්ය ජයතිලකයන් 1956 දී රාමනාදන් ශාලාවේ උපශාලාධිපති ලෙසද, 1958 දී මාර්ස් ශාලාවේ ශාලාධිපති ලෙසද, 1964 සිට එතුමන් මියගිය 1970 වර්ෂයේ ජූලි මාසය තෙක් ම ජයතිලක ශාලාවේ ශාලාධිපතිවරයා ලෙසද කටයුතු කර ඇත. එතුමන් 1960 වර්ෂයේ සිට 1964 වර්ෂය තෙක් විශ්වවිද්‍යාල පාලක සභාවෙහි නියොජිතයකු ලෙසද කටයුතු කර ඇත.

විශේෂයෙන් ම 1963 වර්ෂයේ සිට 1970 වර්ෂය දක්වාම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ අංශාධිපතිවරයා සහ මහාචාර්යවරයා ලෙස කටයුතු කර ඇත. බුදුදහම සහ බෞද්ධ දර්ශනය පිළිබඳ ව පෘථුල දැනුමකින් යුතු වූ මහාචාර්ය ජයතිලකයන් එම දැනුම අවබෝධය සමාජය වෙත ලබා දීමට මහත් කැපවීමකින් කටයුතු කළේය. ඒ සඳහා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන් දෙකෙන් ම දේශන පැවැත්වීම ශාස්ත්‍රීය ලිපි ලේඛන සැකසීම සිදුකර ඇත.

1965 දී විට්නි-ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වයක් ලබා ඇමෙරිකා එක්සත් ජනපදයේ උතුරු කැරොලිනා විශ්වවිද්‍යාලයට ගොස් ඇත. එසේම එම වර්ෂයේදීම හාර්වඩ් විශ්වවිද්‍යාලයේ ආරාධනයකින් ''ක්‍රිස්තු ධර්මය බෞද්ධයෙකුට පෙණෙන හැටි'' යන මාතෘකාව යටතේ ලොව පුරා විද්වතුන්ගේ අවධානය දිනාගත් ලිපය ඉදිරිපත් කර ඇත. නැවත 1966 දී ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රින්ස්ටන්හිදී ''බෞද්ධ සාපේක්ෂතා දර්ශනය සහ එක්සත් ලෝක සංකල්පය'' යන මාතෘකාව යටතේ දේශනයක් පවත්වා ඇත. අනතුරුව 1965 දී ඇමෙරිකාවේ හවායි විශ්වවිද්‍යාලයේදී ''පුද්ගල තදාත්මය හා පුනරුත්පත්තිය'' සහ ''මුල් බුදුසමය සහ නූතන විශ්ලේෂී දර්ශනය'' යන මාතෘකා යටතේ දේශන පවත්වා ඇත. දේශීයව මෙන් ම අන්තර්ජාතික වශයෙන් කීර්තියට ලක් වූ මහචාර්ය ජයතිලකයන්ගේ ශාස්ත්‍රීය ලේඛනයන් අතර "මුල් බුදුසමයේ ඥාන විභාගවාදය" කෘතිය මෙන් ම මහාචාර්ය ගුණපාල මලලසේකරයන් සමඟ එක් ව සම්පාදනය කළ යුනෙස්කෝවෙන් ප්‍රකාශයට පත් කරන ලද බුදුදහම ජාති ප්‍රශ්න 'Buddhism and Race Question' යන කෘතිය ද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

විශ්ව කීර්තියට පත් දේශකයෙකු වූ මහාචාර්ය ජයතිලකයන්ගේ අවසන් සහ කීර්තිමත් ම දේශන වශයෙන් සැළකෙන්නේ නෙදර්ලන්තයේ හේග් විශ්වවිද්‍යාලයේ ලෝක නීති ආයතනයේදී පවත්වන ලද ''බුද්ධ ධර්මයෙහි දැක්වෙන අන්තර්ජාතික නීතියේ මූලධර්මය'' (The principles of International Law in Buddhist Doctrine) යන දේශන මාලාවයි. විශේෂයෙන් ම බුදුදහම සහ බෞද්ධ දර්ශනය පිළිබඳ මහාචාර්ය ජයතිලකයන් තුළ තිබූ අසහාය දැනුම් සම්භාරය නිසාම දේශීයවත් ජාත්‍යන්තරවත් විසිරී සිටි විවිධ විද්වතුන් ශාස්ත්‍රඥයින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අධ්‍යයන අංශයට දැඩි ලෙස ආකර්ෂනය වූ බව සඳහන්ව ඇත. මෙසේ පෙර-අපර දෙදිග විද්වතුන්ගේ ගෞරවාදරයට පත් වූ අග්‍රගණ්‍යයේ විද්වතෙකු ලෝක ප්‍රකට මහා ප්‍රාඥයෙකු වූ මහාචාර්ය කේ.එන්. ජයතිලකයන්ගේ මහා දැනුම් සම්භාරයත් කතිකත්වයත්, දේශන විලාශයත් එතුමන්ගේ සිදු වූ නිම කළ නොහැකි ශාස්ත්‍රීය හා සමාජීය සේවයත්, සදා අනුස්මරණීය වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. Beyond Boundaries One Hundred Year of Humanities And Social Sciences In Sri Lankan Universities (Vol: I), Ed. Premakumara De Silava, KNO Dharmadasa, Asanga Tilakarathne and others, UGC- Sri Lanka, 2021,
2. My Peradeniya, Sarath Edirisinghe, S. Godage & Brothers (Pvt.) Ltd., 2020,

# මධ්‍යකාලීන දර්ශනයේ ආරම්භය හා විකාශනය පිළිබඳ දාර්ශනික අධ්‍යනයක්

## A Philosophical Study of the Origin and Evolution of Medieval Thought

*V. Erandi kawshalya Madushani*

*Department of Philosophy, Faculty of Arts, University of Peradeniya*

### මධ්‍යතන යුගය යනු කුමක්ද?

මධ්‍යතන යුගය වශයෙන් සැලකෙන්නේ හතරවන සහ පස්වන සියවස්වල රෝම අධිරාජ්‍යය බිඳ වැටීමත්, පහළොස්වන සියවසේ ඇති වූ පුනරුදයත් අතර කාලසීමාවයි. බටහිර දර්ශනය යුග කිහිපයකින් සමන්විත වනු ලබයි. බටහිර දර්ශනයේ ආරම්භක යුගය වශයෙන් අපට ග්‍රීක යුගය හඳුන්වාදිය හැකි වේ. ඉන් අනතුරුව එළඹෙන දාර්ශනික යුගයක් වශයෙන් මධ්‍යතන යුගය හඳුන්වා දිය හැකි වේ. බටහිර දර්ශනයේ ආරම්භයක යුගය වන ග්‍රීක යුගය දාර්ශනික වශයෙන් නව අදහස් ඉදිරිපත් වූ එමෙන් ම දාර්ශනික වශයෙන් සමෘද්ධිමත් යුගයක් වශයෙන් හඳුන්වා දිය හැකි වේ. එහෙත් මධ්‍යතන යුගය; ග්‍රීක යුගයේ බිහි වූ මතවාද, අරමුණු, අදහස් වලට බෙහෙවින් වෙනස් දාර්ශනික යුගයක් වශයෙන් අපට හඳුන්වා දිය හැකි වේ.එනම් ප්‍රඥාව අරමුණු කොටගෙන ගෙන පැවති ග්‍රීක චින්තනය රෝම අධිරාජ්‍යයේ බිඳ වැටීමත් ක්‍රිස්තියානි ආගමික ව්‍යාප්තියත් සමග ආගමික අරමුණු ව්‍යාප්ත කරලීම සඳහා දාර්ශනය මෙවලමක් ලෙස භාවිතා කළ අතර ඒ තුළින් මධ්‍යතන දර්ශනය නිර්මාණය විය.මෙලෙස බිහිවූ මධ්‍යතන යුගය ප්‍රධාන යුග කිහිපයකට බෙදා වෙන්කළ හැකිය. එනම්:

1. මුල්කාලීන මධ්‍යතන යුගය ක්‍රි . ව. 476 සිට 1000
2. මධ්‍යකාලීන මධ්‍යතන යුගය ක්‍රි . ව. 1000 සිට 1300
3. පසුකාලීන මධ්‍යතන යුගය ක්‍රි . ව. 1300 සිට 1600

වශයෙනි.

**"මධ්‍යතන යුරෝපීය දර්ශනය බොහෝ විට විස්තර කර ඇත්තේ කතෝලික දර්ශනය නමිනි. එයට ප්‍රධාන හේතුව නම්, එම දර්ශනය, කතෝලික පල්ලි සංස්ථාවේ දර්ශනය වන බැවිනි."**[1] විශේෂයෙන් මෙම චින්තනය ශාන්ත ඔගස්ටීන් (ක්‍රි.ව. 354 - 430) නම් දේවධර්මාචාර්යාගේ පටන් පුනරුත්ථාන හා ප්‍රතිසංස්කරණ ව්‍යාපාර නැතහොත් පුනරුද අවධිය තෙක් ප්‍රමුඛස්ථානයෙහිලා පැවති ආගමික චින්තනය බව කිව හැකිය. ඔගස්ටීන්ගේ දර්ශනය තුළ වැදගත් කියමනක් අපට හමුවේ එනම් "තේරුම් ගැනීමට නම් විශ්වාස කරන්න" යන්නයි. මෙයින් ගම්‍ය වන්නේ නිදහස් මනුෂ්‍ය බුද්ධියට නොව ආධානග්‍රාහි භක්තිය හෙවත් විශ්වාසය එනම් ලබ්ධියට මධ්‍යතන යුගයේ ප්‍රමුඛස්ථානය හිමිවූ බවය.මධ්‍යතන දර්ශනය කතෝලික පල්ලි සංස්ථාවේ දර්ශන ලෙස සලකන අතර එය කතෝලික ධර්මයේ මූලිකාංගයන්ගෙන් සුසැදි දර්ශනයක් බව පැවසීම අසත්‍යයෙන්

[1] ඒ. ඩී. පී. කලන්සූරිය, **නූතන බටහිර දර්ශනය** (බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007), 1.

තොරය. එසේම මධ්‍යතන යුරෝපීය දර්ශනය ආධානග්‍රාහී (dogmatic) ආගමික දර්ශනයකි. මධ්‍යතන යුගය තුළ නිදහස් මනුෂ්‍ය බුද්ධියට ඉඩක් හිමි නොවේ.

මේ යුගයේ දාර්ශනිකයාගේ මෙන්ම ආගමික පූජකවරයාගේ ද කාර්යභාරය එක හා සමාන වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. එනම් කතෝලික නොවන පුද්ගලයන් හට සර්වබලධාරී දෙවියන් වහන්සේ පිළිබඳව අවබෝධ කරලීම මේ අවධියේදී පූජකවරුන්ගේ කාර්යභාරය වූ බව මනාව පැහැදිලි වේ. ඒ හා සමානව දාර්ශනිකයාගේ කාර්යභාරය වූයේ ද ශ්‍රද්ධාව හා භක්තිය ආරක්ෂා කරමින් ඒවායේ අවශ්‍යතාවය පිළිබඳ අවබෝධයක් නොමැති පුද්ගලයින් හට ඒ පිළිබඳ පැහැදිලි කර දීමයි. මෙයින් බලන කළ මෙම යුගයේ දාර්ශනිකයා මෙන්ම ආගමික පූජකවරයා ද එක හා සමාන කර්තව්‍යයක් සිදු කර ඇති බව මනාව පැහැදිලි වේ.

මධ්‍යතන දාර්ශනික යුගය වනාහි දාර්ශනික ප්‍රවාහයන් රාශියකින් සැදුම්ලත් දාර්ශනික යුගයක් ලෙස හඳුන්වාදිය හැකි වේ. ඉන් ප්‍රධාන ස්ථානයක් උසුලන්නේ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ගේ දාර්ශනිකයන්ගෙන් විකසිත වූ පශ්චාත් ඇරිස්ටෝටලියානු දර්ශනයයි. නව ප්ලෝටෝනිකවාදය, ස්ටොයිකවාදය, එපිකියුරියානුවාදය සහ සංශයවාදය යන දාර්ශනික සම්ප්‍රදායන්ගෙන් සැදුම් ලත් හෙලනිස්ටික දර්ශනය මධ්‍යතන දාර්ශනික යුගය නිර්මාණය වීමට පසුතලය නිර්මාණය කරන ලදි. මධ්‍යතන දර්ශනය සුවිශේෂී දර්ශනික ධාරාවක් ලෙස වර්ධනය නොවීමට මෙම කාරණාව බෙහෙවින් බලපා ඇත්තේ එමගින් මධ්‍යතන යුගය සුවිශේෂී අද්විතීය දාර්ශනික විධිවේදයකට උරුමකම් කියන කාල පරාසයක් ලෙස නොව ඇත් පෙරදිග දර්ශනයේ එක් ප්‍රකට වීමක් ලෙස හුවා දැක්වීමයි. වර්තමානයේ මධ්‍යතන යුගය දාර්ශනික වශයෙන් අඳුරු යුගයක් ලෙස සලකයි.

**මධ්‍යතන යුගය අඳුරු යුගයක් ද?**

ග්‍රීක යුගයේ මෙන් ප්‍රබුද්ධ දාර්ශනික මතවාදයන් බිහි කිරීම වෙනුවට මධ්‍යතන යුගයේ සිදුවූයේ ක්‍රිස්තියානි ආගමේ දැඩි බලපෑමෙන් දාර්ශනික දෘෂ්ටිකෝණයකින් ආගම ජනතාව තුලට ගෙන යාමට උත්සහ දැරීමකි. ග්‍රීක යුගයේ විශ්වයේ ආරම්භය, විශ්වයේ පැවැත්ම සහ මිනිසා වැනි සංකල්ප කෙරෙහි අවධානය යොමු ව පැවතිය ද මධ්‍යතන දාර්ශනික යුගය තුළ දර්ශනය ක්‍රිස්තියානි දහමේ මෙහෙකරුවා බවට පත්ව තිබිණි. මේ යුගයේ දාර්ශනික වශයෙන් බලාපොරොත්තු වන අරමුණ එවකට සිටි දාර්ශනිකයන් කෙරෙන් උද්දීපනය නොවූ අතර ඒ තුළින් ජනිත් වූයේ දැඩි ආගම් ආගම්වාදී අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීමකි. මෙම යුගයේ දැකිය හැකි මූලික ලක්ෂණය වූයේ ග්‍රීක යුගය පැවතියා වූ බුද්ධිමය හා තර්කානුකූල බව බැහැර වී මධ්‍යතන යුගයේ විශ්වාසය හා භක්තිය මුල් තැන පැමිණීමයි.

ඒ අනුව ග්‍රීක යුගයේ පැවති නිදහස් සහ චින්තනය යටපත් වෙමින් දේවධර්මයට මුල් තැනක් දුන් දර්ශනයක් මේ අවධිය තුළ ආරම්භ වන බව පැහැදිලි වේ. තත්කාලීන චින්තනය විශේෂයෙන් ආධානග්‍රාහීත්වයට මුල් තැනක් දුන් භක්තිය හා විශ්වාසය මත පදනම් වූ එකක් බව ශාන්ත ඔගස්ටීන්ගේ පහත කියමනෙන් තහවුරු වේ. එනම්, "තේරුම් ගැනීම සඳහා විශ්වාස කරන්න" යන්නයි. මෙසේ විශ්වාසය මත පදනම් වෙමින් ගොඩනැගුණු ආගමික චින්තනය නිදහස් චින්තනයකට වඩා ආධානග්‍රාහී ආගමික චින්තනයක් වූ බව මනාව පැහැදිලි වේ. මෙම චින්තනය දෙවියන් වහන්සේ විසින් දේශනා කරන ලද දේව වාක්‍යන්ගෙන් සමන්විත වූ උත්තරීතර චින්තනයක් ලෙසින් ඉදිරිපත්වීම නිසා කිසිවෙකුටත් ඒ පිළිබඳව ප්‍රශ්න

කිරීම් කළ නොහැකි බව දැඩිව විශ්වාස කළ බව පෙනේ. සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් දේශනාකරන ලද සත්‍ය දේශනාවන් අවිශ්වාස කොට යම් පුද්ගලයෙකු විවිධ ප්‍රශ්න අසනු ලබයි නම් එවැනි අයට දැඩි ලෙස දඬුවම් දිය යුතු බව කතෝලික පල්ලිය විසින් තීරණය කර තිබේ.

**"මධ්‍යතන යුගය දාර්ශනික වශයෙන් අඳුරු යුගයක් යන්න පහත නිදර්ශනයන්ගෙන් මනාව පැහැදිලි වේ. මධ්‍යතන යුගයේ ඉතිහාසය පිළිබඳව විමර්ශනශීලීව අධ්‍යනය කරන්නෙකුට ඒ පිළිබඳ නිදසුන් බොහෝමයක් හඳුනාගත් හැකිය. ඉන් කිහිපයක් මෙසේය.**

- **බෲනෝ (ක්‍රි .ව.1548 - 1600) නම් දාර්ශනිකයා ඉදිරිපත් කළ අදහස් කතෝලික ධර්මයට විරුද්ධ මතවාදයන් වූ හෙයින් ඔහුව පුළුස්සා මරණයට පත් කළ බව සඳහන් වේ.**
- **කොපනිකස් (ක්‍රි .ව.1473 - 1543) විසින් ඉදිරිපත් කරන ලද සූර්ය කේන්ද්‍රවාදය පෘථිවිය සූර්යයා වටා භ්‍රමණය වේ (සූර්යකේන්ද්‍රවාදය) යන විප්ලවීය මතවාදය වර්ෂ 1616 දී කතෝලික පල්ලිය විසින් ඉගැන්වීම නුසුදුසු බව දක්වමින් තහනම් නියෝගයක් පනවා තිබේ.**
- **ගැලීලියෝ ගැලීලිට (ක්‍රි .ව.1564 - 1642) නිදහසේ සිය චින්තනය ඉදිරිපත් කරන්නට ඉඩ නොදුන් කතෝලික පල්ලි සංස්ථාව කොපර්නිකස් ගේ මතවාදය ඉගැන්වීම නොකළ යුතු බවට බලයෙන් දිවුරා පොරොන්දු ගත් බව ද සඳහන් වේ."[2]**

මීට අමතරව දෙවියන් වහන්සේට විරුද්ධව මත ඇතුළත් වූ ග්‍රන්ථ සියල්ලම කතෝලික බැතිමතුන් විසින් පරිශීලනය නොකළ යුතු යැයි වතිකානු රජය විසින් නියෝග කර තිබේ. ඒ තුළින් පුද්ගලයාට යමක් සත්‍ය ද අසත්‍ය ද කියා විමසා බැලීමේ මූලික අයිතිවාසිකම ද ගිලිහී ගොස් ඇති බව මනාව පැහැදිලි වේ. මෙසේ දාර්ශනික මතවාදයන් බිහිවීමට තිබූ ඉඩකඩ සීමා කිරීම හේතු කරගෙන මේ අවධිය දාර්ශනික වශයෙන් අඳුරු ලෙස හැඳින්වීමට විචාරකයන් උත්සුක වී ඇත.

මේ අනුව බලන කළ මධ්‍යකාලීන චින්තනයට වනාහී දේවධර්මවාදී චින්තනයක් ලෙස හඳුන්වා දිය හැකි වේ. ඒ තුළ නිදහස් චින්තනයට මෙන්ම තර්කයට ඉඩකඩක් නොතිබුණු හෙයින් දාර්ශනික ආකල්ප ක්‍රමක් ක්‍රමයෙන් යටපත් වෙමින් පැවති අතර දෙවියන් වහන්සේ පිළිබඳ භක්ති හා විශ්වාසය ඉස්මතු වූ බව මනාව පැහැදිලි වේ. එබැවින් මධ්‍යකාලීන චින්තනය නිසරු චින්තනයක් ලෙසින් බොහෝ දෙනා හඳුන්වා ඇත. මෙවන් පසුබිමක් මත දාර්ශනිකයාගේ කාර්යභාරය වූයේ ක්‍රිස්තියානි දහම නොහඳුන මිනිසුන් සමග වාද විවාද පවත්වා ඔවුන්ට දෙවියන්, ආත්මය, ස්වර්ගය, පාපය වැනි සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.

**"කරුණු මෙසේ වුව ද මේ අවධියේ දී යම් ආකාරයකට දාර්ශනික වැදගත්කමින් යුතු කරුණු කීපයක් හඳුනාගන්නට විචාරකයින් සමත්වී ඇත.**

**එම කරුණු පහත සඳහන් පරිදි නම් කළ හැකිය.**

**සමාන්‍යයන් පිළිබඳ ගැටලුව විමර්ශනය කිරීමට උත්සාහ ගැනීම.**

[2] චාමලි රුවන්දිකා විදානගම, **දාර්ශනික ලිපි** (නාරම්මල: චාමලි රුවන්දිකා විදානගම, 2009), 4 - 5.

**දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාධක ගෙන හැර දැක්වීම.**

**භක්තිය හා බුද්ධිය එකිනෙකට සමීප කිරීමේ උත්සාහය මේ අතර ප්‍රධාන තැනක් ගනී.”[3]**

සමාන්‍යයන් පිළිබඳ ගැටලුවේ දී බුද්ධියට බාහිර ලෝකයේ වස්තූන් සහ ඒවා පිළිබඳව ඇති සංකල්ප සම්බන්ධ කිරීම අවධානය යොමු කරනු ලබයි. මේ පිළිබඳව බොයෙතියෙස්, රොසලීනස්, පීටර් ඇබලාඩ් වැනි අය අදහස් දක්වා තිබේ. දෙවියන්ගේ පැවැත්ම පිළිබඳව ඇන්ස්ලම්, ඇක්වයිනාස් වැනි අය අදහස් දක්වා තිබේ. භක්තිය හා බුද්ධිය එකිනෙකට සමීප කිරීමේ උත්සාහය සාමාන්‍යයෙන් මධ්‍යතන චින්තනය පුරා ම දක්නට ලැබේ. මේ තුළින් අදහස් කරනු ලබන්නේ යම් ශිල්පීය ක්‍රමයක් භාවිත කිරීම හා ඉන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම පිළිබඳවයි. මේ අනුව භක්තිය හා බුද්ධිය සමීප කිරීමට උත්සාහ ගැනිම මධ්‍යතන යුගයේ ශිල්පීය ක්‍රමයක් වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

මේ ආකාරයට ග්‍රීක දර්ශනය ක්‍රමයෙන් යටපත් වීමත් සමඟ ගොඩනැගුණු මධ්‍යතන දර්ශනය වනාහි ක්‍රිස්තියානි පල්ලියේ ආධානග්‍රාහී ආගමික දර්ශනයක් වූ බව මනාව පැහැදිලි වේ. මේ යුගයේ වැදගත් කොට සලකන ලද ආගමික පූජකවරු කිහිප දෙනෙක් හඳුනා ගත හැකිවේ. ඔවුන් පිළිබඳ අදහස් සැකෙවින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.

## මධ්‍යතන දාර්ශනිකයින් වශයෙන් සැලකෙන ප්‍රධාන කතෝලික පූජකවරු

**ශාන්ත ඔගස්ටීන්** (ක්‍රි. ව. 354 - 430)

ශාන්ත ඔගස්ටීන් හිපෝහි ශාන්ත ඔගස්ටීන් ලෙස ද ප්‍රචලිතව පවතී. මොහු ක්‍රි . ව. 354 නොවැම්බර් 13 වන දින අප්‍රිකාවේ ටාගස්ට් නගරයේ ඇගුස්ටින් ඩී හිපෝනා හිදි උපත ලබන ලදි.මොහුගේ නම ලතින් සම්භවයක් ඇති අතර එහි අර්ථය වන්නේ "ගෞරවයට පාත්‍ර වූ තැනැත්තා" යන්නයි. හිපෝහි ශාන්ත ඔගස්ටීන් කිතුනු දාර්ශනිකයෙකු හා දේවධර්මාචාර්යවරයෙකි. ඔහු කතෝලික හා බටහිර යන දෙඅංශයේම වඩාත්ම  බලගතු සාන්තුවරයෙකු ලෙස සැලකේ. ඔහු පොත් 234 අධික ප්‍රමාණයක් ලියා ඇති බවද සඳහන් වෙයි.රෝම අධි අධිරාජ්‍යයේ බිඳ වැට බිඳ වැටීමෙන් පසුව ක්‍රිස්තියානි ධර්මයේ ආධිපත්‍යයට ඔහුගේ අදහස් හා ලේඛන වැදගත් විය. ඔහු බොහෝ විට ඕතඩොක්ස් දේවධර්මයේ පියා ලෙසත් ලතින් පල්ලියේ පියවරුන් සිටි දෙදෙනාගේ ශ්‍රේෂ්ඨතමයා ලෙසත් සැලකේ. ශාන්ත ඔගස්ටින් ලතින් සහ ග්‍රීක දාර්ශනික සම්ප්‍රදායන්ට දැඩි ලෙස බලපෑම් කළ අතර ක්‍රිස්තියානි දේවධර්මය අවබෝධ කර ගැනීමට සහ පැහැදිලි කිරීමට ඒවා භාවිතා කළේය. ඔහුගේ ලේඛන තවමත් පල්ලියේ සාම්ප්‍රදායිකත්වයේ ප්‍රධාන කුළුණු ලෙස පවතී.

ශාන්ත ඔගස්ටීන් යනු මධ්‍යතන යුගයේ විසූ ශ්‍රේෂ්ඨ මනෝවිද්‍යාඥයෙක්, දේවධර්ම ශාස්ත්‍රඥයෙක් සහ දේශපාලනඥයෙක් ලෙසින් ගෞරවාදරයට පත්වූ දාර්ශනිකයෙකු ලෙස හඳුන්වාදිය හැකි වේ. මුල්

[3] එම, 6.

කාලය මොවුහු දර්ශන කෙරෙහි එතරම් උනන්දුවක් නොදැක්වුව ද, ඔහු ලතින් සාහිත්‍යය කෙරෙහි දැඩි ඇල්මකින් කටයුතු කළ අයෙක් බව සඳහන් වේ. දැඩි ලෙස දේව භක්තිකයෙකු වූ මොහු පසුකාලීන ක්‍රිස්තියානි දර්ශනය වෙත සිය චින්තනය මෙහෙයවා ඇත. කෙසේ වුවද ඔහු දෙවියන්ගේ ස්වර්ග රාජ්‍ය කෙරෙහි විශ්වාස කළ අයෙක් නොවේ. එසේම දෙවියන් පිළිබඳ ඥානය තුළින් පරම සත්‍යය කරා ලඟා වීමක් හෝ පුද්ගල ආත්මයට අමරණීයත්වය ලබාගත හැකි බවක් පිළිබඳව මොහු විශ්වාස කළේ නැත. ඔගස්ටියන් මුල් කාලයේ දෙවියන් වහන්සේ සම්බන්ධ යම් යම් සංකල්ප පිළිබඳව ව්‍යාකූලත්වයක සිටිය ද ,පසු කාලීනව ග්‍රීක දර්ශනික සංකල්පනාවන් කෙරෙහි සිය අවධානය යොමු වීමත් සමග එම ව්‍යාකූලත්වයෙන් මිදුණු බව සඳහන් වේ.එසේම මොහු ප්ලේටෝගේ දර්ශනය වෙත වැඩි අවධානයක් යොමු කර ඇත. ප්ලේටෝගේ දර්ශනයේ පැවති ආත්මයේ අද්‍රව්‍යාත්මක බව සහ යක්ෂයාගේ නොපැවැත්ම යන සංකල්ප ඔගස්ටීන්ව අවුල් සහගත බවින් මුදවා ගත් බව සඳහන් වේ.

**"ප්ලේටෝගේ දර්ශනය දේවධර්මය සමග ගළපන්නට ගන්නා ලද දැඩි උත්සාහයක් ද ශාන්ත ඔගස්ටීන්ගේ චින්තනය තුළ දක්නට ඇත. විචාරකයින් පෙන්වා දෙන ආකාරයට ක්‍රිස්තියානි දර්ශනය ක්‍රමානුකූල පිළිවෙළකට සකසන ලද්දේ ද ඔගස්ටීන් විසිනි. ඔහුගේ අදහස් කතෝලිකයින් මෙන්ම ප්‍රොතෙස්තන්ත්‍ර පණ්ඩිතවාදීන් ද මහත්සේ දායක කොටගෙන තිබෙන අතර ඔහුගේ සමාජ දර්ශනය ද පසුකාලීන බටහිර සමාජ සංස්කරණයන් කෙරෙහි බොහෝ සේ බලපෑම් කොට තිබෙන බවත් පිළිගැනේ."** [4]ඔගස්ටීන් පසුකාලීනව ක්‍රිස්තියානි දහමට දැඩි ලෙස ඇලුම් කළේය. ඔගස්ටීන් විසින් පිළිගත් ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා වූ ප්ලේටෝට පවා කිසිම අයුරින් ළඟාවිය නොහැකි උසස් පුද්ගලයකු ලෙස දෙවියන් වහන්සේව හඳුන්වා තිබේ.

**" ඔගස්ටීන් විසින් අවබෝධ කර ගැනීමේ ප්‍රධාන මට්ටම් තුනක පැවැත්ම තීරණය කරන ලදී. මේවා සංවේදනයන් තාර්කික දැනුම සහ ප්‍රඥාව යන ඒවායි."** [5] ඔගස්ටින් විසින් කෘති ගණනාවක් රචනා කොට ඇති අතර ;ඔන් ද ට්‍රිනිටි (On the trinity) ද සිටි ඔෆ් ගෝඩ් (The City Of Gold) යන කෘති ඉතා වැදගත් වේ. මෙහි පළමු කෘතියෙහි ත්‍රිත්වයක් පිළිබඳ අදහස් පළවේ. එනම් දෙවියන් ස්වර්ගය සහ ආත්මය යනුවෙනි. මෙම ත්‍රිත්ව සංකල්පය හැරුණු විට වෙනත් සත්‍යයක් තිබිය නොහැකි බව එදා ක්‍රිස්තියානි පල්ලියෙහි මතවාදය විය. දෙවන කෘතිය මගින් දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ අදහස් ගෙන හැර දක්වයි.මේ ආකාරයට මධ්‍යතන යුගයේ කතෝලික දර්ශනයට විශාල දායකත්වයක් ඔගස්ටියන් විසින් ලබා දී ඇති බව ඉහත විමසුමෙන් මනාව පැහැදිලි වේ.

**ශාන්ත ඇන්ස්ලම් (ක්‍රි . ව.1033 - 1109)**

ශාන්ත ඇන්ස්ලම් තරමක් ධනවත් පවුලක පුද්ගලයෙකි. මෙතුමා ඉතාලියේ බර්ගන්ඩි රාජයේ බෙක් හිදි උපත ලබා ඇත. එමෙන්ම ඉතා නිහතමානී පුද්ගලයකු ලෙසද ඇන්ස්ලම්ව හඳුන්වා දිය හැකි ය.ශාන්ත ඇන්ස්ලම් වනාහි එංගලන්තයේ විලියම් රජුගේ සමයේ කැන්ටබරියේ අග්‍ර බිෂොප්වරයා වූ ඉතාලි ජාතික පූජකවරයෙකි. ඇන්ස්ලම් ද ප්ලේටෝගේ අදහස් දැඩි ලෙස පිළිගෙන ඇත. දෙවියන්වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා වන සත්භාවි තර්කය ද ඉදිරිපත් කරන ලද්දේ ඇන්ස්ලම් විසිනි. එනම්; **"මෙය ප්‍රථම වරට පැහැදිලිව**

[4] චාමලි රුවන්දිකා විදානගම, **දාර්ශනික ලිපි** (නාරම්මල: චාමලි රුවන්දිකා විදානගම, 2009), 9.
[5] https://si.warbletoncouncil.org/aportaciones-de-san-agustin-12153 (accessed 29.06.2023)

**ඉදිරිපත් කළේ මධ්‍යකාලීන කතෝලික පියතුමකු වූ ශාන්ත ඔගස්තීනු පියතුමාය. පසුව මෙය ශාන්ත ඇන්ස්ලම් පියතුමා විසින් වඩා සකස් කොට ඉදිරිපත් කරන ලදී.**"[6]ඇන්ස්ලම්ට අනුව දෙවියන් වහන්සේ යනු සර්ව සම්පූර්ණ පුද්ගලයෙකි.

ක්‍රිස්තියානි දර්ශනයට එරෙහිව ඉස්ලාම් දර්ශනයෙන් හා යුදෙව් ආගමෙන් එල්ල වූ චෝදනා වලට පිළිතුරු සපයන ලද්දේ ද ඇන්ස්ලම් පියතුමා විසිනි. ක්‍රිස්තියානි දර්ශනය නව පුනර්ජීවනයක් සඳහා කටයුතු කිරීම ද ඇන්ස්ලම් පියතුමා තුළින් දැක ගැනීමට හැකි වේ. එසේම ක්‍රිස්තියානි දර්ශනයට ශක්තිමත් පදනමක් ලබා දීමට ද මෙතුමා විසින් කටයුතු කරන ලදී. තවද ක්‍රිස්තියානි දාර්ශනික පුනර්ජීවනයේ ආරම්භක නියමුවා වශයෙන් ද මෙතුමාව හඳුන්වා දිය හැකි වේ. මෙතුමා යුරෝපයේ වඩාත් ජනප්‍රිය වූයේ ශාන්ත ස්ටීවන් තාපසාරාමය කටයුතු කරන සමයේ දී ය. ඒ කාලේ මෙතුමා විසින් ලියන ලද මොනරොජියම් හා ප්‍රොස්ලොජියම් යන ග්‍රන්ථ ඉතා ජනප්‍රිය විය.

මෙතුමා 1993 වර්ෂයේදී කැන්ටගනයේ අගරදගුරු බවට පත් වෙයිග මෙහි දී අගරදගුරු හැටියට කටයුතු කරන සමයේ මෙතුමාගේ කොට්ඨාශයේ තාපසාරාමවල මනා පාලනයක් ඇති කිරීමට මෙතුමා විසින් කටයුතු කරන ලදීග එසේම මූල්‍ය කටයුතුවලදී මනා පාරදෘශ්‍ය භාවයකින් කටයුතු කළ ලදීග කතෝලික තාපසයින් හට මනා මඟ පෙන්වීමක් ද සිදු කරන ලදී.

**ශාන්ත තෝමස් ඇක්වයිනාස් (ක්‍රි . ව.1225 - 1274)**

තෝමස් ඇක්වයිනාස් 1225 දී ඉතාලියට අයත් සිසිලි රාජයේ ඇක්විනෝ කියන නගරයේ උපත ලැබීය.මෙතුමා ශුද්ධවූ සභාවේ දේවධර්මාචාර්ය වරයෙකි (Doctor of the church).ශාන්ත ඇක්වයිනාස් තරම් දේවදූතයන් පිළිබඳව ලියන ලද තවත් දේවධර්මාචාරියෙක් ශුද්ධවූ සභාවේ නැත.තවද ශාන්ත ඇක්වයිනාස්ගේ ජීවිත පැවැත්ම දේවදූතයෙකු මෙන් පිවිතුරුය; භක්තිවන්තය.එලෙසම ශාන්ත ඇක්වයිනාස් දෙවියන් වහන්සේ පිළිබඳව ලියන ලද්දේ උන්වහන්සේ ඉදිරියෙහි සේවය කරන දේවදූතයෙකු මෙන් ප්‍රඥාවක් සහිතවය.එමනිසා (ඛඵෂ) වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පාප්වහන්සේ, ශාන්ත ඇක්වයිනාස්ව හැදින්වූයේ, "ස්වර්ගීය/දේවදූතික දේවධර්මාචාරියා" ලෙසිනි.තෝමස්වාදයේ පියා හා ස්වභාවික දේවධර්මයේ සම්භාව්‍ය පුරෝගාමියාද මොහුය.බටහිර චින්තනය කෙරෙහි විශේෂයෙන්ම එහි ආචාර ධර්ම, ස්වාභාවික නීතිය, පාරභෞතික විද්‍යාව සහ දේශපාලන න්‍යාය යන ක්ෂේත්‍රයන්හිදී මේ ඉතාලි දාර්ශනිකයාගේ බලපෑම අති විශාලය.එලෙසම සිසුන්ගේද කතෝලික ඇකඩමි වලද පාසල් හා විශ්ව විද්‍යාල වලද නාම සාන්තුවරයා වනුයේ ශාන්ත තෝමස් ඇක්වයිනාස්ය.ශාන්ත ඇක්වයිනාස්ගේ දෙමාපියන් ඉතා ධනවත් අය වූවද, බාල පුතු වශයෙන් තෝමස් ඇක්වයිනාස්ව තාපසාරාමයකට ඇතුළු කළහ.වයස අවුරුදු 05 දී පමණ මොන්ටේ කැසිනෝ ඇබේහිදි තම අධ්‍යාපනය ආරම්භ කළ ශාන්ත ඇක්වයිනාස්, IX වන ග්‍රෙගරි පාප්වහන්සේ හා II වැනි ෆෙඩ්රික් අධිරාජ්‍යයා අතර ඇතිවූ යුධ ගැටුම මොන්ටේ කැසිනෝ ඇබේ දක්වා පැමිණෙන තෙක් එහි අධ්‍යාපනය ලැබුවේය. මේ නිසා ශාන්ත ඇක්වයිනාස්ට නේපල්ස්හි විශ්ව විද්‍යාලය වෙත යාමට සිදුවිය.ඇරිස්ටෝටල්ගේ දාර්ශනික බලපෑම් ශාන්ත ඇක්වයිනාස්ට ලැබුනේ මෙහිදී බවට විශ්වාස කෙරේ.

---

[6] ගුණපාල ධර්මසිරි, **දාර්ශනික ප්‍රශ්න** (බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007), 110.

තෝමස් ඇක්වයිනාස් කිසි විටෙකත් තමා දාර්ශනිකයෙකු ලෙස හැඳින්වූයේ නැත, මන්ද මෙය සත්‍යය වටහා ගැනීමට බාධාවක් වන බව ඔහු විශ්වාස කළේය. ඔහු දර්ශනය හැඳින්වූයේ "දේවධර්මයේ සේවිකාව" යනුවෙනි. කෙසේ වෙතත්, ඇරිස්ටෝටල්ගේ සහ නියෝප්ලාටෝනවාදීන්ගේ අදහස් ඔහුට බෙහෙවින් බලපෑවේය."**ඇරිස්ටෝටල්ගේ දර්ශනය තෝමස් ඇක්වයිනාස් නමැති කතෝලික චින්තකයා විසින් නව මඟකට හැරවියි. ඇක්වයිනාස්ට පෙර සිටි කතෝලික පූජක පූජකවරුන් සහ චින්තකයින් වෙත ඇරිස්ටෝටල් පිළිබඳ ව තිබියේ ඉතාමත් අසම්පූර්ණ ඥාණයකි. එහෙත් ඇවරෝස් නැමැති අරාබි දර්ශනවාදියාගේ විවරණයන් නිසා ඇරිස්ටෝටල් පිළිබඳව මධ්‍යතන කතෝලික චින්තකයන් වෙත තිබියේ ළිඳේ සිටින මැඩියා හා සමාන ඥානයක් බව ඔවුන්ටම අවබෝධ වූ බව පෙනේ. තෝමස් ඇක්වයිනාස් විසින් ඇරිස්ටෝටල්ගේ දර්ශනයේ ප්‍රධාන මූලධර්මයන් මාර්ග කොට ගෙන ක්‍රිස්තියානි දේවධර්මයට නව මුහුණුවරක් දීමෙන් පසු ග්‍රීක දර්ශනික ඇරිස්ටෝටල් ක්‍රිස්තියානි දේවධර්මයේ "ආඥාදායකයා" බවට පත් වූ බව පෙනේ."**[7]

විශේෂයෙන් විද්‍යාත්මක පරීක්ෂණ සහ නිගමන සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු නොවුණු මේ අවධියේ කිසියම් විද්‍යාත්මක අදහසක් ඉදිරිපත් වුවොත් එහි සාවද්‍ය බව පෙන්වීමට ද කතෝලික පල්ලිය විසින් ඇරිස්ටෝටලියානු අදහස් උපයෝගීකොට ගෙන තිබීම විශේෂයෙන් කැපී පෙනෙන ලක්ෂණයකි එයට කදිම නිදසුනක් මෙසේ දැක්විය හැකය. **"සූර්යයාගේ තිත් සමූහයක් තිබෙන බන බව සොයා ගත් තීක්ෂණ විද්‍යාඥයකුට මධ්‍යතන චින්තකයෙකු විසින් දුන්නා යයි පැවසෙන පහත පෙනෙන පිළිතුර, මේ ආධානග්‍රාහී ලක්ෂණය මොනවට පැහැදිලි කරයි. එනම්, "මිත්‍රය, මම ඇරිස්ටෝටල්ගේ කෘතීන් කිහිපවරක් කියවා ඇත්තෙමි. මට ඔබට සහතික ලෙස කියන්නට පුළුවනි, ඔහු මෙවැන්නක් සඳහන් කර නො කර ඇති බව. එමනිසා ඔබ දුටුවා යැයි පැවසෙන තිත්, සූර්යයාගේ තිත් නොව ඔබගේ ඇස්වල ඇති තිත්ය," යනුයි"**[8] එසේම දෙවියන්වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා තර්ක පහක් ඉදිරිපත් කර ඇත. ඒවා මෙසේය; අචලචාලක තර්කය, මූලහේතුක තර්කය, සදාචාර තර්කය, සාධ්‍යතා තර්කය, සඵල අවශ්‍යතාවන්ට මූලක් ප්‍රභවයක් අරමුණක් දිය යුතුය යන තර්කය වශයෙනි.

ඇක්වයිනාස් සිය ජීවිත කාලය තුළ දාර්ශනික හා දේවධර්මීය කෘති රාශියක් ලිවීය. නමස්කාරය සඳහා කාව්‍ය කෘති ගණනාවක කතුවරයා වූ ඔහු, බයිබලානුකූල පොත් කිහිපයක විවරණ සහ ඇල්කෙමිය පිළිබඳ නිබන්ධනයන් විය. ඔහු ප්‍රධාන කෘති 2 ක් රචනා කර ඇත. "දේවධර්මයේ එකතුව" සහ "අන්‍යජාතීන්ට එරෙහි මුදල".

**"සංජානනය මිනිසුන් සතුන් හා අනෙකුත් ජීවීන්ගෙන් වෙන් කරයි. දිව්‍ය මූලධර්මය අවබෝධ කර ගැනීම සඳහා මෙවලම් 3 ක් භාවිතා කළ යුතුය - හේතුව, හෙළිදරව් කිරීම සහ ප්‍රතිභානය. දේවධර්මයේ සාරාංශයේදී ඔහු දෙවියන්ගේ පැවැත්මට සාක්ෂි 5 ක් ඉදිරිපත් කළේය.**

**1. චලනය. විශ්වයේ ඇති සියලුම වස්තූන්ගේ චලනය වරක් ඇති වූයේ වෙනත් වස්තූන්ගේ චලනය හා අනෙක් අයගේ චලනයන් මගිනි. චලනය වීමට පළමු හේතුව දෙවියන් වහන්සේ ය.**

---

7 ඒ. ඩී. පී. කලන්සූරිය, **නූතන බටහිර දර්ශනය** (බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමෙන්තුව, 2007), 9.

8 ඒ. ඩී. පී. කලන්සූරිය, **නූතන බටහිර දර්ශනය** (බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමෙන්තුව, 2007), 9.

**2. උත්පාදක බලය. සාධනය පෙරට සමාන වන අතර එයින් ඇඟවෙන්නේ නිපදවන සෑම දෙයකටම මූලික හේතුව මැවුම්කරු බවයි.**

**3. අවශ්‍යයි. ඕනෑම වස්තුවක් විභව හා සැබෑ භාවිතය අදහස් කරන අතර සියලු වස්තූන් විභව විය නොහැක. දේවල් විභවයේ සිට සත්‍ය තත්වයට මාරුවීමට පහසුකම් සැලසීමට සාධකයක් අවශ්‍ය වේ. මෙම සාධකය දෙවියන් ය.**

**4. පැවැත්මේ උපාධිය. මිනිසුන් දේවල් හා සංසිද්ධීන් පරිපූර්ණ දෙයක් සමඟ සංසන්දනය කරයි. උත්තරීතර යන්නෙන් අදහස් කරන්නේ මෙම පරිපූර්ණත්වයයි.**

**5. ඉලක්ක හේතුව. ජීවීන්ගේ ක්‍රියාකාරීත්වයට අර්ථයක් තිබිය යුතුය, එයින් අදහස් කරන්නේ ලෝකයේ සෑම දෙයකටම අර්ථයක් ලබා දෙන සාධකයක් අවශ්‍ය බවයි - දෙවියන්."[9]**

යන්නයි.

මේ ආකාරයට මධ්‍යතන යුගය කැපී පෙනෙන චින්තකයෙකු වූ තෝමස් ඇක්වයිනාස් අවසාන වශයෙන් පෙන්වා දෙන්නේ ද ලොව පවත්නා අපරිමිත වූ සියල්ල පිළිබඳව දන්නා දෙවියන් වහන්සේ කිසිවිටෙකත් මිනිස් සමාජයෙන් බැහැර කරන්නට නොහැකි බවයි. තෝමස් ඇක්වයිනාස් 1274 මාර්තු 7 වන දින ලියොන්හි පල්ලියේ ආසන දෙව්මැදුරට යමින් සිටියදී ෆොසානෝවා ආරාමයේ දී මිය ගියේය. ආසන දෙව්මැදුරට යන අතරමගදී ඔහු බරපතල ලෙස රෝගාතුර විය. භික්ෂූන් වහන්සේලා දින කිහිපයක් ඔහු රැකබලා ගත් නමුත් ඔවුන්ට ඔහුව බේරා ගැනීමට නොහැකි විය. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 49 කි.

## ඉස්ලාම් දර්ශනය පිළිබඳ හැඳින්වීමක්

මධ්‍යතන දර්ශනයේ දෙවැනි අවධිය නියෝජනය කරන්නේ ඉස්ලාම් දර්ශනය යි.ඉස්ලාම් ආගමික ඉගැන්වීම් ඇසුරින් නිර්මාණය වූ දර්ශනය ඉස්ලාම් දර්ශනයය නම් වේ. මෙය අරාබි දර්ශනය ලෙස ද හඳුන්වයි. එලෙස හඳුන්වන්නේ මෙහි එන දාර්ශනික සංකල්ප අරාබි භාෂාව රචනා වී ඇති බැවිනි. ඉස්ලාම් ආගම ඇදහූ අරාබින් පර්සියානුවන් හා තුර්කීන් විසින් සිය චින්තනය මෙහෙයවා ඉස්ලාම් හෙවත් අරාබි දර්ශනය ගොඩනගා ඇත. ඉස්ලාම් දාර්ශනික විමර්ශන ග්‍රීක දර්ශනයට ප්‍රබල බලපෑමක් එල්ල කර තිබේ. මුල්කාලීන ඉස්ලාම් ආගමික කෘති සඳහා නව ප්ලේටෝනිකවාදී පෛතගෝරියානු හා ස්ටොයික් යන දර්ශනවාදයන් හි ආභාෂය ලැබ් තිබුණ ද, වඩා ප්‍රබල ලෙසින් ආභාෂය ලැබුනේ ඇරිස්ටෝටලියානු දාර්ශනික මතවාදයන් මගින්ය. ඒ නිසා ඉස්ලාම් දර්ශනය බිහිවීම ඇරිස්ටෝටල්ගේ පුනරාගමනය ලෙස හඳුන්වයි.

ලොව ලාබාලතම ආගම ලෙස සැලකෙන ඉස්ලාම් දහම ක්‍රිස්තු වර්ෂ 6 වැනි සියවසේ අග භාගයේ දී අරාබිකරයේ පහළ විය. මෙහි ආගමික ශාස්තෘවරයා වන්නේ මොහොමඩ් නබිනායකතුමා ය .ලෝකයේ අන් කවර දහමක වත් වඩා විවිධත්වයේ ඒකත්වය සමර්ථනය කෙරෙන සහ ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවෙන දහමකි ඉස්ලාම් දහම. ඉස්ලාම් දහමේ එන කේන්ද්‍රීය හා මුඛ්‍යතම ඉගැන්වීම මෙන්ම සමස්ත ඉස්ලාමීය සමාජ,

[9] https://si.kuzminykh.org/1907-thomas-aquinas.html (accessed 28.06.2023)

ආගමික, දේශපාලන ,ආර්ථික, සෞන්දර්යාත්මක හා සදාචාරාත්මක සංකල්පනා සමුදාය සංකේන්ද්‍රණය වී ඇති පරම මූලධර්මය වන්නේ;

"අල්ලාහ් වනාහි ස්වර්ගය හා පෘථිවිය නිර්මාණය කළා වූ එක ම දෙවියන් වහන්සේ වෙයි .මුහම්මත් තුමා වනාහි එතුමාගේ වක්තෘවරයා වෙයි ." යන්නයි.

සම්භාව්‍ය ඉස්ලාම් දර්ශනය (Classical Islamic Philosophy) ලෙස සැලකෙන්නේ ක්‍රිස්තු වර්ෂ 8 වැන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 12 වැනි සියවස දක්වා කාලය තුළ දී ඉස්ලාම් ලෝකය තුළ සිදු වූ දර්ශනය විෂයෙහි වූ වර්ධනයයි. මෙම යුගය ඉස්ලාම් ස්වර්ණමය යුගය වශයෙන් හඳුන්වනු ලැබේ. බොහෝ දෙනෙකු අමතක කරන කරුණක් තිබේ. එනම් යුරෝපයේ පුනරුද යුගය ආරම්භ වීම සඳහා පාලම සකස් කළේ මෙම ඉස්ලාම් දර්ශන යුගය බවයි. නූතන දර්ශනය සහ විද්‍යාව ගොඩනැගීම කෙරෙහි ඉස්ලාම් දර්ශනයේ ,විද්‍යාවේ බලපෑම විශාල වශයෙන් ලැබී ඇත. ඉස්ලාම් යුගයේ සිට යුරෝපීය පුනරුද යුගය දක්වා තාක්ෂණය හුවමාරු වීම ලෝක ඉතිහාසයේ සිදු ප්‍රධානතම සංධිස්ථානයක් ලෙස ගෙගරි පාක් වැනි විද්වතුන් විද්වත්හු පවසති.

ඉස්ලාම් දර්ශනය ප්‍රධාන ගුරුකුල කිහිපයකින් සමන්විත වෙයි. එනම්; සූෆිවාදය, සුන්නිවාදය, පෙරදිග පෙරිපටේරිකවාදය, ශුද්ධ සහෝදරත්වයේ ධර්මය, මුස්ලිම් සාධාර්මික දර්ශනය යන ඒවායි.

**සූෆිවාදය**

මෙම දාර්ශනික ගුරුකුලය සඳහා පෙරදිග ඉන්දියානු දර්ශනයේ ආභාෂය ලැබී තිබේ. මෙය පැවතෙන්නේ එකොළොස්වන ශතවර්ෂයේ මුනිවරුන්ගේ ව්‍යාපාරයක් වශයෙනි. මහම්මත්තුමාගේ මරණයෙන් පසුව ඇතිවූ මෙම සම්ප්‍රදාය ශාන්තුවරුන්ගේ සම්ප්‍රදාය නමින් ද හඳුන්වනු ලබයි. දෙවියන් වහන්සේගේ ආදරය හා පෞද්ගලිකත්වය සාමූහිකත්ව යන ගුණාංග මත පදනම් වූ මොවුන්ගේ මාර්ගය වූයේ භක්තිය හා වන්දනයයි. පෘථිවියේ ඇති ඇතිවූ මුල්ම මිනිසා ආදම් විසින් ආරම්භ කළ පැරණි ආගමික ව්‍යාපාරය සූෆිවාදය බව මොවුන්ගේ අදහසයි. සෑම සූෆිවරයෙකුගේම අරමුණ දෙවියන් සමඟ එක්වීමයි. එයට අනුගමනය කළ පියවර තුනක් දක්වා තිබේ. මෙම පියවරයන් විශ්වාස තුළින් ඇරඹිය යුතු අතර ප්‍රේමය හා කැමත්ත තුළින් ඒ සඳහා පෙළඹීමක් ඇති කරයි. යහපත් ක්‍රියාකාරකම්වල නියැලීම. , දිව්‍යමය හා අධ්‍යාත්මික ඥානය ලබා ගැනිම තුළින් ගැලවීමේ නිපුණතාවය ලබා ගැනිම. අවසන් ජයග්‍රහණය කරා ලගා විම. යන කාරණා සම්පූර්ණ කල පසු ඕනෑම පුද්ගලයෙකුට මුනිවරයෙක් වි දෙවියන් හා එක්විය හැකි බවට මොවුන් පිළිගනි.

**සුන්නිවාදය**

සුන්නිවාදය වනාහි සූෆිවාදය තුළම පවත්නා වූ ඉස්ලාමීය ගුරුකුලයකි.මහම්මත්තුමාගේ මරණයෙන් පසුව ඉස්ලාමය ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන අතර, ඔවුන් ෂියා මුස්ලිම් හා සුන්නි මුස්ලිම් නම් වේ. මේ සුන්නි යන්නෙහි අර්ථය ප්‍රකට මාර්ගය යන්නයි. කුරාණයේ හා නබිතුමාගේ ජීවන දර්ශනය මත පදනම් වූ සුන්නිහි නම් ග්‍රන්ථය මත පදනම් වී මොවුන්ගේ වත්පිළිවෙත් සකස් කරගෙන ඇත. මොවුන් ග්‍රන්ථාරූඪ දේ පමණක් පිළිගනු ලබයි. මේ අයට අනුව මිනිසුන් තම යුතුකම් සහ වගකීම් නිවැරදිව ඉටු කර ගැනීමට වගබලා ගත යුතුය.

**පෙරදිග පෙරිපටේටික වාදය**

මෙහි මුල් මූලාරම්භකයා වශයෙන් සලකනු ලබන්නේ අල් කින්දිය. මොහු දර්ශනය පිළිබඳ පමණක් නොව ගණිතය, නක්ෂත්‍ර විද්‍යාව, භූගෝල විද්‍යාව, භෞතික විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, සංගීතය, දේශපාලනය ආදී විවිධ විෂයන් පිළිබඳ දැනුමක් ඇත්තෙක් විය. මොහු ඇරිස්ටෝටල්ගේ මත හා ප්ලේටෝගේ මතවාදයන් අතර සමානාත්මතාව ඇති කිරීමට උත්සාහ දරා ඇත. මේ නිසා අල් කින්දිගේ දර්ශනය ඇරිස්ටෝටල්ගේ දාර්ශනික මතවාදයන්ටත් ප්ලේටෝගේ දාර්ශනික මතවාදයන්ටත් නැඹුරුතාවයක් දක්වයි. මෙම ගුරුකුලයට අයත් වෙනත් දාර්ශනිකයන් ලෙස ඇවරෝස්, අවිසෙනා, ඉබන් සිනා ආදින් පෙන්වාදිය හැකිය. මොවුන් සමස්තයක් ලෙසින් විමර්ශණය යන්න ප්‍රමුඛ හා කේන්ද්‍රීය ලෙස පිළිගනු ලැබූ අතර ශ්‍රැතිය යන්න සලකනු ලැබුවේ ද්විතිකයටය. තවද ආගමික සත්‍යයන් හා දාර්ශනික සත්‍යයන් අතර ප්‍රතිවිරුද්ධතාවයක් නොමැති බව පිළිගනු ලැබේ.

**ශුද්ධ සහෝදරත්වයේ ධර්මය**

මෙය ඉදිරිපත් කරනු ලැබුවේ රහසිගත ආගමික දාර්ශනික නිකායට අයත් පිරිසක් විසිනි. මොවුන්ගේ අදහස් හා ඇරිස්ටෝටල් පයිතගරස් ප්ලේටෝ වැනි අය බලපා තිබේ. එනම් මොවුන්ගේ තර්කය හා ස්වභාවික විද්‍යාව පිළිබඳ දැනුම ලබා ගන්නේ ඇරිස්ටෝටල්ගෙන් වන අතර වෛද්‍ය විද්‍යාව හා මනෝවිද්‍යාව පිළිබඳ දැනුම ලබාගෙන තිබෙන්නේ ගැලගෙන්ය.මොවුන්ගේ කාර්ය වුයේ වෙනත් ආගමික හා දර්ශනවාදයන් තුළ යම් සාවද්‍ය තත්වයක් ඇතිදැයි විටක බලා එම තත්ත්වයන් ඉවත් කිරීමය. යමෙකුගේ පරිපූර්ණ පරිපූර්ණත්වයට ග්‍රීක දර්ශනයත් ශුද්ධ වූ කුරාණයත් මත පදනම් වූ ආගමික වූත්, දෛනික වූත්, නීති පද්ධතියක් සැකසිය යුතු බව මොවුන් පෙන්වා දී තිබේ.

**මුස්ලිම් සාධාර්මික දර්ශනය**

මෙම ගුරුකුල ට අයත් වන්නේ අල් අෂාරි, අල් සසාලි යන දාර්ශනික ඉගැන්වීමය. මින් අල් අෂාරි ප්‍රකට වන්නේ බුද්ධිවාදී තර්ක මත පදනම් වෙමින් ආගමික මතවාද හුවා දැක්වුවෙකු වශයෙනි. මොහුට අනුව ලොව මෙතෙක් බිහිවූ දේ හා සිදුවෙමින් පවතින්නා වූ සියලු දේවලට හේතුව දෙවියන්ය. එම දෙවියන් වනාහී අල්ලා දෙවියන්ය. තවද කිසිඳු වස්තුවකට ඊටම අනන්‍ය වූ ස්ථාවර ගුණාංග නැත. ඒ සියල්ල නිර්මාණය කරන ලද්දේ දෙවියන් වහන්සේ විසිනි. අල් සසාලි ශ්‍රේෂ්ඨතම ඉස්ලාමීය දේවධර්ම ශාස්ත්‍රඥයා ලෙස හඳුන්වනු ලැබේ. මොහුගේ ප්‍රධානම කෘතිය වන්නේ "සමයානුබද්ධ විද්‍යාවන්ගේ පුනරුත්තානය" යන්නයි. මෙය දෙවැනි වන්නේ කුරාණයට පමණි. සම්පූර්ණ ඉස්ලාම් දේව ධර්මයත් පූජා ඇදහිලි ක්‍රමයන් මේ ග්‍රන්ථය තුළ අන්තර්ගත වන අතර ස්වර්ගය සඳහා ඉස්ලාමයේ දැක්වෙන්නා වූ සෑම කරුණක් ම අනුගමනය කළ යුතු බව දක්වා තිබේ.

## ප්‍රධාන පෙළේ ඉස්ලාමීය චින්තකයින්

### අවිසෙනා (Avicenna)

ඉස්ලාම් දර්ශනයය තුළ හමුවන ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා ලෙස අවිසෙනා හඳුන්වා දිය හැකි වේ. මධ්‍යම ආසියාවේ බොකාර (Bokhara) නම් ප්‍රදේශයේ දී උපත ලද අවිසෙනා (ක්‍රි. ව. 980 - 1037) පර්සියන් ජාතිකයෙකි. එමෙන්ම මොහු සමස්ත ලෝකය පුරා සිය දර්ශනය හරහා ඉස්ලාමීය චින්තනය ප්‍රචාරය කළ අයෙකි. දර්ශනය, භෞතික විද්‍යාව, දේව ධර්ම ශාස්ත්‍රය, ගණිතය, වෛද්‍ය විද්‍යාව, විද්‍යාත්මක දැනුම, තර්ක ශාස්ත්‍රය ආදී වූ අංශ ගණනාවක් ලා මොහු සිය අදහස් ව්‍යාප්ත කර තිබේ. අවිසෙනා ලිපි රාශියක් රචනා

කර ඇති අතර ඒවා විවිධ මාතෘකා යටතේ අරාබි භාෂාවෙන් රචනා වී ඇත. ඔහුගේ දාර්ශනික අදහස් ඇතුලත් කෘතින් අතර Sufficientiae වශයෙන් ක්‍රිස්තියානි ලෝකයේ ප්‍රචලිත වූ අල් ෂිෆියා (AL Shifa) කෘතිය විශේෂ වැදගත්කමක් උසුලයි.

**"ඔහුගේ සංකල්පනාවන් අතර ප්‍රධාන තැනක් ගන්නේ "යථාර්ථය සහ තර්කනය" යන අංශයන් ය. විශේෂයෙන් මොහු දැනුම සම්බන්ධයෙන් වැදගත් අංශ හතරක් ඉදිරිපත් කරයි. ඒ මෙසේය;**

**(i) සංවේදනය තුළින් ගන්නා සංඥානනය** **(ii) සංජානන මතකය තබා ගැනීම**

**(iii) පරිකල්පනය** **(iv) තක්සේරු කිරීම**

**මෙම විග්‍රහයෙහි දැක්වෙන ආකාරයට පරිකල්පනයට විශේෂ වැදගත්කමක් හිමිවී ඇති අතර සෙසු අංශ සම්බන්ධයෙන් සිදුවන සැසඳීම එමගින් සිදුවීම ඊට හේතුවයි. මේ චින්තකයාට අනුව දැනුමේ අවසන් ඉලක්කය දෙවියන්වහන්සේ ය."**[10] අවිසෙනා පෙන්වා දෙන පරිදි සෑම දෙයක් ම ආරම්භ වන්නේ ත්, අවසන් වන්නේ ත් දෙවියන්වහන්සේගෙන් වන නමුත් දෙවියන් අපට ප්‍රත්‍යක්ෂ නොවේ. එම නිසා දෙවියන් වූ කලී අධිභෞතික සංකල්පයක් වන්නේ ය. ස්වභාව ධර්මයේ ඇති පිළිවෙළ පිළිබඳව විද්‍යාත්මකව අර්ථ දැක්විය හැකි වුවත්, දෙවියන් වහන්සේ වෙතින් එබඳු පිළිවලක් අර්ථවත් කළ නොහැකි බව අවිසෙනාගේ මතය වී ඇත. මොහු දැනීමේ ආරම්භක අවස්ථාව ලෙස හඳුනාගන්නේ සංවේදනය තුළින් ලබාගන්නා සංජානනයන්ය. ඊට අනුව අප දැනුම මූලිකවම ලබා ගන්නේ සංවේදනය හෙවත් ඉන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය මගිනි. මෙලෙස ලබාගන්නා දැනුම දෙවනුව අපගේ මනස විසින් ධාරණය කරගනු ලබයි. පරිකල්පනය නමැති අවස්ථාව තුළ දී යම්කිසි බුද්ධිමය ක්‍රියාවලියක් සිදුවේ. එනම් ඒ තුළ සිදුවන්නේ අප ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ලබන දැනුම අවශ්‍ය ආකාරයට නිර්මාණය කර ගැනීමයි. එය බුද්ධිමය ක්‍රියාවලියකි. අවසානයේදී තක්සේරු කිරීම සිදුකරනු ලබයි. මේ තක්සේරු කිරීම සාමාන්‍ය දැනීම සමඟ සම්බන්ධ වේ.

තවද ඔහු විසින් ආත්මය පිළිබඳව ද අදහස් ඉදිරිපත් කොට තිබේ. ඔහුගේ මෙම අදහස් මුල්කාලීන මනෝවිද්‍යාවේ වර්ධනයට බෙහෙවින් ඉවහල් වී ඇත. මනස සැබැවින් ම භෞතික ද්‍රව්‍යයක් නොවන බව ඔහුගේ අදහසයි. දැනුම මෙන්ම අධිභෞතිකවාදී සියල්ලම මිනිසා සමඟ සම්බන්ධ වන්නේත් විවිධාකාරයෙන් අප ලබන දැනුම් සම්භාරය එකට එක්කර ක්‍රමාණුකූලව පවත්වාගෙන යනු ලබන්නේත් අප තුළ ඇති ආත්මය මගින් බව ඔහු පෙන්වා දෙනු ලබයි. මීට අමතරව පින - පව හොඳ - නරක පිළිබඳ ඔහු අදහස් ඉදිරිපත් කරනු ලබයි. අවිසෙනාගේ වැදගත් කෘතියක් වූ අල් ෂිෆා කෘතිය තුළින් අධිභෞතික වාදය හා මරණයෙන් පසු පැවැත්ම පිළිබඳව වැදගත් කරුණු රාශියක් ද ඉදිරිපත් කරනු ලබයි. ඒ සඳහා ඔහු තර්කමය හා ගණිතමය ඥානය උපයෝගී කොටගෙන ඇති බවත් ඒ නිසා ම එම කෘතිය ඉස්ලාම් දහමේ පිළිගන්නා වූ ආගමික සත්‍යයන්ට එරෙහි වන්නේ යැයි පල්ලියේ අනුගාමිකයන් විසින් ඔහුට චෝදනා කළ බවත් බවත් සඳහන් වේ. එම හේතු සාධක මත ඔහු ව සිරභාරයට ද පත් ව තිබේ. කෙසේ හෝ රහසේම සිරගෙදරින් පලා ගොස් ඔහු තම හිතවතෙකු සමීපයේ හිඳිමින් ඇරිස්ටෝටල්ගේ දර්ශනයට හා තර්ක ශාස්ත්‍රය සම්බන්ධ පොත් ගණනාවක් රචනා කර බව සඳහන් වේ.

[10] චාමලි රුවන්දිකා විදානගම, **දාර්ශනික ලිපි** (නාරම්මල: චාමලි රුවන්දිකා විදානගම, 2009), 21.

**ඇවරෝස් (Averroes)**

දොළොස්වන සියවසේදී ස්පාඤ්ඤ බිහිවූ ප්‍රබල චින්තකයෙක් ලෙස මොහු හඳුන්වා දිය හැකි වේ. එමෙන්ම මොහුගේ මතවාදයන් හැසිරවීමේදී ඇරිස්ටෝටල්ගේ දාර්ශනික සංකල්පනාවන් කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්වා තිබේ. ඇරිස්ටෝටලියානු හා ඉස්ලාමීය චින්තනය එකට සම්බන්ධ කිරීමට උත්සාහ දරන ලද මොහු ඒ ඔස්සේ ඉතා ප්‍රබල තර්කයක් ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන්ම එම තර්කය යුදෙව්වන්ට හෝ ක්‍රිස්තියානීන්ට බිඳ හෙළිම පවා අපහසු විය. ඇවරෝස් ඇන්ඩලූසියානු සම්භවයක් ඇති දාර්ශනිකයෙකු වූ අතර ඔහු ඉස්ලාමීය දර්ශනය හා නීතිය පිළිබඳ ඉතා වැදගත් ගුරුවරයෙකු ලෙස සැලකූ අතර වෛද්‍ය විද්‍යාව හා තාරකා විද්‍යාව පිළිබද විශාල දැනුමක් ඔහු සතු විය. ඔහුගේ චින්තනය බටහිර සමාජවලට මෙන්ම ඉස්ලාමීය දර්ශනයට ද බලපෑවේය. ආගම හා විද්‍යාව අතර සම්බන්ධතාවය ප්‍රශ්න කළ දාර්ශනිකයෙකු හා දේවධර්මාචාර්යවරයකු ලෙස පිළිගැනේ, ඇඳහිල්ල සහ හේතුව ඔහුගේ දර්ශනය සමග වලංගු කිරීමට උත්සාහ කළේය.

**"ඇවරෝස් දක්වන පරිදි ලෝකය පිළිගත හැකි ප්‍රධාන සත්‍යයන් දෙකක් පවතී. එනම්;**

**(i) ආගමික ස්වරූපයෙන් ඇති සත්‍ය (ii) දාර්ශනික සත්‍ය වශයෙනි."[11]**

ආගම වනාහි දැනුම් ලබා ගැනීමේ ක්‍රමයක් වුවද එයද දර්ශනයට වඩා බෙහෙවින් පහත් ස්ථානයක පවතිනු ලබයි. දෙවියන් සියල්ල දන්නවා යැයි යන්න ඇවරෝස් විසින් ප්‍රතික්ෂේප කරයි.දාර්ශනිකයාට ලෝකය පිළිබඳ පුළුල් අවබෝධයක් පවතින අතර සාමාන්‍ය මිනිසාට එවන් අවබෝධයක් ලෝකය පිළිබඳ නොපවතී. එමනිසා දාර්ශනිකයා යනු ලෝකයේ සිටින්නා වූ වැදගත් පුද්ගලයකු බව ඇවරෝස් විසින් පෙන්වා දෙනු ලබයි. ඇවරෝස් විසින් ඉදිරිපත් කළ තවත් ප්‍රධාන අදහසක් වන්නේ දැඩි ආගමික නීති රීති වලට දාර්ශනිකයාට එකඟ විය නොහැකි නමුත් දර්ශනය ගැඹුරින් හැදෑරීමේදී දර්ශනය හා ආගම අතර සම්බන්ධය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය යන්නයි. ආගමික සත්‍යයන් හා දාර්ශනික සත්‍යයන් පිළිබඳ වූ ඇවරෝස්ගේ ඉගැන්වීම ද්විත්ව සත්‍ය නියාය තුළින් නිරූපණය වේ. ද්විත්ව සත්‍ය න්‍යායට අනුව ආගමික සත්‍යන් හා දරාර්ශනික සත්‍යය අතර වෙනසක් නොමැත. ඇවරෝස් විසින් මනස පිළිබඳව දාර්ශනික මතවාදයන් ගොඩනැගීමට උත්සාහ දරා තිබේ. එමෙන්ම ඉස්ලාම් දර්ශනයේ හා ඉස්ලාම් ආගමික මතවාදයන් හි පවතින විවිධ දුර්වලතා, ගැටලු සහගත තැන් පිළිබඳව මොහු විසින් සාකච්ඡා කොට තිබේ.

මොහු දේශපාලනය හා සදාචාරය සම්බන්ධයෙන් ද ප්‍රබල මත මතවාදයක් ඉදිරිපත්පත් කළ අයකු ලෙස හඳුන්වා දිය හැකි වේ. දේව කැමැත්ත අනුව හොඳ - නරක හරි - වැරදි තීරණය කළ නොහැකි බව බවත් සදාචාරාත්මක කරුණු හා දෙවියන්ගේ අදහස වූ කලි දෙකක් මිස එකක් නොවන බව මොහුගේ අදහස විය. මෙලෙස ආගමේ භාවිතා කරන ආකාරයට වඩා තරමක් වෙනස් ආකාරයෙන් සමාජ සම්මත කරුණු පැහැදිලි කිරීමට උත්සාහ ගත් මොහු සමාජ සම්මතයක් වුව ද පිළිගත යුත්තේ අපේ පැවැත්මට තර්ජනයක් නොවන්නේ නම් පමණක් බවත් පෙන්වාදී තිබේ. මේ ආකාරයට මධ්‍යතන යුගය තුළ මොහුගේ සංකල්පනාවන් ද ඉතා වැදගත් ස්ථානයක් ගෙන තිබෙන බව මනාව පැහැදිලි වේ.

**අල් කින්දි**

---

[11] චාමලි රුවන්දිකා විදානගම, **දාර්ශනික ලිපි** (නාරම්මල: චාමලි රුවන්දිකා විදානගම, 2009), 23.

ඉස්ලාම් දර්ශනයය ආරම්භකයා අල් කින්දි ය. මොහු අරාබි ගවේෂණයන් තුළින් සොයා ගත් ග්‍රීක දර්ශනය මත පදනම් වෙමින් ඉස්ලාම් දර්ශනය නිර්මාණය කිරීමට උත්සහ ගෙන තිබේ. මොහු ග්‍රන්ථ 241 පමණ රචනා කර තිබේ. මොහු වෛද්‍ය විද්‍යාව, දර්ශනය, තර්ක ශාස්ත්‍රය, භෞතික විද්‍යාව, තාරකා ශාස්ත්‍රය වැනි ක්ෂේත්‍රයන්හි තම දැනුම ව්‍යාප්ත කොට ඇත. එමෙන්ම අංක ගණිතය, මනෝ විද්‍යාව, කලාව සහ සාහිත්‍ය ආදී වූ විෂයන්ට රසක මොහු ප්‍රවීණයෙකි. අල් කින්දිගේ ශාස්ත්‍රිය කෘති අතර On Frist Philosopy හෙවත් පළමු දර්ශනය නමැති කෘතිය ඉතා වැදගත් කෘතියක් වේ. On Frist Philosopy නමැති කෘතිය තුළ මොහු ඉදිරිපත් කරන ලද දර්ශනය පාරභෞතිකවාදය ට වඩාත් නැඹුරු වූවක් ලෙස හඳුන්වාදිය හැකි වේ. මොහු ඉහළ භාෂා දැනුමකින් යුක්ත අයෙක් විය. ඒ අනුව ඔහු අනාගතයේ දර්ශනය හදාරන අයට නිවැරදි පදනමක් සකස් කර දීමේ අර්ථයෙන් සරලව අවබෝධ කරගත් හැකි වාක් මාලාවක් මොහු විසින් සකස් කර තිබේ.

අල් කින්දි විසින් සිය දර්ශනය තුළ ප්‍රධාන වශයෙන් සාකච්ඡා කරන ලද තේමාවන් අතර; දෙවියන්ගේ ඒකීයත්වය හා ධර්මිෂ්ඨභාවය , ජගදාත්මය හා මනුෂ්‍ය ආත්මය , අමරණීයත්වය හා විමුක්තිය යනාදිය කැපී පෙනේ. කින්දිට ට අනුව දර්ශනය යනු සත්‍යයේ විෂයයකි. ලොව බිහිවන සෑම දර්ශනයක්ම සත්‍ය ගවේෂණය කරන්නක් වන බව මොහු විසින් පෙන්වා දෙනු ලබයි. කින්දිට අනුව පළමු දර්ශනය වන්නේ දෙවියන් පිළිබඳ ඇති දර්ශනයයි. ඒ අනුව පළමු සත්‍ය දෙවියන් වන අතර සෑම සත්‍යයට ම සෑම පැවැත්මකට හේතුව එය බව ඔහු පෙන්වා දෙයි.

**"කින්දිගේ දාර්ශනික දේවධර්මයෙන් අවධාරණය කරන ප්‍රධාන කරුණු දෙකකි.**

- **සියලු දේවල්වල ඒකීයත්වය හේතුවන සත්‍ය වූ එක් දෙයක් පැවතිය යුතුය.**
- **එම සත්‍ය වූ පදාර්ථයේ ස්වභාවය.**

**යන්නයි."**[12]

මීට අමතරව අල් කින්දි ආචාර් ධර්ම ගැන ද ඔහුගේ ගේ දර්ශනය තුළ සාකච්ඡා කර තිබේ. මොහුගේ ආචාර ධර්ම හා ප්‍රායෝගික දර්ශනය පිළිබඳ අදහස් අන්තර්ගත වන්නේ "ශෝකයෙන් වැලකීමේ කලාව" කෘතිය තුළ ය. මොහුගේ ආචාර වාදී අදහස් කෙරෙහි ප්‍රබල ලෙස ස්ටොයික්වාදය බලපා තිබේ. කින්දි ට අනුව ආචාර වාදය යනු මානසික ඒකාග්‍රතාවය දරා සිටින මෙවලමකි. ඔහු සිය දර්ශනය තුළ සිය දිවි හානි කරගැනීමට යම් සදාචාරාත්මක අවකාශයක් ලබා දී ඇත. නමුත් ඒ අවකාශ ලබා දී ඇත්තේ ජීවත් වීමට වැඩි කාලයක් ඉතිරිව නැති වස්තූන් හා සමෘද්ධිය අතින් අතිශය දුර්මුක වූවන්ට පමණි. මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ අවධානයක් අල් කින්දි විසින් යොමු කරනු ලබයි. මනෝවිද්‍යාව තුළ පර්යේෂණ ක්‍රමවේදයන් යොදාගැනීම අවධාරණය කළ අතර රෝග නිවාරණය සඳහා සංගීතමය චිකිත්සනයන් ලබාදීම වැදගත්කම මොහු විසින් අවධාරණය කරනු ලබයි.

[12] https://si.kuzminykh.org/1907-thomas-aquinas.html (accessed 27.06.2023)

## අල් ගසාලි (AL Ghazali)

ඉස්ලාම් දර්ශනයේ බිහි වූ ප්‍රබල දාර්ශනිකයෙකු අල් ගසාලි (ක්‍රි. ව. 1058 - 1111) හඳුන්වා දිය හැකි වේ. එමෙන්ම මොහු අතිවිශිෂ්ඨ කෘතහස්ත ඉස්ලාම් බැතිමතෙක් ද වනු ලබයි. අල් ගසාලි වනාහි කුරාණය දැඩි ලෙස විශ්වාස කළ පුද්ගලයෙකු ලෙස හඳුන්වා දිය හැකි වේ. කුරාණයේ සඳහන් පරිදි දෙවියන් විසින් ලෝකය මවන ලද අතර දෙවියන් විසින්ම ලෝකය විනාශ කරන ලද බව ඔහු පිළිගනි.

**“දාර්ශනික අදහස් ප්‍රතික්ෂේප කරමින් මොහු පෙන්වා දෙන්නේ ලොව සදාකාලික බව සනාථ කිරීමට මිනිස් චින්තනයට ප්‍රමාණවත් දැනුමක් නොමැති බවයි. විශ්වය තුළ ක්‍රියාත්මක වන්නේ යැයි පිළිගෙන තිබූ ඇරිස්ටෝටලීය අවශ්‍යක හේතුඵල සබඳතාවය ද මොහු බැහැර කරයි. විශේෂයෙන් ඇවරෝස් විසින් අල් ගසාලිගේ දේව ධර්ම සංකල්පය දැඩි ලෙස විවේචනය කරන දැකිය හැකිය. කුරාණයේ සඳහන් අදහස් හා දෙවියන්ගේ මැවීම පිළිබඳ අදහස් සම්බන්ධයෙන් ප්‍රශ්න කරන ආකාරයක් මෙහිදී හඳුනාගත හැකිය.”**[13]

මේ අනුව පැහැදිලි වන්නේ අවිසෙනා, ඇවරෝස්, අල් කින්දි මෙන්ම අල් ගසාලි යන චින්තකයින් මධ්‍යතන යුගය මිනිස් චින්තනය පෝෂණය කිරීමෙහිලා කැපී පෙනෙන දායකත්වයක් දුන් දාර්ශනිකයන් වශයෙන් හඳුන්වා දිය හැකි වේ. ආගම හා දර්ශනය පිළිබඳ නවතම සංකල්පනා ඉදිරිපත් කරමින් සම්භාව්‍ය ග්‍රීක දර්ශනික යුගයේ පැවති විමර්ශනයන් නැවත වතාවක් යම් ආකාරයකට මිනිස් සමාජය වෙත සජීවීව සම්බන්ධ කරන්නට දැරූ උත්සාහය අමතක කළ යුතු නොවේ. මෙසේ ආධානග්‍රාහී මතයන්ගෙන් හෙබි මධ්‍යකාලීන චින්තනයේ අවසාන භාගය වන විට එම චින්තනයට විරුද්ධව නව මතවාදයන් බිහිවීමේ ව්‍යාපාරයක් ආරම්භ විය. එය පුනරුදය නම් වන අතර මෙම ක්‍රියාවලිය හේතු කොට ගෙන මධ්‍යතන යුගයේ දී අභාවයට ගිය නිදහස් චින්තනය හා ආනුභූතිවාදී අදහස් යළි හිස ඔසවන්නට විය.

## යුදෙව් දර්ශනය

බටහිර දර්ශනය තුළ මධ්‍යතන යුගයේ බිහි වූ ප්‍රධාන දර්ශනවාදයන් අතරින් එකක් ලෙස යුදෙව් දර්ශනය හඳුන්වා දිය හැකි වේ. යුදෙව් දර්ශනය වනාහි මධ්‍යතන යුගයේ බිහිවූ සුවිශේෂී දර්ශනවාදයක් ලෙස හඳුන්වාදිය හැකි වේ. ලෝකයේ බිහි වූ ප්‍රධාන ආගම් අතර ක්‍රිස්තියානි දර්ශනය හා යුදෙව් දර්ශනය බොහෝ සෙයින් සමාන දර්ශනවාදයන් ලෙස හඳුන්වාදිය හැකි වේ. යුදෙව් දර්ශනය සර්වබලධාරී සර්වඥ සදාකාලික අසීමිත එක් දෙවියෙකු පිළිබඳ විශ්වාස කරයි. ක්‍රිස්තියානි දර්ශනය මෙන්ම යුදෙව් දර්ශනයට මූලික වශයෙන් අනන්‍ය වූ ආචාර ධර්ම පද්ධතියක් පවතිනු ලබයි. යුදෙව් ආගම බොහෝ විට ජේසුස්ව හොඳ ගුරුවරයෙකු ලෙසත් සමහර අවස්ථාවලදී දෙවියන්වහන්සේව අනාගත ශාස්තෘවරයෙකු ලෙසත් පිළිගනිති. ජේසුස්වහන්සේව මෙසියස් බව යුදෙව් ආගම විශ්වාස නොකරයි.

ක්‍රිස්තියානි දර්ශනය හා යුදෙව් දර්ශනය අතර ඇති වැදගත්ම වෙනස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. යුදෙව් දර්ශනය තුළ සාකච්ඡාවට බඳුන් වූයේ ද දෙවියන් වහන්සේගේ ස්වරූපය, ලෝක නිර්මාණය මෙන්ම ආචාරධර්ම වැනි තේමාවන්ය. පැරණි බැබිලෝනියානු චින්තනයේ ලක්ෂණ විශාල ප්‍රමාණයක් යුදෙව් චින්තනය තුළ දක්නට ලැබෙයි. යුදෙව් සම්ප්‍රදායට අනුව සියලුම යුදෙව්වෝ මෝසෙස්ගේ ඉගැන්වීම් හැදෑරිය යුතු අතර ඒ පිළිබඳව තම අර්ථකථන ඉදිරිපත් කළ යුතුය. එසේම යුදෙව්වන් විසින් පිළිගන්නේ දෙවියන්

[13] චාමලි රුවන්දිකා විදානගම, **දාර්ශනික ලිපි** (නාරම්මලඃ චාමලි රුවන්දිකා විදානගම, 2009), 25.

වහන්සෙ වනාහී විශ්වයටම පොදු වූ සංකල්පයක් නොවන බවයි. එනම් යෙහෙව්වා දෙවියන් වහන්සේ වනාහි සමස්ත ජනතාව ගලවා ගන්නෙකු නොව යුදෙව්වන් පමණක් ගලවාගන්නා දෙවියකු යන්න ඔවුන්ගේ පිලිගැනීමයි.

යුදෙව් දර්ශනයට අනුව යෙහෝවා දෙවියන් යනු මුලදී ඊශ්‍රායල් ජාතිකයන්ට පමණක් අනුග්‍රහ කළ ගෝත්‍රික දෙවිකෙනෙක් විය. ඔවුන් වෙනත් දෙවියන් සිටි යන්න ප්‍රතික්ෂේප කරන ලදී. එසේම ඔවුන් වන්දනය සිරිතක් වශයෙන් කරන ලදී. මේ කාලයේ යුද්ධයෙන් ජය ගැනීමට යොහෝවා දෙවියන් යුදෙව්වන් විසින් දැඩි ලෙස අනුගමනය කරන ලදී. ආගම් සියල්ලම වැරදි යන අදහස මොවුන් විසින් දරන ලද්දේ ය. එසේම රූප වන්දනය කිරීම මිසර යුදෙව්වන් දැඩි ලෙස ප්‍රතික්ෂේප කර එකසේ හෙළා දකිනු ලැබුවේය.

**"එස්රාගෙන් හා නෙහෙමියාගෙන් පසු කලකට යුදෙව්වෝ ඉතිහාසයෙන් ඈත් වෙති. යුදෙව් රාජ්‍යය ස්වෛාධිරාජයක් වශයෙන් අවශිෂ්ට විය. එහෙත් එයට අයත් වූ ප්‍රදේශය ඉතා කුඩා විය. (ජෙරුසලම වටා සතැතපුම් දහයක පහළොවක ප්‍රදේශය පමණකැයි ඊ බෙවන් කියයි) ඇලෙක්සැන්ඩර්ගෙන් පසු ව එය ටොලමිවරුන් හා සිලියුසිඩ්වරුන් අතර ආරවුලට භාජන ව පැවැති ප්‍රදේශයක් විය. එහෙත් මේ නිසා නියම යුදෙව් භූමියෙහි සටන් ඇති නොවීය. එබැවින් යුදෙව්වන්ට දිගු කලක් තම ආගම නිදහස් ලෙස ඇදහීමට ඉඩ ලැබුණි."[14]**

යුදෙව්වන්ට දර්ශනයට අයත් සදාචාර ආප්තයන් එක්ලීසියැස්ටිකස් කෘතියේ ඇතුළත්ව ඇත. එම කෘතිය තුළින් යුදෙව්වන්ට උගන්වා තිබෙන සදාචාරය ඉතාම ලෞකික එකකි. යුදෙව් සදාචාර දර්ශනය තුළ කීර්තිය ඉතා උසස් කොට සලකන ලදී. එසේම ඔවුන්ට අනුව අවංකම උසස්තම ප්‍රතිපත්තියක් ලෙස දකිනු ලබයි. එසේම දන්දීම ඉතා උසස් කොට මොවුන් විසින් සලකන ලදී. අද වර්ථමානයේ විශාලතම යුදෙව් ආගමික ව්‍යාපාරය බවට පත්ව ඇත්තේ ඕතඩොක්ස් යුදෙව් ආගමය.

අමරණීයත්වය පිලිබඳ ඉගැන්වීම් යුදෙව්වන් අතර බහුලව ප්‍රචාරයට පත් විය. ඔවුන්ට අනුව සද්ගුණයේ ආනිශංස මෙලොවදීම ලැබේ. එහෙත් ඉතාමත් සද්ගුණ අය කෙරෙහි පතිත වුණ තාඩන පීඩන නිසා එය එසේ නොවන බව පෙනී ගියේය. මේ නිසා දිව්‍යමය යුක්තිය රැක ගැනීම් වස් මතු අනාගතයේ දී පුන්‍යානිශංස හා පාප විපාක ලැබේවියැයි විශ්වාස කළ යුතු විය. මෙලෙස යුදෙව් දර්ශනය තුළ ඉදිරිපත්ව ඇති මෙම සෑම ඉගැන්වීමක්ම යුදෙව්වන් විසින් එක්හෙළා පිළිගන්නේ නැත.

එසේම යුදෙව් දර්ශනය තුළ සාකච්ඡාවට බඳුන් වන ප්‍රධාන අංශයක් ලෙස මධ්‍යකාලීන යුදෙව් දාර්ශනිකයන් හඳුන්වා දිය හැකි වේ. මධ්‍යකාලීන යුදෙව් දාර්ශනිකයන් අතර ඇලෙක්සැන්ඩ්‍රියාවේ ෆිලෝ සා ආදියා, ගඔන්, ඉබන් ගැබිරෝල් අබ්බ්‍රහම්, ඉබන් දාවුත් යන අය ප්‍රධාන වේ. යුදෙව් දර්ශනවාදය තුළ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ක්ෂේත්‍රයන් ද්විත්වයක් ලෙස ලෝකයේ නිර්මාණය වීම සහ ආචාරධර්ම හෙවත් සදාචාර තේමාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ප්‍රධාන වශයෙන් දැක ගැනීමට හැකි වේ. එහෙත් මධ්‍යකාලීන යුදෙව් දර්ශනයේ පළමු දාර්ශනිකයා ලෙස සැලකෙන්නේ යුදෙව් දාර්ශනික ෆිලෝ ය. මධ්‍යකාලීන යුදෙව් දර්ශනය අඛණ්ඩව ඉදිරියට ගලා ගියේ නැත. මීළඟ යුදෙව් දාර්ශනිකයා වන සා ආදියා ගඔොන් ෆිලෝගෙන් වසර 900 කට පසුව බිහිවූ දාර්ශනිකයෙකු ලෙස හඳුන්වාදිය හැකි වේ. එහෙත් යුදෙව්

[14] බට්රන්ඩ් රසල්, **බටහිර දර්ශන ඉතිහාසය** (හෝමාගම: සී/ ස කරුණාරත්න සහ පුත්‍රයෝ, 2015), 344.

දර්ශන ඉතිහාසයේ සිටි වැදගත්ම දාර්ශනිකයා ලෙස සැලකෙන්නේ මයිමොනිඩ්ස් ය. යුදෙව් දර්ශනය වනාහි අඛණ්ඩව ඉදිරියට සංවර්ධනය වූ දර්ශනවාදයක් නොවේ. එය විවිධ බාධකයන් මැද ගොඩනැගුණු දර්ශනවාදයක් වේ. මධ්‍යකාලීන යුදෙව් දර්ශනයේ පළමු දාර්ශනිකයා ලෙස සැලකෙන්නේ ෆීලෝ නැමති දාර්ශනිකයා ය. ෆීලෝගෙන් පසුව අඛණ්ඩව දර්ශනය ඉදිරියට ගලා ගොස් නැත. මීළඟ යුදෙව් දාර්ශනිකයා වන සා ආදියා ගවොන් ෆීලෝගෙන් වසර 900කට පසුව හමුවන යුදෙව් දාර්ශනිකයෙකි. යුදෙව් දර්ශන ඉතිහාසයේ වැදගත්ම දාර්ශනිකයා ලෙස සැලකෙන්නේ මෛමොනිඩ්ස් ය. ඇලෙක්සැන්ඩ්‍රියාවේ යුඩායස් ෆීලෝ ද, සා ආදියා ගඕන් කැපී පෙනෙන යුදෙව් දාර්ශනිකයින් වේ.

මේ අනුව බලන කළ මෙම ලිපිය මගින් සමස්ත මධ්‍යතන දර්ශනය තුළ කතෝලික දර්ශනය, ඉස්ලාම් දර්ශනය හා යුදෙව් දර්ශනය පිළිබඳව පැහැදිලි එමෙන්ම නිරවුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ. එමෙන්ම ආගම හා දර්ශනය පිළිබඳ නවතම සංකල්පනා ඉදිරිපත් කරමින් සම්භාව්‍ය ග්‍රීක දර්ශනික යුගයේ පැවති විමර්ශනයන් නැවත වතාවක් යම් ආකාරයකට මිනිස් සමාජය වෙත සජීවීව සම්බන්ධ කරන්නට දැරූ උත්සාහය අමතක කළ යුතු නොවේ. මෙසේ ආධානග්‍රාහී මතයන්ගෙන් හෙබි මධ්‍යකාලීන චින්තනයේ අවසාන භාගය වන විට එම චින්තනයට විරුද්ධව නව මතවාදයන් බිහිවීමේ ව්‍යාපාරයක් ආරම්භ විය. එය පුනරුදය නම් වන අතර මෙම ක්‍රියාවලිය හේතු කොට ගෙන මධ්‍යතන යුගයේ දී අභාවයට ගිය නිදහස් චින්තනය හා ආනුභූතිවාදී අදහස් යළි හිස ඔසවන්නට විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. කලන්සූරිය, ඒ. ඩී. පී. **නූතන බටහිර දර්ශනය,** බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007.
2. ධර්මසිරි, ගුණපාල. **දාර්ශනික ප්‍රශ්න,** බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007.
3. මෙන්දිස්, බී. සංජීව මහේෂ්. **මධ්‍යකාලීන බටහිර දර්ශනය,** මහරගම: තරංජී ප්‍රින්ටර්ස්, 2017.
4. රසල්, බට්රන්ඩ්. **බටහිර දර්ශන ඉතිහාසය,** බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2015.
5. රාවෝ, බී. වී. **ලෝක ඉතිහාසය,** (පරි) මාලනී ඇඳගම. බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2003.
6. විදානගම, චාමලි රුවන්දිකා. **දාර්ශනික ලිපි,** නාරම්මල: චාමලි රුවන්දිකා විදානගම, 2009.
7. වීරවර්ධන, සුමේධ. (සංස්) **දැක්ම මංගල කලාපය,** පේරාදෙණිය: සංස්කාරකගේ ප්‍රකාශනයකි, 2007.
8. වීරවර්ධන, සුමේධ. (සංස්) **දැක්ම තෙවන කලාපය,** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2011.
9. වීරසූරිය, පූර්ණිමා. **සොෆි දාර්ශනික ලිපි එකතුව,** පේරාදෙණිය: කතෘ ප්‍රකාශනයකි, 2017.
10. https://si.warbletoncouncil.org/aportaciones-de-san-agustin-12153 (accessed 29.06.2023)
11. https://si.kuzminykh.org/1907-thomas-aquinas.html (accessed 27.06.2023)

# නිවන පිළිබඳ ථෙරවාද විවරණය සහ බෞද්ධ විමුක්ති සංකල්පයෙහි සුවිශේෂිතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# An Investigative Study of the Theravada Commentary on Nirvana and the Peculiarites of the Buddhist Concept of Liberation

***S.U. Dissanayaka***

*Temporary Lecturer, Department of Pali & Buddhist, University of Kelaniya*

## හැඳින්වීම

නිවන හෙවත් නිර්වාණය යනු බුදුදහමේ පරම නිෂ්ඨාවයි. පූර්ණ වශයෙන් දුකින් මිදීම නිවන ලෙස අදහස් කරයි. සාංසාරික පැවැත්මක ඇති කරන ක්ලේෂයන් අතරින් තෘෂ්ණාව මූලික වෙයි. ඒ නිසා ම තෘෂ්ණාව දුරු කිරීම, නැති කිරීම යන අර්ථයෙන් නි+වාණ - නිර්වාණය යැයි කියනු ලැබේ. (ගමගේ, චමින්ද පී,2017,පිː31) නිවන, නිර්වාණ සහ නිබ්බාන යන වචන සියල්ලෙන් ම කියවෙන්නේ, එකම අර්ථයකි. පාලියෙන් නිබ්බාන වශයෙන් ද, සංස්කෘත භාෂාවෙන් නිර්වාණ (නානායක්කාර සනත්, 1998, පි.23-24) වශයෙන් ද, නිවන හඳුන්වයි. නිවන යන පදයෙන් නිවීම, නැවැත්වීම, නොපැවැත්ම ආදී අර්ථ කිහිපයක් ම අදහස් කෙරෙයි. විශේෂයෙන් ම, නිබ්බාන යන පාලි පදයෙහි දන්තජ "න" කාරයෙන් අවසන් වන හෙයින් එහි අරුත නිවීම යන්නයි. (සිල්වා ද, යූ.පී, 1991,පිː17)

නිර්වාණ යන්න ගත් විට තෘෂ්ණාවෙන් ඉවත් වූ යන අර්ථය දිය හැකි ය. පහනෙහි නිවීම ඉන්ද්‍රිය ගෝචර සංකල්පයකි. තෙල් හා තිරය යන දෙකම අවසන් වීමෙන් පහන නිවී යයි. ඒ අනුව ක්ලේෂයන් නැති කිරීමෙන් සංසාර පැවැත්ම නිවීයයි. නිර්වාණය නම් කුමක් ද? යන්න පිළිබඳ විවිධ මත පවතී. එය අනිර්වචනීය වචන මඟින් විස්තර කළ නොහැකි යන්න සමහරුන් පිළිගන්නා අතර, සමහරුන් කියා සිටින්නේ වචන මඟින් ප්‍රකාශ කළ හැක්කේ නිර්වාණයේ යථා ස්වභාවය නොව එහි ගුණයන් පමණක් බවත් ය.

බුදුරාජාණන් වහන්සේ ද, තම ප්‍රථම ධර්ම දේශනයේ දී නිවීම මෙසේ විස්තර කොට ඇත. "**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛ නිරෝධං අරිය සච්චං යො තස්සා යෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ** " මහණෙනි මේ දුක් නිරෝධ ආර්යය සත්‍යය නම් තෘෂ්ණාව මුලින් නැසීමක් වේ ද, අත්හැරීමක් වේ ද, මිදීමක් වේ ද, නොඇලීමක් වේ ද, ඒ නිරෝධ වෙයි. යනාදී වශයෙනි. (ධම්මචක්කපවත්න සූත්‍රය)

**නිවන විස්තර කිරීම සඳහා යොදාගත් පද අතර,**

**තණ්හක්ඛය - තණ්හාව ක්ෂය කිරීම**

**රාගක්ඛය - රාගය ක්ෂය කිරීම**

**දෝසක්ඛය - ද්වේශය ක්ෂය කිරීම** (ගමගේ, චමින්ද පී,2017,පිː31) යනාදිය දක්නට ලැබේ.

එහි අරුත වන්නේ, ආර්යය සත්‍ය විෂයේ දී මෙය නිරෝධ සත්‍ය ලෙසින් දැක්වීමයි. එනම්, දුකෙහි නැවැත්වීමයි. නිවන හැඳින්වීම සඳහා පාලි භාෂාවෙහි යෙදී ඇති පද මාලාව දීර්ඝ ය. ඒ සෑම පදයක ම දක්නට ලැබෙන පොදු ලක්ෂණය නම්, සංසාරික ස්වභාවය නිරූපණය කරන පදයක විරුද්ධාර්ථවත් පදයක් බවට පත් ව තිබීමයි.

- **සසර දුක නම් නිවන පරම සුඛයයි**
- **සසර සංඛත නම් නිවන අසංඛතයි**
- **සසර බන්ධනයක් නම් නිවන එහි විමුක්තියයි**
- **සසර මහභය, මහාකෝෂයක් වන අතර, නිවන බේම වූ දීපයකි.** යනුවෙනි.

(සිල්වා ද, යූ.ජී, 1991,පි:17)

මේ හැර නිවන හැඳින්වීම සඳහා අසංඛත ධර්මයක් ලෙස ද දක්වයි. අසංඛත යනු සංයෝගයක් නොමැතිවීම සහ ස්වභාවයක් නොමැතිවීම යන අරුත් දෙයි. එනම්, හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දෙයක් නොවෙයි.

මිලින්ද පඤ්ඤයේ දී දක්වන්නේ, උපමාවකන් හෝ සාධකවලින් හෝ න්‍යායවලින් හෝ වෙනත් තර්කානුකූල පදනමකින් නිවන විස්තර කළ නොහැකි බව දක්වා ඇත. මහා සමුද්‍රය ඇත. නමුදු එහි සිටිනා සතුන් ප්‍රමාණය ගණන් කළ නොහැකි ය. ඒ අනුව, නිවන ද අස්ථාර්ථයෙන් සැලකිය යුතු ධර්මතාවයකි. නිවන අස්ථාර්ථයෙන් පිළිගන්නා නමුදු එය පවතින ස්ථානයක් නොමැත. ගින්දරෙහි ස්වභාවය වැනි ය. ලී කැබලි දෙකක් එකට ඇතිල්ලීමෙන් ගින්න හටගිනියි. නමුත්, ගින්න පවතින ස්ථානයක් නොමැත. (ගමගේ, චමින්ද ජී,2017,පි:31) මෙසේ සසරෙහි දක්නට ලැබෙන යම් බඳු, අත්‍යප්තිකර, අහිතකර, අප්‍රිය, අසහනකාරී ස්වභාවයක් වේ නම් එහි කෙළවර නිවන වශයෙන් හඳුන්වා දී ඇත. සංයුක්ත නිකායේ අසංඛත සංයුක්තයේ එන නිර්වාණවාචි සියලු පද සියුම් විමසා බැලීමේ දී, නිෂේධාර්ථසූචක අව්‍යය පදයක් සහිතව හෝ රහිතව, සංසාරික ලක්ෂණවාචී නාමයක් හා සාපේක්ෂ ව ඒවා යෙදී ඇති ආකාරය පැහැදිලි ය.

නිවන යනු මරණයෙන් සත්ත්වයාගේ ඉපදීම අවසන් වීමකි. ඉන් ඔබ්බෙහි නැවත ඉපදීමක් නැත යනුවෙන් පැවසෙන උච්ඡේදවාදී සංකල්පයක් නොවේ. එය භාවාත්මක වූ අවිනාශ්වර පදාර්ථයක හෝ යම්කිසි ශක්තියක් විද්‍යාමාන කිරීමක් නොවේ. ඒ දෙපැත්තේ ම අන්තයෝ ය. එකී නාස්තික හා ආස්තික දෘෂ්ටිගතයන් වෙත නැඹුරු නොවී මධ්‍යම මාර්ගයකින් ලබන අවබෝධය බෞද්ධ නිර්වාණය හෙවත් විමුක්තියයි. (සිල්වා ද, යූ.ජී, 1991,පි:17)

නිවීම පිළිබඳ ලෞකික අර්ථයෙන් මෙන් ම ලෝකෝත්තර වශයෙන් ලබන අවබෝධය බෞද්ධ සාහිත්‍යයේ විද්‍යාමාන වේ. කිසාගෝතමීය සිදුහත් කුමරුන් දෙස බලා එම හැඩරුව අනුව ඔහුගේ මවත්, පියත් නිවුණු අය විය යුතුයැයි ප්‍රකාශ කොට ඇත. ශෝකයෙන් හඬමින් වැළපෙමින් සිටින අයෙක් බුද්ධිමතෙකුගේ අනුශාසනයක් අසා මෙහි කිරීමෙන්, තමා සිහිල් වූ බව (සීතීභූත), නිවුණ බව (නිබ්බුත) ඒ මොහොතෙහි ප්‍රකාශ කරයි. ලෞකික වශයෙන් නාම කයෙහි තාවකාලිකව ඇතිවන සැනසිලි සහගත බව මෙයින් නිරූපණය කරයි. බෞද්ධ නිර්වාණය වනාහි ලෝකෝත්තර වශයෙන් ලබන අවබෝධය මුල් කොටගත් නිවීමයි. නිතර බෞද්ධයා හදාරණ රතන සූත්‍රයෙන් එන සරල

නිදසුනක් උපුටා ගත හැකි ය. නුවණැත්තා පියවරෙන් පියවර මගඵල ලබමින් නිවන කරා ළඟා වන ආකාරය සංසරත්නය ආදර්ශ කොටගෙන එහි විවරණය කෙරෙයි.

## පර්යේෂණ ගැටලුව

පර්යේෂණ ගැටලුව වන්නේ නිවන පිළිබඳ ඇති ථෙරවාදී මතය සහ බෞද්ධ විමුක්ති සංකල්පයෙහි සුවිශේෂිතා මොනවාද? යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමයි.

## පර්යේෂණ අරමුණු

පර්යේෂණ අරමුණ වන්නේ නිවන පිළිබඳ ඇති විවිධ සාම්ප්‍රදායික, ථෙරවාද විවරණයන් පිළිබඳ අධ්‍යයනය කිරීමත් බෞද්ධ විමුක්ති සංකල්පයෙහි සුවිශේෂිතා අධ්‍යයනය කිරීමත් ය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ලෙස සංකල්පනාත්මක පර්යේෂණ (Conceptual Research) ක්‍රමය මත පදනම් වී සිදුකරන ලද මෙම අධ්‍යයනය සාහිත්‍ය මූලාශ්‍රය මත රඳා පවතී. එහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ත්‍රිපිටකය, මහවංශය, දීපවංශය යන මූලාශ්‍ර භාවිතා කළ අතර ද්විතීක මූලාශ්‍ර රැසක් භාවිතා කරන ලදි. සඟරා, කෝෂ ග්‍රන්ථ මෙන් ම අන්තර්ජාලය මඟින් ලබාගන්නා දත්ත ගවේෂණය හා විශ්ලේෂණය කිරීමෙන් අදාල ප්‍රස්තුතය පිළිබඳ අධ්‍යයනය කිරීම සිදුකළ අතර, මෑත කාලීන වාර්තාවල දත්ත ලබාගැනීමෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

## නිවන පිළිබඳ ථෙරවාද විවරණය

හීනයාන හෙවත් ථෙරවාද සම්ප්‍රදායට අනුව, සත්වයා තුන් ආකාරයක දුක්වලින් පීඩා විඳියි.

- **දුඃඛ දුඃඛතා** - භෞතික හා මානසික හේතු නිසා උපන් ක්ලේෂයන් වේ. (ප්‍රියයන්ගේ වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, කැමති දේ නොලැබීම) එදිනදා ජීවිතයේ ලබන කටුක අත්දැකීම් මේ නමින් හැඳින්වේ.
- **සංසාර දුඃඛතා** - උපත සහ විනාශ ස්වභාවය ඇති ලෝකයේ වස්තූන් නිසා උපන් ක්ලේෂයන් වේ. (නැවත නැවත ඉපිදෙමින් මැරෙමින් යන සසර)
- **විපරිණාම දුඃඛතා** - සැපය දුකට පෙරළීම නිසා උපන් ක්ලේශයන් වේ. (මොහොතක් පාසා, ක්ෂණයක් පාසා සිදුවන වෙනස්වීම වයසට යෑම, මෙනයින් අදහස් වේ)

චතුරාර්ය සත්‍ය අනුගමනය කිරීමෙන් ද, ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් ද, හීනයාන සම්ප්‍රදායට අනුව, මෙම ක්ලේෂයන්ගෙන් මිදී සදාකාලික ව ම විමුක්තිය ලබාගත හැක. මෙය නිර්වාණය වන අතර, නිර්වාණය ක්ලේෂභාව ස්වරූපයක් හා සුඛ ස්වරූපයක් ලෙස හීනයානය

දක්වා තිබේ. බොහෝ හීනයාන නිකායන් නිර්වාණයේ අභාවාත්මක බව පිළිගනියි. මිළින්ද ප්‍රශ්නයේ දී නාගසේන හිමියන් පැහැදිලි ව ම ප්‍රකාශ කොට ඇත්තේ නිරෝධයට පත්වීම නිර්වාණය බවයි. ථෙරවාද දෘෂ්ටියට අනුව, බුදුන් වහන්සේ විසින් යමක් පිළිබඳ ධර්ම දේශනා කරන ලද නම්, පරම ඉලක්කය නිර්වාණයයි. යම් විටක අවිද්‍යාව සම්පූර්ණයෙන් නැතිකර දමන ලද ද, එවිට රහතුන් ලබන තත්වය නිර්වාණයයි. නිර්වාණය මේ ලෝකයේ දී ම ලබාගත යුත්තකි. නිර්වාණය වනාහි මානසික හා භෞතික ජීවිතයේ පරම නිරෝධය වන අතර, එය ලැබීමෙන් පසු පුද්ගලත්වය (මමත්වය) සියලු අයුරින් ම නැති වී යයි. නිර්වාණය නම් නීවි යාම යනුවෙන් නිවන පිළිබඳ ථෙරවාදී මතය වේ. ඒ අනුව ථෙරවාදය තුළ එන නිර්වාණයෙහි,

- **නිර්වාණය සත්‍ය, නිත්‍ය, දුඛ්‍යාභාව හා පිවිතුරුයි**
- **නිර්වාණය ලබාගැනීම වස්තුවකි (ප්‍රාප්තයි)**
- **නිර්වාණය භික්ෂූන්ගේ ධ්‍යාන සහ ඥානය අරමුණු වන්නකි.**
- **නිර්වාණය ලෝකෝත්තර තත්වයකි. සත්ත්වයන්ට සියල්ලට ම වඩා උසස් තත්වය මෙයයි.**
- **නිර්වාණයේ කොටස් දෙකකි. එනම්, සෝපාදිසේස හා නිරුපදිසේස ලෙසිනි.**
- **නිර්වාණය හා සංසාරයේ ධර්ම සමතාව පිළිනොගනි.**
- **ලෝකයේ පදාර්ථයන්ගේ සත්‍යතාව පිළිගනි, නිර්වාණයසේ ම ලෝකය ම සත්‍යයයි.**
- **දෙවැදෑරුම් ආවරණයන් පිළිනොගනී.** යනාදි වශයෙනි.

සත්ත්වයා සසර දිගින් දිගටම ගමන් කරන්නේ අවිද්‍යාව හෙවත් අනවබෝධය නිසාවෙනි. නිවැරදි අවබෝධයට පත් වූ කල්හි සියල්ල අනිත්‍ය බව වටහා ගනී. ඒ අවබෝධය ලැබීම නිවනට පැමිණීමයි. එබැවින්, ඉහත පරිදි නිවන පිළිබඳ ථෙරවාදී මතය නිදසුන් සහිත ව පැහැදිලි කරගත හැකි ය.

## බෞද්ධ විමුක්ති සංකල්පයේ සුවිශේෂිතා

බුදුදහමේ විමුක්ති සංකල්පය අන් සෑම දාර්ශනික ආගමික ඉගැන්වීමකට ම වඩා වෙනස් වන්නේ එහි ඇති ආනුභවික ස්වරූපය නිසාවෙනි. අන් සෑම ආගමක ම විමුක්තිය යනු මරණින් මතු ජීවිතය පිළිබඳ ඉගැන්වීමකි. මෙලොව දී සාක්ෂාත් කරගන්නා දෙයක් නොවේ. නමුත් බුදුදහමේ විමුක්තිය ඊට හාත්පසින් වෙනස් වේ. බුදුදහමට අනුව, විමුක්තය යනු මේ ලෝකයේ දී ම, අවබෝධ කරගත යුතු යථා තත්වාවබෝධයකි. ඒ බව සංයුක්ත නිකායේ ලෝක සූත්‍රයේ පහත නිදසුනෙන් පැහැදිලි වේ.

**"ඉමස්මිං බ්‍යාමත්තෙ කලේබරේ ලෝකඤ්ච පඤ්ඤාපෙමි, ලෝක සමුදයංච පඤ්ඤාපෙමි, ලෝක නිරෝධංච පඤ්ඤාපෙමි, ලෝක නිරෝධගාමිනි පටිපදංච පඤ්ඤාපෙමි. "** මෙම බඹයක් පමණ වූ සත්ත්ව ශරීරය තුළ ලෝකය ද, ලෝකය හටගැනීමේ හේතුව ද, ලෝකය නැති කිරීම ද, ලෝකය නැති කිරිමේ ප්‍රතිපදා මාර්ගය ද පනවමි. යන්න, බුදුරාජාණන් වහන්සේ දේශනා කොට ඇත. මෙයින් පැහැදිලි වන්නේ නිවන අප ශරීරයේ ම පවතින බවයි. නිවන මෙලොව වශයෙන් ම අත්දැකිය යුත්තක් බව පවසයි. ( ගමගේ චමින්ද ජී.2017, පි:32)

බෞද්ධ විමුක්ති සංකල්පයට ම අනන්‍ය වූ අනිත් විශේෂ ලක්ෂණය වනනේ, නිවන පුද්ගලයා විසින් ම ස්වකීය උත්සහයෙන් අවබෝධ කර ගත යුත්තක් බවයි. බොහෝ දේවවාදී ආගමික ඉගැන්වීම්වලට අනුව, සර්ව බලධාරී දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව, පුද්ගලයාගේ විමුක්තිය හෝ නිරාගත වීම තීරණය කරයි. දෙවියන් වහන්සේට අවනත ව ක්‍රියා කළ අය දෙවියන් සමීපයට කැඳවා ගැනීම සිදුවන්නේ, දෙවියන් වහන්සේගේ අභිමතය අනුව ය. කෙතරම් යහපත් දේ කළ ද දෙවියන් වහ්නසේට අවනත නොවිම නිසා අපාගත විය හැකි ය. නමුත්, බෞද්ධ විමුක්ති මාර්ගය කිසිවෙකු විසින් විවර කරන ලද්දක් නොව, පුද්ගලයා විසින් තමාම තම ශක්තියෙන් ගොඩනගා ගත යුත්තකි. ඒ බවට ධම්මපදයේ දී බුදුවරු මග පෙන්වන්නේ ය. එම මග ගමන් කිරීම ඔබ සතු යුතුකමකි. **"තුම්හේව කිච්චං ආතපප්ං අක්ඛාතාරෝ තථාගතා"** යනුවෙන් එය පැහැදිලි වේ. (ඛුද්දක නිඛාය, ධම්මපද මාර්ග වග්ගය, 4 ගාථාව , පිː 94)

බුදුදහමට අනුව, තමාගේ විමුක්තිය ළඟා කරගත යුත්තේ, තමා විසින් ම ය. එහි වගකීම පුද්ගලයාට ම පවරා දී ඇත්තේ, බුදුදහම මානව කේන්ද්‍රීය දහමක් වන බැවිනි. එම නිසා බුදුරාජාණන් වහන්සේ බොහෝ අවස්ථාවල දේශනා කලේ තමන්ට සරණ තම අත බවත් ය. **"අත්තාහී අත්තනෝ නාථෝ - කෝහී නාථෝ පරෝසියා "** (ඛුද්දක නිඛාය, ධම්මපද **"අත්තාහී අත්තනෝ නාථෝ - කෝහී නාථෝ පරෝසියා "** (ඛුද්දක නිඛාය, ධම්මපද මාර්ග වග්ගය, 4 ගාථාව, පිː 94) තමාට තමා පහනක් කොට ජීවත්වීමට උපදෙස් දී ඇත්තේ ස්වීයත්වය අගය කරමිනි. **"අත්ත දීපා භික්ඛවේ විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා"** යහපත් ක්‍රියා කොට නිවන ලබා ගන්නේ ද, නැතහොත් අයහපත් ක්‍රියා කොට අපාගාත වන්නේ ද, යන්න තමා විසින් තීරණය කළ යුතු ය, යන්න බෞද්ධ ඉගැන්වීමයි. තමා කළ පාපයෙන් තමා අපිරිසිදු වන බවත්, තමා කළ කුසලයෙන් තමා පිරිසිදු වන බවත්, පිරිසුදු හෝ අපිරිසිදු බව තමා විසින් ම තීරණය කළ යුතු බවත්, දේශනා කිරීමෙන් යථෝක්ත අදහස මනාව ප්‍රතීයමාන වේ. (දීඝ නිකාය, මහා පරිනිබ්බාන සූත්‍රය, පිː158 )

**"අත්තනාව කතං පාපං - අත්තනාසං කිලිස්සති**

**අත්තනා අකතං පාපං - අත්තාව විසුජ්ඣති**

**සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤං විසෝදයේ "**

මේ අනුව, පැහැදිලි වන්නේ, බුදුදහම විමුක්තිය පිළිබඳ වගකීම පුද්ගලයාට ම පවරා දී ඇති බවයි. එහිදී තමාට වඩා උසස් තමා පාලනය කරන ඊශ්වරයෙකු හෝ සර්ව බලධාරියෙකු නොමැති බව අවධාරණය කරයි. බුදුදහමේ ඉගැන්වෙන විමුක්ති සංකල්පයේ ඇති සුවිශේෂීත්වය මෙයින් ප්‍රතීයමාන වේ.

බුදුදහමේ විමුක්තිය ලෙස දකින නිර්වාණය පරම සුවයකි. බුදුසමය ද සංසාරික තත්වය දුක් සහිත බව උගන්වන අතර, ඉන් මිදීම පරම සුවය ලෙස පෙන්වා දී ඇත. ධම්මපදයේ දී නිවන පරම සැපය ලෙස දක්වා ඇත්තේ, **"නිබ්බානං පරමං සුඛං "** යනුවෙනි. (ඛුද්දක නිඛාය, ධම්මපද පාළිය, සුඛ වග්ගය, 8 ගාථාව, පිː76) ධම්මපදයේ ම **"නත්මී සන්ති පරං සුඛං "** යනුවෙන් දක්වා ඇත්තේ, නිවන් සැපතට වඩා උසස් සැපතක් නැත යන්නයි. (ඛුද්දක නිකාය, ධම්මපද පාළිය, සුඛ වග්ගය, 8 ගාථාව, පිː76)

ථෙරී ගාථා පාළියේ නිවන පරම නිවන පරම සුවයක් ලෙස දක්වා ඇත්තේ, "**නිබ්බානං සුඛ පරං නත්ථි** " යනුවෙනි. ථෙරි ගාථා පාළියේ දී සම්බුදුවරයාණන් වහන්සේලා විසින් දේශනා කරන ලද නිර්වාණය අතිශයින් සුඛ සහගත බව දක්වෙයි. **සුඛවත නිබ්බානං, සම්මා සම්බුද්ධ දේශිතං** (ඛුද්දක නිකාය, ථේරගාථා පාළි) යන පිටකාගත පාඨයන්ගෙන් පැහැදිලි වන්නේ, ලොව ඇති උත්තරීතර සුවය නිර්වාණය බවයි. **අංගුත්තර නිකායේ නවක නිපාතයේ** සැරියුත් හිමියන් උදායි තෙරණුවන් සමග කරන ලද සංවාදයේ දී දක්වෙන්නේ, නිවන **අවේදයික** සැපයක් වන බව දැක්වේ. **"එතදේව කොත්ථ ආයුසො සුඛං යදෙතථ නත්ථි වේදයිතං සංයුක්ත නිකායේ සුඛ වේදනා, දුක්ඛ වේදනා. අදුක්ඛද සුඛ වේදනා "** යනුවෙන් දක්වා ඇත. (සංයුක්ත නිකාය, සළායතන සංයුක්තය, ලෝක සූත්‍රය, පිː 116)

**අවේදික සැපයක් වන නිවන කිසිදා වෙනස් නොවන නිත්‍ය තත්වයක් සේ හඳුන්වයි.** නිවනින් මෙහා ඇති දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ආදී සෑම සැපයක් ම අස්ථිර බැවින් ඒවා ප්‍රාර්ථනා නොකළ යුතු යන්න බෞද්ධ ඉගැන්වීමයි.

බෞද්ධ විමුක්ති මාර්ගයේ පිවිසීම් පියවර 04 කි.

- **සෝවාන්**
- **සකෘදාගාමී**
- **අනාගාමී**
- **අරහත්** යන්නයි. (යසස් හිමි, පනහඩුවේ, 2009, පිː10)

ථෙරවාදයට අනුව, සෝතාපත්ති ඵලය නිවනෙහි පළමුවන පියවරයි. එහිදි යෝගාවචරයා මමය, මාගේයැයි දැඩිව ගන්නා සක්කායදිට්ඨිය ද, සසර හා නිවන පිළිබඳ සැක ඇතිවීම නම්, විචිකිච්ඡාව ද, මිත්‍යාශීල හා ව්‍රත මඟින් නිවන අවබෝධ කළ හැකි ය. යන සීලබ්බතපරාසය ද යන බැමි (සංයෝජන) තුන සිඳීයයි. කාමරාග හා ව්‍යාපාද යන බැමි දෙක සෘදාගාමි මඟින් තුනී වන අතර, අනාගාමී වීමෙන් ඒවා ප්‍රහීන වේ. ඕරම්භාගිය සංයෝජන නමින් දක්වෙන ඒ බැඳීම් පස සිඳ දමන තැනැත්තා සම්බෝධිය ආසන්නේ ම සිටින්නෙකි. උද්ධම්භාගිය සංයෝජන නම් වූ රූපරාග, අරූපරාග, මාන, උද්දච්ඡ, අවිජ්ජා යන බැමි සිඳ දැමීමෙන් හෙතෙම සියලු ආශ්‍රව ධර්මයන් ක්ෂය කරනු ලද්දෙකු බවට පත්වේ. (සිල්වා ද, යූ.ජී,1991,පිː18)

ඒ සමඟ ම තමන් පෙර විසූ ආත්ම භවයන් පිළිබඳ දැනීම ද, දිවැස් ලැබීම ද, තමන් විසින් සියලු කෙලෙස් නැති කරන ලද බව දන්නා ආසවක්ඛය ඥාණය ද යන ත්‍රිවිද්‍යා පහළ විය යුතු වේ. එවැන් තැනැත්තා නිවන ප්‍රත්‍යක්ෂ කරගත් රහතන් වහන්සේ නමින් හැඳින්වේ. නිවන යනු දහම් ඇසෙයි, විද්‍යාවයි, ප්‍රඥාවයි, ආලෝකයයි, සත්ත්වයා හා ලෝකය පිළිබඳ යථාභූත ඥාන දස්සනයයි. කුසල් හෝ අකුසල්වලට එහි ඉඩ නැත. ඒවා සත්ත්වයා සසරට බැඳ තබන උපකරණ හෙයිනි. නිවන අවබෝධ කළ පුද්ගලයා කුසල් නොකරයි. අකුසල් ගැන කිව යුත්තක් නැත. එහෙත් අතීත කුසලාකුසල කර්මයන්හි විපාක වළඳයි. සීවලී මහ රහතන් වහන්සේගේ හා මුගලන් මහරහතන් වහන්සේගේ චරිත කතා එයට නිදසුන් වශයෙන් සිහිපත් කළ හැකි ය. (සිල්වා ද, යූ.ජී,1991,පිː19)

ව්‍යවහාරික ලෝකයේ දී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ 05 එක්වීම පුද්ගලයා නමින් හැඳින්වෙන අතර, නිවන අවබෝධ කරගනුයේ, ඒ පූර්ණ වශයෙන් නිවනට පැමිණි පුද්ගලයෝ ය. නිවන අවබෝධ කරගැනීම ස්කන්ධ පංචකය ඇති කල්හි ම, ජීවත්ව සිටියදී ම සිදු වන්නක් බව එයින් පැහැදිලි වේ. නිර්වාණ අවබෝධයත්, කලුරිය කිරීමත්, යන අවස්ථා දෙක වෙන් වශයෙන් දැක්වීමට අවශ්‍ය නිසා පරිනිර්වාණය කොටස් දෙකකින් හඳුන්වනු ලැබේ.

නිවන ලබා ගැනීමට මාර්ග 03 ක් ද ඇත. ඒවා තුන්තරා බෝධිය ලෙස හඳුන්වයි. බුදු, පසේබුදු, මහරහත් යන තුන්තරා බෝධියෙන් එක් තත්වයකට පැමිණීම නිවන් පසක් කරගත හැකිය යන්න ථෙරවාදී ඉගැන්වීමයි. විශේෂයෙන් ම ථෙරවාදී නිවන් සංකල්පයේ දී අවධාරණය කරන්නේ නිවන බුදුවීමෙන්, පමණක් නොව පසේබුදු වීමෙන් ද, රහත් වීමෙන් ද, නිවන් ලැබීමට පොළඹවන අර්ථයෙන් ථෙරවාද දහම හීනයානය ලෙස හඳුන්වන බවයි. ( ප්‍රේමරත්න හිමි,රොටුඹ, ලංකාරතන හිමි, රොටුඹ, 2014,පි:185 )

මීට අමතරව, ථෙරවාදයේ දැක්වෙන ආකාරයට නිර්වාණය පිණිස සීල විශුද්ධි ආදී සප්ත විසුද්ධි ධර්ම එකින්නෙකට උපකාරී වීම ද බෞද්ධ විමුක්ති සංකල්යේ සුවිශේෂීත්වයකි. එනම්, විදර්ශනා භාවනා ක්‍රමය පුහුණු වන යෝගාචාර්යවරයෙකු විසින් අනිවාර්යෙන් ම දැනගෙන සිටිය යුතු ඉගැන්වීමක් නම් සප්ත විශුද්ධියයි. සප්ත යනු හතයි. විශුද්ධිය හෙවත් ආත්ම විමුක්තියට අනුබල දෙන කරුණු 07 ක් සප්ත විසුද්ධිය නමින් හඳුන්වනු ලබයි. එනම්,

- **සීල විසුද්ධිය**
- **චිත්ත විසුද්ධිය**
- **දිට්ඨි විසුද්ධිය**
- **කංඛාවිතාරණ විසුද්ධිය**
- **මග්ග මග්ගඥාණ විසුඩධිය**
- **පටිපදා ඤාන දස්සන විසුද්ධිය**
- **ඤාණ දස්සන විසුද්ධිය** ආදියයි.

විමුක්තිකාමීන් විසින් මෙම සප්ත විසුද්ධීන් සම්පූර්ණ කළ යුතුවෙයි. මෙහි පළමු වැන්න සීල විසුද්ධියයි. එනම් සිල්වන්තකමයි. දුස්සීලයෙකුට කිසිසේත් ම විමුක්තිය ලද නොහැකි ය. ගිහි පැවිදි කවරෙකුට වුව ද සිල්වත්කම අත්‍යවශ්‍ය වේ. ගිහියෙක් වශයෙන් පන්සිල් සුරැකිය යුතු ය. තවදුරටත්, අටසිල්, බ්‍රහ්ම චරියා ශිලය, ගිහි දස සීලය ආදිය වැඩිය හැක. පැවිද්දන් ද ප්‍රාතිමෝක්ෂ, ඉන්ද්‍රීය සංවර ආදී සීලයන්ගෙන් යුක්ත විය යුතු ය.

චිත්ත විසුද්ධිය යනු සිතේ පවිත්‍රතාවයයි. එය නැති වන්නේ කාමච්ඡන්ද නීවාරණයෙනි. සීල විසුද්ධියෙන් යුක්ත නම් චිත්ත විසුද්ධිය හෙවත් සමාධිය ලැබෙයි. උපචාර සමාධි, අපචාර සමාධි ලෙස එය කොටස් වේ. කංඛාවිතාරණ විසුද්ධියේ දී පංචස්කන්ධය පිළිබඳ සැකය දුරු කිරීම ඉගැන්වෙයි. (ප්‍රේමරත්න හිමි රොටුඹ, ලංකාරතන හිමි රොටුඹ, 2014,පි:37) මේ ආදී ඒ සියලු විසුද්ධිවලින් සම්පූර්ණ තැනැත්තා පමණක් ථෙරවාදයට අනුව, නිවන් අවබෝධ කරගනියි.

බෞද්ධ විමුක්ති සංකල්පයේ සුවිශේෂිතාවයක් ලෙස පරිනිර්වාණ සිදුවන ආකාර ද්විත්වය හඳුන්වා දිය හැකි ය. ජීවත්ව සිටිය දී හෙවත්, පංච ස්කන්ධයෙන් නිරුපද්‍රිත ව පවතිද්දී ක්ලේෂ පරිනිර්වාණය සිදුවන අවස්ථාව සෝපාදීසේස පරිනිර්වාණය යැයි හඳුන්වනු ලැබේ. එනම්, රාග, ද්වේෂ, මෝහ අකුසල් මුල් ක්ෂය කිරීම නිවනයි. ජීවත් ව සිටිය දී නිර්වාණ අවබෝධය කිරීම මෙයින් අදහස් කෙරෙයි. ස්කන්ධයන් නැවත ඇති නොවන අයුරින් විනාශවීම හෙවත් කලුරිය කිරීම නිරුපදිසේස (අනුපාදිසේස) පරිනිබ්බාන වෙයි. මේ වනාහි කාලීන වශයෙන් පහළ වන්නා වූ, ගැටලු විසඳා ගැනීම සඳහා අවස්ථානුකූල ද යොදාගෙන ඇති විවරණයක් බව සඳහන් කළ හැකි ය. එනම්, නිරුපදිසේස නිර්වාණය යනු මේ භයවයේ දී නිවන් අවබෝධ කළ උතුමන් මේ ජීවිතයෙන් සමුගැනීම හෙවත් පිරිනිවන් පෑමයි. ඉහත පරිදි ගත්කල නිවන පිළිබඳ ථෙරවාදි මතය විවරණය කළ හැකි අතර බෞද්ධ විමුක්ති සංකල්පයේ සුවිශේෂතාවයන් පර්යේෂණාත්මක ව හඳුනාගත හැකි ය.

## නිගමනය

පරමාත්මය, කේවල ඥානය, බ්‍රහ්ම සහව්‍යතාවයය, මොක්ෂය ආදී වශයෙන් විවිධ ආගම් ඇසුරින් පරම වූ සුවයක් පිළිබඳ ඉගැන්වෙයි. ථෙරවාදී බුදුදහමේ එය නිවන හෙවත් නිර්වාණය ලෙස හඳුන්වයි. නිවන යනු බුදුදහමේ පරම නිෂ්ඨාවයි. මෙලොව උපත ලබන ඕනෑම සත්ත්වයෙකු මෙම සසර ගමන කෙළවර කිරීමට නම් නිවන අවබෝධ කරගත යුතු ය. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් නිවන් අවබෝධ කළ හැකිය යන්න ථේරවාදි ඉගැන්වීම වෙයි.**"තණ්හක්ඛයෝ නිබ්බානං"** යන්න එය ඉගැන්වෙයි. ඒ අනුව, නිගමනය කළ හැකි වන්නේ නිවන යනු, ලෝකෝත්තර සුවයක් බවත්, ඒ නිසාම නිවනේ විශිෂ්ටත්වය ලෞකික වචන ඇසුරින් පැහැදිලි කිරීම කළ නොහැකි බවත් ය. එපමණක් ද, නොව, නිවන වනාහී නොවිඳිනා සුවයක් විඳීම (අවේදයිත) වීම, පුද්ගලයා විසින් ම ස්වකීය උත්සහයෙන් අවබෝධ කළ යුක්තක් වීම, නිවන අවබෝධ කරගැනීමට අවස්ථා දෙකක් තිබීම එනම්, සෝපාධිසේස නිර්වාණය (පඤ්චස්කන්ධය සහිත), නිරුපධිසේස නිර්වාණය (පඤ්චස්කන්ධය රහිත), විමුක්තිය පිළිබඳ වගකීම පුද්ගලයාට පවරාදීම සහ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ගයේ ගමන් කිරීම, නිවන ලබා ගැනීමට (බුදු-පසේ බුදු-මහරහත් ) තුන්තරා බෝධිය ඔස්සේ ගමන් කිරීම සිදුවීම ආදී බෞද්ධ විමුක්ති සංකල්පයේ සුවිශේෂිතා දැක්විය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර


**<u>ඛුද්දක නිඛාය</u>**, ධම්මපද පාළිය, සුඛ වග්ගය, (2006), කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය

**<u>ඛුද්දක නිඛාය</u>**, ධම්මපද මාර්ග වග්ගය, (2006), කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය

**<u>ඛුද්දක නිකාය</u>**, ථේරගාථා පාළිය, (2006), කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය

**<u>සංයුක්ත නිකාය</u>**, සළායතන සංයුක්තය, ලෝක සූත්‍රය, (2006), කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය

**<u>දීඝ නිකාය</u>**, මහා පරිනිබ්බාන සූත්‍රය, (2006), කොළඹ, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය

**ද්විතීක මූලාශ්‍ර**


ගමගේ, චමින්ද ජී, (2017), **අද්‍යතන ලෝක ආගම්,** නුගේගොඩ, නැණිල පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ඤාණානන්ද හිමි, කටුකුන්දේ, (2000), **නිවනතේ නිවීම,** ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහාභාරකාර දෙපාර්තමේන්තුව.

ධම්මදස්සි හිමි බෝගහපිටියේ, (2015), **නිවන් සුවයට එකම මඟ,** කොළඹ, එම්. ඩී.ඩී. අයි. ගුණසේන සහ සමාගම

ධම්මජෝති හිමි, මැදවච්චියේ, (1999), **ස්වර්ගය පිළිබඳ බෞද්ධ චින්තනය**, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නානායක්කාර, සනත්, (1998), **බුදු දහම හා ශ්‍රී ලංකාවේ සෙසු ආගම්,** දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රත්නායක ශාන්ත, (1984), **බුද්ධ ධර්මය,** කොළඹ, සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ සමාගම.

රාහුල හිමි, වල්පොළ, (2010), **බුදුන් වදාළ ධර්මය,** දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විමලරතන හිමි බෙල්ලන්විල, (2006), **විචාර ලිපි සරණිය**, දෙහිවල, සී දේව් ප්‍රින්ටස්.

සිල්වා ද, යූ.ජී, (1991), **බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**, පාදුක්ක, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

හේවාපතිරණ ආරිය රත්න, (2017), **නිවන මඟ,** කුරුණෑගල, නිව්ලක් ප්‍රින්ටස්.

BUDDHIST PUBLICATION SOCIETY, (2008)**, Foundations of Buddhism: The Four Noble Truths ,** Raththnapitiya, ajith printers

Eliade, Mircea (1977), **From primitives to zen. A Thematic Source book of the History of Religions,** Harper & Row publishers, New York, USA

Eliade, Mircea (1977), **patterns in Comparative Religion**, A Meridian Book, New American Library, New York, USA

Leauw, G. van Der, (1963) **Religion in Essence and Manitestation, Vol.Two**, translated, J.E Turner,Harper & Row, publishers,New York, USA.

Walpola Rahul, (1974),**WHAT THE BUDDHA TAUGHT**,New york, Grove press


**ශබ්දකෝෂ.**


බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, (1998), **පාලි-සිංහල අකාරාදිය**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ලියනගේ, සිරි,(2003), **නිරුක්ති සහිත ශබ්ද කෝෂය,** කොළඹ, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

සෝරත හිමි, වැලිවිටියේ, (1998), **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය**, පළමු භාගය, සහ ද්විතික භාගය, කොළඹ, ඇස්. ගොඩගේ සහ සමාගම

හරිස්චන්ද්‍ර, විජයතුංග,(2008),**<u>ගුණසේන මහා ශබ්ද කෝෂය,</u>** කොළඹ 12: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

හේවගේ, බුද්ධදාස, (2014), **<u>සිංහල-ඉංග්‍රීසි ශබ්දකෝෂය</u>**, පිළියන්දල, පියුමි මුද්‍රණ ශිල්පියෝ.

James, Murry, (1948), **<u>Oxford Dictionary,</u>** Oxford university press.

Rhys Davids T.W, (1997), **<u>The pali -Dictionary,</u>** William stede.

## සඟරා

හෝනර්, අයි. බී, (2020), ථෙරවාදි බුද්ධ ධර්මයේ ලක්ෂණ, **<u>දේශන සම්ප්‍රදාන</u>**, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

යසස්සි හිමි, පනහඩුවේ, (2009), "සමයාන්තර දර්ශනාගත විමුක්ති සංකල්පය", **<u>සමය අධ්‍යයන,</u>** සංස්: මහමිතිලාව පඤ්ඤාරතන හිමි, දෙහිපාගොඩ විජිතනන්ද හිමි, මහරගම, රුවන්පහරුව

Dammadinna himi, galagama, Narada himi, (2018), "The Liberation Concept in Esatern Religions ", **<u>Journal of Religious Studies</u>**, Religious studies Research & publication society, Buddhist and pali university in sri Lanka

## අන්තර්ජාලය

පුෂ්පකුමාර, ජී.ජී, 2021.පෙබරවාරි.13, නිවන , **<u>සිළුමිණ,</u>** www.silumina.lk accessed 2021.02.17 at.20:40

ප්‍රේමරත්න, ඒ.එම්, 2008 ජනවාරි.15, නිවන කුමක්ද?, එය ලබන්නේ කෙසේ ද?, **<u>බුදුසරණ අන්තර්ජාල කලාපය</u>**, www.budsarana.lk accessed 2021.02.17 at.20:50

නිවන පිහිටි තැන, **<u>බුදුසරණ අන්තර්ජාල කලාපය</u>**, www.budsarana.lk accessed 2021.02.17 at.20:54

අතුලඥාණ හිමි, කඩුවෙල, 2017, අගෝස්තු 17, නිවන් අවබෝධයට භාවනා කළ යුතුම ද? සිත නිවන භාවනා mahaviharaya.lk accessed 2021.02.17 at.20:58

ලිවර, ළහිරු, 2019 සැප්තැම්බර් 03, නිවන කෙබඳුදැයි කිව මැන, , www.linkedin.lk accessed 2021.02.17 at.21:03

# බෞද්ධ ආගමික ස්ථානයක් මගින් සමාජයට සිදුකෙරෙන කෘත්‍යයන් පිළිබඳව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක්

# A Sociological Analysis of the Functions Performed by Buddhist Religious Institutions to the Society

*P.K.G.I.L. Ranasinghe*

## හැඳින්වීම

ආගම යනු අනාදිමත් කාලයක සිට පැවතෙන සමාජ සංස්ථාවකි. වර්තමානයේ ද ආගමික කටයුතුවල පුද්ගලයන් නිරත වීම, නව ආගමික ප්‍රවණතා මෙන්ම අනාගාමිකත්වය වැනි සංකල්ප ද ආගම ඇසුරින් හඳුනාගත හැකි සමාජ විද්‍යාත්මක සංසිද්ධි වේ. සමාජයේ පැවැත්මට ආගම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආගම පිළිබඳ සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය තුළින් ආගම පිළිබඳ මිනිස් පැතිකඩ, ආගම පුද්ගලයාට සහ සමූහයට බලපාන ආකාරය පිළිබඳව අවධානය යොමු කරයි.

මෙම පර්යේෂණය තුළින් ආගම පිළිබඳ සමාජ විද්‍යාවට අදාළ සංකල්ප සහ න්‍යායන් භාවිතා කරමින් බෞද්ධ ආගමික ස්ථානයක් වන කෝට්ටේ රජමහා විහාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදුකොට ඇත. ඉහත ආගමික ස්ථානයෙහි ඉතිහාසය, සමාජ සංස්කෘතික පසුබිම, ආගමික මධ්‍යස්ථානයේ ආරම්භය, විකාශනය සහ ගෝලීයකරණය හේතුවෙන් ඇති වූ නව ප්‍රවණතා, ආගමික මධ්‍යස්ථානයේ දිනපතා, සතිපතා, මාස්පතා සහ වාර්ෂිකව සිදුකරන පූජාවිධි සහ යාතුකර්ම, බැතිමතුන්ගේ අරමුණු සහ ස්වාභාවය යනාදිය පිළිබඳව අවධානය යොමුකර ඇත.

'බෞද්ධ ආගමික ස්ථානයක් මගින් සමාජයට සිදුකරන කෘත්‍යයෙහි ස්වභාවය කුමක් ද?' යන පර්යේෂණ ගැටලුව පිළිබඳව මෙහිදී අවධානය යොමුකර ඇත. බෞද්ධ ආගමික ස්ථානයක් සමාජයට කොතෙක්දුරට කෘත්‍යාත්මක වන්නේ ද? යන්න හඳුනාගැනීම මෙහි මූලික අරමුණයි. බෞද්ධ ආගම සම්බන්ධයෙන් ගෝලීයකරණය හේතුවෙන් ඇති වූ නව ප්‍රවණතා, ආගමික මධ්‍යස්ථානයේ දිනපතා, සතිපතා, මාස්පතා සහ වාර්ෂිකව සිදුකරන පූජාවිධි සහ යාතුකර්ම සහ ආගමික ස්ථානයට පැමිණෙන බැතිමතුන්ගේ අරමුණ සහ ස්වාභාවය පිළිබඳව හඳුනාගැනීම මෙහි උප අරමුණු විය. ආගම සම්බන්ධයෙන් ගෝලීයකරණය හේතුවෙන් ඇති වූ නව ප්‍රවණතා මොනවා ද?, අදාළ ආගමික මධ්‍යස්ථානයේ දිනපතා, සතිපතා, මාස්පතා සහ වාර්ෂිකව සිදුකරන පූජාවිධි සහ යාතුකර්ම මොනවා ද? සහ මෙම ආගමික ස්ථානයට පැමිණෙන බැතිමතුන්ගේ අරමුණ සහ ස්වාභාවය කුමක් ද? යන පර්යේෂණ ප්‍රශ්න පිළිබඳව මෙහිදී අවධානය යොමුකරන ලදී.

බුද්ධ දර්ශනය සහ බුදු දහම පුළුල් සමාජය තුළ පවතින ආකාරය වෙනස් ලක්ෂණ දක්වයි. ථෙරවාදී බුදුදහම ආශ්‍රිතව ශ්‍රී ලාංකීය සිංහල ජනතාව  ආගම පුහුණු කරන ආකාරය පිළිබඳව සහ එහි ස්වභාවය පිළිබඳව ගොම්බ්‍රිච් සහ ඔබේසේකර (1988) පර්යේෂණයට ලක්කරන ලදී. එම පර්යේෂණයන්හි සොයාගැනීම් ආශ්‍රිතව දක්වන ආකාරයට ථෙරවාදී බුදුදහම පිළිබඳව මෙරට තුළ මූලික වෙනස්කම්

කිහිපයක් සිදුව ඇති අතර තවදුරටත් වෙනස්කම් සිදුවෙමින් ද පවතී. පුළුල් ආකාරයෙන් සලකා බලන කළ මෙම වෙනස්කම් වලට හේතූන් ලෙස එම පර්යේෂකයන් පහත කරුණු දක්වයි,

- බටහිර තාක්ෂණයේ බලපෑම.
- බටහිර සංස්කෘතික සහ දේශපාලන අධිකාරීත්වය.
- ප්‍රධාන සංධිස්ථාන 3ක් ඔස්සේ මෙරට සිදු වූ ජනගහන වර්ධනය (වර්ෂ 1931 සිට 1981 දක්වා 50 වසරක් ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 5 සිට 25 දක්වා වර්ධනය වීම).
- ආර්ථිකය බිඳ වැටීම.
- වර්ෂ 1971 සිට 1983 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා දේශපාලනයේ සංධිස්ථාන (1971 ශිෂ්‍ය කැරැල්ල, 1983 සමූහ මිනිස් ඝාතන සහ ඒ සමඟ ආරම්භ වූ ගැටුම් සිංහල සහ දමිළ තරුණයන් අතර වූ කැරලි දක්වා දුරදිග යාම).

ශ්‍රී ලාංකීය බුදුදහම සහ ආගමික සංස්කෘතිය ඉහත කරුණු වල ප්‍රකාශනයක් වන ආකාරය පිළිබඳව ගොම්බ්‍රිච් සහ ඔබේසේකර තවදුරටත් කරුණු දක්වන ලදී. එහිදී ඔවුන් වඩාත් අවධානය යොමු කරන්නේ කතරගම දෙවියන් ඇදහීම, වෙනත් ඉෂ්ට දේවතා වන්දනය යනාදිය ජනප්‍රිය බුදුදහම තුළට ඇතුළු වීම සහ ඒ හා සබැඳි සමාජ ආකෘති, මතවාදයන් සහ ආර්ථික උනනදුන් මොනවා ද? යන්න පිළිබඳවයි. මෙරට තුළ පවතින්නේ කුමන ආකාරයේ බුදු දහමක් ද? යන්න පිළිබඳව ඔවුන් අවධානය යොමු කරයි (ගොම්බ්‍රිච් සහ ඔබේසේකර උපුටා ගැනීම සෙනෙවිරත්න, 1990: පි. 398 - 401). තවදුරටත් ඔවුන් දෙදෙනා දක්වන ආකාරයට බුදුදහම අංශ කිහිපයකට බෙදා දැක්විය හැකිය,. එනම්,

- චූල සම්ප්‍රදාය.
- මහා සම්ප්‍රදාය.
- ග්‍රාමීය බුදුදහම.

බුදු දහම සහ ජන සමාජය තුළ එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ඉහත කරුණු පිළිබඳව විවේචනාත්මක දෘෂ්ටියක් අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

රාජගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෝට්ටේ රජමහා විහාරය පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් යොදාගන්නා ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා මූලික දත්ත දායකයෙකු වශයෙන් විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් ද, අනෙකුත් දත්ත දායකයන් ලෙස අරමුණු සහගත නියැදිය යටතේ විහාරස්ථානයට පැමිණි බැතිමතුන් 20 දෙනෙකු සම්බන්ධ කරගන්නා ලදී. නියැදිය නැවත ප්‍රතිස්ථාපනය ද යොදා ගන්නා ලදී (Sampling with Replacement). ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා මූලික දත්ත දායකයා සමඟ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡාවක් පැවත් වූ අතර නියැදියේ අනෙකුත් දත්ත දායකයන් 20 දෙනා සමඟ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. සහභාගී නොවන නිරීක්ෂණ ද සිදුකරන ලදී. ආගම පිළිබඳ සමාජ විද්‍යාත්මක පර්යාලෝක, න්‍යායන් සහ සංකල්ප භාවිතයෙන්

දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී. තේමා අන්තර්ගත විශ්ලේෂණය දත්ත විශ්ලේෂණය සඳහා යොදාගන්නා ලදී.

## සොයාගැනීම් සහ සාකච්ඡාව

**කෝට්ටේ රජමහා විහාරයේ ඉතිහාසය සහ සමාජ, සංස්කෘතික පසුබිම.**

වසර 600 කට පමණ පෙර සැළලිහිණි, ගිරා සංදේශ කාව්‍ය කෝට්ටේ පුරවරය පිළිබඳව දක්වන විට කෝට්ටේ රජමහා විහාරය පිළිබඳව ද දක්වා ඇත. ඓයිතිහාසික ග්‍රන්ථ රාශියක මෙම විහාරස්ථානය පිළිබඳව සඳහන් වේ. වර්තමානයේදී පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව මඟින් මෙම සිද්ධස්ථාන ඓතිහාසික පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස නම්කර සංරක්ෂණය කරනු ලබයි. විහාරස්ථානයෙහි ඉතිහාසය කෝට්ටේ යුගය දක්වා දිවයයි. ක්‍රි.ව. 1415 දී ත්‍රී සිංහලය එක්සේසත් කරමින් රජකමට පැමිණි කෝට්ටේ 6 වන පැරකුම්බා රජතුමා විසින් ඓතිහාසික කෝට්ටේ රජමහා විහාරය ඉදිකළ බවට සාක්ෂි ඇත. දළඳා වහන්සේ විෂයෙහි පවත්වනු ලබන පුද පූජා, එදා සිට අද දක්වාම මෙම විහාරස්ථානයෙහි වර්තමානයේදීත් සිදුකෙරේ. මහනුවර ඓතිහාසික රාජධානියේ දළඳා මාළිගයෙහි දළඳා වහන්සේ තැන්පත් කිරීමට පෙර සතුරු ආක්‍රමණිකයන්ගෙන් දළඳා වහන්සේ ආරක්ෂා කිරීම සඳහා කුරහන් ගලක සඟවා තැබීමට පෙර අවසාන වරට වැඩ හිඳින ලද්දේ කෝට්ටේ රජමහා විහාරයේය.

**ආගමික මධ්‍යස්ථානයේ දිනපතා, සතිපතා, මාස්පතා සහ වාර්ෂිකව සිදුකරන පූජාවිධි සහ යාතුකර්ම**

කෝට්ටේ ශ්‍රී දළඳා මහ පෙරහැර මෙම විහාරස්ථානයෙහි ප්‍රධාන වාර්ෂික යාතුකර්මයයි. දළඳා වහන්සේ මෙරටට වැඩම වූ දින සිට මෙරට සෑම රජ කෙනෙකු විසින්ම මෙම දන්ත ධාතුන් වහන්සේ තම දිවි දෙවැනි කොට ආරක්ෂා කළ අතර ඒ හේතුවෙන් සිරිලක රාජ්‍ය සංකේතය බවට ශ්‍රී දළඳා වහන්සේ පත්විය. මේ නිසාවෙන් පසු කාලයේ විසූ සියලුම රජවරු රාජ්‍ය පාලනය සඳහා මධ්‍යස්ථානයක් තෝරාගත් සෑම අවස්ථාවකම තම මාළිගාව අසලම දළඳා වහන්සේ තැන්පත්කොට ගරු බුහුමන් සහ පුද පූජා පැවැත්වූහ. දළඳාවේ අයිතිය, රාජ්‍යත්වයේ හිමකම සහ පාලකයාගේ දැහැමි බවෙහි අභිමානවත් සංකේතය විය. දළඳා වහන්සේ උදෙසා කිත්සිරි මෙවන් රජතුමන් දළඳා පෙරහැරක් අරඹා එය වාර්ෂිකව ඉදිරියට පවත්වන ලෙස දන්වා සිටියහ. මෙතැන් පටන් සියලුම රජවරුන් මෙම දළඳා පෙරහැර සිදු කරනු ලැබූහ. මෙලෙස මෙරට රාජ්‍යත්වයේ සංකේතය වූ දළඳා වහන්සේ පිළිවෙලින් බෙලිගලට, දඹදෙණියට, යාපහුවට, කුරුණෑගලට, ඉන් අනතුරුව ගම්පොළට ද වැඩම කරවනු ලැබූහ. කෝට්ටේ රාජධානියට දළඳා වහන්සේ වැඩම කරවනු ලැබූයේ 6 වන පරාක්‍රමබාහු රජු සමයේදී ය. ඔහු එය වර්තමාන කෝට්ටේ රජමහා විහාර භූමියෙහි මහල් තුනකින් යුත් දළඳා මාළිගාවක වඩා හිඳුවන ලදී. වටිනාකමින් ඉතා ඉහළ වූ විවිධ මාණික්‍ය වලින් අලංකාර කරන ලද කරඬුවක දළඳා සමිඳුන් වඩා හිඳුවා සියලු රාජ්‍ය ගෞරව ලබාදුන් බවත්, එයට පුද පූජා සත්කාර සිදුකරනු ලැබූ බවත් සඳහන්ය. ක්‍රිස්තු වර්ෂ 1415 දී පමණ වීදාගම හිමියන්ගේ අනුශාසනා පරිදි කෝට්ටේ දළඳා මහ පෙරහැර ප්‍රථම වරට වීථි සංචාරය කළ බවට තොරතුරු ඉතිහාසයෙහි දැක්වේ. 6 වන පරාක්‍රමබාහු රජුගේ දියණිය වූ ලෝක භාෂා හෙවත් උලකුඩය දේවිය විවාහ වී සිටියේ "නන්නූර්තුනයා" නම් වූ ඇමතිවරයා සමඟයි. මොවුන් දෙදෙනාහට පුතෙකු ලබාදෙන ලෙසට ඉල්ලමින් සැළලිහිණියකු සංදේශයක භාරකරුකොට කැලණියේ විභීෂණ දෙවිඳුන්ට ආයාචනයක් යොමු කරමින් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සැළලිහිණි සංදේශය රචනා කරනුයේ සංදේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගය බවට ද පත් කරමින්.

මෙම ඉල්ලීම සඵල වෙමින් ඔවුන් දෙපළට පුත් රුවනක් ලැබුණි. මෙයින් මහත් සතුටට පත් වූ නන්නූර්තුනයා ඇමතිවරයා එවකට රාජ්‍ය උත්සවයක් ලෙසින් සිදු කරනු ලැබූ කෝට්ටේ දළඳා පෙරහැර තවදුරටත් වර්ණවත් කරමින් අලි ඇතුන් 500ක් පමණ යොදාගනිමින් මහත් හරසරින් යුතුව සිදුකළ බව සඳහන්ය. මෙම කෝට්ටේ රාජධානි සමය තුළ ඉතා අභිමානව පැවති ශ්‍රී දළඳා මහ පෙරහැරට අඳුරු යුගය උදාවනුයේ පරසතුරු ආක්‍රමණ හේතුවෙන් කෝට්ටේ රාජධානියත් ඊට සමගාමීව කෝට්ටේ රජමහා විහාරයත් පරිහාණිය කරා ගමන් කළ නිසාවෙන්, එනම් 1505 දී පෘතුගීසීන්ගේ ආක්‍රමණයත් සමඟ සිංහල ජාතියට මෙන්ම බුදු දහමට ද බලවත් පහරක් එල්ල වීමෙනි. අද දක්වා ඓතිහාසික පෙරහැර මංගල්‍ය වසර 117 ක් මුළුල්ලේ වීථි සංචාරය කරමින් වාර්ෂිකව අගෝස්තු මාසයේදී පවත්වනු ලබයි. එහි එන විවිධ යාතුකර්ම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

පෘතග්ජන මිනිසුන්ට එකවරම නිවන් දකින්න බණක් දේශනා කලද අවබෝධ නොවන නිසා එම නිවන් දකින බණ ඇසීමට පෙර, මේ සංසාරයේ ස්වාභාවය යම් යම් රූප, ශබ්ද මාධ්‍ය යොදාගෙන පෙන්වයි. බණ ඇසීමට පෙර ඒ සඳහා හැඩගැසී පසුතලය සකස් කරගත යුතුය. ඒ සඳහා සිදු කරන වැඩපිළිවෙල, පෙරහැර ලෙස පෙන්වාදිය හැකිය. පෙරහරේ අංග පහත පරිදි වේ.

- සර්ව රාත්‍රික පිරිත් දේශනය - දස දහසක් සක්වල ජීවත් වන දිව්‍ය, බ්‍රහ්ම ආදීන්ට සිදු කිරීමට යන සත් කටයුත්ත ගැන මුල් සංඥාවක් ලබා දීමක් මෙයින් සිදුකෙරේ.
- කප් සිටුවීම - කිරි ගහක අත්තක් කපා එය පන්සල් භූමියේ දේවාලය අසල සිටවීමෙන් එය මාධ්‍යක් කරගෙන දේවතා ආකර්ෂණය සිදුවන බවට විශ්වාස කෙරේ.
- කුඹල් පෙරහැර - නොඉඳුල් වලං වලින් විහාර මැදුරේ බුදු ආසන, මල් ආසන, දේවාල ආසන සෝදා පවිත්‍ර කිරීම සහ එම වලං හදන කුඹල්කරුවන් විසින් ඒවා පෙරහැරකින් ගෙනවිත් පූජා කරන සිරිතක් අතීතයේ පැවතුණි. එය මෙලෙස වර්තමානයේදී හඳුන්වයි.
- මල් පෙරහැර - මල් ගෙන යන පොඩි ළමයින් දුටු විට සැඩ ගති නැතිවී මෘදු මානසිකත්වය ඇතිවී අවශ්‍ය කරන පසුතලය සකස් වන බවට විශ්වාස කරයි.
- පාවඩ පෙරහැර - බිම කුණු රොඩු යනාදී අපද්‍රව්‍ය තිබිය හැකිය. ඒ උඩින් පාවඩයක් එළීම මඟින් එම අපද්‍රව්‍යය වලින් ආරක්ෂා වීම අදහස් කරයි. සීලයට උපමා කර තිබෙන්නේ පොළොවයි. සීලය පිරිසිදු කරගන්නවාට පවසන සංකේතය මෙහිදී පෙන්වයි. එවිට පොළවේ කටු, කුණු අපද්‍රව්‍ය තිබේ නම් ඒවා ඉරිසියාව, ක්‍රෝධ, මාන ආදිය ලෙස දක්වයි.
- වීථි පෙරහැර - විහාරස්ථානය අවට තියෙන ප්‍රධාන මංමාවත් වල පෙරහැර පළමුවෙන්ම ගමන් කිරීමක් සිදු වන්නේ වීථි පෙරහැර සමඟයි.
- රන්දෝලි පෙරහැර - මෙම පෙරහැර ගමන්කරන විට අතීතයේදී සිටි නරඹන්නන් එයට පුණ්‍යාධාර ලෙස තමන් සතු රත්‍රන්, කාසි ආදිය පෙරහැර දෙසට විසි කිරීමේ සිරිතක් පැවත ඇත.
- දිය කැපීම සහ ගෙවදින පෙරහැර - මෙය පෙරහැරේ අවසාන අංගයයි. කඩුවෙන් දිය කපා, දිය දෙබෑ වන ජලය අතරින් නොඉඳුල් ජලය කාලයක් ගෙන එය මීළඟ වර්ෂය වනතෙක්

තබාගනී. එයින් සිසිල සංකේතවත් කරයි. අයහපත් දේ සිදුකර තිබුණහොත් ඉහත කාලයේ ජලය වර්ෂයක් ගතවන විට අඩු වන බවට විශ්වාසයක් පවතී. ජලය එසේ අඩුනොවන්නේ නම් එය සුභ ලක්ෂණයකි. මීළග වර්ෂයේ දිය කපන විට අලුත් බඳුනකට මාරු කරන්නේ මෙම කළයයි.

- සංඛ නාදය පැවැත්වීම - පන්සලේ පෙරහැරට සමගාමීව පංච තූර්ය නාදය ඇසේ. ප්‍රථමයෙන් හක්ගෙඩියක් පිඹිනු ලබයි. සංඛ නාදයෙන් දහම් හඬ සංකේතවත් කරයි. අෂ්ඨ බ්‍රහ්ම ස්වර නාදය පෙන්වන්නේ සංඛ නාදය මඟිනි. එය බුදුන් වහන්සේට තිබූ හඬ බවටත්, මහබ්‍රහ්මයාට ද එම හඬ ඇති බවටත් විශ්වාසයක් පවතී.
- හොරණෑ නාදය - සවනට මිහිරි දහම් හඬ ශාන්තය, ප්‍රණීතය. හොර නැති හඬ හොරණෑව පිඹීමෙන් පෙන්නුම් කරයි. හොර නැති හඬ ඇසීමට පැමිණෙන්න කියා මෙම ආරාධනය සිදුකරයි.
- හේවිසි නාදය - බෙරය දෙපැත්තෙහි බෙර ඇස් ද්විත්වයට කෝටු දෙකකින් අධි වේගයෙන් කරකවා ගසයි. මේ ආකාරයට අප දෑස් කරාත් වේගයෙන් අරමුණු පැමිණෙයි. ඒවා පාලනය කර විසි කරන්න යනුවෙන් දක්වයි.
- ගැටබෙර වාදනය - මීළඟට ඊට වඩා අඩු වේගයෙන් ගැටබෙර ගසනු ලබයි. බෙරි හඬ යනු බෙරිහන් දෙන්න එපා යන්නයි. සෝසා නොකරන්න යන පණිවිඩය මෙමගින් ලබා දෙයි. මන්දයත්, දහම් ශ්‍රවණයට එය බාධාවකි.
- දවුල් බෙර වාදනය - මීළඟට දවුල් බෙර ගසයි. මිනිසුන් හැම වෙලාවකම දාහය නිසා ගැටුම් ඇතිකර ගනී. මෙම දාහය ඉතා කටුකයි, හැම අවස්ථාවකම සිත කම්පා කරයි. මෙවැනි පංච කාම රසයට ගිජු නොවන්න යන්න මෙමගින් සංකේතවත් කෙරේ.
- තම්මැට්ටම් වාදනය - "තම්" යනු කිසියම් ස්ථානයකි. එම ස්ථානයේ තිබෙන බාධක මට්ටම් කර මැඩ පවත්වයි. සම්පත්තිය, සුගතිය එයින් සංකේතවත් කරයි.

පෙරහැරෙහි ඒ ඒ අංගයන්ගෙන් සංකේතාත්මකව අදහස් කරන දේ, සැඟවුණ දහම් අරුත පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැකිය.

- කස පුපුරුවන්නන් –පෙරහැරේ පළමු අංගයයි. සමාජයේ ජීවත් වන විට සුළු කරුණු වලට අඬදබර ඇතිකර ගතහොත් අවසානයේ මෙම කසය මෙන් මහා කම්පනයක් ඇති වී ක්‍ෂය බවට පත්වීමට සිදුවන බව දක්වයි.
- ගිණි බෝල කරුවන් - රාග, ද්වේශ, මෝහ ගිනි හටගෙන එයට බැඳුණු විට සෑම අවස්ථාවකම ගිනිගත් ගමනක් නිර්මාණය වීම ගිනිබෝල මගින් සංකේතවත් කරයි. අවිද්‍යාවෙන්, තණ්හාවෙන් තැවෙමින් සහ දැවෙමින් ලෝක සත්වයා සසරෙහි ගමන් කරන ආකාරය මෙම ගිනිබෝල කරකැවීමෙන් පෙන්වයි. රාග සහ ද්වේශ නිසා මෝහයත්, මෝහය නිසා රාග සහ ද්වේෂත් හටගනී. මෙය පෙන්වීම සඳහා ගිනිබෝල දෙපැත්තට කරකවමින් ගමන්කරයි. රෝදයක් මෙන් රවුමට ගින්දර කරකැවීමෙන් මෙවැනි ගිනි චක්‍ර වල ලෝකයා ගමන් කරන බව දක්වයි.

- මුරායුධ - සමාජය තුළ සම්පත් තමන්ගේ කොට ගනිමින් ඒවාට ඇලී, ගැටී, ඒවායින් මත්වී, ඉන්පසු එම සම්පත් රැකගැනීමට මුරකාවල් දමාගෙන යන ආකාරය මෙමගින් පෙන්වයි.
- බොරු කකුල් - සසර ගමන ගමන් කරන විට සමාජයේ ස්වරූපය ආකාරය මෙමගින් පෙන්වයි. සමහර මිනිසුන් බොරුවට උඩගුකමින් අනිත් අයට වඩා ඉහළින් ගමන් කිරීම පෙන්වයි.
- මොණර, හංස, අශ්ව නැටුම් - පංච කාමයට ලොල් වූ විට මිනිසුන් පහත් දේ සිදු කරයි. එසේ ගමන් කරන විට තිරිසන් ලෝකයේ සතුන් වී ඊළඟ භවය සකස්වන ආකාරය පෙන්වයි. එය පෙන්වීමට විවිධ සතුන් අනුකරණය කරමින් නටමින් ගමන්කරයි.
- ලී කෙළි සහ පතුරු නැට්ටුවෝ - සමාජයේ ගැටෙන ආකාරය මෙමගින් පෙන්වයි. සසර ගමන ගැටී ගැටී යන ගමනක් බව පෙන්වයි.
- කයිතාලම්, චාමර, නෛයිඅඩ්, රබන් නැට්ටුවෝ - විවිධාකාරයෙන් නටමින් යන නැට්ටුවෝ ඇත. මෙම හරයක් නොමැති, ලෝකයා මුලා කරවන නැට්ටුක්කාර වැඩපිළිවෙල හඳුනාගෙන, සංසාර විමුක්තිය සඳහා ගමන්කරන වැඩ පිළිවෙලකට එකතු වෙන්න යන පණිවිඩය ලබාදීම මෙහි අර්ථයයි.
- කාවාඩි නැටුම් - "ක" යනු කිළුටු හෙවත් කහට ද, "වාඩි" යනු වැඩියක් හෙවත් කොටසක් යන්නයි. අවිද්‍යාවෙන් සහ තණ්හාවෙන් සිටීම මෙමෙගින් දක්වයි. තමන්ගේ කුඩා හෝ වරදක් වූවා නම් එය මේ ආකාරයට සිහිකරගෙන එයින් බැහැර කිරීම යන්න කරින් කරට කාවඩිය මාරු කර කර විසි කිරීමෙන් පෙන්වයි. එකකින් අනෙත් අතට විසි කරනවා මිස අතින් අල්ලන්නේ නැත. තම තමන් අතින් සිදුවන වැරදි ඇත්නම් ඒවා වරද වරද ආකාරයට දැක ඒවායින් බැහැර වීම මෙමගින් නිරූපණය කරයි.
- උඩරට, පහතරට, සබරගමු නැටුම් - සියලු දේශීය නැටුම් කලාවන්හි අත්, පා හසුරුවන ආකාරයෙහි ශරීරයන්හි තිබෙන විෂ කිරණ ඇද ගනිමින් අවසානයේ පොළවට බහා තබන ස්වභාවයේ රටාවක් ඇත. මෙම නැටුම් ක්‍රමය කිරණ ශක්තිය තුළින් බාහිර ලෝකයේ තිබෙන විස කිරණ පොළවට බස්වන විද්‍යාවක් වේ. මෙහිදී ගාන්ධර්ව නම් දේවතා කොටස සම්බන්ධ වේ. එම දේවතා කොටස දිව්‍යමය නැටුම් ශිල්පීන් වේ. එම දේවතාවන් නැට්ටුක්කාරයන්ගේ ශරිරයන්ට සම්බන්ධ වූ විට එම දේවතාවන්ගේ නැටුම් නටන බවට විශ්වාසයක් පවතී. මෙම විද්‍යානුකූළ නැටුම දෙස බලා සිටින විට සිත යම්කිසි මානසික සුවයකට පත් වේ.

(මෙම කරුණු පිළිබඳව මීට වෙනස් ආකාරයේ අදහස් තිබිය හැකි බවද සලකන්න. පර්යේෂණ ක්ෂේත්‍රහිදී දැක්වූ අදහස් මෙහිදී අන්තර්ගත කර ඇත).

ආගම යනු අභියෝගාත්මක සංකල්පයකි. ආගම පිළිබඳව විශ්වීය වශයෙන් එකඟවන එක් නිර්වචනයක් නොමැති අතර, අනාගතයේ එවැන්නක් තිබිය හැකි බව ද සිතිය නොහැක (ඇල්ඩ්‍රිජ්, 2007, පි. 30 උපුටා ගැනීම ගිඩ්න්ස් සහ සටින්, 2013, පි.720). ආගම පිළිබඳ ප්‍රධාන සමාජ විද්‍යාත්මක නිර්වචනයන් ත්‍රිත්වයකි. එනම්, ද්‍රව්‍යාත්මක, කෘත්‍යාත්මක සහ සමාජ නිර්මාණවාදී නිර්වචනයයි. ආගම මානව ජීවිතය සඳහා අවශ්‍ය අංගයක් බවත්, සමාජයට කෘත්‍යාත්මකව වැදගත් බවත් කෘත්‍යාත්මක නිර්වචනය තුළින් දක්වයි. ද්‍රව්‍යාත්මක නිර්වචනය එම මතයට විරුද්ධ වන අතර එම නිර්වචනය දක්වන්නේ සෑම ආගමක් මගින්ම ආනුභාවික ලෞකික ලෝකය සහ ලෝකෝත්තර යථාර්ථය අතර ප්‍රභේදනයක් ඇති කරන

බවයි (රොබට්සන්, 1970 උපුටා ගැනීම ගිඩ්න්ස් සහ සට්න්, 2013, පි. 721). ආගම යනුවෙන් තත්‍ය ප්‍රපංචයක් පවතින බව අභ්‍යුපගමනය කිරීම සහ ඒ අනුව සමාජයක් තුළ ආගම ප්‍රකට වන විවිධ ආකාරයන් ගවේෂණය කිරීම වෙනුවට, ආගම මිනිසුන් විසින් නිර්මාණය කරන ලද්දක් ලෙස හෝ ආගමෙහි අර්ථයන් සහ ස්වයංව නිර්වචනය කරනු ලබන ආගමික පුරුදු පිළිබඳව අවධානය යොමු කිරීම වඩාත් ඵලදායක බව ආගම පිළිබඳ සමාජ නිර්මාණවාදය තුළින් දක්වයි. (ගිඩ්න්ස් සහ සට්න්, 2013, පි. 722). යතාර්ථය තුළ මුසාවක් යැයි පැවසිය හැකි කිසිදු ආගමක් නැත. එම ආගම අදහන පුද්ගලයන්ටම අනන්‍ය රටාවකට අනුව ඒ සියල්ල සත්‍ය වේ, විවිධාකාර පිළිතුරු ලැබුණ ද, ඒ සියල්ලම මිනිසාගේ පැවැත්ම සමඟ සම්බන්ධ වේ. (ඩර්කයිම් උපුටා ගැනීම ස්වෙයින්, 1915: 04).

ශ්‍රී ලාංකික සමාජයේ ආගම තේරුම් ගැනීමට ආගමට අදාළ ඇදහිලි ආකෘතිය වැදගත් වේ. එහි ප්‍රධාන ලක්ෂණ 4 ක් පවතී. එනම්, සියලුම ජන කණ්ඩායම් විසින් එක් වස්තුවක් ශුද්ධ ලෙස සැලකීම, එම සමූහයේ සියලුම දෙනා එම ආචාරධර්ම පිළිපැදීම, එම සමූහයේ සියලුම දෙනා එක සමාන යාතුකර්මවල යෙදීම සහ එක් සමූහයක් ලෙස පෙනී සිටීමයි. අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයෙහි මෙම සාධක මැනවින් ප්‍රකට විය. ඒ අනුව එහි පවත්වන පූජා විධි රටාවන් කිහිපයක්ම හඳුනාගත හැකිවිය. ඉහත දැක්වූ දෛනික පූජා විධි රටාවන්ට අමතරව සතිපතා, මාසිකව සහ වාර්ෂිකව පවත්වන පූජා රටාවන් පවතී.

ආගමක් තුළ පවතින වැදගත් දෙයක් වන්නේ ආගමික විශ්වාස පද්ධතියක් පැවතීමයි. එනම්, ආගම සංස්කෘතික වන අතර ආගම යන්න විශ්වාසය මත පදනම් වූවකි, එම විශ්වාස මත පදනම් වූ යාතුකර්ම වල භාවිතාවන්ගෙන් සැදුම් ලද්දකි. ආගම මිනිසුන්ව යම්කිසි අරමුණක් කෙරෙහි යොමු කරයි.

සියලුම විශ්වාස පද්ධතීන් සහ සියලුම ඇදහීම්හි පදනම තුළ අත්‍යාවශයෙන්ම නිශ්චිත සංඛ්‍යාවක් මූලික නියෝජනය කිරීම් හෝ සංකල්ප පවතී. ඒවා විවිධත්වයකින් යුක්ත වුව ද සෑම ස්ථානයකම ඒ හා බැඳුණු සමාන, වැදගත් අරමුණු සහ ඇතැම් කෘත්‍යන් සමාන වේ.

මෙවා ආගමක් තුළ ස්ථාවර මූලිකාංග වේ (ඩර්කයිම් උපුටා ගැනීම ස්වෙයින්, 1915: 05). ඩර්කයිම්ගේ මතයට අනුව ආගමේ අවසාන කාර්යය විශ්වාස, ධර්මතා, සංකේත සහ යාතුකර්ම සමඟ සම්බන්ධ වේ (ඩර්කයිම් උපුටා ගැනීම - රත්නපාල, 2000: 54). ශුද්ධ වූ වස්තුවක් මත ඉහත සාධක පදනම් වේ. එමෙන්ම ටයිලර් ගේ අදහසට අනුව ද ආගමේ ප්‍රධාන අංග යටතට ශුද්ධ වූත්, අධිස්වභාවික වූත් වස්තූන් සහ පුද්ගලයන් පැවතීම, විශ්වාස සහ ඇදහිලි, ඇදහිලි වාද සහ යාතුකර්ම අයත් වන අතර, ඒ හරහා ධර්මතා ස්ථිරසාර කිරීම, මනුෂ්‍යා තුළ ඇතිවන දොම්නස සහ අසහනය පාලනය කිරීම අපේක්ෂිතය (ටයිලර් උපුටා ගැනීම - කුමාර, 2002: 117). මෙම ආගමික මධ්‍යස්ථානය ද ප්‍රදේශයේ සියලුම බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වූ ශුද්ධ වස්තුවකි. දෛනිකව මෙම ස්ථානයට පැමිණෙන බැතිමතුන් මල්, පහන් පූජා කරමින් අදාළ යාතුකර්මයන්හි නිරතවීම දක්නට ලැබේ. එමෙන්ම බුද්ධ ප්‍රතිමා වහන්සේ වෙත උදෑසන සහ දිවා දානය පූජා කිරීම සිදුකරයි. හේවිසි වාදනයන් මධ්‍යයේ ඒ සඳහා පේවී සිටින පිරිස් ලවා එය සිදුකෙරේ. පෙරහැර, සිල්, පිරිත් වැනි ආගමික වැඩසටහන් සහ වෙනත් ආගමික උත්සව ද පැවැත්වේ. පුද්ගලයා මත ගොඩනැගුණ විශ්වාස පද්ධතීන් මත මෙම යාතුකර්ම සිදුකරන බව සහ විවිධ සංකේත වන්දනාවට ලක්කරන බව මේ අනුව පැහැදිලි වේ.

බෝධීන් වහන්සේ වන්දනා කිරීම යන්නට විශාල සමාජ අර්ථයක් ඇති වී තිබෙන අතර, බෞද්ධයා ඊට ආරෝපණය කර ඇති ශුද්ධත්වය මත විවිධ ක්‍රම ඔස්සේ වන්දනාමාන කෙරේ (චන්ද්‍රසිරි, 1999: 100). මිනිසුන් ඒකරාශී කිරීමේ ශක්‍යතාව, ශුද්ධ වස්තුවක් වටා ගොඩනැගී තිබෙන විශ්වාස පද්ධතියක් සතුව පවතින ආකාරය එමඟින් ප්‍රකට වේ. නමුත් මෙම විහාරස්ථානයේ වර්තමානයේ බුදුන් වහන්සේට වඩා බෝධිය කෙරෙහි අවධානය යොමුවෙයි. එයට හේතු වී ඇත්තේ ඔවුන්ට ලෞකික ජීවිතයේ පවතින ගැටලුන් ය.

උදාහරණ - විභාග සමත් වීම, ග්‍රහ අපල දුරුවේවා යනුවෙන් සඳහන් කොඩි බෝධියේ එල්ලීම.

මෙලෙස සිදු කිරීම මගින් තම ආවේග සමාජයට හානිදායක නොවන අයුරින් මුදා හැරීම සමාජ පර්යාය පවත්වා ගැනීමේ දී වැදගත් වේ. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් දක්වන ආකාරයට ආගම මිනිසුන්ගේ මනස තේරුම් කිරීමට හැකි දෙයකි. එම තත්වය මත ඇතිවන රික්තකය පුරවන අවකාශය ආගම බව ඔහු දක්වන ලදී. අවිඥානික මනස තුළ අප කැමති දේවල් බහුතරයක් ඇත. නමුත් ඒවා සියල්ල අපට සම්පූර්ණ කරගත නොහැක, තෘප්ත කරගැනීමට නොහැකි වූ ආශයන් ආගම හරහා තෘප්ත කරගැනීමට උත්සහ කරයි.

මෙම පුදබිම තුළ එකිනෙකා පෞද්ගලිකව නොහඳුනන නමුත් සාමූහික බවක් වන්දනා කටයුතු හේතුවෙන් ගොඩනැගේ. මේ අනුව ආගම සාමූහික විඥාණය ගොඩනගයි. විවිධ පූජා විධි රටාවන් පවත්වයි. ජනතාවගේ විශ්වාස පද්ධතීන් මත මෙකී විධි නිර්මාණය වී ඇති අතර, ඒ හරහා ජනතාව ඒකරාශී කිරීම සිදු කෙරේ. මේ අනුව ඩර්කයිම් විසින් ඉදිරිපත් කළ, ආගම යනු ශුද්ධ විශ්වාස, ශුද්ධ පූජා විධි සහිත ඒවා සම්බන්ධ වූ ඒකීය ක්‍රමයක් වේය යන මතය තහවුරු වේ. ඩර්කයිම් ප්‍රකාශ කරන ආකාරයට කිසියම් සමාජයක ඒකාග්‍රතාවය, සාමූහික විඥාණය වර්ධනය කිරීම ආගමේ ප්‍රධානතම සමාජ කෘත්‍යන්ය (ඩර්කයිම් උපුටා ගැනීම - ජයසිංහ, 2013: 160). ඒ අනුව පොදු විශ්වාස මත සිදුකරනු ලබන පුද පූජා විධි වලදී පොදු අනන්‍යතාවය සහ තමා සමූහයක කොටස්කරුවන්ය යන හැඟීම වර්ධනය වේ.

ආගම හා බැඳුණු දේව සංකල්පය කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. එක් එක් දෙවිවරුන්ට එක් එක් කාර්යය කිරීම සඳහා විශේෂඥතාවක් සමාජය විසින් නිර්මාණය කොට ඇත. බුදුන් වහන්සේ සමග සබඳතාව අධ්‍යාත්මික කරුණක් වේ. නමුත් මිනිසුන්ට අවශ්‍ය ලෞකික අරමුණු ද පවතින නිසා දෙවිවරුන් වන්දනාමාන කිරීමට මිනිසුන් යොමු වේ. ආගම මිනිසුන් අතර ඒකාබද්ධතාවය මෙන්ම ගැටුම් ද ඇති කළ හැකිය. ග්‍රන්ථාරූඪ බුදුදහම තුළ දේව විශ්වාස නොමැති අතර නමුත් ප්‍රායෝගික භාවිතය තුළ බෞද්ධයන් දේව විශ්වාස කෙරෙහි යොමුව ඇති බව දැකගත හැකිය. වර්තමානයේ මිනිසුන්ට ප්‍රශ්න වර්ධනය වී තිබීමෙන් දේව වන්දනය ආශ්‍රිත අභිචාර විධි තුළින් මිනිසුන්ගේ මානසික ආතතිය මුදාහැරීම සිදු කරයි.

උදාහරණ - බෞද්ධ දේව ධුරාවලියට නව දෙවිවරුන් එකතු වී ඇත. ලක්ෂ්මී දෙවියන් - නව ලිබරල් ආර්ථිකය සමඟ මෙය සම්බන්ධ වේ.

ආගම තුළ පවත්නා ශුද්ධ වස්තු හරහා පූජනීයත්වය ගොඩනැගේ. එදිනෙදා ජීවිතයේ අප භාවිතා කරන දේ ද සන්දර්භය අනුව ශුද්ධ වස්තු බවට පරිවර්තනය කළ හැකිය.
උදාහරණ - දළදා කරඬුව, පිරිත් පැන්, පිරිත් නූල්, බුද්ධ පූජාව.

ශුද්ධ වස්තු මත ආගම ගොඩනැගේ. ඩර්කයිම් දක්වන්නේ තෝටමයකට වන්දනා කිරීම තුළින් මිනිසුන් එම තෝටමය ශුද්ධත්වයට පත්කළ තමන්ටම වන්දනා කරගනු ලබන බවයි. එකම ශුද්ධ වස්තුවකට වන්දනා කිරීම මගින් ඇතිවන සාමූහික විඥාණය සමාජය නිර්මාණය කරයි. මේ අනුව ආගම තුළින් ප්‍රධාන කෘත්‍යයන් 3ක් ඉටුකරන බව ඔහු දක්වන ලදී. එනම්, සමාජ සංසක්තිකභාවය, සමාජ පාලනය සහ ආගමට දේශපාලන පද්ධතිය සාධාරණීකරණය සහ සමාජයේ සදාචාර පද්ධතිය ඉගැන්වීම යනාදියයි.

උදාහරණ - කුසල - අකුසල, පින් - පව් යනාදී සංකල්ප.

මිනිසුන්ට ජීවිතය තේරුම් ගැනීමට තිබෙන ප්‍රධාන ප්‍රශ්න වලට ආගම මගින් පිළිතුරු ලබා දෙයි. මිනිසුන්ගේ විශ්වාස පද්ධතිය මත ගොඩනැගුනු භාවිතයන් ප්‍රකාශ වන එක් ස්ථානයක් වන්නේ ආගමික සිද්ධස්ථානයන්ය. මිනිසුන්ට ඇති විශ්වාස මත එම ස්ථානයන් ආගමික සංස්ථාවන් බවට එළිදැක්වී ඇත. එම විශ්වාසයේ භෞතික ප්‍රකාශනය ලෙස යාතුකර්ම සිදු කරයි. යාඥා කිරීම, බුදුන්ට පූජා කිරීම, ගාථා කීම ආදිය මගින් එම විශ්වාසයන් ප්‍රකාශ වීම සිදුකරයි. ආගම සමග බැඳුණු වටිනාකම් පද්ධතියක් ඇත (උදාහරණය - සුදු ඇඳගෙන පන්සල් යාම).

ආගම පිළිබඳ සාකච්ඡා කිරීමේ දී අධි මානුෂික බලවේග පිළිබඳව සාකච්ඡා කිරීම ද වැදගත් ය. මිනිසුන්ට වඩා බලයක් එයට ඇති බවට විශ්වාසයක් පවතී. මිනිසුන්ට හොඳ සහ නරක යන ද්විත්වයම කළ හැකි, මිනිසුන්ට වඩා බලවත් යමක් ලෙස මිනිසුන් ඒ පිළිබඳව සිතයි. එම අධිස්වාභාවික බලවේග කෙරෙහි යොමු වූ සදාචාරමය කාර්යභාරයක් ඇත. මිනිසුන්ගේ විශ්වාස අපට පැහැදිලි වන්නේ චර්යාව හරහාය, ඒවා ආගමේ භක්තිය පිළිබඳ ප්‍රකාශනය වන මාධ්‍ය වේ. විශ්වාස පද්ධතියක් නොමැතිව ආගමක් නොපවතී.

ආගම යනු සංස්කෘතික පද්ධතියක් වේ. එය තුළ සංකේතාත්මක පද්ධතියක් ඇත. එය තුළින් මිනිසා තුළ යම් බලයක් ඇති කරයි. ඒ බලය කෙරෙහි මිනිසුන් යොමු කිරීම, එම බලයෙන් විවිධ උදව් උපකාර ගැනීමට මිනිසුන් දරන උත්සාහය ලෙස ද ආගම දැක්විය හැකිය. මිනිසුන්ව අභිප්‍රේරණයට ලක්කරන්නේ එම ප්‍රධාන බලයෙන් තමන්ගේ ප්‍රශ්න වලට දේවල් ලබා ගැනීමටයි. එම බලය සංකේත හරහා ප්‍රකාශ වේ.

උදාහරණ - බුදුන් වහන්සේගේ බලය වර්තමානයේ ප්‍රකාශ වන්නේ දන්ත ධාතුව හරහාය. ඒ සඳහා පුදපූජා පැවැත්වීමට වාර්ෂික දළදා පෙරහැර මෙම විහාරස්ථානයේ ද පවත්වයි.

මිනිසුන්ගේ ආගමික ලෝක දැක්ම බුද්ධ, ධම්ම, සංඝ ලෙස ධුරාවලියක් සකස්ව ඇත. ලෝක දැක්ම හරහා ආගම සංවිධානය වී ඇත.

උදාහරණ - විහාර ගෙවල් වල අපාය ඇද තිබීම. විහාර ගෙවල් සාදා තිබෙන්නේ ද මෙම ලෝක දැක්ම/ ධූරාවලියේ ආකාරයටයි.

ලෞකික සහ ලෝකෝත්තර ජීවිතයේ යහපැවැත්ම සඳහා වැදගත් වන පණිවිඩ රැසක් විවිධ සංකේත යොදාගනිමින් ආගම මඟින් සන්නිවේදනය කරයි. ආගමක් හඳුනාගැනීමේ දී සුවිශේෂ ලක්ෂණයක් වන්නේ මිනිසුන් තුළ ඇතිවන ආගමික හැඟීමය (උදාහරණ - සාධු කීම, ධාතු වැඩමවීම, දේවරූප වැඩමවීම ආදියෙහිදී සිදුකරන හැඟීම් ප්‍රකාශනය). අධි ස්වාභාවික වස්තූන් සමඟ මිනිසුන් සන්නිවේදනය කරයි. එම සන්නිවේදනය විවිධ ආකාරයට සිදුවිය හැකිය.

උදාහරණ -

- බෝධි පූජාවක් සිදුකරන විට බෝධියත් සමඟ සිදුකරන සන්නිවේදනය.
- බැතිමතා සහ දෙවියන් අතර සන්නිවේදනය ඍජුව මෙන්ම කපු මහතා, ස්වාමීන්වහන්සේ ආදී ලෙස යම් පුද්ගලයෙක් මැදිහත්ව ද සිදුකරයි.
- නාථ දේවාලයට ගොස් පඬුරු ගැටගැසීම.

**ගෝලීයකරණය සහ බෞද්ධ ආගමික ස්ථානයක කාර්යභාරය**

ආගම විවිධ සමාජ සන්දර්භයන්ට ඇතුලු වනවිට වෙනස් වීම මත ග්‍රන්ථාරූඪ ආගමික කරුණු සහ ප්‍රායෝගිකව සමාජයේ ක්‍රියාත්මක වන ආගම අතර වෙනසක් දක්නට හැකිය. ගෝලීයකරණය වැනි සාධක සමඟ නව ආගමික ප්‍රවණතා නිර්මාණය වේ. කැසනෝවා දක්වන ආකාරයට ආගම සමාජය තුළ පුළුල් කාර්ය භාරයක් ඉටු කරයි. ඔහු දක්වන ආකාරයට පශ්චාත් නූතන සමාජය තුළ ආගම පොදු අවකාශයට පැමිණ ඇත. ගෝලීයකරණය වූ ලෝකය තුළ ගෝලීය ආගමක් දක්නට ඇත. විද්‍යාව, තාක්ෂණය, සාක්ෂරතාව අධ්‍යාපනය මත නූතන ජන ජීවිතයකට මිනිසුන් සකස් වන විට ආගමෙන් බැහැර වනවා සිතුවත් ලෝකයේ ආගම වේගයෙන් නැවත පැමිණෙමින් ඇත.

ගෝලීයකරණය තුළ වර්තමානයේ ආගමට වෙමින් පවතින තත්වය පිළිබඳව **බර්ජර්** සාකච්ඡා කරයි. එහිදී ඔහු දක්වන ප්‍රධාන න්‍යායික අදහස් ද්විත්වයක් වැදගත් වේ. එනම්,

- **සුවිශේෂතාවාදය**
- **විශ්වාන්තරවාදය**

සුවිශේෂතාවාදීන් දක්වන ආකාරයට පොදු විවේචනාත්මක චින්තනයක් හෝ ප්‍රමිතීන් නොමැත (ගෝල්ඩ්බර්ග්, 2011).

ආගම පිළිබඳ විශ්වාන්තරවාදය යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ විශ්වීය පැතිකඩයන් සඳහා උනන්දු කරවන, මානව ප්‍රමිතියක් ලෙස ආගම දැකීමයි. සියලුම නිර්මාණයන් ආරක්ෂා කළ යුතු බව සහ ඒවා පිළිබඳව සැලකිලිමත් විය යුතු බව විශ්වාන්තරවාදය තුළින් දක්වයි. එයට අනුව ආගම අන්තර්කරණ මාර්ගයක් ද වේ. මූලික කරුණු පිළිබඳව ආරක්ෂාව සපයමින්, මනුෂ්‍ය අත්දැකීම්හි විශ්වීයභාවය විශ්වාන්තරවාදය විශ්වාස කරයි, මානව සංහතියේ එකමුතුභාවය, සංහිදියාව සහ තිරසාර බව ඇතුළත්

සමාජීය වශයෙන් සවිඥානික ලෝක පර්යායක් පිළිබඳව විශ්වාන්තරවාදීන් අවධාරණය කරයි (ශ්වොර්ට්ස්, 2007).

ඔහු දක්වන්නේ දක්වන්නේ වර්තමානයේ අප ගෝලීය තත්වයක ජීවත් වන බවයි. මිනිසුන්, සංස්කෘතිය, ශිෂ්ටාචාර සහ ලෝකය යන සියල්ලම පෙරනොවූ විරූ ලෙස, නමුත් මඟහැරිය නොහැකි ලෙස එකිනෙකට සම්බන්ධ වීමේ වේගය වැඩිවෙමින් පවතී. මිනිසුන් සංක්‍රමණය වීමේ වේගය වැඩි වී ඇත. එමනිසා ලොව ප්‍රධාන සංසිද්ධි ද්විත්වයක් ලොව ඇතිවිය හැකිය. විවිධ සංස්කෘතීන් සහ ආගම් වේගයෙන් එකිනෙකට හමුවීමෙන් ගැටුම් ඇතිවීමේ විභවතාවන් වැඩිවිය හැකිය. මෙම එකිනෙකට වේගයෙන් හමුවීම තුළ ඒවා අතර ගැටුම් අඩුවීමේ හැකියාවක් ද ඇත. සුවිශේෂතාවාදය යනු කිසියම් සංස්ථාවක, සමාජයක කණ්ඩායමක තිබෙන සුවිශේෂී ගුණාංග වඩාත් අවධාරණයයයි. එය තුළ විශේෂයෙන්ම ජාතික, ප්‍රාදේශීය, සංස්කෘතීන් සහ ආගම යනාදී ඒවා අතර වෙනස පිළිබඳව අවධානය යොමුකරයි. එනම්, සියලු සමාජ සහ මිනිසුන් අතර තිබෙන සමානකම් මූලිකව අවධාරණය කරයි. වර්තමානයේ ලෝකය තුළ ප්‍රධාන උප පද්ධති ත්‍රිත්වය ලෙස වැදගත්ව ඇත්තේ දේශපාලන, විද්‍යාත්මක සහ ආර්ථික පද්ධතියයි. ගෝලීය කාර්යභාරයක් ආගම තුළ නොමැති නම් ආගම වර්තමානයේ වඩාත් වැදගත් වන්නේ මිනිසුන්ගේ පෞද්ගලික ප්‍රශ්නවලට විසඳුම් සොයන ක්‍රමයක් ලෙසයි. ආගම තමාට තිබූ පොදු විශ්වීය අවකාශය කිසියම් දුරකට පෞද්ගලික අවකාශය දක්වා පසුබැස ඇත. එනිසා සත්‍ය වශයෙන්ම ගෝලීය තත්වය තුළ වී ඇත්තේ ආගම කුඩා කුඩා නිකායන්, ඇදහිලි කණ්ඩායම් සහ කුඩා සමූහයන් ලෙස පසුබැස ඇත.

උදාහරණ - ඉෂ්ට දේවතා යන සංකල්පය මතුව ඇත. මෙම සංකල්පය මඟින් අතීතයේදී පොදු වූ දෙවියන් තමන්ගේ දෙවියන් ලෙස පෞද්ගලික බවට පත්කොටගෙන ඇත. ඉහත දී දැක්වූ වර්තමානයේ වැදගත් පද්ධතීන් වන දේශපාලන, විද්‍යාත්මක සහ ආර්ථික උප පද්ධතීන් වර්තමානයේ අර්බුදයකට පත්ව ඇත. මෙම අර්බුදය හේතුවෙන් ගෝලීයකරණය සහ නූතනත්වය මත ඇති වී තිබෙන මෙම උප පද්ධති මගින් මිනිසාට ඇතැම් ප්‍රශ්න නිර්මාණය කර දී ඇත.

උදාහරණ - රැකියා විරහිත බව, දරිද්‍රතාව

මෙම තත්වය මත තම අනන්‍යතාවය ප්‍රකාශ කරන මාධ්‍යක් ලෙස ආගම නැවත පුනර් උදාවකට ලක්කර ඇත. ගෝලීයකරණය තුළ මිනිසුන්ගේ අනන්‍යතාව අර්බුදයකට පත්ව ඇත. සංක්‍රමණය පෙර නොවිරූ ලෙස වේගයෙන් වර්ධනය වීමත් සමඟ පිටමං සමාජ (Diaspora) ලෝකයේ සෑම රටකම පාහේ නිර්මාණය වී ඇත. එම පිටමං සමාජ සාමාජිකයන්ගේ අනන්‍යතාවය තම රටින් පිටත දී ප්‍රකාශ කිරීමේ මාධ්‍යක් බවට ආගම පත්ව ඇත. මිනිසුන් හුදකලාවට පත්වීම වර්ධනය වනවිට ආගමට නැඹුරු වීම ද වර්ධනය වේ. නූතනත්වය පිළිබඳව අදහස් දැක්වූ චින්තකයෙක් වන ඩෙරිදා ද දැක්වූයේ ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් ලෙස ආගම නැවත පැමිණෙන බවයි. ගෝලීයකරණ තුළ අනන්‍යතාව වියැකී යාම තුළ තම තමන්ගේ ආගම පදනම් කරගත් ජාතිකවාදය නිර්මාණය වීමේ අවදානමක් ද පවතී. ගෝලීය ප්‍රවණතාවන්ට ප්‍රතිපක්ෂව විශේෂයෙන් ගෝලීය ප්‍රවණතාවයන් හේතුවෙන් බහිෂ්කරණයට සහ තර්ජනයට ලක්වන තත්වයන් තුළ යම් ආකාරයක අස්වැසිල්ලක් ලබාදීමට ආගම වැදගත්ව ඇත. සාමූහික සහ පොදු අනන්‍යතාව යන ද්විත්වයටම ආගම වැදගත් වේ. පිටමං

සමාජයන්හි අවශ්‍යතා ඉටු කිරීමේදී ආගම වැදගත් වේ. (එම පුද්ගලයන්ට අධ්‍යාත්මික සුවය ලබා දීමට විදේශයන්හිදී සිදුකරන වැඩසටහන්, පෙරහැර සජීවීව ලෝකය පුරා විකාශය).

**ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණය සහ බෞද්ධ ආගමික ස්ථානයක කාර්යභාරය**

ක්ෂේත්‍ර දත්ත තුළින් පැහැදිලි වූ ආකාරයට මෙම විහාරස්ථානයෙහි පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් වැඩි වශයෙන් ආගමික කටයුතු වල නිරත වේ, පුරුෂයන්ට පවතින ආර්ථික පීඩනය හේතුවෙන් ඔවුන් ආගමික කටයුතු වල නිරත වීම ස්ත්‍රීන්ට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. පන්ති, ආගම්, අධ්‍යාපන මට්ටම් සහ වයස අනුව විභේදනයක් නොමැතිව පුද්ගලයන් ආගමික කටයුතු සඳහා විහාරස්ථානය වෙත පැමිණෙති. ස්ත්‍රිය ආගම තුළ ප්‍රතික්ෂේප කිරීමට ලක්වන බව ස්ත්‍රීවාදී මතයයි (උපුටා ගැනීම - ලියනගේ සහ වලාකුළුගේ, 2004, පි. 46). නමුත් බෞද්ධ ආගමික සිද්ධස්ථාන වන පන්සල්, බෝධීන් වහන්සේලා පදනම් කරගත් ආගමික සිද්ධස්ථාන වෙත ළඟාවීමට ස්ත්‍රියට තහනමක් නැත.

සමාජය පුරුෂාධිපත්‍යය සහිත සමාජයක් වීම තුළ ආගම ද පුරුෂාධිපත්‍ය සහිත සමාජ සංස්ථාවක් වීම දක්නට හැකිය. ඒ අනුව ආගම තුළ ද ස්ත්‍රී - පුරුෂ සමාජභාවී අසමානතා නිරීක්ෂණය කළ හැකිය. ආගම තුළ ආගමික විශ්වාස පද්ධතිය වැදගත් වන අතර ස්ත්‍රිය යම් ආකාරයකට ආගමික මතවාදය තුළ පුරුෂාධිපත්‍යයට යටත්කොට ඇත. ස්ත්‍රීවාදීන් එයට සාක්ෂි කිහිපයක් ඉදිරිපත් කරයි. එනම්, ආගමික සංවිධානය, ඇතැම් වන්දනාමාන කරන ස්ථාන පුරුෂ කේන්ද්‍රීයව නිර්මාණය වී ඇත (උදාහරණ - මෙම විහාරස්ථානයේ පෙරහැරෙහි කටයුතු සඳහා සහභාගි විය හැක්කේ පුරුෂයන්ට පමණයි. විහාරස්ථානයේ මූලික කටයුතු, තීරණ ගැනීමේ සහ නායකත්ව මට්ටමෙහි පුරුෂයන් විසින් සිදුකරයි). ප්‍රධාන ආගමික ග්‍රන්ථයන්හිද කාන්තාවන් සම්බන්ධ කොට ගනිමින් තිබෙන කතා ඉතාමත් අඩු අතර සමහර කතා පැවතිය ද ඒවා තුළ කාන්තාවට අඩු වැදගත්කමක් ආරෝපණය කර ඇත. ස්ත්‍රී ආගමක් නොමැති බවත්, තිබෙන්නේ පුරුෂ ආගමක් බවත් ස්ත්‍රීවාදීන් තර්ක කරයි. ඔවුන්ට අනුව ආගමික නීතිරීති සහ චාරිත්‍ර වාරිත්‍ර තුළත් ස්ත්‍රියට ලබා දී ඇත්තේ අඩු වටිනාකමකි, ආගම තුළින් ද කාන්තාව සම්ප්‍රදායික සහ ප්‍රජනන භූමිකාවට සීමා කර ඇත.

එසේ වුව ද ආම්ස්ට්‍රෝන් (1993) දක්වන්නේ නිරන්තරයෙන්ම ආගම කාන්තාවන් යටපත් කරන බව කිව නොහැකි බවයි. ඇතැම් ආගම් වල දෙවඟනන් සිටින බව ද ඇය දක්වයි. මෙරට භික්ෂුණී ශාසනය පැවතීම, බෞද්ධ භික්ෂුණීන් සිටීම, පත්තිනි, කාලි සහ ලක්ෂ්මී වැනි දෙවඟනන් සිටීම එයට උදාහරණ ලෙස දැක්විය හැකිය. නමුත් ඒක දේවවාදයට නැඹුරු වීම තුළ මෙය එතරම් දක්නට නොමැත. බහු දේවවාදය තුළ ද මෙය තවමත් දැකිය හැක්කේ අවම වශයෙනි. නමුත් ආගම තුළ පුරුෂ මූලික බවක් නොමැති බව ඇය දක්වන අදහසෙන් ඉදිරිපත් නොවේ. මේ සියල්ල සංස්කෘතික ගොඩනැගීම් බව ස්ත්‍රිවාදීහු දක්වති. ජීව විද්‍යාත්මක වෙනස භාවිතා කර සංස්කෘතික නිර්මිතයන් සිදුකිරීම මේවා මඟින් සාමාන්‍යකරණයට/ ස්වාභාවික තත්වයක් බවට පත්කර ඇත. මෙම විහාරස්ථානයේ ද දෙවඟනන් වන්දනය දක්නට හැකිය.

**විහාරස්ථානයෙහි පරිපාලන ව්‍යුහය සහ කාර්යභාරය**

ඕනෑම ආගමික ස්ථානයක පැවැත්ම සහ සංවර්ධනය උදෙසා එහි පරිපාලන ව්‍යුහය වැදගත් වේ. වෙබර් දක්වන ආකාරයට විවිධ සංවිධාන කාර්යයන්හි නියැලී සිටින සාමාජිකයන් සමූහයක් හසුරුවන සහ සම්බන්ධීකරණය කරනු ලබන විධිමත් සංවිධානාත්මක ව්‍යුහයක් නිලබල ක්‍රමයකි (වෙබර් උපුටා ගැනීම ජයසිංහ, 2013: 219). ඒ අනුව මෙම විහාරස්ථානයේ පරිපාලන ව්‍යුහය ගත්කළ ඒ තුළ ද ඉහළ සිට පහළට විහිදී යන බල ධුරාවලියක් පවතින බව කිව හැකිය. මෙහිදී බලය සහ වගකීම් ක්‍රමක්‍රමයෙන් පහළට ගලා එයි. වෙබර් ප්‍රධාන ආධිපත්‍ය ප්‍රවර්ග 3ක් පිළිබඳව අදහසක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ඒවා නම්, සාම්ප්‍රදායික ආධිපත්‍යය, කැරිස්මා ආධිපත්‍ය සහ නෛතික/ තාර්කික ආධිපත්‍ය වේ (වෙබර් උපුටා ගැනීම ජයසිංහ, 2013: 241). සාම්ප්‍රදායික ආධිපත්‍යය දී සම්ප්‍රදායන් සහ සිරිත් විරිත් මත ක්‍රියාත්මක වන අතර කැරිස්මා ආධිපත්‍ය පුද්ගලයෙකුගේ පෞද්ගලික ගති ස්වාභාවය මත ඇතිවේ. නෛතික නොහොත් තාර්කික ආධිපත්‍ය නීතිමය පද්ධතියක් මත ගොඩනැගුණු ආධිපත්‍යකි (වෙබර් උපුටා ගැනීම ජයසිංහ, 2013: 241). මෙම විහාරස්ථානයේ නායක ස්වාමීන්වහන්සේ ප්‍රදේශය තුළ කැරිස්මා සහ සම්ප්‍රදායික ආධිපත්‍යක් දරයි.

ආගමේ කාර්යභාරය පිළිබඳව අධ්‍යයනය කරනු ලබන සමාජ විද්‍යාඥයන්ට අනුව ආගමේ ප්‍රධාන කාර්ය භාරයක් වන්නේ මිනිසුන්ව ආගමට බැඳ තබා ගැනීමයි. මෙම ආගමික සිද්ධස්ථානය තුළ මෙම කරුණ මැනවින් ඉටුවනු දක්නට ලැබේ. පවතින පරිපාලන ව්‍යුහය විසින් සංවිධානාත්මකව සැලසුම් කර පවතින සමාජ, ආගමික සහ සංස්කෘතික වැඩසටහන් හේතුවෙන් ඒ වටා සුවිශාල ප්‍රජාවක් ඒකරාශි වී සිටී. ඒ හරහා මිනිසුන් ආගමට බැඳ තබා ගැනීමක් සිදු වී තිබේ. විශේෂයෙන්ම මෙහිදී වෙබර්ගේ මෙලොවට බර සහ පරලොවට බර ආගම් පිළිබඳ විග්‍රහය වැදගත් වේ. බුදුදහම යනු පරලොවට බර ආගමක් බව වෙබර් දක්වා තිබේ (වෙබර් උපුටා ගැනීම පෙරේරා, 2014: 179). එනම්, එය මරණින් මතු ජීවිතය පිළිබඳව පුද්ගලයාව උනන්දු කරවයි. මෙලොව වශයෙන් පුණ්‍ය ක්‍රියාවන්හි නිරතවීම පරලොව යහපත පිණිස හේතුවන බව බෞද්ධ විශ්වාසයයි. එබැවින් බෞද්ධයන් මෙවැනි ආගමික මධ්‍යස්ථාන වෙත ඒකරාශී වී මුල්‍යමය, ද්‍රව්‍යමය ආධාර සිදුකරන අතර එහි ප්‍රතිලාභ ලබන සමාජයේ විවිධ සමාජ මට්ටම් වල ජනතාව ද එය හේතු කරගනිමින් මෙවන් ආගමික මධ්‍යස්ථාන වෙත ආකර්ෂණය වේ. වෙබර්ට අනුව, බුදු දහම යනු විමුක්තිකාමීත්වය අරමුණු කරගත් භික්ෂුන්ගේ ආගමකි, එහිදී ගිහියාට යමක් කිරීමට නොමැති බව ඔහු ඉන් අදහස් කර තිබේ (වෙබර් උපුටා ගැනීම ජයසිංහ, 2013: 157). නමුත් මෙම විහාරස්ථානය සම්බන්ධව ගත්කළ වෙබර් ගේ මෙම මතය අභියෝගයට ලක්වේ. විහාරස්ථානයෙහි පරිපාලන සහ කාර්යභාරය සම්බන්ධයෙන් ගිහියන්ද සහභාගී වන අතර මෙම ආගමික මධ්‍යස්ථානය ගිහි ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා සුවිශාල කාර්යභාරයක් සිදුකර ඇතිබව විද්‍යාමාන වේ. එබැවින් මෙම ආගමික මධ්‍යස්ථානය බෞද්ධ ජනයාගේ ලෞකික සහ ලෝකෝත්තර යන දෙඅංශය සඳහාම උපකාරී වේ.

ඩර්කයිම්ගේ විග්‍රහයට අනුව ආගමික වත්පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට ගොඩනගාගත් ආගමික සංවිධාන පැවතීම ආගමක දැකිය හැකි මූලික ලක්ෂණයකි (ඩර්කයිම් උපුටා ගැනීම - ජයසිංහ, 1996: 96). බුදුදහමට අදාළව ගොඩනැගී ඇති ආගමික සංවිධානයක් ලෙස ඉහත විහාරස්ථානය හැඳින්විය හැකිය. එමෙන්ම බුදුදහම හා බද්ධ වූ වත්පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට මහජනයා මෙම මධ්‍යස්ථානය වෙත ඒකරාශී වන අතර ඒ අනුව ආගම සාමූහික ක්‍රියාවක් බවට පත්වේ.

සමාජය සහ ආගම අතර ද්වන්ධාත්මක සම්බන්ධතාවක් පවතී (කුමාර, 2001: 115). මේ හේතුවෙන්ම ශුද්ධ වස්තූන් ලෙස සැළකෙන ආගමික මධ්‍යස්ථානයන්හිද ශුද්ධ නොවන දේද පවතින අතර, ශුද්ධ නොවන ක්‍රියාවන් සඳහා සහභාගී වීම දක්නට ලැබේ. මෙම විහාරස්ථානය තුළ ද ලෝකෝත්තර සහ ලෞකික වැඩසටහන් ක්‍රියාත්මක වේ.

මාක්ස් ගේ අදහස් අනුව, සමාජයේ පවතින  ධනපති පන්තියේ සහ නිර්ධන පන්තියේ පැවැත්ම සම්බන්ධයෙන් ආගම බලපෑම් කරයි (මාක්ස් උපුටාගැනීම - ජයසිංහ, 2013: 167). ධනවාදය පවත්වාගෙන යාමට සහ පරලොව පිළිබඳ සංකල්පය හඳුන්වා දෙමින් මිනිසා පීඩනයට ලක්කිරීමට ආගම සහය දක්වන බවට තවදුරටත් මාක්ස් දක්වා තිබේ. පරලොව යහපත උදෙසා ධනය උපයා දන්දිය යුතුය යන මතයට මාක්ස් එරෙහි වේ. නමුත් මෙම ආගමික මධ්‍යස්ථානය තුළ ක්‍රියාකාරිත්වය ගත්විට ධනපති පන්තිය විසින් සිදු කරන ආධාරයන්, නිර්ධනයන්ගේ සුභසාධනය උදෙසා භාවිතා වන අවස්ථා රැසක් පවතින බැවින් මාක්ස්ගේ මතය අභියෝගයට ලක්වේ.

සමාජයේ විවිධ ස්තර නියෝජනය කරන පිරිස් කිසිදු බාධාවකින් තොරව මෙම ස්ථානයට පැමිණෙයි. එමඟින් පැහැදිලි වන කරුණක් නම් කිසිදු අධ්‍යාපනික, වෘත්තීය භේදයකින් තොරව නිර්ධන, ධනපති පන්ති නියෝජනය කරන්නන් මෙම ස්ථානය සම්බන්ධ විශ්වාස පද්ධති, යාතුකර්ම අනුගමනය කරන බවයි.

## නිගමන

ලෞකික සහ ලෝකෝත්තර අරමුණු  සාධනයෙහිලා බෞද්ධ ආගමික ස්ථානයන් තුළින් වැදගත් කාර්යභාරයක් සිදුකරයි. මිනිසුන් ආගම වෙත යොමුවන අරමුණු සහ ඒවා සඳහා යොමුවන පුද්ගලයන්ගේ ස්වභාවය විවිධ සමාජ, ආර්ථික සහ සංස්කෘතික සාධක මත වෙනස් වේ.  ආගමික විශ්වාස පද්ධතිය, යාතුකර්ම සහ සමාජය අතර සම්බන්ධතාවයේ ස්වරූපය පිළිබඳව නිශ්චිත එක් නිර්වචනයක් ලබාදිය නොහැකි වුව ද ආගම මිනිස් ජීවිතයේ වැදගත් පැතිකඩකි. ආගම මානව සමාජයේ ආරම්භයේ සිටම විවිධාකාරයෙන් පරිනාමණයට සහ විකාශයට පත්වෙමින් පැවත එන්නකි. ඒ තුළ කෘත්‍යයන් මෙන්ම දුෂ්කෘත්‍යයන් ද දක්නට ලැබේ. ආගම සහ සමාජය අතර පවතින සබඳතාවය විවිධාකාර සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන් සහ පර්යාවලෝක ඇසුරින් විග්‍රහ කළ හැකිය. බොහෝ අවස්ථාවන්හිදී ආගමෙහි කාර්යභාරයක් වන්නේ මිනිසුන්ට පිළිතුරු සපයාගත නොහැකි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමයි, එය යථාර්ථවාදී වීමට වඩා මිනිසුන් එයින් අපේක්ෂා කරන්නේ මානසික සහනයක් බවද දැක්විය හැකිය. ආගම තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳුණු සහ බලය, ධුරාවලිය සම්න්බන්ධව පවතින මතවාද සහ අගතීන් පවතී. ආගමික අභිචාර, යාතුකර්ම සහ විශ්වාසයන් බොහෝවිට මානව ජීවිතයේ සංසිද්ධි සහ අර්ථ සමඟ බැඳී පවතී. ඓතිහාසික වශයෙන් පරම්පරා ගණනාවක් තිස්සේ සිදුකරන ඇතැම් පුජාවිධි සහ යාතුකර්ම තවමත් මෙම විහාරස්ථානය තුළ සිදු කෙරේ. ඇතැම් ඒවා විදේශ ආක්‍රමණ සහ ජන සම්මිශ්‍රණ යනාදී විවිධ හේතු මත වෙනස් ස්වරූපයක් ගෙන ඇති වුවත් තවමත් අඛණ්ඩව සිදුකෙරේ. ඒවා සමඟ සියවස් ගණනාවක් තිස්සේ මිනිසුන්ගේ ලෞකික සහ ලෝකොත්තර ජීවිත සමඟ බැඳි අර්ථ සහ වටිනාකම් සම්බන්ධව ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ද සිල්වා, ප්‍රේමකුමාර සහ අත්තනායක, අබේරත්න (දෝෂි, එස්., එල් සංස්කරණය)., 2016, **නූතනත්වය, පශ්චාත් නූතනත්වය සහ නව සමාජ විද්‍යාත්මක න්‍යායයන්,** කොළඹ 10: ෆාස්ට් පබ්ලිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

චන්ද්‍රසිරි, ලියනමගේ., 1999. **වෘක්ෂ වන්දනාවේ ඓතිහාසිකත්වය හා ජන විඥානය තුළ ඇගයෙන බෝධි පූජාව**, කොළඹ 10 : එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, ඒ.කේ.ජී., 2013. **සමාජ විද්‍යාව: මූලික සංකල්ප - 2,** කඩවත: කඩුල්ල ප්‍රකාශකයෝ.

පෙරේරා, ටෙනිසන්., 2014. **සමාජ විද්‍යාව: සමාජය හා සංස්කෘතිය,** කඩවත : නුවණි ප්‍රකාශන.

රජමහා විහාරය පිටකෝට්ටේ., 2017. ***සිරි දළදා මහා පෙරහැර,*** කතෘ ප්‍රකාශනයකි.

රත්නපාල, නන්දසේන., 2000. **සමාජ විද්‍යාවේ මූලධර්ම**, මල්වාන: ආර්.එස්. ප්‍රින්ටෙක් ප්‍රයිවට් ලිමිටඩ්.

ලියනගේ, කමලා සහ වළාකුළුගේ, සුමුදු., 2006. **ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය**, කොළඹ 04: ෆෙඩ්රික් ඊබට් පදනමේ ප්‍රකාශන.

හේමන්ත, කුමාර., 2001. **සමාජ විද්‍යාවේ මූලික සංකල්ප, න්‍යාය හා ක්‍රමවේද**, මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

Haralambos, M & Heald, R., 1980. **Sociology: Themes and Perspectives**, New Delhi: Oxford University Press.

Giddons, Anthony & Sutton, Philip., 2013. **Sociology** *(*7th ed.), Hoboken: John Wilsey & Sons.

Goldberg, Ilan Y., 2011. **Reasoning and Religion: The Relevance of the Academic Study of Religion to Critical Thinking Pedagogy.** Author Publication, accessed on 11th September 2023, https://researchcommons.waikato.ac.nz/bitstream/handle/10289/5325/thesis.pdf?sequence=3

Schwartz, Shalom H., 2007. Universalism Values and the Inclusiveness of our Moral Universe **In Journal of Cross-Cultural Psychology, *38,* 711-728** The Hebrew University of Jerusalem, accessed on 8th September 2023, https://www.researchgate.net/publication/242128996_Universalism_Values_and_the_Inclusiveness_of_Our_Moral_Universe

Seneviratne, H.L., 1990. Reviewed Work: Buddhism Transformed: Religious Change in Sri Lanka by Richard Gombrich, Gananath Obeyesekere In **Ritual and Power, Vol. 4, No. 2,** Published by Stewart Pamela J. and. Strathern Andrew J, accessed 8th September 2023, https://www.jstor.org/stable/44368496

Swain, Joseph., Ward., 1915. **The Elementary Forms of Religious Life** (English Translation), London: George Allen & Unwin Ltd, accessed on 12th February 2020, https://archive.org/details/elementaryformso00durk

# මහායාන බෞද්ධ දර්ශනයෙහි එන දශ භූමි පිළිබඳව අධ්‍යයනයක්

## A Study about Dasabhumi of Mahayana Buddhism

*K.W.D Nujitha*

*Department of Pali & Buddhist, university of Ruhuna*

**ප්‍රවේශය**

බෞද්ධ දර්ශන විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රධාන තැනක් උසුලන අංශයක් ලෙස මහායාන බෞද්ධ සම්ප්‍රදාය දැක්විය හැකිය. මහායාන බෞද්ධ දර්ශනයෙහි එන දශ භූමීන්ගේ විශේෂතා පිළිබඳව විමර්ශනය කිරීමට පෙර, මහායාන සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳව කෙටියෙන් මෙසේ දැක්විය හැක. එනම්, මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ප්‍රභවය සිදු වී ඇත්තේ ක්‍රි.ව. 1 වන සිය වසයේ දී ය. එනම්, ඉන්දියාවේ කණිෂ්ක රාජ්‍ය යුගයේ දීය. මෙම රාජ්‍ය කාලය තුළ කාෂ්මීරයේ ජාලන්දර නම් ස්ථානයේ දී මෙම රජතුමාගේ අනුග්‍රහයත් සමග පාර්ශව හා අශ්වඝෝෂ තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සිව්වන ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් ලෙස මහායාන බෞද්ධ සම්ප්‍රදාය බිහි විය. කෙසේ නමුත් පෙළ දහම තුළ කරුණු අනාවරණය වන්නේ මෙහි මූලාරම්භය දෙවැනි සංගීතියෙන් පසුව වජ්ජිපුත්තක හිමිගෙන් ආරම්භ වූ මහාසංඝික නිකායෙන් බවය. කෙසේ වෙතත් කණිෂ්ක රාජ්‍ය සමය වන විට මෙය තරමක් දුරට විකාශය වූ බව මත ඉදිරිපත් වී ඇත. මහායාන බෞද්ධ සම්ප්‍රදායට අයත් සුවිශේෂ දර්ශනයක් ඇත. එනම්, "මහායාගයේ පොදු දර්ශනයයි. විමුක්තිය සඳහා බුද්ධ යානය එම දර්ශනයයි". යනුවෙන් එම ප්‍රකාශය මඟින් අර්ථකථනය කරනු ලබන්නේ නිවන අවබෝධ කරගැනීමට නම් බුද්ධත්වය අවබෝධ කරගත යුතු බවයි. මේ අනුව මහායානිකයන් විශ්වාස කරනු ලබන්නේ විමුක්තිය අවබෝධ කර ගැනීම සඳහා ඇති එකම යානය "බුද්ධයානය" බවයි. මෙහි දී බුද්ධයානය යනුවෙන් අදහස් කරනු ලබන්නේ බුද්ධත්වයට පත්වීමයි. මේ අනුව මහායානිකයන් හීනයානය ප්‍රතික්ෂේප කර ඇත. ඊට හේතුව වන්නේ මහායානිකයන් බුද්ධත්වයට පත්වීමෙන් පමණක් නිවන් අවබෝධ කළ හැකි බව පැවසා ඇති බවයි. හීනයානිකයන් බුද්ධ, පච්චචේක බුද්ධ හා අරහත් යන මඟ ඵල පසක් කිරීම මගින් නිවන් අවබෝධය වන බව පැවසීම යන මෙම කාරණය නිසා මහායානිකයන් විසින් හීනයානය ප්‍රතික්ෂේප කර ඇත. එමෙන් ම මහායාන බෞද්ධ සම්ප්‍රදායේ මූලික සංකල්පය වන්නේ බුද්ධ සංකල්පයයි. එය මනඃකල්පිත වූ බුදුවරයෙකු පිළිබඳව ඉගැන්වීමකි. තවද මහායාන බෞද්ධ සම්ප්‍රදාය සංවර්ධනය වූයේ ජනප්‍රිය බුද්ධාගම මුල් කරගෙන ය. තවද මහායාන බෞද්ධ සම්ප්‍රදාය තුළ වටිනා වූ ප්‍රායෝගික වූ දර්ශනයක් ඇත. මෙම සම්ප්‍රදායේ ප්‍රධාන කොටස් දෙකක් ඇත. එනම්, මාධ්‍යමික හා යෝගාචාර දර්ශනය යනුවෙනි.

මේ අනුව මහායාන සම්ප්‍රදායේ මූලික සංකල්ප කිහිපයක් ඇත. එනම්, දශ භූමි, ෂට් පාරමිතා, ත්‍රිකාය හා බෝධි චිත්ත සංකල්පය යනුවෙනි. මෙහිදි මහායාන සම්ප්‍රදායේ එන දශ භූමි සුවිශේෂී තැනක් ගනු ලබයි. මෙම දශ භූමි මහායාන සම්ප්‍රදාය තුළ සුවිශේෂී වන්නේ කුමන කාරණාවක් නිසා ද මෙම දශ භූමි යනු කුමක් ද යන්න අධ්‍යයනයක් මතු දැක්වෙන කරුණු තුළින් මෙසේ පිළිබිඹු කරගත හැකිය.මහායාන සම්ප්‍රදාය යනු බෞද්ධ දර්ශනයෙහි එන විශේෂ අංගයකි. ඊට හේතුව වන්නේ මෙම සම්ප්‍රදාය තුළ වෙනස් වූ ඉගැන්වීම් හා ප්‍රතිපදා රැසක් පෙන්වා දෙන ලදී. ඒ අතරින් සුවිශේෂීතාවයක්

ලබන අංශයක් ලෙස මහායාන දශ භූමි පෙන්වා දිය හැකිය. මහායාන දශ භූමි පිළිබඳව තොරතුරු හමු වන්නේ මෙම සම්ප්‍රදායෙහි එන දශ භූමික සූත්‍රය තුළිනි. මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි එන දශ භූමි යනුවෙන් අදහස් කරනු ලබන්නේ බුද්ධත්වය ලබා ගැනීමට සම්පූර්ණය කළ යුතු ප්‍රතිපදාවන් ය. නමුත් හීනයානය තුළ ද බුද්ධත්වය අවබෝධ කිරීම පිණිස පිරිය යුතු පාරමිතා දහයක් ඇත. නමුත් එම පාරමිතා දහය මහායාන දශ භූමි හා සමානතාවයක් නොගනී. එමෙන් ම තවත් ආකාරයකින් මෙම දශ භූමි සංකල්පය මෙසේ හැඳින්විය හැක. එනම්, සත්‍යාවබෝධය ලැබීම තෙක් බෝධිසත්ත්වයකුගේ ආධ්‍යාත්මික අවස්ථා දහය ලෙස මෙම දශ භූමි සංකල්පය හැඳින්විය හැක. එමෙන්ම මෙම දශ භූමිවල විශේෂත්වය වන්නේ මහායාන බෝධිසත්ත්වයන් විසින් පිරිය යුතු පාරමිතා හයක් ඇති නමුත්, එම පාරමිතා හය පිරිය යුත්තේ දශ භූමියෙහි එන දූරංගමා නම් සත් වැනි භූමිය තුළය. තවද මහායාන බෝසත්ත්වයන් මෙම දශ භූමි පිළිවෙලින් පිරීම මඟින් බුද්ධත්වයට පත් වේ. ඉන් පසුව එම බුදුවරු ධර්මකාය සමඟ එකතු වෙති. ධර්මකාය යනුවෙන් අදහස් කරනු ලබන්නේ වස්තූන්ගේ ධර්මතාවය සාරය වශයෙන් පවත්නා හෙයින් ධර්මකාය යනුවෙන් හැඳින්වේ. මෙය බුදුවරුන්ගේ පාරමාර්ථික ශරීරයයි. ධර්මකාය සියලුම බුදුවරුන්ට එක සමානය. කිසිදු වෙනසක් නොමැත. යනුවෙනි. එමෙන් මහායාන දශභූමි තුළ ක්ලේශයන් ක්ෂය වීමට වඩා යම් යම් ගුණාංගයන් බෝධිසත්ත්ව සන්තානයට යොමු වන ආකාරය අවධාරණය කර ඇත. දශ භූමි යනු අර්හත්වය පිළිබඳ අවස්ථාව නොව බුද්ධත්වය පිළිබඳ යොමු කරන අවස්ථාවකි. මෙහි විශේෂත්වයක් වන්නේ පාරමිතා සමඟ සම්බන්ධව පැවතීම දැක්විය හැක. ඊට හේතුව වන්නේ පාරමිතා පිරීම සිදු වන්නේ මෙම දශ භූමි තුළට පැමිණි ම ඒවා පූර්ණ කිරීම මඟිනි. මේ අනුව මහායාන බෞද්ධ දර්ශනය තුළ එන දශභූමි පිළිබඳව දශභූමි සූත්‍රය මඟින් තොරතුරු මෙසේ දැක්විය හැක. එනම්,

1. ප්‍රමුදිතා
2. විමලා
3. ප්‍රභාකරී
4. අර්චිස්මතී
5. සුදූර්ජයා
6. අභිමුඛී
7. දූරංගමා
8. අචලා
9. සාධුමති
10. ධර්ම මේඝා

යනුවෙනි. මෙම දශ භූමි එකිනෙක තුළ එන සුවිශේෂිත්වය පිළිබඳව මතු කරුණු තුළින් මෙසේ අනාවරණය කරගත හැකිය. එනම්,

1. ප්‍රමුදිතා

මහායාන බෝසත්වරයෙකු මුලින් ම පිරිය යුතු භූමිය ලෙස ප්‍රමුදිතා භූමිය පෙන්වා දිය හැකිය. මෙම භූමිය තුළ විශේෂත්වය වන්නේ බුද්ධත්වය පිළිබඳව මනා අධිෂ්ඨානයකින් යුතුව සිට සිත තුළ බෝධි චිත්තය උපදවාගෙන සිත ප්‍රමුදිතව තබාගෙන විසීමයි. එමෙන්ම ආධ්‍යාත්මික සුවයෙන් යුතුව ධර්මකාය සොයන බෝසතුන්ට ඇති වෙන ප්‍රීතිය ප්‍රමුදිතාවයි. ඒ සමගම ඔහු බෝසත් ගුණ සම්පන්නයෙකු බවට පත්වේ. ගිහි සැප හැර දමා තවුස් දමින් යුතුව සමාධිය වඩමින් බෝධි චිත්තය උපදවමින් සියලු සත්ත්වයා දුකින් මුද වීමට කල්පනා කරයි. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ, මෙම භූමියෙහි සිටින බෝසත්වරයා කරුණාවෙන් යුත්තව තවත් කරුණු දහයක් පූර්ණය කරයි. ඒවා හඳුන්වනු ලබන්නේ දශ ප්‍රණිධාන ව්‍රත ලෙසය. එම ප්‍රණිධාන මෙසේ දැක්විය හැක. එනම්,

01.සියලු දිසාවල සිටින බුදුවරුන්ට නමස්කාරය කිරිම.

02. සියලු බුදුවරුන්ගේ ශික්ෂා පද ආරක්ෂා කිරිම.

03. තුසිත දෙව්ලොව අත්හැර මිනිස් ලොව පැමිණ නිවන් අවබෝධ කරන තුරු සියලු බුදුවරුන් දැකීම.

04.සියලු භූමීන් හා පාරමිතාවන් සම්පූර්ණය කිරිම පිණිස ඥානය ලබා ගැනීම.

05.ලෝකයේ සියලු සත්ත්වයන් බුද්ධත්වයට පමුණුවාලීම.

06.ලෝකයේ විද්‍යාමාන සමස්ත වස්තූන්ගේ විශේෂතා ඥානය ලබා ගැනීම.

07.සියලු සතුන් ඔවුන්ගේ සිතැති අනුව සතුටු කිරිම.

08.එක ම එක භාවනාවක් පුහුණු කිරීම.

09.බෝධි සත්ත්ව චර්යා වැඩීම.

10.බුද්ධත්වයට පැමිණිම පිණිස ශ්‍රද්ධාව, දයාව, මෛත්‍රිය, දාන, ශාස්ත්‍ර ඥානය, ලෝක ඥානය, විනය, නම්‍රත්වය, අධික වීර්ය හා ක්ෂාන්තිය වැඩීම.

යනුවෙනි. මෙම දශ ප්‍රණිධාන වැඩීම මගින් ප්‍රමුදිතා භූමිය වෙත පැමිණ එය පූර්ණය වේ. එමෙන්ම උක්ත කරුණු තුළින් ප්‍රමුදිතා භූමියෙහි එන විශේෂත්වය ප්‍රකට වේ .

2. විමලා

විමලා යනු නිර්මලත්වයට පත්වීමයි. මුල් භූමිය පූර්ණ කරන බෝධිසත්ත්වයන්ගේ සිත, කය හා වචනය යන තිදොර දස අකුශල කර්මයන්ගේන් සම්පූර්ණයෙන් ම මිදීමයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ මුල් භූමිය(ප්‍රමුදිතා) පූර්ණය කළ නිසා චිත්ත පාරිශුද්ධියත්, මනෝ පාරිශුද්ධියත් ලැබ බෝධිසත්ත්වයන් කරුණාවෙන් යුක්තව අකුසල් කර්මයන්ගෙන් තොරව පිරිසිදු සිතක් ඇති වීමයි. මෙහි තවත් විශේෂත්වයක් ලෙස දස අකුසල දුරු කොට දස කුසල කර්ම පථයෙහි යෙදෙමින් ශීල පාරමිතාවේ මස්තක ප්‍රාප්තිය සඳහා කැපවෙන භූමියයි.

3.ප්‍රභාකාරී

ප්‍රභාකාරී යනු බැබලීමයි. ප්‍රභාෂ්වර භාවයයි. මෙහි විශේෂත්වය වන්නේ බෝධිසත්ත්වයන් අෂ්ට සමාපත්තිවලට හා සතර බ්‍රහ්ම විහාර ධර්මවලට පැමිණ කාම වාසනා හා ශරීර තෘෂ්ණා ක්‍රමයෙන් දුරු කරනු ලබයි. එමෙන්ම තවත් සුවිශේෂත්වයක් ලෙස ක්ෂාන්ති පාරමිතාවේ වර්ධනය ඇති වන්නේ ද මෙම භූමිය තුළ බව දැක්විය හැක.

4.අර්චිස්මතී

අර්චිස්මතී යන්නෙන් අදහස් කරනු ලබන්නේ දිලිසීමයි. මෙම භූමියට පැමිණි බෝධිසත්ත්වයන් බෝධි පාක්ෂික ධර්ම හා බෝධිසත්ත්වයන් බෝධි පාක්ෂික ධර්ම හා ආර්ය අෂ්ටාංගික මාර්ගය පූර්ණය කරති. එමෙන් ම මෙහි විශේෂත්වය වන්නේ වීර්ය පාරමිතාව ක්‍රියා කිරීම ඇති වන්නේ මෙම භූමිය තුළදීය. තවද සැකය සම්පූර්ණයෙන්ම නැති වේ. එහෙත් විරාගය ඇති වේ. එමෙන්ම මෙහි එන බෝධි පාක්ෂික ධර්ම හීනයානයේ එන එම ධර්ම හා සමාන බවත් එහි කිසිදු වෙනසක් නොමැත. මෙයත් මෙහි එන එක් සුවිශේෂිත්වයකි.

5.සුදූර්ජයා

සුදූර්ජයා යනුවෙන් අදහස් කරනු ලබන්නේ ජය ගැනීමට දුෂ්කර වූ කටයුත්ත යනුවෙනි. අර්චිස්මතී භූමියෙහි පූර්ණ කළ ධර්මයන්ගෙන් යුක්ත වූ බෝධිසත්ත්වයන් මෙම භූමිය මගින් බෝධිසත්ත්ව ආලෝකයෙන් පාප අන්ධකාරය දුරු කොට කරුණාව හා ඥානයෙන් යුක්තව සියලු බුදුවරුන්ගේ ආරක්ෂාව ලැබ භව මුක්තිය ලැබීමට නුවණ වඩති. එමෙන්ම මෙම භූමියෙහි විශේෂත්වයක් ඇත. එනම්, බෝධිසත්ත්වයන් ධර්මාවබෝධ කොට අනෙක් සියලුම සත්ත්වයන් ධර්මාවබෝධය කරනු පිණිස නොයෙක් විද්‍යාවන් පුහුණු කරති. එමෙන්ම මෙමගින් සම්මුති වශයෙන් ගනු ලබන පරමාර්ථ සත්‍ය අවබෝධ කර ගනු ලබයි.

6.අභිමුඛී

අභිමුඛී යන්නනේහි අර්ථය වන්නේ ඉදිරියෙහි සිටින්නේ යන්නයි. මෙම භූමිය මගින් සියලු ධර්මයන්ගේ පරමාර්ථය මෙනෙහි කිරීමෙන් බෝධිසත්ත්වයන් මෙම භූමිය පූර්ණ කරති. එමෙන්ම මෙම භූමියෙහි සුවිශේෂිතාවය වන්නේ බෝධිසත්ත්වයන් සියලු සත්ත්වයින්ගේ ශූන්‍යතාවය අවබෝධ කර ගනිති. තවද සත්‍යාවබෝධ කළ බෝධිසත්ත්වයන් මුළාවෙන් සංසාර චක්‍රයෙහි දුක් විඳින සත්ත්වයන් කෙරෙහි කරුණාව දක්වති. එමෙන්ම මෙම භූමියෙහි තවත් විශේෂතාවයක් ඇත. එනම්, මෙම භූමිය තුළට පැමිණෙන බෝධිසත්ත්වයන් ප්‍රඥා පාරමිතාව සම්පූර්ණය කරති.

7. දූරංගමා

බොහෝ දුර ගියා වූ යන අර්ථය දූරංගමා භූමිය මගින් ප්‍රකට වේ. මෙම භූමිය මගින් බෝධිසත්ත්වයන් සවර්ඥතා ඥානය වෙත පිවිසේ. තවද සර්වඥතා බවට ද පත්වෙති. නමුත් නිවන තව බොහෝ දුරය. ඊට හේතුව වන්නේ නිවන් අවබෝධ කිරීම පිණිස මෙම භූමි දහය ම සම්පූර්ණයෙන් පිරිය යුතු බැවිනි. එමෙන්ම මෙම භූමියේ දී ශූන්‍යතාවය ලැබ අනිමිත්ත හා අප්‍රණිහිත තත්ත්වයෙන්

යුක්ත වෙති. තවද මෙම භූමියේ දී බෝධිසත්ත්වරු ධර්ම කාය මෙනෙහි කරමින් කුසල් කරති. තවද මෙහි විශේෂත්වයක් වන්නේ බෝධිසත්ත්වයන් ලෝකෝත්තර චිත්තයෙන් යුක්ත වූව ද ගෘහවාසයෙහි වාසය කරති. තවද අකුසල මූල නසති. එමෙන්ම මෙහි තවත් විශේෂත්වයක් වන්නේ ලෞකික තත්ත්වයට පැමිණ දුක් විඳිමින් තමාගේ පුණ්‍ය සම්පත්තිය ලෝකයාගේ හිත සැප පිණිස යොදා ගැනීම උදෙසා දස පාරමිතා පිරීම සඳහා බෝධිසත්ත්වයන් සෑම මොහොතකම උත්සහා කරති. එමෙන් ම මෙම භූමියෙහි තවත් විශේෂත්වයක් වන්නේ බෝධිසත්ත්වයන් සිවු වැදෑරුම් වීර්ය වඩා, එයින් උපාය කෞශල්‍ය පාරමිතාව පූර්ණය කරති. එමෙන්ම මෙම භූමියෙහි තවත් විශේෂත්වයක් වන්නේ මහායාන බෝධිසත්ත්වයන් පිරිය යුතු ප්‍රධාන පාරමිතා සය පිරීම යුතු වන්නේ මෙම භූමියයි දී ය.

8. අචලා

අචලා යනු නොසෙල්වීමයි. එමෙන්ම මෙම භූමියෙහි විශේෂතාවය වන්නේ බෝධිසත්ත්වයන් මේ භූමියේ දී සියලු ලෞකික තත්ත්වයන්ගේ යථාර්ථය අවබෝධ කර, අනුත්පත්තික ධර්ම ක්ෂාන්තිය වූ ලෝකෝත්තර තත්ත්වයට පත් වීමයි. අනුත්පත්තික ධර්ම ක්ෂාන්තිය යනුවෙන් අදහස් කරනු ලබන්නේ විශ්වයේ කිසිවක් කිසිවකු විසින් නිර්මාණය කරන ලද්දක් නොවන බවත්, සියල්ල පරමාණු සංකලනයේ ස්වභාවය නිසා නිෂ්පාදනය වූ බවය. තවද මෙම භූමිය පූර්ණ කරන බෝධිසත්ත්වයන් මේ විශ්වය ශූන්‍ය බව දැන ගනිති. තවද නිවන සඳහා දුරු කළ යුතු ක්ලේශ ධර්මයන් තවත් නොමැති බව දැන ගනිති. තවද මෙහි තවත් විශේෂත්වයක් ලෙස බෝධිසත්ත්වරු ධර්ම කාය හා එක්වී දස වැදෑරුම් වූ තථාගත බලය උත්පාදනය කරනු ලැබීම දැක්විය හැක.

9. සාධුමතී

සාධුමතී යනු යහපත් නුවණ ඇති යන්නයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ සාමාන්‍ය මනුෂ්‍ය ඥානයෙන් අවබෝධ කළ නොහැකි සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ බෝධිසත්ත්වයෝ එය සම්පූර්ණයෙන් ප්‍රතිඵල ලැබුවෝ වෙති. මෙම භූමිය මගින් නිවන සාක්ෂා කිරීමට ළඟා වෙනවා සේම සත්ත්වයින්ට ධර්ම දේශනා කිරීම පිණිස අර්ථ, ධර්ම, නිරුක්ති හා පටිභාන යන ප්‍රතිසම්භදා පිළිබඳව ඥානය අවබෝධ වෙති. මෙයත් මෙම භූමිය තුළින් ප්‍රකට වෙන සුවිශේෂිතාවයක් ලෙස පෙන්වා දිය හැකිය.

10.ධර්ම මේඝා

මෙහි අර්ථය වන්නේ දහම් වළාකුළු යනුවෙනි. බෝධිසත්ත්වයෙකු වීමට සම්පූර්ණ කළ යුතු අවසාන ම භූමිය ලෙස මෙය හැඳින්විය හැකිය. මෙම භූමිය සම්පූර්ණ කිරීම මගින් සියලු පාරමිතා ධර්මයන් සම්පූර්ණ කොට සියලු බෝධ්‍යංගයෙන් ද පරිපූර්ණ වෙති. මෙහි විශේෂත්වය වන්නේ තථාගත තත්ත්වයට පැමිණ අවසාන වීමයි. එමෙන්ම සකල විධි චේතනාවන් දැන් පවතින්නේ බුද්ධ භූමියේ ය. සකල ක්ලේශයන් දුරු කොට, බුද්ධ භූමියට පත් බෝධිසත්ත්වයන් චතුර් වෛශාරද්‍ය ඥානයෙන් යුක්ත වෙයි. මෙහි විශේෂත්වය වන්නේ මෙම භූමිය සම්පූර්ණය කිරීම මගින් ධර්ම කාය හා එක්වීමයි.

එමෙන්ම මෙහිදි දැක්විය යුතු කරුණක් ලෙස දශ භූමි යන්නෙහි දාර්ශනික අර්ථයක් ඇත. එනම්, තත්ත්වය යන්නයි. ඉහත දශ භූමි මගින් ප්‍රකාශිත වන්නේ බෝධිසත්ත්වයන් විසින් බුදු වීමට පෙර ක්‍රමානුකූලව පැමිණිය යුතු තත්ත්වයන් දහයක් ලෙසය . තවද යෝගාවචාර සම්ප්‍රදායට අයත් ග්‍රන්ථවල

මෙම භූමි යෝග ක්‍රමයක් බව මත දක්වා ඇත. තවද මෙහි තවත් විශේෂත්වයක් වන්නේ ථෙරවාදී සම්ප්‍රදාය තුළ එන සෝවාන් ආදී මාර්ග ඵල මේ දශභූමි හා යම් සමානකමක් පවතින බවයි. ඊට හේතුව වන්නේ එම මාර්ග හා ඵල ක්ෂීණාශ්‍රව පුද්ගලයාගේ තත්ත්වයන් ප්‍රකාශ වන බැවිනි. මෙම සම්ප්‍රදායෙහි එන දශ භූමි හාත්පසින් ම වෙනස් වූ සංකල්පයක් බව පැවසිය යුතුය. ඊට හේතුව වන්නේ බෝධිසත්ත්වයන් විසින් බෝධියානය අවබෝධ කිරීම සඳහා මෙම භූමි ක්‍රමානුකූලව පූර්ණය කළ යුතු බැවිනි.

**සමාලෝචනය**

ඉහත කරුණු තුළින් මහායාන සම්ප්‍රදායෙහි එන දශ භූමි පිළිබඳවත්, ඒවායේ ඇති විශේෂත්වය පිළිබඳවත් යන කරුණු කාරණා මනාකොට ප්‍රකට වේ. තවද මහායාන බෞද්ධ සම්ප්‍රදාය යනු ජනප්‍රිය බුද්ධාගම සමගින් ව්‍යාප්ත වූ සම්ප්‍රදායකි. කෙසේ වෙතත් මෙම සම්ප්‍රදාය වෙනස් ආකාරයකින් තම ඉගැන්වීම් හා ප්‍රතිපදාවන් පෙන්වා දී ඇත. එමෙන්ම මහායාන බෝධිසත්ත්වයකු විසින් බුද්ධත්වය අවබෝධ කිරීම පිණිස අනිවාර්යයෙන් ම සම්පූර්ණය කළ යුතු ප්‍රතිපදාවක් ලෙස මෙම දශ භූමීහු පෙන්වා දිය හැකි බවයි.

**ආන්තික සටහන්**

දශ භූමික සූත්‍රය, 155 පිට

මහායාන ථෙරවාදී බෞද්ධ දර්ශනය, 383 පිට

ලක්දිව මහායාන අදහස් , 181 පිට

**ආශ්‍රිත ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍ර**

දශ භූමික සූත්‍රය

ධර්මසිරි,ගුණපාල.(2002), ලංකාවතාර සූත්‍රය,(පරි), කොළඹ: වයි.එන්.ප්‍රින්ටස්.

**ද්විතීයක මූලාශ්‍ර**

සාසනරතන හිමි, මොරටුවේ.(1962), ලක්දිව මහායාන අදහස්, බොරලැස්ගමුව: සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ.

ගමගේ, එස්.අයි. (2014), මහායාන ථෙරවාදි බෞද්ධ දර්ශනය, කතෘ ප්‍රකාශනයකි.

මහාචාර්ය අභයවංශ, කපිල.(1999), බෞද්ධ අධ්‍යයනය, කොළඹ: ඇස්.ගොඩගේ ප්‍රකාශකයෝ

# ප්‍රත්‍යක්ෂය, අනුමානය, සහ සංවාක්‍යය පිළිබඳ විමසුමක්

# An Analysis of Perception, Inference and Syllogism

*Y.M. Janaka Priyadarshana Dissanayake*

*Buddhist & Pali University of Sri Lanka*

දැනුම හටගන්නේ කෙසේද? යන ගැටළුවත්, හටගන්නා දැනුමෙහි ස්වභාවයන්, සහ දැනුමේ වපසරියේ ප්‍රාමාණිකත්වය පිළිබඳව විමර්ශනශීලී වීම උදෙසාත්, සකස්කර ඇති දාර්ශනික විධික්‍රම පද්ධතීන් දෙකක් හමුවෙයි[1]. ඉන් එකක් බටහිර දාර්ශනික චින්තන ප්‍රවාහයට අයත් වන අතර, අප අවධානයට නතුවන අනෙක් පද්ධතිය භාරතීය දාර්ශනික චින්තන ධාරාවට අයත් වෙයි. ''ඥාන මීමංසා'' යනු භාරතීය චින්තන ධාරාවට අයත් දැනුම් පද්ධති ගවේෂණය සඳහා විවිධ දාර්ශනික ගුරුකුලයන් වෙතින් දායාද වූ ක්‍රමවේදයන්ගේ එකතුව හඳුන්වන පොදු නාමයයි. මෙකී භාරතීය ඥාන මීමංසාවට අයත් උප කුලකයන් වන ප්‍රත්‍යක්ෂය (Pereepion) අනුමානය (Inference) සහ සංවාක්‍ය (Syllogism) පිළිබඳව සරල හැඳින්වීමක් සිදුකිරීම මෙම ලිපියෙහි අරමුණ වෙයි.

ඉන්ද්‍රිය පංචකය මගින් ලබාගන්නා වූ ඥානය[2] ප්‍රත්‍යක්ෂය නමින් හැඳින්වෙයි. දැනුම ලබාගැනීම සඳහා අවශ්‍ය හේතුවක් හෙවත් ප්‍රමාණයක් වශයෙන් ප්‍රත්‍යක්ෂය පිළිබඳව පුළුල් මෙන්ම සකාරණිකව සාකච්ඡාවට බඳුන් ව ඇත්තේ පෙරදිග දාර්ශනික චින්තන ධාරාවට අයත් අද්විතීය දාර්ශනික සම්ප්‍රදායය වන භාරතීය චින්තනය තුළය යනු අවිවාදාත්මක කාරණාවකි. බටහිර චින්තකයින්ද මේ පිළිබඳ යම් අධ්‍යයනයක නිර වුවත් එය සාකල්‍යයෙන් පරිපූර්ණ වුවක් නොවේ යැයි විවිධ විවේචන එල්ල වේ. භාරතීය දර්ශන ඉතිහාසය තුළ මෙකී සාකච්ඡා සිදුවූ ප්‍රධානතම පාර්ශව දෙකක් වශයෙන් දාර්ශනිකයින් සහ නෛයායිකයන් ඉස්මතුකර පෙන්වාදිය හැකිය. ප්‍රත්‍යක්ෂය හෙවත් දැනුම ලබාගන්නා මාර්ගයක් වශයෙන් එහි ඇතුළත් සංකල්ප පිළිබඳව විවිධ සාකච්ඡා සිදුවී තිබේ. ප්‍රත්‍යක්ෂ සංකල්ප (The concepts of perception) හටගැනීම සඳහා බලපාන ලද ප්‍රබලතම මෙන්ම පාදකමය මූල හේතුව වශයෙන් ඉන්ද්‍රිය හා විෂය වස්තු සන්නිකර්ෂය හෙවත් ඉන්ද්‍රිය - විෂය වස්තු ඝටණාව යන තත්ත්වය හඳුනාගත හැකි වේ. නෛයායිකයින් වෛශේෂිකයින් මෙන්ම ඥාන මීමංසාත්මක ගුරුකුලයට අයත් සියළු දාර්ශනිකයින්ගේ ඒකමතික පිළිගැනීම වන්නේ ද එකී ඉන්ද්‍රිය හා විෂය වස්තු සන්නිකර්ෂණ සංකල්පයයි. ප්‍රත්‍යක්ෂ සංකල්පය හටගැනීමට පාදක වූයේ ඝටනාව පිළිබඳ පැහැදිලි කිරීම් බව නිසැකය[3].

ඒ පිළිබඳව උක්ත සඳහන් කළ දාර්ශනික සම්ප්‍රදායයන්ට අයත් මූල සූත්‍රයන්හි පුළුල් අයුරින් සංවාදයට ලක්වී තිබේ. "විෂය වස්තුව" පිළිබඳව විවිධ හැලහැප්පීම් ද සිදුව ඇති බව පෙනීයයි. ඊට බලපෑ ප්‍රමුඛතම හේතුව වූයේ "ඔවුනොවුන් විසින් දැනටමත් පිළිගන්නා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ නිවැරදි බව හෙවත් සත්‍යතාවය[4]" සුරැකීමේ අවශ්‍යතාවයයි. ඒ ආකාරයෙන් "ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ සත්‍යතාවය සුරැකීමේ අවශ්‍යතාවය" වෙනුවෙන් පෙනී සිටීමේදී විඥ්ඥාන වාදය හෙවත් ආත්ම ඛ්‍යාතිය[5] පළුදුවේය යන තර්කය ඉදිරිපත් වූ අතර, සත්‍ය වශයෙන්ම උක්ත කාරණාවේදී විඥ්ඥාන වාදය ඛණ්ඩනය විය.

"ආත්ම ඛ්‍යාතිය" යනු බෞද්ධ යෝගාචාර විඥානවාදයෙන් පැන නැගි අදහසකි. පුද්ගල සන්තානගත අදහස් මාත්‍රයක් ඔහුගෙන් අන්‍ය වූ (පරිබාහිර) විෂය වස්තුවක ස්වරූපයෙන් ප්‍රක්ෂේපණය වී පැමිණීම යනු විපර්යයකි. එකී විපර්යය අදාල පුද්ගලයා මුල් කොටගනිමින් හටගන්නා වූ තත්ත්වයක් හෙයින් (පුද්ගලානුබද්ධ) ඊට ආත්ම ඛ්‍යාති යැයි ව්‍යවහාර කෙරේ.

න්‍යාය සූත්‍රාගත නිර්වචනයේ දී ප්‍රත්‍යක්ෂය යන්න කාරණා තුනකට යටත්ව ඉදිරිපත් කර තිබෙයි. ඒ කාරණා ත්‍රිත්වය අරභයා "ව්‍යවසායාත්මක" "අව්‍යපදේශ්‍ය" සහ "ව්‍යාභිචාරී" යන වචන ත්‍රිත්වය භාවිත කොට තිබෙයි. කිසියම් විෂය වස්තුවක් යම් ආකාර ඉන්ද්‍රියක් සමග ගැටීම හේතුවෙන් හටගන්නා නිශ්චිත භාවයෙන් යුක්ත වූ හෙවත් -ව්‍යවසායාත්මක; නම් කිරීමකින් දැක්වීමට නොහැකි වූ හෙවත් අව්‍යපදේශ්‍ය, එමෙන්ම නිර්වද්‍ය වූ හෙවත් ව්‍යාභිචාරී ඥානය ප්‍රත්‍යක්‍ෂය නමින් හැඳින්වෙයි යන එකී න්‍යාය සූත්‍රාගත නිර්වචනයේ සංක්ෂිප්තයයි. යට සඳහන් කරන ලද නිශ්චිත හෙවත් ව්‍යවසායාත්මක යන සංකල්පය පැහැදිලි කිරීම සඳහා උදාහරණයක් යොදාගනු වටී. යම් විවෘත පැහැදිලි ස්ථානයක සිට අනන්ත දුර බලන අයෙකුට කිසියම් දර්ශනයක් පෙනී යයි. එක්කෝ වලාකුළු සමූහයක් විය හැකිය. නැත්නම් කඳුපංතියක් විය හැකිය. නමුත් නියත වශයෙන්ම දර්ශනය වන්නේ කුමක්දැයි ඔහුට පැහැදිලි නැත. එම අවස්ථාවේදී ඔහුට ඇති වන්නේ නිශ්චිත නොවූ හෙවත් ව්‍යවසායාත්මක නොවූ ඥානයකි. අව්‍යපදේශ යනු යම් ආකාර (අදාළ) විෂය වස්තුව පිළිබඳව ප්‍රත්‍යක්‍ෂයෙන් ලබාගන්නා වූ ඥානය, ඊට ආරෝපණය කරන ලද්දා වූ සම්මුති නාමය හා අසම්බාසිත බව යන අර්ථය ඉස්මතු කරන්නකි. යම්සේ අර්ථයෙන් ඉවතට ගමන් කරන යන අදහා සම්පාදනය කරන්නේ ද, ඒ වනාහි ව්‍යාභිචාරී නම් වෙයි. ව්‍යාභිචාරී යන්නෙහි ප්‍රතිවිරුද්ධාර්ථමය යෙදුම වන්නේ "අව්‍යාභිචාරී" යන්නයි. එනම් යම්සේ යථාර්ථයේම රැඳී සිටින්නේ ද, යතාර්ථයෙන් ඉවත නොයන්නේ ද, එවිට එය අව්‍යාභිචාරී යන අර්ථය සම්පාදනය කරයි. උදාහරණ වශයෙන් දක්වන්නේ නම් "මිරිඟුව" ජලය මෙන් පෙනෙන අවස්ථාවක් සළකමු.

මිරිඟුව දුටු අවස්ථාවේදී ජලය පිළිබඳ සංඥාවක් හටගනී. එනම් ජලය පිළිබඳ දැනීමක් හෙවත් ඥානයක් හට ගනී. නමුත් ඒ දැනුම ප්‍රත්‍යක්ෂ වුවක් නොවේ. මක්නිසාදයත් සත්‍ය වශයෙන්ම ඒ ජලය නොවන බැවිනි.

ඥානය, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳව බුදුසමය පුළුල් සංවාදයක යෙදෙයි. ඥානය හෙවත් දැනුම් මට්ටම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී සඤ්ඤා[6], විඤ්ඤාණ[7], පඤ්ඤා[8], පරිඤ්ඤා[9], අභිඤ්ඤා[10], අඤ්ඤා යනාදී පර්යායයන් සමුදායයක් ඉදිරිපත් කොට තිබේ. මහාවේදල්හ සූත්‍රයේ දී සඤ්ඤා යන්නෙහි අර්ථය මහා කොට්ඨිත හිමියන් විසින් සාරිපුත්ත හිමියන්ගෙන් විමසූ අවස්ථාවේදී එවිට සාරිපුත්ත මහරහතන් වහන්සේ විසින් ලබා දෙන පිළිතුර වන්නේ "හැඳින ගනී යන යම් හේතුවක් වේද එයම සඤ්ඤා නම් වේ[11]" යන්නයි.

හින්දු න්‍යායවාදීන් ද ප්‍රත්‍යක්ෂය පිළිබඳව විසල් පරාසයකින් සාකච්ඡා කොට තිබේ. එය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. පළමු ක්‍රමය යටතේ මෙකී ප්‍රත්‍යක්ෂ සංකල්පය කොටස් දෙකකට බෙදා දක්වා තිබේ. එනම් ලෞකික ප්‍රත්‍යක්ෂය සහ අලෞකික ප්‍රත්‍යක්ෂය යනුවෙනි. ලෞකික ප්‍රත්‍යක්ෂයේද බෙදීම් දෙකක් දක්වති. බාහ්‍ය ප්‍රත්‍යක්ෂය සහ මානස ප්‍රත්‍යක්ෂය යනුවෙනි. අලෞකික ප්‍රත්‍යක්ෂයද කොටස් තුනකට බෙදා සාකච්ඡා කරන ආකාරයක් දැක්විය හැකිය. සාමාන්‍ය ලක්ෂණ ප්‍රත්‍යක්ෂය, ඥාන ලක්ෂණ ප්‍රත්‍යක්ෂය සහ යෝගජ ප්‍රත්‍යක්ෂය යනුවෙනි. ඉහත බාහ්‍ය ප්‍රත්‍යක්‍ෂය යනු ඉංද්‍රිය පංචකය හෙවත් ඇස, කන, නාසය, දිව ශරීරය කේන්ද්‍රකොට ගනිමින් හටගන්නා වූ දැනුමයි.

මනස සහ ආත්මය අතර ගැටීම හේතුවෙන් හට ගන්නේ මානස ප්‍රත්‍යක්‍ෂයයි. සාමාන්‍ය ලක්‍ෂණ ප්‍රත්‍යක්‍ෂය යනු කිසියම් තත්ත්වයකට සහජයෙන්ම උරුම වූ සාමාන්‍යකරණික අවස්ථාවකි. නිදර්ශනයක් වශයෙන් "මිනිස් වර්ගයාට" උරුම වූ "මනුෂ්‍යත්වය" යන්න හඳුන්වාදිය හැකිය. කිසියම් දෘඩ වස්තුවක භෞතිකමය සැකැස්ම හෙවත් සකස්වීමේ ස්වරූපය අනුව එහි බාහිර ස්වරූපයෙන් දර්ශනය වීමේදී අදාළ වස්තුවේ වර්ණය, ගන්ධය, රස, ඕජා යන තත්ත්වයන් ප්‍රත්‍යක්‍ෂ වේ[12]. තවත් පැහැදිලි කිරීමක යෙදෙන්නේ නම් යම් වස්තුවක් ඇසට දකින ක්ෂණයෙහිම අපට එහි සුවඳ ප්‍රත්‍යක්‍ෂ වේ යැයි සිතන්න. ඉන්පසු කාලයකදී එක් වස්තුව නැවත දර්ශනය වීමත් සමග චක්ෂුස ප්‍රත්‍යක්‍ෂය හටගන්නා බව නෛයායිකයින්ගේ අර්ථ දැක්වීමයි. එහි අර්ථය නම් අතීත අත්දැකීමක් මගින් ඇතිවන ඥානය මුල්කොටගෙන වර්තමානයේ අදාල අත්දැකීම හා සම්බන්ධ ඥානයක් හටගන්නා බවයි .එය නෛයායිකයින්ගේ ඥාන ලක්‍ෂණ ප්‍රත්‍යක්‍ෂයයි.

යෝගජ ප්‍රත්‍යක්‍ෂය යනුවෙන් දැක්වෙන්නේ උසස් ඥානය හා සම්බන්ධිත ප්‍රත්‍යක්ෂයකි. යෝගීන් සතු බලයෙන් ඔවුන්ට ත්‍රෛකාලවර්තීව යම් යම් දේ හැඟේ, පෙනේ, එය යෝගජ ප්‍රත්‍යක්‍ෂයයි. හින්දු න්‍යායවාදීන්ගේ ප්‍රත්‍යක්‍ෂය දෙවදෑරුම් බව ප්‍රකාශ කළෙමු. පළමු ආකාරය පිළිබඳව පැහැදිලි කරන ලදී. දෙවන බෙදීමට අයත් වන්නේ නිර්විකල්ප, සවිකල්ප සහ ප්‍රත්‍යාභිඥා යන අවස්ථා ත්‍රිත්වයයි. නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂය සහ සවිකල්ප ප්‍රත්‍යක්‍ෂය අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වේ. මක්නිසාද යත් නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂයක් ඇති නොවී සවිකල්ප ප්‍රත්‍යක්‍ෂයක් හට නොගන්නා බැවිනි. එහෙයින් එම ප්‍රත්‍යක්‍ෂ ප්‍රභේද දෙක අන්‍යෝන්‍ය වශයෙන් බද්ධවූවාහු මෙන් යම් වස්තුවක සරළ භෞතිකමය තත්ත්වයන් රහිතව මූලික වශයෙන්ම ඉන්ද්‍රියයන්ට ගෝචරවීමේ මාත්‍රය නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂය නමින් හැඳින්වේ. මෙහිදී භෞතිකමය ස්වරූපය යනු දිග, පළල, උස, ගැඹුර ආදියයි. නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂය හටගත් පසු සවිකල්ප ප්‍රත්‍යක්‍ෂය හටගනී. නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂය යම්සේ හටනොගන්නේද, එසේම නියත වශයෙන්ම සවිකල්ප ප්‍රත්‍යක්‍ෂයද හටනොගන්නේමය. ප්‍රති+අභි මූලයන්ගෙන් සුසැදුණා වූ ප්‍රත්‍යාභිඥා ප්‍රත්‍යක්‍ෂය භාෂා යෙදුම පරිදිම නිර්වචනය කළ හැකිය. පූර්ව අවස්ථාවක ඉන්ද්‍රිය ගෝචර වූ යමක් හෝ යමෙක්, නැවත වරක් හමුවූවිට මේ වනාහී අසවල් අවස්ථාවේ දී හමුවූ, දුටු පුද්ගලයා හෝ වස්තුවය යනුවෙන් හඳුනා ගැනීමයි.

බෞද්ධ න්‍යාය ශාස්ත්‍රයේ එන ප්‍රත්‍යක්‍ෂයේ ප්‍රභේදකරණය සිව්වැදෑරුම් වෙයි.

01. ඉන්ද්‍රිය ඥානය

02. මනෝ විඤ්ඤාණය

03. ආත්මසංවේදන ඥානය

04. යෝගී ඥානය යනුවෙනි.

ඉන්ද්‍රිය ඥානය යනු පංචේන්ද්‍රියන් වන චක්ඛු, සෝත, ඝාන, ජිව්හා" කාය, මන යන ඉන්ද්‍රියයන් මගින් ලබාගන්නා දැනුමයි. මජ්ඣිම නිකායේ මහා හත්ථිපදෝපම සූත්‍රයෙහි දැක්වෙන පරිදි ඉන්ද්‍රිය ඥානය ඇති වීම සඳහා කරුණු තුනක් සම්පූර්ණ විය යුතුයි.

01. අපරිභින්නව පවතින අභ්‍යන්තර ඉන්ද්‍රිය.

02. රූප ශබ්ද, ගන්ධ, රස ස්පර්ශ යන අරමුණු (බාහිර ආයතන)

03. මානසික අවධානය

"මහණෙනි ඇසද රූපය ද ප්‍රත්‍ය කොට ගෙන ඇස සම්බන්ධ විඥාණය උපදී. මේ ත්‍රිත්වයේ එක්වීම ස්පර්ශය වෙයි. ස්පර්ශය ප්‍රත්‍ය කොට ගෙන වේදනාව වෙයි. යමක් වින්දනය කරන්නේ ද එය දැගන්නේය. යමක් දැනගන්නේ ද එය ගැන විතර්ක කරන්නේය, යමක් ගැන විතර්ක කරන්නේද ඒ ගැන පච්චුප්පන්න වෙයි. යමක් ගැන පච්චුප්පන්න ඇති කරගන්නේ ද, අතීත අනාගත හා පච්චුප්පන්න ඇසට ගොදුරුවන්නා වූ විෂයයන් සම්බන්ධ සංකල්පයක් ඔහු යටපත් කොටගෙන නැගී සිටී"

න්‍යාය බිංදුවේ පළමුවන පරිච්ඡේදයෙහි සඳහන් වන ප්‍රත්‍යක්‍ෂයේ ප්‍රභේද සතර බෞද්ධ නෛයායිකයින්ගේ ඉහත කී ප්‍රත්‍යක්‍ෂ සතරම මිස වෙනකක් නොවේ.

ඉහත සඳහන් කරන ලද සියළුම ප්‍රත්‍යක්‍ෂය සම්බන්ධ සෛද්ධාන්තිකමය ප්‍රභේදයන් භෞතික සහ පාරභෞතික වශයෙන් කොටස් දෙකක් යටතේ සංග්‍රහ කළ හැකිය. එතැනදී බාහ්‍ය ප්‍රත්‍යක්‍ෂය, නිර්විකල්ප ප්‍රත්‍යක්‍ෂය, සවිකල්ප ප්‍රත්‍යක්ෂය, ප්‍රත්‍යභිඥ ප්‍රත්‍යක්‍ෂය සහ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය යන ප්‍රත්‍යක්‍ෂයන් "භෞතිකමය" වශයෙන් සැළකිය හැකි අතර, අනෙකුත් ප්‍රත්‍යක්‍ෂයන් පාරභෞතික ප්‍රත්‍යක්‍ෂයන් වශයෙන් සැලකිය හැකිය. මෙහිලා පාරභෞතික ප්‍රත්‍යක්ෂයට අදාල සුවිශේෂී කාරණාව වන්නේ එමගින් වෙසෙසින්ම ආගමික අනුභූතියක්[13] ඉදිරිපත් වීමයි. කොයි හැටි වෙතත් ගෞතම බුදුරජාණන් වහන්සේ සහ නූතන මනෝ විශ්ලේෂණවාදී විද්‍යාඥයින්ගේ ප්‍රත්‍යක්ෂය පිළිබඳ න්‍යායාත්මක කාරණා සැලකිල්ලට ගැනීමේදී ඒවා "ආනුභවික ප්‍රත්‍යක්ෂමය විග්‍රහයක්" කෙරෙහි යොමුව ඇති ආකාරයක් පෙනෙන්නට තිබේ. විශේෂයෙන්ම බෞද්ධ දර්ශනයට අයත් ඥාන විභාගය පුද්ගල කේන්ද්‍රීයව සංවරණය වන ප්‍රත්‍යක්ෂමය තත්ත්වයකි. බුදුරදුන් අතින් ප්‍රතික්ෂේප වූ ඇතැම් මතවාද වර්තමාන යුගයටද අදාලය. විශ්වාසය හා භක්තිවාදයෙන් විනිර්මුක්ත වූ තත්ත්වයක් ලෙස බෞද්ධාගමේ ඥාන විභාගය පෙන්වාදිය හැකිය.

අනුමාන (ඥානය) යනු දැනුම ලබා ගැනීමේ තවත් ක්‍රමයකි. අනුමාන ඥානය පවතින්නේ එක්තරා සාපේක්ෂකමය තත්ත්වයක් මතය. එනම් සාධ්‍යය සහ හේතුව යන කාරණා දෙකෙහි අන්‍යෝන්‍ය සබඳතාවය මතය. සාධ්‍යය යනු තහවුරුකළ යුතු කාරණාව හෝ සිද්ධියයි. අදාල කාරණාව සහ හේතුව අතර සම්බන්ධතාවය අවිච්ජින්නව පැවතිය යුතුය. එම අවිච්ජින්නව සම්බන්ධතාවය අරහයා දර්ශනයේදී "ව්‍යාප්ති" යන නාමය භාවිත වෙයි. උදාහරණ වශයෙන් "යම් ප්‍රමාණයක හෝ තෙතමනයක් පවතින සියලු ස්ථානයන්හි කවර හෝ ශාක ගහණයක් පවතී" මෙහිලා තෙතමනයත් ශාකයන්ගේ පැවැත්මත් අතර අවිච්ජින්න සබඳතාවයට ඉහත කී "ව්‍යාප්ති" යන නාමය භාවිත වේ. වෛශේෂික සූත්‍ර නම් ග්‍රන්ථයේ දී අනුමානයේ ප්‍රභේද දෙකක් පෙන්වා දී තිබේ.

එනම් ,

01. **දෘෂ්ට ලිංග අනුමානය**

02. **අදෘෂ්ට ලිංග අනුමානය** යනුවෙනි.

මහාචාර්ය එස්. එම්. ජී. වීරසිංහයන්ට අනුව මෙහි ලිංග යනුවෙන් දක්වා ඇත්තේ හේතුව පිළිබඳව වූ ඥානයයි. ඒ අනුව හේතුවේ දෘශ්‍ය, අදෘශ්‍ය භාවය මුල්කරගෙන පදනම් කරගෙන අනුමානයේ දෘෂ්ට-අදෘෂ්ට භාවයේ ප්‍රභේදකරණය හටගන්නට ඇතැයි පෙන්වා දිය හැකිය.

ශබර නම් ආචාර්යවරයාගේ "විමංසා භාෂ්‍යය" නම් ග්‍රන්ථයේදී අනුමානයේ ප්‍රභේද දෙකක් පෙන්වා දී තිබෙයි. එනම්

**01.ප්‍රත්‍යක්ෂතෝ දෘෂ්ට සම්බන්ධ**

**02.සාමාන්‍යතෝ දෘෂ්ට සම්බන්ධ** යනුවෙනි.

ප්‍රත්‍යක්ෂතෝ දෘෂ්ට අනුමානය යන්නට උදාහරණ වශයෙන් "යම් තැනක දුමක් දර්ශනය වේද, එතැන නිසැකවම ගින්නක් පවතී" යනාදී නිගමනයට පැමිණීම පෙන්වාදිය හැකිය. ශබරාචාර්ය වරයාට අනුව සාමාන්‍යතෝ දෘෂ්ට අනුමානය චන්ද්‍රයාගේ චලනය ආශ්‍රිතව පැහැදිලි කළ හැකිය. එනම් චන්ද්‍රයා විවිධ අවස්ථාවල විවිධ ස්ථානගතවීම් පෙන්නුම් කරයි. යම් වස්තුවක් ස්ථානීය වශයෙන් වෙනස් වන්නේ නම් එහි අර්ථය වන්නේ එකී වස්තුව චලනය වන්නේය යන්නයි. ඒ අනුව චන්ද්‍රයා චලනයවේ යන්න අනුමාන කරන්නේනම් එය සාමාන්‍යතෝ දෘෂ්ට නම් වේ.

ගෞතම අක්ෂපාදයන්ගේ අනුමානය පිළිබඳ ඉදිරිපත් කිරීම ඉහත තත්ත්වයන්ට වඩා තරමක් වෙනස් වේ. ඔහුගේ න්‍යාය සූත්‍රයේදී ත්‍රිවිධ අනුමානයක් පිළිබඳ අදහසක් ඉස්මතු වේ.

එනම්,

**01.පූර්වවත් අනුමානය**

**02.ශේෂවත් අනුමානය**

**03.සාමාන්‍යතෝ දෘෂ්ට අනුමානය** යනුවෙනි.

යම් සේ හේතුවක් පිළිබඳ දැනගෙන එහි ඵලය පිළිබඳ අනුමාන කරන්නේ ද, එසේ ලබන අනුමානය පූර්වවත් අනුමානය නම් වේ. උදාහරණ වශයෙන් ආකාශයේ කළු වලාකුළු දැක ස්වල්ප මොහොතකට පසු වැසි පතිතවන්නේය යන අනුමානය පෙන්වාදිය හැකියි. අවශේෂමය ද්‍රව්‍යයන් හෝ කාරණාවන් පිළිබඳව අනුමාන කර එහි මුල සිද්ධීන් පිළිබඳව ඇති කරගන්නා වූ අනුමානය ශේෂවත් අනුමානයයි. යම් සේ ජලය බොරවී සැඩපහර සහිතව වේගයෙන් ගලා බසින ගංගාවක් දැක ඉහළ ප්‍රදේශ වලට වැසි පතිතවී ඇතැයි අනුමාන කරන්නාක් මෙනි. ගෞතම අක්ෂපාදයන්ගේ අනුමානය පිළිබඳ තෙවන වර්ගීකරණය හෙවත් සාමාන්‍යතෝ දෘෂ්ට යන්න ශබරාචාර්ය වරයාගේ ඥාන මීමංසා භාෂ්‍යයේ එන සාමාන්‍යතෝ දෘෂ්ට අනුමානයට සාකල්‍යයෙන්ම සමාන වේ.

ආචාර්ය ප්‍රශස්තපාදයන් භාරතීය අනුමාන තර්කයන් පිළිබඳ විග්‍රහ කිරීමේදී නැවුම් අදහසක් ඉදිරිපත් කරයි. අනුමානයකට එළඹීමට හෝ අනුමානයක් පැලපදියම් වීමට බලපාන හේතු හෙවත් ලිංග දෙකක් ඔහු ඉදිරිපත් කරයි. එනම්

01. දෘෂ්ට
02. සාමාන්‍යතෝ දෘෂ්ට වශයෙනි.

යම් නිදර්ශකයක් මගින් ඥාන පථයට හසුවූ දෙයත්, සාධ්‍යමය හෙවත් තහවුරු කළ යුතු කාරණාවත් යන දෙකෙහි ස්වභාවයන් ගේ සමානත්වයන් ඉන්ද්‍රිය ගෝචරවන අවස්ථාවේදී හටගන්නා වූ අනුමානය දෘෂ්ට අනුමානය වේ යැයි ප්‍රශස්තපාදයන් කියා සිටි උදාහරණ වශයෙන් "රශ්මිය ඇත්තේ ගින්නටමය" යන දැනීමට අනුරූපව රශ්මියක් සහිත යම් වස්තුවක් දුටු කෙනෙහිම ගින්න හා සබැඳි අනුමානයක් හටගනී. ආචාර්ය ප්‍රශස්තපාදයන් දෙවනුව ඉදිරිපත් කරන්නේ සාමාන්‍යතෝ දෘෂ්ට

යන්නයි. උදාහරණ වශයෙන් "දැනටමත් අප තුළ අනුභූතිමත්ව පවතින යම් යම් කාරණාවන්ගේ ආධාරයෙන් අපගේ අනුභූතියට මේ දක්වා කවරාකාරව හෝ හමු නොවූ දේ පිළිබඳව අනුමානාත්මක ඥානය ලබා ගත හැකිය" යන අදහස පෙන්වාදිය හැකිය. යම්සේ පෘථිවියට සෑම අතින්ම සමාන තත්ත්වයන් පවතින ග්‍රහලෝකවල නියත වශයෙන්ම ජීවය පවතින්නේ යැයි අනුමාන කිරීමට සමානය. මහාචාර්ය එස්. එම්. ජී. වීරසිංහයන්ට අනුව විවිධ භෞතිකමය ක්‍රියාකාරිත්වයන් හා සමගාමීව, ඊට අනුරූපමය ප්‍රතිඵල (ඵල) ලබන්නේයැයි ස්වකීය අත්දැකීම් මාර්ගයෙන් අවබෝධ කරගත් පුද්ගලයා, තපස් රැකීම මගින්ද තපසට අනුරූපය ඵල ලැබෙන බව අනුමාන කිරීමට පෙළඹීම සාමාන්‍යය.

ආචාර්ය වසුබන්ධු නම් ශ්‍රේෂ්ඨ මහායානික පඬිවරයා අනුමානය සම්බන්ධයෙන් ස්ව-පර ප්‍රභේදයක් ඉදිරිපත් කර තිබේ. පසුව ආචාර්ය දින්නාගයන්ද එම අවස් අවධානයක් යොමු කර ඇත. එකී අනුමානයේ ස්ව-පර ප්‍රභේද නම්,ථාවන් දෙක පිළිබඳව දැඩි

01. ස්වාර්ථානුමානය

02. පරාර්ථානුමානය

යන ප්‍රභේදයන් දෙකයි. මෙයින් ස්වාර්ථානුමාන යනු ස්වකීය චිත්ත සන්තානයෙන් හටගන්නා වූ එකඟතාවයකි.  යම් ආකාරයකින් තමා තමාටම සපථ කර ගැනීමකි. මෙය සාකල්‍යයෙන්ම බාහිරව නොපෙනෙන පුද්ගලානුබද්ධ වූ තත්ත්වයකි. යමෙක් යම්සේ බාහිර පුද්ගලයින් හෙවත් අන්‍යයින් සඳහා කවරාකාර හෝ අනුමානයක් ඉදිරිපත් කරන්නේද, එය වනාහී පරමාර්ථානුමානයයි.

සංවාක්‍යය යන සංකල්පය පිළිබඳව සාකච්ඡාවට බඳුන් කිරීමේදී එය "සත්‍යය" සමඟ සම්බන්ධ වන බව පෙනේ. මක්නිසාදයත්, නෛයායිකයින් විසින් සත්‍යය ඉස්මතු කරගැනීම සඳහා භාවිත කරන ලද එකම ක්‍රමය වූයේ සංවාක්‍යය ක්‍රමයයි. යමක් සංවාක්‍යය ක්‍රමවත්ව ඉදිරිපත් කිරීමත් සමගම එහි ප්‍රතිඵලයක් වශයෙන්
"න්‍යායය" යන සම්ප්‍රදායය ඇතිවිය. "න්‍යාය" ශබ්දාර්ථය වන්නේ හේතුවාදයේ හැඳින්වීමයි. යඥවල්ක්‍යය ට අනුව න්‍යාය යනු ප්‍රධාන විද්‍යා දාහතරෙන් එකකි[14]. පසුකාලීනව "න්‍යායය" විද්‍යාවක් වශයෙන් ජනප්‍රිය වූ ආකාරය මහාභාරතය, පද්මපුරාණය, මත්ස්‍ය පුරාණය වැනි ග්‍රන්ථ පරිශීලනයේදී මනාව ප්‍රකට වෙයි. පෙර දැක්වූ ආකාරයෙන් "අවයව පහකින්" යුතු සංවාක්‍යයේ ආධාරයෙන් සත්‍යය පිරික්සීමේ ක්‍රමය ප්‍රභවය වූයේ න්‍යාය ශාස්ත්‍රය ආරම්භ වීමත් සමගමය. සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණයන්ට අනුව න්‍යාය සූත්‍රයෙහි පෞරාණික පාඨයන් රචනා වූයේ ක්‍රිස්තු වර්ෂ 100-150 ත් අතර විය යුතුය. පසු කාලීනව විවිධ දාර්ශනික සම්ප්‍රදායයන් පැන නගිත්ම හින්දු න්‍යාය ශාස්ත්‍රය, ජෛන න්‍යාය ශාස්ත්‍රය සහ බෞද්ධ න්‍යාය ශාස්ත්‍රය යනුවෙන් කොටස් තුනක් වශයෙන් සංවර්ධනය වූ අතර එකී න්‍යායන් කාලාවරෝධයට අනුරූපව ප්‍රාචීන හෙවත් පැරණි න්‍යායන් සහ නව්‍ය හෙවත් අලුත් න්‍යායයන් යනුවෙන් කොටස් දෙකක් යටතේ සංග්‍රහ විය.

සංවාක්‍ය යන්නට පර්යාය කිහිපයකි. සංවාක්‍යය යනු වාක්‍යයයි. කෙසේ වාක්‍යයක්ද පඤ්ච-අවයව-උප්පන්න වාක්‍යයයි. මෙය න්‍යාය නමින්ද පරාර්ථානුමාන නමින්ද හැඳින්වෙයි. සංවාක්‍යයෙහි කොටස් හෙවත් අවයව පහක් ඇතිබව ඉහත කී පර්යාස විග්‍රහ වැකියේ දී පෙනී යන්නට ඇත. ඒවා එකිනෙක දක්වන්නේනම්,

i. ප්‍රතිඥා

ii. අපදේශ (හේතු)

iii. දෘෂ්ටාන්ත හෙවත් නිදර්ශන

iv. අනුසම්බන්ධ හෙවත් උපනය

v. ප්‍රත්‍යාම්නාය හෙවත් නිගමනය

සංවාක්‍යයේ පළමු අංගය වන ප්‍රතිඥාව මගින් අදහස් කරන්නේ අන්‍යයන්ට දැනුම ලබාදීමයි. දැනුම ලබා ගැනීමට උපකාර වන අංගයක් බැවින් එහි පරම විශ්වාසයක් හෙවත් බිඳ නොවැටෙන සුළු තාර්කික ගම්‍යතාවයකින් යුක්ත විය යුතුමය. අපදේශ හෙවත් හේතු යනු සංවාක්‍යයේ දෙවන අංගයයි. අනුමානයෙහි පැනෙන විශේෂිත ලක්ෂණ උලුප්පා දැක්වීම හේතු නම් වේ. අනුමානය මගින් යමක් තහවුරු කරන්නට උත්සහ ගන්නේ නම් හේතු හෙවත් අපදේශය පුරාවටම විසිර පැතිර තිබිය යුත්තේ ඊට පාක්ෂික වූ (සපක්ෂික) කරුණු පමණි. ප්‍රතිවිරුද්ධ තත්ත්වයන්ට පක්ෂපාති කිසිවක් එහි නො පැවතිය යුතුමය. තෙවන අංගය වන දෘෂ්ටාන්තය හෙවත් නිදර්ශන යන්න කොටස් දෙකකට බෙදෙයි. එනම් අන්වය හෙවත් සාරධර්ම්‍ය උදාහරණ සහ වෛධර්ම්‍ය හෙවත් ව්‍යතිරේකමය උදාහරණ යනුවෙනි. වෛධර්ම්‍ය උදාහරණය මඟින් අනුමානයට නිරන්තර සබඳතාවයක් නැති තත්වයන් පිළිබඳව අවධානය යොමුකරවයි. සාරධර්ම්‍ය උදාහරණය එවැන්නක් නොවෙයි. එමගින් අනුමේයය සමඟ නිරන්තරයෙන්ම සම්බන්ධ වන තත්වයන් පිළිබඳ තහවුරු වන ආකාරයේ උදාහරණ දක්වයි. උපනය හෙවත් අනුසම්බන්ධ යනු අනුමේයයෙහි සෑම විටම සංවාක්‍ය මගින් අනුමානාත්මක නිගමනයක් ඇතිකර ගැනීමේ ආධාරකය වන ලිංගය පවතින බව ඉදිරිපත් කිරීමයි. නිගමනය මගින් ප්‍රතිඥාව ස්ථිර විශ්වාසයක් සමඟ නැවත ප්‍රකාශ කෙරේ. නිගමනය යන්න පරිසමාප්ත වාක්‍ය යනුවෙන් හැඳින්වෙන්නේද එහෙයිනි.

සංවාක්‍යයේ අවයව පහ භාවිත කරමින් ප්‍රතිජානනාත්මකව මෙන්ම ප්‍රති ශේධනාත්මකව ද අදහස් තහවුරු කළ හැකිය. වාත්ස්‍යායනයන්ගේ සංවාක්‍යයේ ප්‍රතිජානක සහ ප්‍රතිශේධන ස්වරූප දෙක විමසා බලමු. "ශබ්දයෙහි අනිත්‍යතාවය" පිළිබඳව තහවුරු කරන්නේ නම්:

01) **ප්‍රතිජානනාත්මකව**

I. ශබ්දය අනිත්‍යයි.

II. ශබ්දය හට ගැනීම ලක්ෂණ කොට ඇත.

III. ශබ්දයෙහිවූ සියල්ල අනිත්‍යය

IV. ශබ්දයේ ධර්මතාවයක් වන්නේ හටගැනීමයි

V. එහෙයින්ම ශබ්දය අනිත්‍යයි.

02) **ප්‍රතිශේධනාත්මකව**

I. ශබ්දය අනිත්‍යයි

II. ශබ්දය හට ගැනීම ලක්ෂණ කොට ඇත

III. ආත්මන් වැනි හටගැනීම ලක්ෂණ කොට නොගන්නා දේ නිත්‍යයි

IV. හට නොගැනීම ශබ්දයේ ධර්මතාවයක් නොවේ

V. ශබ්දය හටගැනීම ලක්ෂණයක් කොට පවතින නිසා නිසා අනිත්‍යයි

VI. භාරතීය ඥාන මීමංසාව පිළිබඳව පුළුල් විග්‍රහයක් කිරීම පරමායුෂ්ක යමෙකුගේ ජීවිත කාලය පුරාවට වුවත් සිදු කළ හැක්කක් නොවේ. එය එතරම් භාරදූර කර්තව්‍යකි. කෙසේ

වෙතත් ප්‍රත්‍යක්ෂය, අනුමානය සහ සංවාක්‍ය පිළිබඳව කෙටි නමුත් ප්‍රමාණාත්මක හැඳින්වීමක් සිදුකිරීම මෙහි අරමුණ විය.

## ආන්තික සටහන් සහ පරිශීලිත ග්‍රන්ථ නාමාවලිය

"ඥානය පිළිබඳ බෞද්ධ විග්‍රහය තුළින් සාපේක්ෂතාවාදී ප්‍රවණතාවක් ප්‍රකට වේද?"


ධම්මතිස්ස හිමි, මලබැද්දේ, දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, සම්භාෂා 2005 13 කලාපය 345 පිටුව.

භාරතීය තර්ක ප්‍රවේශය ආචාරය වීරසිංහ එස්.එම්.ජී, ප්‍රකාශන මණ්ඩලය කැළණිය 1973,9 පිටුව.

THE NYĀYA - SUTRAS OF GAUTHAMA re-print Motilal Banarsidass, The University of Michigan 1984 1.1.4.

කළුපහන, ජිනදාස, භාරතීය දර්ශන ඉතිහාසය (වෛදික , උපනිෂද් යුගය) අධ්‍යාපන ප්‍රකාශන 2014 ,92 පිටුව.

ආචාර්ය වීරසිංහ එස්.එම්.ජී, භාරතීය තර්ක ප්‍රවේශය, ප්‍රකාශන මණ්ඩලය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, විද්‍යාලංකාර මණ්ඩපය කැළණිය 1973 , 8 පිටුව.

මජ්ඣිම නිකාය මූල පණ්ණාසක චූල යමක වග්ග, මහා වෙදල්ල සූත්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව 2005, 5; 3, 688 පිටුව.

මජ්ඣිම නිකාය ප්‍රථම භාගය, සීහනාද වග්ග, මධුපිණ්ඩික සූත්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව 2005, 1.2.8.

සරණ හිමි, තන්තිරිමුල්ලේ "බුද්ධ ඥානය කර්තෘ ප්‍රකාශන 1997, 80 පිටුව.

මජ්ඣිම නිකාය ප්‍රථම භාගය මූල පණ්ණාසක මූල පරියාය වග්ග, මූල පරියාය සූත්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය දෙහිවල 2005; 1; 1.

මජ්ඣිම නිකාය තෘතිය භාගය උපරි පණ්ණාසකය දෙවදහ වග්ග ගෝපක මොග්ගල්ලාන සූත්‍රය 3ඃ 1ඃ 8.

මජ්ඣිම නිකාය ප්‍රථම භාගය මූල පණ්ණාසක චූල යමක වග්ග, මහා වේදල්ල සූත්‍රය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා 2005; 5; 3, 688 පිටුව.

ආචාර්ය වීරසිංහ, එස්.එම්.ජී. භාරතීය තර්ක ප්‍රවේශය ප්‍රකාශන මණ්ඩපය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, විද්‍යාලංකාර මණ්ඩපය, කැළණියඃ1973, 12 පිටුව.

දිසානායක ප්‍රියදර්ශන ජනක, බෞද්ධ චින්තන ක්‍රමයේ විශිෂ්ටත්වය, සී/ස එස් ගොඩගේ සහ සහෝදරයෝ කොළඹඃ 2014, 78 පිටුව.

ආචාර්ය වීරසිංහ, එස්.එම්.ජී. භාරතීය තර්ක ප්‍රවේශය, ප්‍රකාශන මණ්ඩපයඃ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, විද්‍යාලංකාර මණ්ඩපය, කැළණියඃ 1973, 2 පිටුව.

# ශූන්‍යත්වයේ දාර්ශනිකත්වය පිළිබඳ මාධ්‍යමකයන්ගේ දෘෂ්ටිය පිළිබඳ විමසුමක්

## An Analysis of the View of Madyamika Tradition on Philosophy of Sunyatha

***S.A.S.Chathurika***

*Faculty of Buddhist Studies, Nagananda International Buddhist University*

''ඔබ මා වෙත වතුර පිපාසාවෙන් පැමිණ පිරිසිදු වතුර කෝප්පයක් ඉල්ලන විටක මම ඒ වතුර කෝප්පයට වතුර දැමීමට සූදානම් වන විට එය කළු තෙල් සහිත කෝප්පයක් බව දුටුවහොත් මම එයට ඔබට වතුර නොදෙමි. මන්ද කළුතෙල් සහිත කෝප්පයට මම ඔබට පිරිසිදු ජලය දුන්නොත් ඔබට සිදුවන්නේ පිපාසාව තුරන් වෙනවා වෙනුවට පාචනය නම් රෝගය වැළඳීමයි.''

දහම් දැනුමෙන් ඔබ්බට ධර්මාවබෝධයේ නිම් වළලු පුළුල් කරගනු වස් උත්තරානුභූතික සත්තාවක් ජනනය කරන ශූන්‍යතා සංකල්පය මධ්‍යමක දර්ශනයේ කැඳවුම්කරුවාණන් වන නාගාර්ජුන පාදයන්ගේ දාර්ශනික සන්තාවේ ප්‍රාදූර්භූතිය කැයි සැලකේ. දෙසැටක් මිත්‍යා දෘෂ්ටීන්ගෙන් ගහන භාරතය තුළ බුද්ධෝත්පත්තියෙන් පසු පෙන්වා දෙන ලද අනාත්ම දර්ශනයට එල්ල වූ විවිධ අභියෝගයන් මර්දනය කරනු වස්, එනම් ආත්මවාදී මත ඛණ්ඩනය කිරීමට පරියාය මාර්ගයක් ලෙස ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කර ගන්නා ලදී. නාගාර්ජුන[1] පාදයන්ගේ මාධ්‍යමක දර්ශනය පටිච්චසමුත්පාදය තුළින් ජන්ම ලාභය ලැබුවක් ලෙස සැලකෙන අතර සත්ත්වයන් හා ලෝකය අතර ස්වාභාවය පැහැදිලි කරන විට ස්ථවිරවාදීන්ගේ සහ ආභිධම්මිකයන්ගේ විවරණයන්ට අනුව මුල් බුදු සමය පුද්ගල නෛරාත්ම්‍ය වාදයක් හා ධර්ම අනිත්‍යත්ව වාදයක් ලෙස ද පෙන්වා දිය හැකිය. නමුත් මෙකී කිසිවක් තුළින් බුද්ධ මතය ඉස්මතු වන බවක් නොපෙනෙන බව පෙන්වාදෙමින් මාධ්‍යමකයන් ''ශූන්‍ය'' යන වදනට අවදානය යොමු කරන ලදී.

බුදුහූ දෙසැටත් මිත්‍යා දෘෂ්ටීන්ගෙන් ගහන ලෝකයට ප්‍රාදුර්භූතව ප්‍රයත්න දරන ලද්දේ හැටතුන් වන මිත්‍යාදෘෂ්ටියක් ගොඩ නැගීම උදෙසා නොව **''සර්ව දෘෂ්ටි ප්‍රහාණාය යඃ සද්ධර්ම දේශයත්...''**

.- මූල මාධ්‍යමික කාරිකාව .

සියලු දෘෂ්ටි ප්‍රහාණය කොට මැද මාවතක යථාර්ථය අවබෝධ ක්‍ර ගැනීමයි.

**''න ස්වතො තාපි පරපො**
**න ද්වාභ්‍යං නප්‍ය හේතුතං**
**උප්පන්නාහඃ ජාතු විද්‍යතෙ**
**භවඃ ක්වචන කේචන.''**[5]

. මූලමාධ්‍යමික කාරිකාව .

ස්වත, පරත, ස්වත . පරත, අහේතුක ආදි සියලුම වාද අර්ථ ශුන්‍ය බවත් අහේතුකව අප්‍රත්‍ය වූ කිසිවක් ලොව කිසිම තැනක විද්‍යාමාන නොවන බවත් නාගාර්ජුන දර්ශනය විවරණය කරනු ලබන මූල මාධ්‍යමික කාරිකාවේ තවදුරටත් පෙන්වා දෙයි.

**අප්‍රතිත්‍ය සමුප්පන්නෝ**
**ධර්ම කශ්චින්න විද්‍යතේ**
**යස්මාද් තස්මාද් ශූන්‍යෝහි**
**ධර්ම කශ්චින්න විද්‍යතේ**[4]

මූලමාධ්‍යමික කාරිකාව

මාධ්‍යමක දර්ශනයට ප්‍රකාරව ශුන්‍යතාව වානාහි ලෝකෝත්තර සත්තාවක් නොවන අතර ශුන්‍යතා සංකල්පයම ගත හැක්කේ ශුන්‍යතා අර්ථයෙනි. එනම් ශුන්‍යතාවයම ශුන්‍යයි යන්නෙන් ධර්ම නෛර්යත්මතාව, නිශ්ස්වාභාවය, පරස්පරාපේක්ෂිත බව ප්‍රකට කෙරේ. මධ්‍යමක දර්ශනයේ කේන්ද්‍රීය සංකල්පාගත අර්ථයෙන් ම ශුන්‍යතාවාදය ඉස්මතු වන අතර මෙහිදී දාර්ශනික හා ආචාර විද්‍යාත්මක පදනමක් ද ප්‍රකට වේ. ශුන්‍යතාව හුදු සාරධර්ම විද්‍යාව අර්ථවත් කරන පදයක් ම නොවන අතර ආනුභූතික සියලු දේ සාරවූ යථාර්ථයෙන් බැහැර වන හෙයින් වටිනාකමින් තොරය. නමුදු සත්ත්වයා ලෞකික දේ සමඟ බැඳීම් ඇති කර ගැනීම නිසා හුදෙක්ම ශුන්‍යතා අර්ථය වරදවා වටහා ගනු ලබයි.

නාගර්ජුන පාදයන් ස්මතු කළ ශුන්‍යතාව සාතිශය වශයෙන් විචාරයට පාත්‍ර වූ දර්ශන මතවාදයක් ලෙස හේන්පිටගෙදර ඥානසිංහ හිමි, ජේ කළුපහන, අසංග තිලකරත්න සහ ඒ. කේ. වෝඩර් යන විචාරකයන් පෙන්වා දෙන අතර මුල් බුදු සමය දාර්ශනිකව අර්ථ විවරණය කරන ලද දාර්ශනිකයකු සේ ද අර්ථ දක්වති. එතෙක් බෞද්ධ සම්ප්‍රදාය තුළ ප්‍රචලිතව නොපැවති පරීක්ෂණ ක්‍රමවේදය යොදා ගනිමින් වෙනත් ගුරුකුලවල ඉගැන්වීම් ඇසුරෙන් තාර්කිකව සුපෝෂණය කරන ලද දැක්මක් යටතේ ගෙන හැර දක්වන ලද දාර්ශනික ඉදිරිපත් කිරීමකි. ශාස්වත හෝ උච්චේද දෘෂ්ටිවලට නොවැටී මධ්‍යස්ථ දර්ශනයක් ලෙස ශුන්‍යතා දර්ශනය ඉස්මතු කොට ඇත.

බහු දෘෂ්ටිවාදයකට හෝ විකල්ප දෘෂ්ටි වලින් විනිර්මුක්තව සමයක් දෘෂ්ටිය තුළින් යථාර්ථය පෙන්වා දෙනු ලබන මාර්ගෝපදේශනයකි. මූල මාධ්‍යමික කාරිකාව නම් මාර්ගෝපදේශිත ග්‍රන්ථය ඊට උපාය මාර්ගයක් ලෙස මඟපෙන්වීම ලබා දෙමින් ඇති දේ ඇති සැටියෙන් අවබෝධයට අවස්ථාව සලසනු ලබයි. බුදුන් දේශිත ප්‍රතිත්‍ය සමුත්පාද ධර්මයට ප්‍රකාරව සියලු දේ ශුන්‍යත්වයහි ලා සැලකෙන බව මෙකී දර්ශනයෙන් පිළිබිඹු වේ. සත්‍ය ලෝකයේ පවතින යථාර්ථය මධ්‍යමිකයන් මින් තහවුරු කරනු ලබයි.

''මධ්‍යමක දර්ශනය ඉන්දියානු දර්ශනය තුළ කොපර්නිකානු විප්ලවයක් සිදු කළේ ය'' යන ටී. ආර්. වී. මූර්තිගේ ප්‍රකාශයත් සමඟම මධ්‍යමකයන්ගේ දෘෂ්ටිය වෙත වර්තමාන වියතුන්ගේ අවධානය යොමුව ඇත. බුදු දහමට ආගන්තුක්කාරයෙකැයි සැලකෙන ශුන්‍යතා සංකල්පය එහි මූලික ඉගැන්වීම් උඩු යටිකුරු කරන දැක්මක් ලෙස විවරණය කෙරුණද යථාවබෝධ ඥානයෙන් බලන කල මාධ්‍යමක දෘෂ්ටිය තුළින් හෙළිදරව් කරන ශුන්‍යතා දර්ශනය මුල් බුදු සමයෙන් කිසිසේත් පරිබාහිර නොවූ දර්ශනයක් ලෙස හඳුනාගත හැකිය.

5

**"මෝඝරාජයිනි, ආත්ම දෘෂ්ටිය සිඳ ලෝකය ශුන්‍ය ලෙස සලකන්න"**

යනුවෙන් සංයුක්ත නිකාය සලායතන සංයුක්තනයේ සුඤ්ඤ සූත්‍ර ප්‍රකාරව ශුන්‍යතා සංකල්පය බුදු දහමට ආගන්තුක නොවූවක් බව පෙන්වා දිය හැකිය.

එන් අයිය සාමි ශාස්ත්‍රිගේ මතය අනුව මෙම ශුන්‍යතා ධර්මය බෞද්ධයන්ට අවිෂය වූවක් නොවේ. නමුත් ශුන්‍යතාවය පටිච්චසමුප්පාදය සඳහා පරියාය නාමයක් වශයෙන් නාගාර්ජුන පාදයෝ ප්‍රථමයෙන් ම යොදා ගනු ලැබිණි.[6]

ආචාර්ය ෂර්බැට්ස්කි ශුන්‍යතාව පිළිබඳ අදහස් මහායාන ධර්මයෙන් ආරම්භ වූවක් ලෙස සලකයි. දාර්ශනික චින්තාවන්ගේ ප්‍රගතිය නිසා එසේ ඇරඹුන ශුන්‍යතා සංකල්පයේ මූල බීජ හීන යාන බුදු සමයේ ද ගැබ්ව පවතින නමුත් ඊට නව්‍යාර්ථ කවන ලද්දේ මහායානයයි.[7] මහායාන දර්ශනයෙන් ඔප් නැංවෙන ශුන්‍යතා දර්ශනය බුදුන් වහන්සේගේ ප්‍රතීත්‍යසමුත්පාද දේශනය මූලික පදනම කොට ගෙන ගොඩ නැගී ඇත. ප්‍රතීත්‍ය සමුප්පන්න සියල්ල සංඛත බවත්, සංඛත සියල්ල අනිත්‍ය බවත්, දුක් සහිත සියල්ල අනාත්ම බවත් බුද්ධ දේශනාව වන අතර නාගාර්ජුන දර්ශනය මඟින්ද පුද්ගලයා පිටුපස ආත්මයක් නැති බව ප්‍රකට කරන්නා සේම පුද්ගලයා හා ලෝකය සමන්විත වන ධර්මයන් කිසිවක් තුළ ආත්මයක් හෝ ආත්මීය වූ කිසිවක් නොමැති බවත් ලෝකයම ආත්මයකින් හෝ ආත්මීය ස්වරූපයකින් යුතු කිසිවකින් තොර බවත් ඊට ප්‍රකාරව ශුන්‍ය වන බවත් දක්වන ලදී.

**යං ප්‍රතීත්‍ය සමුප්පාදඃ . ශූන්‍යතඃ ප්‍රචක්ෂ්මහෙ**
**සා ප්‍රඥප්ති රූපාදාය . ප්‍රතිපත්ති සෛව මධ්‍යමා**[8]

යමක් පටිච්ච සමුප්පන්න වේ නම් එය ශුන්‍යතාව බවත්, ශුන්‍යතා ප්‍රඥප්තිය නිසාම මාධ්‍යමක වන බවත් දක්වන අතර උක්ත සඳහන් කළ පරිදි අහේතු අප්‍රත්‍ය කිසිවක් කිසිම තැනක විද්‍යාමාන නොවන බවත් පෙන්වා දෙයි.

ලොව සියල්ල ශුන්‍ය ලෙස මාධ්‍යමික දෘෂ්ටිය වන අතර ලොව සියල්ල ශුන්‍ය වන්නේ නම් ඇතිවීමක් නැතිවීමක් පැවතිය නොහැකි බවට ප්‍රතිවාදීන්ට ප්‍රශ්න කළ හැකිය.

**යදී ශූන්‍යම්දං සර්ව මුදයො . නාස්ති නව්‍යයඃ**
**චතුර්ණාමාර්යසත්‍යානා . මහාවස්තේ ප්‍රසජ්‍යතෙ**[9]

නාගාර්ජුන දර්ශනයට අනුව මෙකී ප්‍රතිවාදී ප්‍රශ්න කිරීම් ඔවුන්ගේ අනවබෝධය මත ගොඩ නැගෙන බව පෙන්වා දෙයි. ශූන්‍යත්වය හුදු නාස්තිකවාදයක් ලෙස අර්ථකථනය කරමින් සංවෘති හා පරමාර්ථ සත්‍ය පටලවා ගනිමින් කරනු ලබන ප්‍රශ්න කිරීම් ලෙස බැහැර ලීමට මාධ්‍යමක දෘෂ්ටිය හරහා ගොඩ නගන සම්‍යක් දෘෂ්ටියට සක්‍යතාව පවතී. නිසැකවම අනාත්ම හා ශුන්‍යතා යන්නෙහි වෙනස බොහෝ දුරට අවධාරණයේ වෙනසක් පමණක් වන අතර හරයේ කිසිදු නොමැති බව පෙන්වා දෙයි.

ශුන්‍යතාව වනාහි උච්ඡේදයක් ද නොවන ශාස්වතයක් ද නොවන අදානග්‍රාහී දෘෂ්ටියක් ද නොවන ප්‍රතීත්‍යසමුප්පනතාවය පදනම් කොට සාපේක්ෂතාව විවරණයෙහිලා කරන ලද පාරදෘශ්‍ය පෙන්වාදීමක් බව නොරහසකි. එහි හරය නොඑසේනම් දාර්ශනික සිද්ධාන්තමය ශුන්‍යතාවය වනවා විනා, එය සංවෘති සත්‍ය මගින් නොව පරාමර්ථ සත්‍ය මගින් විවරණය කළ හැකි ගැඹුරු විවරණයක්

ලෙස පෙන්වා දිය හැකිය. හුදු වචනයෙන් අප්‍රකාශිත අවබෝධයෙන් ප්‍රකාශිත ප්‍රත්‍යක්ෂයක් ලෙස පෙන්වා දිය හැකිය.

යථාර්ථය තුළ අනාත්ම ධර්මතාවය තහවුරු කිරීම සඳහා උපයෝගී කරගනු ලබන උපකරණයක් හෝ මාධ්‍යයක් ලෙස ශූන්‍යතාව භූමිකාගත වෙයි. එනයින් බලන කල අන් දෘෂ්ටිවලට වඩා සුපිරි ගණයේ දෘෂ්ටියක් ලෙස ශූන්‍යතාව පෙන්වා දීම මුග්ධත්වය විශද කිරීමක් වන අතර එය දෘෂ්ටියක් ලෙස ගැනීම ම සුව කළ නොහැකි රෝගයක් බව මධ්‍යමකයන්ගේ දෘෂ්ටියයි.[10]

**''කුල්ලුපමං වො භික්ඛවේ ධම්මං දෙසිස්සාමි**
**නිත්සරණත්ථාය නො ගහණත්ථාය''**

යනුවෙන් අලගද්දූපම සූත්‍රයේ දී බුදුන් වහන්සේ පෙන්වා දෙමින් තහවුරු කරනු ලබන්නේ ද, ශූන්‍යතාව වනාහි අවබෝධයට විනා දෘෂ්ටි ග්‍රහණයට නොවන බවයි. ඇරිස්ටෝටල් සහ සොක්‍රටීස් විසින් ඉදිරිපත් කරන දයලෙක්තිකය හෙවත් අපෝහකය නාගර්ජුන පාදයන් බෞද්ධ අපෝහකය වෙත ආදේශ කරමින් අන්තර්පරායත්තතාවය ඉස්මතු කරනු ලබයි. එනම් හේතුව හා ඵලය අතර පවත්නා සාපේක්ෂ හෙවත් අන්තර්පරායත්ත සම්බන්ධතාවය විශද කරයි. උක්ත සංකල්පය සනාතනීකරණය උදෙසා නාගාර්ජුනයෝ යොදා ගනු ලබන අග්නි – ඉන්ධන උපමාව තුලින් ඉන්ධනය ගින්න මත පරාධීන වන බව ඉස්මතු කොට දක්වයි. නල කලාප සූත්‍රය මඟින් ද විඥානය හා නාමරූපය අතර සාපේක්ෂ සබඳතාවයක් ගොඩ නගනු ලබන අතර විඥානයෙන් තොර නාමරූපයක් නොමැති බවත් නාම රූපයෙන් තොර විඥානයක් නොමැති බවත් අවධාරණය කරයි.

පිං.පව්, සසර .නිවන, හොඳ . නරක, සුන්දර .අසුන්දර, ඇත .නැත හා ගැහැණු . පිරිමි යන ද්විත්වමය ප්‍රතිපක්ෂ සංකල්පයන්හි අන්තර් පරායත්තතාවය පෙන්වා දෙමින් ශූන්‍යතා දර්ශනයේ ප්‍රතීත්‍යසමුත්පන්න ඉස්මතු වීම පෙන්වා දෙනු ලබයි. ''පුණ්‍ය පාපී පහීනස්ස'' යනුවෙන් පින- පව යන දෙඅන්තයන්ම අත්හල යුතු බව පෙන්වා දෙන අතර ම සසර හා නිවන සමානකරමින් සසර හා නිවන අතර වෙනසක් නැතැයි යන ආන්දෝලනාත්මක හෙළිදරව්ව ද සිදු කරයි.

- **න සංසාරස්‍ය නිර්වාණාත්**
**කිඤ්චිදස්ති විශේෂණම්**
**න නිර්වාණස්‍ය සංසාරාත්**
**කිඤ්චිදස්සි විශේෂණම්**[11]

සසර සසර වීම නිවන මතත්, නිවන නිවන වීම සසර මතත්, පරාධීන වනවා සේම ධර්මය ධර්මය වීම අධර්මය මතත්, අධර්මය අධර්මය වීම ධර්මය මතත්, පරාධීන වන බවත් එමනිසාවෙන් සසර . නිවන හා ධර්මය . අධර්මය යන සියල්ලත් අත්හල යුතු බව පෙන්වා දෙයි. පටු දෘෂ්ටියකින් යුතුව ශූන්‍යතාව අදානග්‍රාහීව ග්‍රහණය කර ගැනීමට නොව එය ද අත්හළ යුතු ධර්මතාවයක් ලෙස පෙන්වා දෙනු ලබයි.

**''කුල්ලුපමං භික්ඛවේ ධම්මං දෙසිස්සාමි**
**නිත්තරණායිනො ගහණත්ථාය''**

යනුවෙන් අලගද්දූපම සූත්‍රයේ පේනවා දෙනු ලබන්නේ ද ධර්මය කරතබාගෙන යාමට නොව නිර්වාණය සාධනය සඳහා පමණක් බවත්, ඉනික්බිත් ධර්මය ද අත්හල යුතුබවත් පෙන්වා දෙනු ලබයි.''

**''සබ්බේ ධම්මා පහාතබ්බා පගේවා අධම්මා''**

යනුවෙන් සියලු ධර්ම අධර්ම පමණක් නොව ශුන්‍යතාවය ද අත්හල යුතු බව පෙන්වා දෙයි. නිවන නිවන යැයි මඤ්ඤනය නොකිරීමත්, දෘඪිව අල්ලා නොගැනීමත්, නිවන නිවන යැයි භක්ති වන්දනයේ නොයෙදීමත් සිදු කරමින් සියලු සංකල්ප අත්හලයුතු බව පෙන්වා දෙනු ලබයි.

ශුන්‍යත්වයේ දාර්ශනිකත්වය වෙත යොමු වන මාධ්‍යමකයන්ගේ දෘෂ්ටිය, ශුන්‍ය නොවූ කිසිවක් ලොව විද්‍යාමාන නොවන බව විවරණයටත්, පංචස්කන්ධයෙන් වෙන් වූ ආත්මයක් නොමැති බව විවරණයටත්, ශුන්‍යතාව වරදවාගත් තැනැත්තා ධර්මය විනාශකරණයට යොමු කරවන ආකාරය හඳුනා ගැනීමටත්, නිර්වාණය භාව ධර්මයක් නොවන බව විශද කිරීමටත්, ක්ලේෂ නිර්වෘතිය නිර්වාණය බව දක්වීමටත්, තථාගත තෙමේ ද ශුන්‍ය ස්වභාවය කොට ඇතිබව දක්වීමටත්, පරමාර්ථයෙන් තොර නිර්වාණයක් අවබෝධ කළ නොහැකි බව පෙන්වීම කෙරෙහිත්, ඵලය හැම අතින් ම ශුන්‍ය වේ, යන්න අවධාරණය පිණිසත්[12] පුළුල්ව එකී දෘෂ්ටිය හෙලනු ලබයි.

**''සර්ව දෘෂ්ටි ප්‍රහාණාය . යං සද්ධර්මදෙශයත්**
**අනුකම්පාමුපාදය . තං නමෂ්‍යාමි ගෞතමම්**[13]

දෘෂ්ටි සාහසිකත්වයෙන් තොරව ධර්මවාදයෙන් ආත්ම සංකල්පය බැහැර කොට සම්‍යක් දෘෂ්ටියෙහිලා ඉවහල් වන ශුන්‍යතා සිද්ධාන්තය ඉස්මතු කිරීම මාධ්‍යමකයනගේ දර්ශනය විය. මිත්‍යා දෘෂ්ටි නැසීම පිණිස ඒහිපස්සික වූ ධර්මය දෙසූ බුදුන් වහන්සේට නාමස්කාර කොට මූලමධ්‍යමිකකාරිකාව අවසන් කිරිම තුළන් නාගාර්ජුන පාදයෝ ධර්මයේ විකෘතියක් හෝ උඩුයටිකුරු කිරීමක් සිදු කලා නොව ශුන්‍යතා දර්ශනය මඟින් මමායනයෙන් මිදී සියලු දේ අනාත්ම දෘෂ්ටි කෝණයකින් බලා අවබෝධ කොටගත යුතු ආකාරය පෙන්වා දීම සිදු කොට ඇත.

සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, විදුලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස්:, බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පි. 301

සාසනරතන හිමි, මොරටුවේ, මූලමාධ්‍යමික කාරිකාව, 15 ගාථාව, 1963

නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමික කාරිකාව සංස්. සාසනරතන හිමි, මොරටුවේ, අනුල මුද්‍රනාලය, 98, කොළඹ 10

නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමික කාරිකාව සංස්. සාසනරතන හිමි, මොරටුවේ, අනුල මුද්‍රනාලය, 98, කොළඹ 10

සංයුක්ත නිකාය, මෝසරාජ සූත්‍රය, 1123 . 1124 ගාථා, පිට 250, 344, බුද්ධ ජයන්තිය ත්‍රිපිටක මුද්‍රණය

කරුණාසේන, එම්. ඇස්. ථෙරවාදී බෞද්ධ දර්ශනයේ ශූන්‍යතාවාදය පටිපදා 18 කාණ්ඩය, සංස්, සෝමසිරි කලුගෙදර, 1968, පි. 15


කරුණාසේන, එම්. ඇස්. ථෙරවාදී බෞද්ධ දර්ශනයේ ශූන්‍යතාවාදය පටිපදා 18 කාණ්ඩය, සංස්, සෝමසිරි කලුගෙදර, 1968, පි. 15


ශාසනරථන හිමි මොරටුවේ මුල්‍යධ්‍යමික කාරිකාව 24 -. 18 ගාථා පිටුව 160, පී, ජේ, රුදිගෝ ප්‍රකාශන, 1963

Kalupahana D. J. , A History of Buddhist philosophy. Motilal Banarsidas Publishers, Delhi, 1994.

තිලකරත්න අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමක කාරිකාවෙහි පෙළ හා සිංහල පරිවර්තනය, තිමිර ප්‍රකාශන, 2001, දෙල්කද, නුගේගොඩ


තිලකරත්න අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමක කාරිකාවෙහි පෙළ හා සිංහල පරිවර්තනය, තිමිර ප්‍රකාශන, 2001, දෙල්කද, නුගේගොඩ


වනරතන හිමි, ඉත්තෑදෙමලියේ, බෞද්ධ සම්ප්‍රදායන් අතර මාධ්‍යමිකයන්ට හිමි තැන, බෞද්ධ සංස්කෘතිය. පිටු 217 -. 218


වනරතන හිමි, ඉත්තෑදෙමලියේ, බෞද්ධ සම්ප්‍රදායන් අතර මාධ්‍යමිකයන්ට හිමි තැන, බෞද්ධ සංස්කෘතිය. පිටු 217- . 218

# කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ දේශපාලන දර්ශනය පිළිබඳ විමසුමක්

# An Inquiry into the Political Philosophy of King Keerthi Nishshankamalla

*S.W.S.G. Wijerathna and P.W.P.H.Samaranayaka*

*Faculty of Arts, University of Peradeniya.*

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන දර්ශනය පිළිබඳ අවධානය යොමු කරන විට පෙරදිග දේශපාලන චින්තනයට අනුගතව විශේෂයෙන්ම ඉන්දීය දේශපාලන න්‍යායන් හා සංස්ථා ගුරුකොට ගනිමින් මෙරට පාලන ක්‍රමයන් සකස් වී පැවති ආකාරය දේවානම්පියතිස්ස රජ සමයේදී ඉන්දියාවේ අශෝක රජු හා පැවති සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස මෞර්ය පාලනය හා සමගාමී අයුරින් රාජාභිෂේකය සිදු වීමත්, පුරෝහිත, භාණ්ඩාගාරික, සේනාපති වැනි නිලධාරීන් පත් කිරීමත් ඉන් පසුව පාලන තන්ත්‍රයට අදාළ බොහෝ කටයුතු ඒ අනුව සිදු වීමත් විමසන විට ද, පසුකාලීනව පොළොන්නරු රාජධානි සමයේ 1 වන පරාක්‍රමබාහු රජු කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය හැදෑරූ බව ද 2 වන විජයබාහු රජු මනු නීතිය උල්ලංඝණය නොකොට රාජ්‍ය කළ බව මහාවංසයේ සඳහන් වන නිසා මනුධර්ම ශාස්ත්‍රය වැනි දේශපාලන න්‍යායන් අන්තර්ගත ඉන්දීය කෘතීන් හැදෑරූ බව ද පැහැදිලි වේ. ඉන්දීය දේශපාලන චින්තනය වර්ධනය වී ඇත්තේ එහි ආගමික චින්තනයට සමගාමීවය. ගුරුකුලයන් ගණනාවක පෝෂණය සහිතව මෙකී ඉන්දීය දේශපාලන චින්තනය වර්ධනය වන අතර රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි ඍජු හා වක්‍ර යන දෙයාකාරයෙන්ම බලපා තිබේ. මුල් කාලීනව සිටම ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයන් ඉන්දීය දේශපාලන දර්ශනයන් හදාරා ඒවායේ ඇතැම් අවස්ථා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරමින් රාජ්‍ය පාලන කටයුතු වඩාත් හොඳින් හා කාර්යක්ෂම ලෙස සිදු කරන්නට උත්සාහ දරා තිබේ. මෙවැනි පාලකයන් අතර පොළොන්නරු රාජධානි සමයේ රජකළ නිශ්ශංකමල්ල රජු ඉන්දීය දේශපාලන දර්ශනයන් ද ආදර්ශයට ගනිමින් තම දේශපාලන  දර්ශනය සකස් කරගෙන ඇති බවට සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් තොරතුරු ඉදිරිපත් වන අතර ඒ පිළිබඳ මෙහිදී සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

## කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජුගේ පාලනය

පොළොන්නරු රාජධානි සමය පිළිබඳ අවධානය යොමු කරන විට විවිධ අංශවලින් වැදගත් තත්ත්වයක් අත්පත් කරගෙන සිටි පාලකයන් අතර 1 වන විජයබාහු, 1 වන පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල යන පාලකයන් ඉතා වැදගත් වේ. කාලිංග පෙළපතට අයත් විදේශික ජන්මයක් සහිත තැනැත්තෙකු ලෙස හඳුනාගත හැකි නිශ්ශංකමල්ල රජු ක්‍රි.ව. 1186 - ක්‍රි.ව. 1197 අතර කාලයේදී පොළොන්නරුව අගනුවර වශයෙන් තබාගෙන පාලන කටයුතු මෙහෙයවා තිබේ. මෙරට දීර්ඝතම පුවරු ලිපිය ලෙස සළකනු ලබන ගල්පොත සෙල්ලිපිය ද ඇතුළත්ව වැඩි ම සෙල්ලිපි සංඛ්‍යාවක් පිහිට වූ පාලකයා ලෙස මොහු හඳුනාගත හැකි අතර තමාගේ ශ්‍රේෂ්ඨත්වය විදහා දැක්වීමේ අරමුණ මූලික කරගෙන ජනතාව වෙනුවෙන් කටයුතු රාශියක් සිදු කළ අයෙකු බව පැහැදිලිය. ආර්ථික කටයුතු දියුණු කිරීමට වාරි කටයුතු නගා

සිටුවීම මෙන්ම ජනතාව වෙනුවෙන් බදු අඩු කිරීම්, තුලාභාර දානයන් දීම් ආදිය මගින් සහන ලබාදීමට කටයුතු කළ පාලකයෙකු ලෙස ද මොහු හඳුනාගත හැකිය. දේශපාලනමය වශයෙන් පැවති විදේශීය ජන්මය නිසා රාජ්‍ය උරුමය පිළිබඳ ගැටලු, පාණ්ඩ්‍ය වංශිකයන්ගේ අභියෝග, ප්‍රබල සෙන්පතීන්ගේ අභියෝග, රුහුණු ජනතාවගේ විරුද්ධත්වය වැනි අභියෝග ගණනාවකට සාර්ථකව මුහුණ දෙමින් ක්‍රියාකළ බව හඳුනාගත හැකි අතර පාලන තන්ත්‍රය විධිමත් කරමින් කටයුතු කළ අයෙකු බව ද පැහැදිලි වේ.

**ආර්ථික කටයුතු**

නිශ්ශංකමල්ල රජු රට වැසියාගේ ආර්ථික ශුභසිද්ධිය සඳහා වැව් තැනීම හා වාරි මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදී. පාණ්ඩිවිජයකුළම වැව මොහු විසින් ඉදිකරන ලද බව **ගල්මැටියාන වැව් සෙල්ලිපිය** මගින් පැහැදිලි වේ. නිශ්ශංකමල්ල රජු අයබදු අංශයේ ද ඇතැම් ප්‍රතිසංස්කරණ සිදු කළේය. පෙර රජුන් විසින් ගන්නා ලද අසාධාරණ අයබදු නිසා පීඩාවට පත් වූ රට වැසියන්ට සහනයක් ලබා දීම් වස් පස් අවුරුද්දක අයබදු නොගෙන අත්හළ බව **අනුරාධපුර රුවන්වැලි දාගැබ අසල ලිපිය, හැටදාගේ ප්‍රවේශශාලා ලිපිය** ආදියේ සඳහන් කරයි. මතුවට එන රජවරුන් විසින් අධික අයබදු ගැනීම වළක්වාලීම සඳහා අයබදු තක්සේරු කරන පිළිවෙළ ද නියම කළේය. "සෙහෙත් කටුසර අය", "සෙහෙත් කොටාගත් තැන අය", "කැති අඩ" සහ "කොටු කනබ අය" නම් බද්දක් නිශ්ශංකමල්ල රජු විසින් නැති කර දැමූ බව **අනුරාධපුර රුවන්වැලි දාගැබ අසල ලිපිය, දඹුල්ල ලිපිය** ආදියේ සඳහන් වේ. තවද ජනතාව වෙනුවෙන් තුලාභාර දානයන් දීම් සිදුකළ බව **අනුරාධපුර රුවන්වැලි සෑ පුවරු ලිපියේ, හැටදාගෙයි ප්‍රවේශශාලා බිත්ති ලිපිය** හා **ගල්පොත** සෙල්ලිපිවල තොරතුරු අනුව පැහැදිලි වේ.

**පරිපාලන කටයුතු**

නිශ්ශංකමල්ල රජු බලයට පත්වන විට මෙරට පැවතියේ 1 වන විජයබාහු රජු විසින් ආරම්භ කර 1 වන පරාක්‍රමබාහු රජු විසින් ප්‍රතිසංවිධානය කරන ලද පාලන ප්‍රතිපත්තිය බව පැහැදිලි වේ. පොළොන්නරුව සිය දේශපාලන කේන්ද්‍රස්ථානය බවට පත්කර ගත් ඔහු පෙර රජුන් දවස ගෙනගිය දේශපාලන ක්‍රියාකලාපයන් දෙස අවදියෙන් සිටිමින් මුළු දිවයිනම සිය කේන්ද්‍රස්ථානය මගින් පාලන කටයුතු ගෙනයාමට උනන්දු වී ඇති බව පෙනේ. නිශ්ශංකමල්ල රජුගේ ලිපිවල ඉතාම පැහැදිලි ලෙස ඈපා, මාපා තනතුරු දැරූවන් සම්බන්ධව තොරතුරු පෙන්වා දී ඇති තිබේ. රජු සමඟ රාජ සභාවේ "උරෙහිදා වීරබාහු මාපාණන් වහන්සේ" ද වූ බව **දොරටියාව සන්නස** අනුව පෙනියයි. රජු තුලාභාර නඟින අවස්ථාවලදී නිරතුරුවම ඔහු සමඟම ඈපා, මාපාවරුන් විසූ බව **හැටදාගෙයි ප්‍රවේශශාලා බිත්ති ලිපිය** හා **ගල්පොත** සෙල්ලිපිවල සඳහන් වේ. ඒ අනුව පෙනී යන්නේ නිශ්ශංකමල්ල රජු මෙම ඈපා, මාපා තනතුරු දැරූවන් රුහුණ සහ මායා රට පාලනය සඳහා යොදා නොගත් බවයි. පරාක්‍රමබාහු රජු යුද්ධාධිකාරීන් යොදවා ගනිමින් රුහුණ වැනි ඈත පෙදෙස් පාලනය කළ ද නිශ්ශංකමල්ලට එවැනි සහායක පිරිසක් නොසිටි බව පෙනේ.

නිශ්ශංකමල්ල රජු විසින් සූක්ෂම උපක්‍රම රාශියක් ක්‍රියාත්මක කරමින් වසර නවයක පමණ සාර්ථක පාලනයක් ගෙනගිය අතර එම සාර්ථකත්වය සඳහා විරාගතව පැවත ආ චරපුරුෂ සේවාව බෙහෙවින් ප්‍රයෝජනයට ගැනීමට සමත් වූ බව දක්නට ලැබේ. සිය රාජ්‍යයේ දුර බැහැර පළාත්වල විසූ ජනයා සමඟ පෞද්ගලික සබඳතා ඇතිකර ගැනීමට නිශ්ශංකමල්ල රජු දැරූ ප්‍රයත්නය තවත් ලක්ෂණයකි. රාජ්‍යයේ නිත්‍ය චාරිකාවල යෙදුණු බව නිරතුරුව සෙල්ලිපිවල සඳහන් කිරීම නිසා මෙම තත්ත්වය හඳුනාගත හැකි ය. **හැටදාගේ ප්‍රවේශශාලා බිත්ති ලිපිය** හා **වාදුරුප්ප ලිපිය** අනුව රජු ශ්‍රී ලංකාවේ සතර දිග ප්‍රදක්ෂිණා කර ඇත්තේ රජ වී දෙවසරක් ගිය තැනය. ඓතිහාසික වශයෙන් ගත්කල නිශ්ශංකමල්ල රජු මේ ආකාරයට චතුරංගනී සේනාව කැටුව චාරිකාවල නිමග්නව ඇත්තේ එක් අතකින් ඔහුගේ ආත්මාරක්ෂාව සඳහා වේ. පුරතන ඉන්දියාවේ දේශපාලන න්‍යායන් දෙස බලන විට චක්‍රවර්තී රාජ්‍ය සංකල්පය තුළ ද මේ ආකාරයට චක්‍රවර්තී රජු සිය සිව්රඟ සෙනඟ සමඟ සිය රාජ්‍යයේ උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර ආදී වූ සෑම ප්‍රදේශයකටම ගමන් කරමින් තම දේශපාලන ආධිපත්‍ය වර්ධනය කරගැනීමට කටයුතු කළ බව හඳුනාගත හැකිය.

රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි ඔහු තුළ පැවති ඉමහත් වූ පෞද්ගලික උනන්දුව, දූෂණ ක්‍රියාවන්හි නොයෙදෙන ලෙස භාණ්ඩාගාරයේ නිලධාරීන්ට අවවාද අනුශාසනා දීම සඳහා පිහිටුවා ඇති **ගල්පොත ලිපිය** ආදිය අධ්‍යයනයෙන් අවබෝධ වේ. මෙම තත්වයට සමාන උපදේශයන් **කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි** ද ලබාදී ඇති බව පෙනේ. නිශ්ශංකමල්ල මනා පෞරුෂත්වයකින් හෙබි පාලකයෙකු බව ජනයාට ඒත්තු ගැන්වීමට තමාට පෙර සිටි රජවරුන් කිසිවෙකු හෝ භාවිත නොකළ විරුදනාම භාවිතයට ගෙන ඇති බව පෙනේ. "පරාක්‍රමබාහු", "කාලිංග ලංකේශ්වර", "චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ", "අප්‍රතිමල්ල" ආදී විරුදනාම යොදා ගැනීමෙන් ඔහු බලාපොරොත්තු වන්නට ඇත්තේ තම තේජස පිළිබඳ මෙරට ජනයා තුළ ගෞරව භක්තිය ඇති කිරීමය. නිශ්ශංකමල්ල රජු විසින් සිය රාජ්‍ය පුරාවටම අණසක පතුරුවා තබා ගැනීමට ගත් තවත් උත්සාහයක් ලෙසට රාජ්‍ය උරුමය හිමිවීම පිළිබඳ දක්වන ආකල්පය වැදගත් වේ. එතුමා රජකම උරුම විය යුතු ආකාරය සම්බන්ධයෙන් ද යම් සම්ප්‍රදායක් අනුගමනය කොට තිබේ. පොළොන්නරුව **උතුරු දොරටු ලිපියේ** රාජ්‍ය උරුම නීතිය ප්‍රකාශයට පත් කිරීමේ දී ඔහු ගල්පොත ලිපියේදීට වඩා ප්‍රවේශමෙන් වචන යොදා තිබෙන්නේ ද වීරබාහුගේ නාම යෝජනය පිළිබඳ මත භේදයක් තිබූ නිසාය. අනෙක් අතට යුවරාජයන් නැති කල බිසෝවරුන්ට පළමු අනෙක් රජ කුමාරයන්ට අවස්ථාව ලැබිය හැකි බව දක්වයි. තවද නිශ්ශංකමල්ල රාජ්‍ය සමයේ පැවති ඇතැම් ඉදිකිරීම් දෙස බලන විට එකල දේශපාලනයේ ඇතැම් අංශයන් පිළිබඳ තොරතුරු හමු වේ. විශේෂයෙන් ම පරිපාලන තන්ත්‍රයේ ක්‍රියාකාරීත්වයන් සිදු වූ ආකාරය පිළිබඳ මනා චිත්‍රයක් මේවා තුළින් දැකිය හැකි ය. මෙහිදී රාජසභාව හා මන්ත්‍රණ සභාව යන නිර්මාණයන් දෙක සුවිශේෂී බව පෙනේ.

**රාජසභාව**

මේ යුගයේ පාලන තන්ත්‍රය මෙහෙය වූ ප්‍රධාන නියමුවා රජ වුවද, ඔහුට සහාය වීම සඳහා කිසියම් උපදේශක මණ්ඩලයක් සිටි බව පැහැදිලි ය. නිශ්ශංකමල්ල විසින් ලෝකේනාවන්ට දොරටියාව පමුණුව ලබා දීමේදී ඇමති ගණා පිරිවරා සිටි බව **දොරටියාව සන්නසෙහි** සඳහන් වන අතර මෙහි ඇමති ගණාට ඇතුළු වූ අය නම් අගබිසව, දෙවන බිසව, යුවරජු සෙනෙවිරත් අධිකාරිවරුන් තිදෙනෙක් හා සභාපතිනා යන අය වෙයි. මේ දෙපළෙහිම දැක්වෙන ඇමති ගණා යන්න පනාකඩුව ලිපියේ යෙදුණු රාජගණා යන්න වෙනුවටම යෙදූ වචනයකැයි ද, ඉන් සාමාන්‍යයෙන් රජුගේ සභාව යන අදහස හැඟෙන බව පරණවිතාන පෙන්වා දී ඇත. මේ සභාවේ සිටියවුන් වැඩි වශයෙන් ඇමතිවරුන් හෙයින් ඇමති ගණා ව්‍යවහාර වන්නට ඇතැයි ද ඔහු තවදුරටත් පෙන්වා දෙයි.

**මන්ත්‍රණ සභාව**

නිශ්ශංකමල්ලගේ මන්ත්‍රණ සභා ගොඩනැගිල්ලේ නටබුන් හඳුනාගෙන ඇත. මෙහි තිබී ඔහුගේ ශෛලමය සිංහාසනය හමුවී තිබේ. එහි "ශ්‍රී විරිඳු රාජ වීර වේශ්‍යා භුජංග නිශ්ශංක ලංකේශ්වර කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ වැඩ හුන් වීර සිංහාසනයයි" යන වාක්‍ය සඳහන් ව ඇත. **හැටදාගෙයි ප්‍රවේශශාලා බිත්ති ලිපියෙහි** "ශෛලමය කොට වීර සිංහාසනය ද කරවා" වශයෙන් මේ සිංහාසනය පිළිබඳ සඳහන් කර තිබේ. රජු සිංහාසනයේ හිඳගත් විට ඒ ඒ නිලධරයන් අසුන් ගත් ආකාරය කුළුණුවල කොටා ඇති නිසාවෙන් මෙම මන්ත්‍රණ සභාව පිළිබඳව තරමක පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. එහි සැලැස්මට අනුව රජුගේ දකුණු පසින් පිළිවෙළින් යුවරාජයන්, ඈපාවරුන්, සෙනෙවිරදුන්, ප්‍රධානයන්, පොත්වරුන් ඇතුළු කායස්ථයක් ද, වම්පසින් තුන්වන පේළියේ සිට මාණ්ඩලිකවරුන්, චෞරායිවරුන් හා කඩසෝෂ්ඨියේ ඇත්තවුන්ද හිඳගෙන සිට බව පැහැදිලි වේ.

නිශ්ශංකමල්ල සමය පිළිබඳ විමසන විට විදේශ සබඳතා කීපයක් පිළිබඳ තොරතුරු හමුවේ. චෝළ හා පාණ්ඩ්‍ය රාජ්‍ය දෙවරක් ආක්‍රමණය කොට කප්පම් ලබා ගත් බව **දඹුල්ල ගිරි ලිපිය** හා **කිරිවෙහෙර පුවරු ලිපියේ** සඳහන් වේ. ජයග්‍රාහී පාණ්ඩ්‍ය ආක්‍රමණය අනුස්මරණය කිරීම සඳහා පාණ්ඩිවිජයකුළම වැව තැනූ බව **ගල්මැටියාන වැව සෙල්ලිපියේ** සඳහන් වේ. පරාජිත රජවරුන්ගෙන් කප්පම් ලබාගෙන දිළිඳු ජනයාට තුලාභාර දාන දී, එම ප්‍රදේශවල දානශාලා පිහිටුවා, නිශ්ශංකේශ්වර නම් දේවාලයක් ද ඉදි කළ බව **රංකොත්වෙහෙර ටැම් ලිපියේ** සඳහන් වේ. කලිංග, වෙගි, කර්ණාට, නෙල්ලූරු, ගුර්ජර යනාදී රාජ්‍ය සමඟ නිශ්ශංකමල්ල විවාහ සම්බන්ධතා ඇතිකරගත් බව **හැටදාගේ ප්‍රවේශශාලා බිත්ති ලිපියේ** සඳහන් වෙයි.

**සමාජමය තත්ත්වය**

නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපි අධ්‍යයනයේ දී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයක් වන්නේ සමාජයේ විවිධ ස්ථර නියෝජනය කරන බව පෙනීයාමයි. මෙම ස්ථර වනාහි පූජක

පංතියේ සිට රජු, රාජ සභාව, ගොවි, වෙළඳ, කම්කරු, සාමාන්‍ය ජනතාව ආදී ලෙසට සමාජය තුළ බෙදී ගිය රටාවක් පෙන්නුම් කරයි. දොළොස්වන සියවස අග භාගයේදී නිශ්ශංකමල්ල රජු ක්ෂත්‍රියන් රජකමට තෝරා ගත යුතු බවත් ගොවි කුලයෙහි අය රාජ ලීලාවට නොපැතුව යුතු බවත් පවසා තිබේ. නිශ්ශංකමල්ල රජුගේ පාලන සමය තුළදී සමාජයේ ස්ථරගත වීම පිළිබඳ විමසන විට ආගමික නායකයා ලෙස පිළිගත් භික්ෂුවට සමාජයේ මෙන්ම රාජ්‍යයේ ද ප්‍රමුඛත්වය ලැබී ඇති බව දැකිය හැකිය. මෙම ස්තරයේ ප්‍රභූත්වය දරන රජු වනාහි ඉහළම ස්ථරය නියෝජනය කරයි. භික්ෂූන් හා සමතැන් නොගත්ත ද සමාජය තුළ සෙසු පිරිස් නියෝජනය කරන ස්ථරයන්ට වඩා ඉහළම ස්තරයේ රජු වැජඹෙන බව පැහැදිලි ය. නිශ්ශංකමල්ල රජුගේ රාජ සභාවේ සිටි "පොත්වරුන්" හා "කායස්ථවරුන්" යන තනතුරු දැරූ නිලධාරීන් ඔහුගේ දකුණු පස අසුන්ගෙන සිටි නිලධරයන් වේ. එසේම ඔවුහු කිසියම් ධුරාවලියකට අනුව සමාජගත වී ඇති අතර රජුගේ රාජ සභාවේ වම්පස සිටි පිරිස් ද මේ ආකාරයටම සමාන ස්ථරයන් නියෝජනය කළවුන් වේ.

**ආගමික හා සංස්කෘතික කටයුතු**

නිශ්ශංකමල්ල රජු විසින් ගෙනගිය උපක්‍රමශීලී ප්‍රතිපත්තියේ එක් කඩයිමක් ලෙසට එතුමාගේ ශාසන අනුග්‍රහය සහ එතුමන් විසින් ඇති කළ සංස්කෘතික අභිවර්ධනය හේතු සාධක වන්නට ඇත. ඔහුගේ ආගමික ශ්‍රද්ධා සම්පන්නභාවය ඉස්මතු කරන තවත් වැකියක් එතුමාගේ **රුවන්වැලි සෑ පුවරු ලිපියෙන්** හඳුනාගත හැකි ය. රජු රුවන්වැලි සෑය පෙනෙන මායිමේදී රථයෙන් බැස ශ්‍රී පාදයෙන් රුවන් මළුවට පැමිණ තිබේ. අනතුරුව විවිධ පූජා පවත්වා තිබෙන බව පෙනේ. **වාදුරුප්ප ලිපියේ** සඳහන් වන "තුන් නිකා සමගි කොට" යන කියමන ද **දඹුලු ලිපියේ** එන "බෝ කල් බින්නව තිබූ තුන් නිකාහි සඟරුවන් සමඟ කරවා තෙවලා බුදුන් වදන් ද" යන පාඨය ඔහු තුන් නිකාය සමඟි කරවූ බවට හඳුනාගත හැකි තොරතුරු ඉදිරිපත් වන බව පෙනේ. දුශ්ශීල භික්ෂූන් වහන්සේලා ශාසනයට මහත් හානියක් සිදු කරන්නේය යන හැඟීම ඇතිව ඔහු විසින් සිය අභිලේඛනවල සඳහන් කරන "ගුණ නැතිව ගත් මහණ වෙස්ගෙන" යනුවෙන් දක්වන සඳහන් අතිශය වැදගත් ය. භික්ෂූන් වහන්සේලාට සිවුපසයෙන් උවටැන් කරමින් ඔවුන් වහන්සේලාගේ නෑයන්ට ද නොයෙක් ආකාර වස්තූන්ගෙන්ගෙන් සංග්‍රහ කර තිබේ. ධර්මධර, ශාස්ත්‍රධර, පඬිවරුන්ට අනුරූප වෘත්ති ලබා දී කඨිනදාන, දේවදාන දරු කුසලාන්, පෙර පරිද්දෙන් තමා ලබා දුන් අතර අවුරුදු පතා මහණුවම් ද කරවිය.

**වාස්තු විද්‍යාව**

නිශ්ශංකමල්ල රජු සිංහල පෑ හැටකදී හෙවත් එක් දවසකදී ගොඩ නංවන ලදැයි ජනප්‍රවාදයේ සඳහන් හැටදාගෙය නම් දළදාමැඳුර කරවන ලද බව ද පෙනේ. තවද රංකොත් වෙහෙර ඉදිකර ඇති බවද නිශ්ශංකමල්ල රජු මෙයට දී ඇත්තේ රුවන්වැලි දාගැබ යන නාමය බවද පෙනේ. නිශ්ශංකමල්ල විසින් අලුත්වැඩියා කරන ලදැයි සැලකෙන වටදාගෙය ඊට පෙර කාලයන්ට අයත් චෛතියඝරයක් ලෙසද සළකනු ලබයි. රජු දළදා වහන්සේ වැඩ පුදාගෙන

ඇත්තේ නිශ්ශංකලතා මණ්ඩපයේ සිට බව පෙනේ. එහි වේදිකාවේ ද කණුවල ද ඇති ලිපිවලට අනුව එය නිශ්ශංකමල්ල කර වූ බවට සනාථ වේ. සත්මහල් ප්‍රාසාදය මොහු ඉදිකළ තවත් නිර්මාණයක් ලෙස සැළකේ. තවද රජ මාළිගය, රාජ මන්ත්‍රණ සභාව සහ විවිධ පොකුණු ඉදිකර ඇති බවද හඳුනාගත හැකිය.

**නිශ්ශංකමල්ල රජුගේ දේශපාලන දර්ශනය**

නිශ්ශංකමල්ල රජුට රාජ්‍ය බලය ලබා ගැනීමේදී හා පවත්වාගෙන යාමේදී අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වූ බව දක්නට ලැබේ. විශේෂයෙන්ම ඔහුට එරෙහි බලවේග ගණනාවක් ක්‍රියාත්මක වී තිබේ. මේ නිසා වඩා ප්‍රශස්ත වූත් ජනහිතකාමී වූත් පාලනයක් ගෙන යමින් තමා මෙරට රාජ්‍ය පාලනයට වඩාත් සුදුස්සෙකු වන බව පෙන්වීමට ද තම විරුද්ධවාදීන්ට පිළිතුරු සැපයීමට ද අවශ්‍ය විය. මෙකී අවශ්‍යතාවන්ට සරිලන ආකාරයෙන් තම දේශපාලන දර්ශනය සකස් කර ගැනීම සඳහා තමන්ට පෙර සිටි පාලකයන් අනුගමනය කරනු ලැබූ වැදගත් ප්‍රතිපත්තීන් ද, ඉන්දීය දේශපාලන දර්ශනයන්හි අන්තර්ගත වැදගත් අවස්ථාවන් ද, බෞද්ධ දේශපාලන දර්ශනය ද ආදර්ශ කොට ගනිමින් නව මුහුණුවරකින් යුතු දේශපාලන දර්ශනයක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ බව හඳුනාගත හැකිය.




**පූර්ව පාලකයන්ගේ ප්‍රතිපත්තීන්හි ආභාෂය**

නිශ්ශංකමල්ල රජු තමාට පෙර සිටි වැදගත් පාලකයෙකු වන 1 වන පරාක්‍රමබාහු රජුව ආදර්ශයට ගෙන තිබේ. **ගල්පොත ලිපියේ** අන්තර්ගත තොරතුරු විමසන විට පරාක්‍රමබාහු රජුගේ චරිතයට විවිධ අයුරින් සම්බන්ධ වීමට උත්සාහ කර ඇති ආකාරය තමා පරාක්‍රමබාහු රජුගේ බෑණා බව ප්‍රකාශ කිරීමෙන් ද, තමාව මෙරටට ගෙන්වා ශිල්ප ශාස්ත්‍රයෙහි නිපුණ කරවන ලද්දේ පරාක්‍රමබාහු රජු බව දැක්වීමෙන් ද, පරාක්‍රමබාහු මෙන් තමන් ද පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කළ බව දැක්වීමෙන් ද පැහැදිලි වේ. එමෙන්ම පෙර පාලකයන් ජනතාවගෙන් අධික ලෙස බදු අයකළ බවත් එනිසා තමන් බදු අඩුකළ බවත් දැක්වෙන තොරතුරු අනුව පෙර පාලකයන්ගේ අඩුපාඩු හඳුනාගනිමින් තමන් එම අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කළ බව දැකිය හැකිය.

ඉන්දියාවේ අශෝක රජුගේ පරිපාලන කටයුතු හා පාලන තන්ත්‍රයෙහි සැකැස්ම විමසන විට ඔහු වැදගත් දේශපාලන දර්ශනයක් අනුගමනය කළ බව පැහැදිලිය. විවිධාකාරයෙන් උපදේශයන් හා අවවාදයන් සපයන ලිපි පද්ධතියක් අශෝක රජු පිහිටුවා තිබෙන අතර ඒවා මගින් දේශපාලන දර්ශනය පිළිබඳව ද තොරතුරු ඉස්මතු වේ. නිශ්ශංකමල්ල රජු විසින් අශෝක රජුගේ චරිතය ආදර්ශයට ගත් බව ඇතැම් කරුණු ඇසුරින් පැහැදිලි වේ. නිශ්ශංකමල්ල රජු ද අශෝක රජු මෙන් මෙරට සෙල්ලිපි විශාල සංඛ්‍යාවක් පිහිට වූ අතර තම ලිපි පවා අශෝක ලිපි ස්වරූපයෙන් ලියවන්නට ද උත්සාහ කළ බවක් ඉස්මතු වේ. (ප්‍රනාන්දු, 1976 : 168) අශෝක රජු පිහිට වූ බොහෝ සෙල්ලිපිවල අන්තර්ගත වන්නේ රට වැසියාගේ සදාචාරය වර්ධනය කිරීම සඳහා දුන් උපදේශයන්ය. නිශ්ශංකමල්ල රජු ද සාමාන්‍ය රට වැසියාට විවිධ අවවාදයන් සිදු කර තිබේ.

අශෝක රජු මෙන් නිශ්ශංකමල්ල රජු මනුෂ්‍යයන්ට මෙන්ම සත්ත්වයන්ට ද අභයදානය දුන් බව සෙල්ලිපි කීපයකම දක්වා ඇත. අනුරාධපුරයේ **රුවන්වැලි සෑ පුවරු ලිපියෙහි** "නුවරට හාත්පසින් සත් ගව්වක් පමණ තැනැ හැමැ සතුන් නොමැරිය හැක්කැයි අභය දී බෙර ලබා දොළොස් මහ වැ තැනැ මසුන්ට අභය දී කාබොදින්ට රත්පිළි ආදි වූ කැමැති වස්තු දී පක්ෂීන් නොබදන නියායෙන් සම්මත කොට පක්ෂීන්ට අභය දී" වශයෙන් එහි සඳහන් වන අතර **රංකොත්වෙහෙර ටැම් ලිපියේ** "තුන් රජයෙහි නොඑක් මහ වැ තැනැ අවශේෂ ප්‍රාණීන්ට අභය දී" ලෙස සඳහන් වේ. මෙරට පාලනය කළ අමණ්ඩගාමිණී අභය වැනි පාලකයන් මාඝාත වැනි ආඥාවන් පනවමින් සත්ව ඝාතනය තහනම් කර තිබේ.

රට යථා තත්ත්වයට පැමිණවීමේ පියවරක් වශයෙන් නිශ්ශංකමල්ල රජු මුළු දිවයින පුරා සිවුරඟ සේනාව පිරිවරා සංචාරය කොට "පෙර රජුන් නොමඳ අයගෙන දුඃප්‍ර කළ ලංකාවාසීන්ට පස් හවුරුද්දක අය හැරි බවත්, දුකින් කරන සෙනෙහන් කටුසර අය හැම කලටම නොගන්නා නියායෙන් නියෝග පැණ වූ බවත් බදු අඩුකිරීම් හා කපා හැරීම් සිදුකළ බවත්" ඉහත දැක්වූ ලෙස ඔහු විසින් පිහිටුවනු ලැබූ නොයෙක් සෙල්ලිපිවල සඳහන් වේ. අශෝක රජු ද ඉන්දියාවේ නොයෙක් තැන්වල ඇවිද බවත් මෙසේ ඇවිද අවශ්‍ය කටයුතු සඳහා ජනපද ජනයාත් ශ්‍රමණ බ්‍රාහ්මණයනුත් වයෝවෘද්ධයනුත් හමු වූ බව අශෝක රජුගේ ලිපිවල සඳහන් වී ඇත. මෙසේ රටේ සංචාරය කළ අවස්ථාවල සමහර තැනක දී ඔහු එතැන්හි වාසය කළ මිනිසුන් විසින් ගෙවිය යුතුව තිබූ අයබදු අඩුකළ පුවත් හමුවේ. **රුම්න්දෙයි ලිපිය** අනුව බුදු රජුණ් උපත ලද ස්ථානය වන්දනාමාන කළ අශෝක රජු එහි වැසියන්ගේ බදු අඩුකර තිබේ. අශෝක රජු මෙලෙස සිය රට පුරා සංචාරය කළේ රට සමෘද්ධිමත් කිරීමට වඩා රටේ සම්භාවනීය තැනැත්තන් හමු වී අදහස් හුවමාරු කිරීමටත් සිද්ධස්ථාන වැඳපුදා ගැනීමටත් බව දක්නට හැකි ය. එහෙත් නිශ්ශංකමල්ල රජු රට පුරා සංචාරය කළේ හුදෙක් දේශපාලන අරමුණක් ඉටු කර ගැනීමට බව පැහැදිලි ය.

**ඉන්දීය දේශපාලන න්‍යායන්හි ආභාෂය**

ඉන්දීය දේශපාලන න්‍යායන්හි ආභාෂය නිශ්ශංකමල්ල රජුට ලැබුණු බවට සනාථ වන සාධක හමු වේ. ඉන්දීය දේශපාලන න්‍යායන් පොළොන්නරු යුගයෙහිදී පරිශීලනය කළ බව මහාවංසයේ පරාක්‍රමබහු රජු පිළිබඳ තොරතුරු විමසන විට පැහැදිලි වේ. පරාක්‍රමබාහු කුඩා කල කෞටිල්‍ය ආදීන්ගේ නීති ශාස්ත්‍රයන් හදාළ බව මහාවංසකතාකරු සඳහන් කරයි. (ඌනපූරණසහිතො මහාවංසො, 61 පරි, 39 ගාථාව) තවද 2 වන විජයබාහු රජු මනු නීතිය කිසිසේත් උල්ලංඝණය නොකොට රාජ්‍ය කළ බව ද **මහාවංසයේ** සඳහන් වන නිසා (ඌනපූරණසහිතො මහාවංසො, 78 පරි, 09 ගාථාව) මනුධර්ම ශාස්ත්‍රය හැදෑරූ බව ද පැහැදිලි වේ. පරාක්‍රමබාහු විසින් නිශ්ශංකමල්ල ශාස්ත්‍ර ශාස්ත්‍රාගමයෙහි නිපුණ කරවන ලද නිශ්ශංකමල්ල රජු තම ලිපිවල දක්වන නිසාවෙන් කෞටිල්‍ය ආදීන්ගේ නීති ග්‍රන්ථ නිශ්ශංකමල්ල හදාළ බවට සැකයක් නැති බව මැන්දිස් රෝහණදීර මහතා ද සඳහන් කරයි. (රෝහණදීර, 1998 : 77)

**කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය**ට අනුව වල් වැස්සන් මෙන්ම සොරුන් ද යහමඟට හරවා ඔවුන් ද නිර්භීත භේවාභටයන් වශයෙන් යුද්ධ හමුදාවට බඳවා ගැනීම වැදගත්ය. (චාල්ස්, 1999 : 72-73) මෙම අදහස **ගල්පොත ලිපියෙහි** එන "නොඑක් ජනපදයෙහි ධර්මාධිකරණ ලවා අන්‍යාය නිවාරණ කොටැ" "සොරුනුදු සොරකම් කරන්නේ ධනාශායෙන් වෙදයි උන් උන් කැමැති වස්තු දී" සහ "කණ්ටක ශොධනය කොටැ" යන පාඨවලින් (Wickremasinghe, "Polonnaruwa ; Galpota slab inscription", 1928 : 105) ඉස්මතු වී පෙනේ. "කණ්ටක ශොධනය" යන්නෙන් අවුල් විසඳා යන සාමාන්‍ය අර්ථය ද මෙහි ගැනෙන නමුත් කණ්ටක ශෝධනය යනු සාපරාධි නඩු විසඳන අධිකරණයක් වශයෙන් මෞර්ය රාජ්‍ය සමයෙහි පැවතී තිබේ. එනිසා මෙහි අර්ථය වන්නේ "සාපරාධී නඩු විසඳා" යන්නයි. ගල්පොත ලිපියෙහි ධර්මාධිකරණය දක්වා ඇත්තේ සුළු නඩු හෙවත් සිවිල් නඩු විසඳු අධිකරණයක් වශයෙනි. මෙය "අධිකරණය ධර්මස්ථිය" යනුවෙන් අර්ථ ශාස්ත්‍රයෙහි හඳුන්වා ඇත. (චාල්ස්, 1999 : 61)

**ප්‍රීතිදානක මණ්ඩප ලිපියේදී** "අනෙක වධ බන්ධන තාඩනයෙන් හා ඉතා දුස්ථව ගියා වූ ලොකවාසීන්ට දඩනාදි නොයෙක් දෙය හැර" වශයෙන් ද **රංකොත්වෙහෙර ටැම් ලිපියේ** "මහාපරාධ කළ වුනුදු මෙය වන් කල අභය යැයි අභය දී" "මහණ බමුණු කණපි කුරුකුදු ආදී වූ දිනානාථ ජනයන් සනාථ කොටැ" ආදී වශයෙන් ද නිශ්ශංකමල්ල රජු පීඩිතයන්ට හා දුර්වලයන්ට සංග්‍රහ කළ අයුරු පැහැදිලි වේ. මෙහි වධ බන්ධන යන්නෙන් දක්වා දක්වා ඇත්තේ මරණීය දණ්ඩනය හා සිර දඬුවම්ය. අශෝක රජු ද මේ ආකාරයෙන් දඬුවම් ලැබූවන්ට සමාව දීමට ක්‍රියාකළ ආකාරය දක්නට ලැබේ. ඔහුගේ **දිල්ලි තෝප්‍රා ලිපිය** අනුව සෑම වසරකම සිරකරුවන්ට අභය දානය දී තිබේ. කෞටිල්‍ය විසින් ද රටක් දිනාගනු කැමති තැනැත්තෙකු විසින් වධ බන්ධනයෙන් මිනිසුන් නිදහස් කළ යුතු බව දක්වා තිබේ. (චාල්ස්, 1999 : 62) නිශ්ශංකමල්ල රජු තමා හමුවේ තිබූ නොයෙක් විරුද්ධ බලවේගයන්ට හැකි සෑම විටම සාමකාමීව, මුහුණ දීමට උත්සාහ කළ බවක් ඔහුගේ අවවාද පාඨයන් තුළින් පැහැදිලි වේ.

නිශ්ශංකමල්ල රජුගේ ලිපිවල දැක්වෙන ආකාරයට ප්‍රජාපාලකයෙකු ත්‍යාග සත්‍යයාදී ගුණ සමූහයකින් යුක්ත විය යුතුය. සෞම්‍ය ගුණය, ධීරතාව, ගැඹුරු බව හා ක්ෂාන්තිය ද ඔහුගේ ගුණාංග අතර විය යුතුය. රජු ශාස්ත්‍ර ශාස්ත්‍රාගම සකල කලා විද්‍යායෙහි නිපුණ විය යුතුය. "ජනතාවත් ශාසනය රැකීම රජුගේ අද්විතීය කාර්යය වන්නේය." "කුලාචාර ද රැක්ක යුතුය" යන ප්‍රකාශ රජුගේ ලිපිවල නිතර දක්වා ඇත. මෙසේ නිශ්ශංකමල්ල රජුගේ ලිපිවලින් අනාවරණය වන රාජ චරිත ලක්ෂණ අර්ථ ශාස්ත්‍රයෙහි දැක්වෙන රාජ චරිත ලක්ෂණයන්ට අනුකූල වන බව මෙහිදී හඳුනාගත හැකිය. **කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි** දැක්වෙන ආකාරයට රට අල්වාගත් රජු රජුගේ විස්මයජනක ක්‍රියාවන් දුටු ජ්‍යොතිශාස්ත්‍රඥයන්, ශාස්ත්‍ර කියන්නන්, නිමිති කියන්නන් හා කථාන්තර කියන්නන් ආදී තැනැත්තන් දෙවතාවන් සමඟ කථාබහ කොට ඔවුන් ආශ්‍රය කිරීමට රජු කෙරෙහි ඇති කුසලතාව රට තුළ පතළ කර හැරිය යුතුය. එමෙන්ම රජු ඉදිරිපිට දේවතාවන් පෙනී සිටිය බවත් දිව්‍යමය අවි ආයුධ සහ අගනා වස්තුව රජුට ලැබෙන බවත් පිටරටවල පතළ කළ හැරිය යුතුය. (ප්‍රනාන්දු, 1976 : 174) මේ ආකාරයෙන් නිශ්ශංකමල්ල රජු ද තමා පිළිබඳ නොයොක් අතිශයෝක්තිගත තොරතුරු දක්වා තිබේ. **ගල්පොත සෙල්ලිපිය** අනුව මොහුට කුරිරු වැළහින්නක මුණ ගැසී තිබෙන අතර ඔහුගේ මහා නද තෙද නිසා වැළහින්නගේ දිව කැඩී සිය පිළුන් සමඟ ඔහු පා පිට වැටී තිබේ. තවද ඔටුනු මඟුලෙහිදී අහස් කුස පුරවමින් මහා මේඝ කුළක් පැමිණෙන්නට වූ අතර ඔහු කිපී බැලීමෙන් පමණක් මහ මේ කුළු බියවී විසිරී ගිය බව දක්වයි.

නිශ්ශංකමල්ල රජු **මනුස්මෘතිය** හෙවත් **මානව ධර්ම ශාස්ත්‍රය** ආදර්ශ කොටගත් බවට ද තොරතුරු හමුවේ. මානව ධර්ම ශාස්ත්‍රය පොළොන්නරු සමයේ ලක්දිව ප්‍රචලිත වූ බව 2 වන විජයබාහු රජු මනු නීතිය කිසිසේත් උල්ලංඝණය නොකොට රාජ්‍ය කළ බව **මහාවංසයේ** සඳහන්ව තිබීමෙන් පැහැදිලි වේ. (ඌනපූරණසහිතො මහාවංසො, 78 පරි, 09 ගාථාව) නිශ්ශංකමල්ල රජු ද ධර්ම නීති දත් කෙනෙකු බව **උතුරු දොරටුවේ පුවරු ලිපියෙහි** සඳහන් වී ඇත. එම ලිපියෙහිම ඔහු නීතියෙහි නිපුණ කෙනෙකු හෙවත් "නීති කුශල" වශයෙන් හඳුන්වා තිබේ. "ධර්මනීති" යන්නෙහිදී ධර්ම යන්නෙන් හැඟවෙන්නේ රාජධර්ම බව නිගමනය කළ හැකිය. නීති කුශල යන්නෙන් හැඟවෙන්නේ නීති ශාස්ත්‍ර යන ග්‍රන්ථ විශේෂයෙන් ප්‍රගුණ කළ බව පෙනේ. අර්ථ ශාස්ත්‍රයෙහි කර්තෘ වශයෙන් සලකනු ලබන චාණක්‍ය පිළිබඳ මහාවංසටීකාවෙහි වර්ණනා කර ඇත්තේ ද "නීති පුරිස" යනුවෙනි. (ප්‍රනාන්දු, 1976 : 183)

රජ දරුවන්ගේ ගුණ මහිමය රට වැසියාට වටහා දීමට **ගල්පොත ලිපියේදී** නිශ්ශංකමල්ල උත්සාහ ගන්නේ මෙසේ ය. "රජ දරුවන් මනුෂ්‍ය රූපයෙන් සිටිය ද නරදේවතා හෙයින් දෙවියන් වහන්සේ සේ දැක්ක යුතුයි. රාජයන්ගේ දරු ඇපා මහපාවන් බාල වුවද ලෝක ස්වාමි හෙයින් රාජ්‍යයට බලා ගෙනැ" යනුවෙනි. **මනුස්මෘතියේ** සත්වන අධ්‍යායේ දැක්වෙන ලෙසට "බාලොපි නා වමන්තෞව්‍යො - මනුෂ්‍ය ඉති භූමිපඃ - මහතී දෙවතාහ්‍යෙ ෂ - නර රූපෙණ තිෂ්ඨති" එනම් බාල වූ භූපතියෙකු වුවද මනුෂ්‍යයෙකැයි අවමන් නොකොට යුත්තේය. ඔහු වනාහි නර රූපයෙන් සිටින මහා දේවතාවෙකි. මේ අනුව නිශ්ශංකමල්ලගේ ඉහත දැක් වූ අවවාද පාඨය මේ ශ්ලෝකය අනුවම ඉදිරිපත් කරන ලද්දක් බව නිගමනය කළ

හැකිය. තවද **මනුස්මෘතිය**, **අග්නි පුරාණය** වැනි ග්‍රන්ථවලට අනුව ඉන්ද්‍ර හෙවත් වස්තු දෙන්නා ද, යම හෙවත් දඬුවම් දෙන්නා ද රජුගේ ශරීරය තුළ වාසය කරයි. එනිසා රජු වනාහි දාන, දණ්ඩ දෙකම පමුණුවන අදෘශ්‍යමාන දෙවියෙකි. **උතුරු දොරටු ලිපියෙහි** දක්වා ඇති ඉහත අවස්ථාවම අනුව "නර දේවතා වැ සිටි රජ දරුවන්ගේ ගුණ මහිම නොදැන උන්ට අපරාධ කළවුන්ට දඬුවම් ලැබේ. රජුන් හිඟි රක්ක මිනිස් ලෝ නිරා සේ වෙයි. හිඟි රක්ක දෙව්ලෝ සෙ වෙයි. රජ දරුවන්ට ගන්නා දුක් සුවයට වපුරන බිජුවට ය. රජුන්ගේ රහස් දෙඩීම මරහු එන්නට මතුරන නියායැ. වෙළෙඳාම ගොවිතැන ආදී දෑ රජුන් නිසා වන්නේය. එහෙයින් රාජ රක්ෂායෙහි නොපමා විය යුතුය." ආදී වශයෙනි.

**බෞද්ධ දේශපාලන ප්‍රතිපත්තීන්හි ආභාෂය**

නිශ්ශංකමල්ල රජු පොදු රටවැසියාට හඳුන්වා දීමට උත්සාහ කළ දේශපාලන දර්ශනය බෞද්ධ මුහුණුවරකින් ඉදිරිපත් කිරීමට උත්සාහ කළ අයුරු හඳුනාගත හැකිය. රජ දරුවන් වරදට සුදුසු නිග්‍රහ කරන්නේ වෙදෙකු කරන පිළියමක් සේ හිත සිතිනි. "රජහු වැසියා අකටයුත්තෙන් වළකා අපායෙහි නොහිය දෙන්නාහ" යනාදී කියමන්වලින් පැහැදිලිව බෞද්ධ මුහුණුවරක් ගත් බව දැකගත හැකිය. රජුගේ කෝපයට ලක් වන්නවුනට අත්විය හැකි ඉරණම දක්වන **මනුස්මෘතිය** ගින්න තමාට ළංවූවෙකු පමණක් දවන බවද එහෙත් රජුගේ කෝපය නැමැති ගින්න ගව, ධන සම්පත් සහිත මුළු පවුලම නසන බවද කියයි. නිශ්ශංකමල්ල ද රාජ ද්‍රෝහ නම් පඤ්චානන්තරි කර්මය නොකට යුතු යැයි කියයි. බුදු දහමට අනුකූලව රාජ ද්‍රෝහය, පඤ්චානන්තරී කර්මයට සමාන කරයි. එසේ රාජ නීති දක්වන්නේ බෞද්ධ මුහුණුවරේ නිදසුන් ද ඉදිරිපත් කරමිනි. **උතුරු දොරටු ලිපියෙහි** "පාණාති පාතාදී දුශ්චරිත කළාහු ද විෂ කැවෝ ද තුමූ මතු නසිති. රාජද්‍රෝහ නම් කළවුන් ද, උන්ගේ වර්ග ද, උන් හා එක් වුවන් ද නසයි. එහෙයින් රාජද්‍රෝහ නම් සිතිනුත් නොසිතිය යුත්තාහයි" ඔහු පවසයි.තවද බෞද්ධ දේශපාලන දර්ශනයෙහි අන්තර්ගත ප්‍රතිපත්ති තමන් අනුගමනය කරන බව දක්වා තිබේ. තමන් දසරාජ ධර්මයෙන් රාජ්‍ය කරන බවත්, සතර සංග්‍රහ වස්තුවෙන් ලෝක-ශාසන සනසන බවත්, දස පින්කිරියවත් පුරන බවත් **ගල්ආසන ලිපියේ** සඳහන් කොට ඇත.

ඉතා දැඩි එහෙත් සහනශීලී ප්‍රතිපත්ති අනුගමනය කරමින් නිශ්ශංකමල්ල ක්‍රියාත්මක වී ඇත්තේ මෙරට ජනයා කාලිංග ආධිපත්‍යයට අවනත කර ගැනීමටය. තමා විදේශීය ජාතිකයෙකු ලෙස ශ්‍රී ලංකාවේ දේශපාලන යාන්ත්‍රණයට සම්බන්ධ වී ක්‍රියාත්මක වීමේ දී දේශීය වශයෙන් එල්ල විය හැකි බාධකයන් අවම කරවාලීමට උත්සාහ ගෙන ඇත. නිශ්ශංකමල්ල රට වැසියාගේ අර්ථ සිද්ධිය කෙරෙහි ඉතාමත් සැලකිල්ලක් දැක්වීය. උදාර පරිපාලන ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට ද සිය රාජ්‍යයේ ආරක්ෂාව ද, දේශපාලන අවශ්‍යතා අනුව සකසා ගැනීමෙන් ඔහුගේ කීර්තිය විජාතිකයෙකු සේ දේශීය වශයෙන් ගොඩනංවා ගෙන තිබේ. වසර නවයකට සීමා වූ නිශ්ශංකමල්ල රජුගේ පාලන කාලය තුළ ආගමික හා ලෞකික කාර්ය සන්සිද්ධීන් රැසක් ඉතා කෙටි කාලයක් තුළදී සපුරා ගනිමින් තම අභිප්‍රාය සාර්ථක කර ගැනීමට උත්සාහ කර තිබේ.

**සමාලෝචනය**

දේශපාලන දර්ශනයන්හි වැදගත්කම කෙබඳු වී ද යත් එය රාජ්‍යක පැවැත්ම තීරණය කළ හැකි ප්‍රබල සාධකයක් බව ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ. නිශ්ශංකමල්ල රජුගේ සියලු කටයුතු සමාලෝචනය කොට බලන විට පළමුවැනි පරාක්‍රමබාහු රජුගෙන් පසුව පොළොන්නරුවේ රජ වූ පාලකයින් අතුරින් දීර්ඝතම කාලයක් හා බලවත් පාලනයක් ගෙන යා හැකි වූයේ නිශ්ශංකමල්ල රජුට පමණක් බව පෙනේ. ඔහු වසර නවයක් වැනි කෙටි කලක් පාලනය ගෙනයනු ලැබුව ද එය සෑම අංශයකම පාහේ ඉතා වැදගත් සමයක් වූ බව පැහැදිලිය. මෙය නිශ්ශංකමල්ල රජු විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් බව පහසුවෙන් හඳුනාගත හැකි අතර මෙහිදී ඔහු උපයෝගී කරගත් දේශපාලන දර්ශනය ඔහුට මහගු පිටුබලයක් වූ බව පැහැදිලි වේ. ඒ අනුව පාලන උපක්‍රමයක් ලෙස නිශ්ශංකමල්ල රජු අනුගමනය කළ දේශපාලන දර්ශනය සාර්ථක වී ඇති බවක් පිළිබිඹු වේ. මෙරට පාලකයන් බොහෝ විට ඉන්දීය දේශපාලන දර්ශනයන් මැනවින් ප්‍රගුණ කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ බවට සාධක හමුවන අතර නිශ්ශංකමල්ල රජු ද ඒ ආකාරයෙන් ඉන්දීය දේශපාලන දර්ශනයන් මැනවින් භාවිතයට ගත් බවද පූර්ව පාලකයන් ද ආදර්ශයට ගනිමින් බෞද්ධ ප්‍රතිපත්ති ද යොදා ගනිමින් නව ආකාරයකින් දේශපාලන දර්ශනයක් ඉදිරිපත් කර ක්‍රියාත්මක කළ බව පැහැදිලිව නිරීක්ෂණය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ඌනපූරණසහිතො මහාවංසො**, (1959). සංස්. ඒ. පී. බුද්ධදත්ත හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ගුණවර්ධන, වී. ඩී. එන්. එස්. **අශෝක අධිරාජයාගේ ප්‍රජා පාලනය**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නිශ්ශංක, පියදාස. (1991). **මනුස්මෘති හෙවත් මානව ධර්ම ශාස්ත්‍රය**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චාල්ස්, එච්. පී. (1999). **කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍ර සාරය**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රනාන්දු, පී. ඊ. ඊ. (1976). “නිශ්ශංකමල්ල අශෝක හා කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය”, **හේන්පිටගෙදර අභිස්තව සංග්‍රහය**, සංස්. හේන්පිටගෙදර ඥාණාවාස ස්ථවිර හා කොන්ගස්වැවේ ආනන්ද හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

රණසිංහ, ශ්‍යාමා කුමාරි. (2018). **නිශ්ශංකමල්ල රජුගේ දේශපාලන භූමිකාව**, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රෝහණධීර, මැන්දිස්. (1998). **නිශ්ශංකමල්ල පොළොන්නරු යුගය**, මහරගම : තරංජී ප්‍රින්ට්ස්.

වික්‍රමසිංහ, සිරිමා. (1972). "පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ අන්තරාගාමිකයෝ : පොළොන්නරු රාජධානිය බිඳ වැටීම". **ලංකා විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය I කාණ්ඩය, II භාගය**, සංස්. හේමචන්ද්‍ර රාය, කැළණිය : විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

සෝමතිලක, මහින්ද. (2009). **නිශ්ශංකමල්ල අනුශාසනා හෙවත් පොළොන්නරුවේ ශිලා ලේඛන**, කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Sharma, Ram sharan, (1966). **Aspects of political ideas and institutions in Ancient India**, Delhi : Motilal Banarsidass Publishers Private Limited.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; slab inscription at the north gate of the citadel", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; Galpota slab inscription", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; Nishshankamalla slab inscription", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; Rankot dageba Pillar inscription", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; Priti danaka mandapa rock inscription", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

Wickremasinghe, D. M. de. Z. (1928). "Polonnaruwa ; Kalinga Park Galasana inscription", **Epigraphia Zeylanica Vol. II**, New Delhi : Asian Educational Services.

# ඉන්දියානු දර්ශනයේ එන උපනිෂද් දර්ශනය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක්

## A Brief Analysis of Upanishad Philosophy in Indian Philosophy

*D.K.G.Harsha Nilan Nawarathna*

*Department of Classical Language, Faculty of Arts, University of Peradeniya*

ලෝක ඉතිහාසය දෙස අවධානය යොමු කිරීමේදී භාරතීය ඉතිහාසයට හිමි වන්නේ ද අතිශය අනර්ඝ වූ ගෞරවයකි. පෙර අපර දෙදිග බොහෝ විද්වතුන්ගේ විචාරයට පාත්‍ර වූ ඓතිහාසික පසුබිමක් භාරතයට හිමි වී ඇති බව අතීත තතු අනාවරණය කිරීමේ දී අපට අවබෝධ කරගත හැකිය. එකල විසූ මිනිසුන් ඇදහිලි විශ්වාස මත මෙන්ම දාර්ශනික පසුබිමක් මත ද හිඳිමන් කටයුතු කළ බවට සාහිත්‍ය මූලාශ්‍රයන් දෙස් දෙයි. තවද එකී ජන කොට්ඨාසයන්ගේ ආගමික, සමාජීය, සංස්කෘතික හා දේශපාලන තත්වයන් පිළිබඳ ද නිගමනයකට පැමිණිය හැකිය. භාරතීය දර්ශනය වෛදික යුගය තරම්ම ඈතකට විහිදී යන්නකි. කාල නිර්ණය අනුව වර්ෂ සහස්‍ර ගණනාවක් එහාට අතීතයක් ඇති බවට එහි ඇති භාෂා ලක්ෂණ හා වාග්විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමෙන් අවබෝධ කරගත හැකිය. භාරතීය ඉතිහාසය තුළ මුලින්ම බිහි වී ඇත්තේ වේද ග්‍රන්ථයන් ය. වෛදික යුගය තුල අපට හමුවන ආදිම කෘතිය ලෙස ඍග් වේදය හැඳින්විය හැකිය. එනම් මෙය භාරතීය සාහිත්‍යයේද ආරම්භක අවස්ථාව යි. මුලින් ත්‍රිවේදයක් ලෙස වර්ධනය වී පසු කාලීනව මෙය චතුර්වේදයක් දක්වා වර්ධනය විය. එනම්,

1. ඍග් වේදය
2. යජුර් වේදය
3. සාම වේදය
4. අථර්ව වේදය (තිලකසිරි, 1958: 5)

යථෝක්ත සඳහන් වේද යුගය වන විට ජන සමාජය විවිධ වූ ඇදහිලි, විශ්වාස, ආගමික හා නිර්මාපක ආදි මතයන්හි එල්බ ගෙන විශ්වය හා පරිසරය කෙරෙහි අදෘශ්‍යමාන ස්වරූපක් ඉදිරිපත් කිරීමට උත්සහ ගෙන ඇත. ඒ අනුව ඔවුන් දේව විශ්වාසයන් හා දාර්ශනික චින්තාවන් ඔස්සේ ගමන් කර ඇත. එහි ප්‍රතිඵල ලෙස ස්වභාවික වස්තු වන්දනා කිරීම, බහුදේවවාදය, ඒකදේවවාදය, විශ්වාරම්භය හා යාගහෝම ආදි සංකල්ප කරලියට පැමිණ ඇත. ඉන් පසුව බිහි වන්නේ බ්‍රාහ්මණ ග්‍රන්ථ යුගයයි. මෙහිදී වේද ග්‍රන්ථයන්හී අන්තර්ගත කොටස් ම වඩාත් විස්තරාත්මක ව අටුවාකරණයෙන් බ්‍රාහ්මණ ග්‍රන්ථ රචනා කර තිබේ. කෙසේ වෙතත් ආගම හා දර්ශනය පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට මෙයින් මහඟු පිටුවහලක් ලැබෙයි.

තදනන්තරව පහළ වී ඇත්තේ ආරණ්‍යක ග්‍රන්ථ යුගයයි. මෙය බ්‍රාහ්මණ ග්‍රන්ථ සමඟ සසඳා බැලූ කල මේ යුගය වන විට මිනිසාගේ දාර්ශනික චිත්ත සන්තානයන් තුල යම් උච්චාවසයනයක් දැකිය හැකිය. බ්‍රාහ්මණ ග්‍රන්ථ සියල්ලටම පාහේ ආරණ්‍යක ග්‍රන්ථ රචනා වී ඇත. නමුත් බ්‍රාහ්මණික අදහස් පිළිබඳ විවේචනාත්මක ව කල්පනා කළ බුද්ධිමතුන්ගේ

දාර්ශනික සංකල්පනාවන් ආරණ්‍යක ග්‍රන්ථවල අඩංගු වී ඇත. මෙහි දී විශේෂත්වය වන්නේ ආරණ්‍ය වාසීන් විසින් මෙම ග්‍රන්ථ රචනා කිරීමත් ඔවුන් පමණක්ම මේවා පරිශීලනය කිරීමත් ය. මන්ද ග්‍රාමවාසීන් කෙරෙහි ඒවායේ අඩංගු කරුණු අවබෝධ කරගැනීමට තරම් බුද්ධියක් නොතිබුණු හෙයිනුත්, සාමාන්‍ය ජනයා අතර ට එවැනි ඉගැන්වීමක් ගියහොත් මිත්‍යා කල්පනාවට ලක්වේ යැයි සිතා මේවා ආරණ්‍යවාසීන් ට පමණක් සීමා කරගෙන තිබුණි. මේ යුගය වන විට මිනිසා අද්භූත දෙවල් කෙරෙහි පුදුම වීමට හෝ ඒ කෙරෙහි දේවත්වයක් ආරෝපණය කිරීමට උනන්දු වූයේ නැත. ඒ වෙනුවට විචාරත්මක බුද්ධිය මෙහෙයවා ඒවා පිළිබඳ පර්යේෂණ කිරීමට ප්‍රවිශ්ට විය.

ආරණ්‍යක යුගයෙන් පසුව එළඹියේ උපනිෂද් ග්‍රන්ථ යුගයයි. වෛදික දාර්ශනික යුගයේ ස්වර්ණතම යුගය ලෙස මෙම යුගය හැඳින්විය හැකිය. එමෙන්ම භාරතීය දර්ශනයේ හැරවුම් ලක්‍ෂය ලෙස උපනිෂද් යුගය හැඳින්වුවහොත් වඩාත් යෝග්‍යය යැයි උදක්ම හැඟිමි. මේ කාලය වන විට මිනිසා ඉතා සියුම් දේ පිළිබඳ පවා බොහෝ දුරට විද්‍යාත්මකව කල්පනා කර තීරණාත්මක විනිශ්චයකට පැමිණීමට තරම් ඥාන ශක්තියෙන් යුකත් විය. ඒ අනුව මුල් කාලයේ ස්වභාවික අපදාවන් හා කාලගුණ විපර්යාසයන්ට පවා ආශ්චර්යයී - අද්භූත ස්වරූපයක් ආරෝපණය කරමින් අන්ධ භක්තිය නිසා ඇති කරගන්නා ලද පදාර්ථ තාත්වික වශයෙන් කල්පනා කරමින් ඒ පිළිබඳ යථාර්ථාවබෝධයකට පත් වීමට මිනිසා සමත් විය. පසු කාලීන බොහෝ පඬිවරුන්ට ස්වකීය දාර්ශනික අධ්‍යයනයන් කෙරෙහි මූල බීජය සැපයී ඇත්තේ මෙම උපනිෂද් යුගයෙන් ය.

උපනිෂද් යන පදයට පෙර අපර දෙදිග බොහෝ විචාරකයන් විවිධ අර්ථ දක්වා ඇත. උප-නි පූර්ව වූ 'හිඳීම' යන අරුත දෙන √සද් ධාතුවෙන් මෙම පදය නිෂ්පන්න වී ඇත. මේ අයුරින් පදානුගතව යමින් බොහෝ විචාරකයෝ පොදුවේ අදහස් කිහිපයක් දක්වා ඇත. (වීරසිංහ, 1992 පි.3)

- ළඟ හිඳගැනීම.
- ළඟ හිඳගෙන ලබන දැනුම.
- යාග ගින්න ළඟ හිඳගෙන සිටීම. යනාදියයි.

තවද විවිධ විචාරකයන් ''උපනිෂද්'' යන්නට පර්යාය පදයක් වශයෙන් ''රහස්‍යම්'' යන වචනය දක්වා ඇත. එනම් රහස්‍ය ඉගැන්වීම යන්නයි. සමස්තයක් ලෙස ගත් කල උපනිෂද් වනාහි ''ගුරුවරයාගේ ළඟ හිඳගෙන රහසේ අධ්‍යයනය කරන ලද කරුණු අඩංගු ග්‍රන්ථ කොට්ඨාසය'' (කැකුළාවල, 1961 ඒ 18) උපනිෂද් යන්න සරලව අවබෝධ කරගත හැකිය. මෙහි අන්තර්ගත ග්‍රන්ථයන් ප්‍රාමාණිකව දැක්වීමේදී ද විවිධ අදහස් හමුවෙයි. උපනිෂද් ග්‍රන්ථ 200 ක් බව රාධා ක්‍රිෂ්ණා පෙන්වා දෙයි. එමෙන්ම උපනිෂද් ග්‍රන්ථ 11 සඳහා ශංකරාචාර්ය භාෂ්‍ය සපයා ඇත. බටහිර විචාරකයෙකු වූ ඩොයිසන් උපනිෂද් ග්‍රන්ථ සංඛ්‍යාව 13 ක් බව පෙන්වා දෙයි. නූතන විචාරකයන්ගේ පොදු පිළිගැනීම බවට පත්ව ඇත්තේ ද උපනිෂද් ගණනින් 13 ක් යන්නයි.

මෙවැනි උපනිෂද් දාර්ශනික සංකල්පයක් බිහි වීමට කරුණු කිහිපයක් ඉවහල් වී ඇති බව ඉතිහාස අධ්‍යයනයේ දී අනාවරණය කරගත හැකිය. (තිලකසිරි, 1958, 101-106 )

1. **විශ්ව නිර්මාපක මහා බ්‍රහ්මන් විචාරයට ලක් කිරීම හා බ්‍රහ්මන් පිළිබඳ නව අර්ථකථන සැපයීම.**
2. **බ්‍රාහ්මණයන්ගෙන් එල්ල වූ සමාජ පීඩනයට එරෙහි වී ක්ෂත්‍රිය කුමාරවරු වනගත වීම.**
3. **යාගයේ ශාන්තිය විචාරයට ලක් කිරීම හා යාගයේ භෞතිකත්වය ප්‍රතික්ෂේප කොට නව අර්ථ කථන සැපයීම.**
4. **භාවනායෝගීව ආභ්‍යන්තරික ඥානයෙන් ආත්ම තත්ත්වය ප්‍රත්‍යක්ෂ කරගැනීමට උත්සුක වීම.**

වෛදික යුගය වන විට භාරතීය සමාජය අන්තගාමී කුල බේදීමකට ලක් ව තිබුණි. එහිදී වැඩි බලයක් හිමි වූයේ බ්‍රාහ්මණික වංශිකයන්ට ය. ඔවුන්ගේ යාගහෝම ආදී අන්තගාමී ක්‍රියාවන් නිසා ක්ෂත්‍රියන් හා අනෙකුත් වර්ණ වැසියන්ද බොහෝ පීඩාවට පත් ව සිටියහ. මෙම පීඩාවන් නොඉවසූ ක්ෂත්‍රියෝ ඒවා පෙරලා විවේචනය කරන්න පටන් ගත්හ. අශ්වමේධ යාගය එහිලා කදිම නිදසුනකි. මුල්කාලයේ අශ්වයෙකු බිල්ලක් වශයෙන් ගෙන යාග කර්තව්‍ය සිදුකර ඇත. නමුත් උපනිෂද් යුගය වන විට එම චාරිත්‍ර වෙනස් කරමින් ඒ සඳහා අශ්වයාගේ හිස සහ ඇස් වශයෙන් සූර්යයා මෙනෙහි කර භාවනාවක යෙදීමට නියමකර ඇත. එකල බ්‍රාහ්මණ නියමයට අනුව මහා බ්‍රහ්මයාගේ අණට පිටු පෑ යාම දඬුවම් ලැබිය හැකි වරදකි. නමුත් වනගත ව සිටින ක්ෂත්‍රිය කුමාරවරු සම්ප්‍රදාය අතික්‍රමණය කොට විවිධත්වයෙහි අන්තර්ගත ඒකත්වය සෙවූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් උපනිෂද් දාර්ශනික ප්‍රවණතා බිහි වී ඇත. මේ අනුව චතුර්වේදය සඳහාම උපනිෂද් ග්‍රන්ථ රචනා කොට ඇත. එනම්, (තිලකසිරි, 1958: 110-112 )



යථොක්ත උපනිෂද් ග්‍රන්ථයන්හි දාර්ශනික මතවාද ගොඩනැගීමට මූලික වශයෙන් සැකය හා විචාරය හේතු වී ඇත. මේ සියල්ලක්ම කැටි කොට ගත්විට ප්‍රවණතා කිහිපයක් ඔස්සෙ විග්‍රහ කර දැක්විය හැකිය.

1. ආත්මන් සංකල්පය
2. බ්‍රහ්මන් සංකල්පය
3. විශ්ව නිර්මාණ වාදය
4. අද්වෛත වාදය
5. කර්මය
6. පුනරුත්පත්තිය
7. යෝගය
8. මෝක්ෂය

උපනිෂද් ඉගැන්වීම් අධ්‍යයනයේදී අපට හමුවන ඉතාම වැදගත් දාර්ශනික සංකල්පනාවන් දෙකක් ලෙස ආත්මන් හා බ්‍රහ්මන් යන සංකල්පයන් හැඳින්විය හැකිය. සමස්ත උපනිෂද් සාහිත්‍ය පුරාවටම මෙම සංකල්ප දෙක සාකච්ඡා වි ඇත. මෙලොව විද්‍යමානව පවතින මිනිස් තිරිසන් ආදී සත්ත්ව වර්ගයාටත්, ගස් වැල් ආදී සැම ජීවීන්ටමත් සාධාරණ වූ එක් පදාර්ථයක් නම් ආත්මයයි. මේ සියල්ල නිර්මාණය කිරීමේ එකම ශක්තිය ඇත්තේ බ්‍රහ්මන් පදාර්ථයටයි. කෙසේ වෙතත් එකිනෙකා කෙරෙහි හේතු වී ඇති ආත්මයත්, විශ්වව්‍යාපී බ්‍රහ්මන් පදාර්ථය ත් එකක්ම බව පෙන්වා දීමට උපනිෂද් දාර්ශනිකයෝ උත්සහ ගෙන ඇත. ආත්මන් සංකල්පය සමඟ බැඳී පවතින විශේෂ ගැටලුවක් බවට පත් වූයේ මරණින් පසු මිනිසාගේ ජීවිතය තීරණය වන්නේ කුමන අයුරින් ද යනුවෙන් දැන ගැනීමයි. මැරුණායින් පසුවත් මිනිසා ජීවත් වන්නේ යැයි සමහරෙක් පවසති. එසේම ඇතමෙක් මෙයට විරුද්ධව මත ඉදිරිපත් කරති. මේ සම්බන්ධයෙන් කඨෝපනිෂදයෙහි යම විසින් මෙසේ ප්‍රකාශයක් කර ඇත.(වීරසිංහ, 1992: 10)

න ජායතේ න මීයතේ වා විපශ්චින්
නායං කුතශ්චින්න බභූව කශ්චිත්
අජෝ නිත්‍යඃ ශාස්වතෝ'යං පුරාණෝ
න හන්‍යතෙ හන්‍යමානෙ ශරීරේ

(ආත්මය නූපදී. නො මැරේ. එය කිසිවකිනුදු හට නො ගත්තේ ය. ඉදිරියට කිසිවක් හටගන්නේ ද නැත. සාර්වකාලිකයි. සිරුර වැනසුන ද ආත්මය නොවැනසේ.)

ආත්මන් සංකල්පය පිළිබඳ කරුණු අනාවරණය කිරීමේදී ඡාන්දොග්‍ය උපනිෂදය විශේෂ වූවකි. මන්ද එය පසුකාලීන බොහෝ විචාරකයින්ගේ නිතර පරිශීලනයට ලක්වූ කෘතියකි. එහි ප්‍රජාපති හා ශිෂ්‍යයා වන ඉන්ද්‍ර අතර වූ සංවාදයෙහි දී ආත්මය පිළිබඳ අර්ථ 4ක් දක්වා ඇත. (Chandogya, VIII : 3,12)

1. ශාරීරික ආත්මය
2. ආනුභවික ආත්මය

3. අනුභූතිකාරක ආත්මය
4. පරමාත්මය

තවද පාප මුක්ත වූ, අජර වූ, අමර වූ, නිශ්ශෝකී වූ, සාපිපාසා දෙකින් තොර වූ ඇලුම් කළ යුතු දේට හැර අනික් කිසිවකට ඇලුම් නොකරන, සිතිය දේ හැර අන් කිසිවක් නොසිතන, තත්ත්වය ආත්මන් වශයෙන් ප්‍රජාපතී පවසයි. මුල් කාලීන දාර්ශනිකයෝ මිනිසාගේ භෞතික ශරීරය ආත්මය ලෙස සලකා ඇත. කැඩපතක් ඉදිරියේ හෝ දිය පිරුණු තැනක් තුළින් තමන්ට දෘෂ්‍යමාන වන ප්‍රතිබිම්බය ආත්මය ලෙස සළකා ඇත. මේ පිළිබඳ දිගින් දිගටම අවධානය යොමු කළ දාර්ශනිකයන් ආත්මාධිගමයේ දී පැමිණෙන අවස්ථා හතරක් පෙන්වා දී ඇත.

1. **ජාගර**
2. **ස්වප්න**
3. **සුෂුප්ති**
4. **තුරීය** (තිලකසිරි, 1958: 122)

භෞතික ශරීරය මියගිය ද ආත්මය මිය යා නොහැක යනුවෙන් සැලකූ නිසා ශරීර ප්‍රතිබිම්බය ආත්මය ලෙස සැලකීම විචාරයට ලක් වී ඇත. ඒ අනුව ජාගර අවස්ථාවේ පවත්නා භෞතික ශරීරය ආත්මන් සේ සැලකීම උපනිෂද් දාර්ශනිකයන් ප්‍රතික්ෂේප කොට ඇත. ස්වප්න අවස්ථාවේ දී පවත්නා විඥානය සැබෑ ආත්මය ලෙස උපනිෂද් මුනිවරුන් අතර මතයක් ඇති විය. නමුත් ස්වප්න වනාහි සුභ හෝ අසුභ මෙන්ම හොඳ හෝ නරක විය හැකිය. මේ නිසා ස්වප්නගත ආත්මය ආත්මයක් ලෙසින් ගැනීම වැරදි යැයි ඔවුහු සිතූහ. මෙම ස්වප්න අවස්ථාවෙන් සුෂුප්ති අවස්ථාවට පැමිණි මිනිසා විවිධ අරමුණු කෙරෙහි නො පිහිටුවා එක අභිමාර්ථය වූ විශ්වාත්මය හා එක්වීම ගැන අවධානය යොමු කරයි. මෙම අවස්ථාවේ ඇතිවන පරම සුඛය, ශාන්තිය, නිර්භය, නිර්දෝශී භාවය බෘහදාරණ්‍යක උපනිෂදයේ මැනවින් පෙන්වා දී ඇත. සුෂුප්ති අවස්ථාවෙන් පසුව යෝගභ්‍යාසවල ප්‍රතිඵලයක් වශයෙන් තුරීය අවස්ථාව පහළ වී ඇත. මෙම අවස්ථාවේ පවතින ආත්මයේ ස්වරූපය සත් භාවය යි. පරම යථාර්ථය යි. යෝග දර්ශනය තුළ මේ අවස්ථාව සඳහා වැදගත් තැනක් ලබා දී ඇත. ආත්ම සංකල්පය පිළිබඳ නොනවත්වා ගවේෂණය කළ දාර්ශනිකයෝ පසුව ''පඤ්චකෝෂ'' වාදය හෙවත් ආත්මයාගේ පඤ්චවිධ 'කෝෂ' (කොපු) පිළිබඳ මතය ඉදිරිපත් කළහ.

1. **අන්නමය කෝෂය**
2. **ප්‍රාණමය කෝෂය**
3. **මනෝමය කෝෂය**
4. **විඥානමය කෝෂය**
5. **ආනන්දමය කෝෂය** (තිලකසිරි, 1958: 124)

මෙම කෝෂයන් එකින් එකට පටිච්චසමුප්පන්නව පවතියි. ආත්මයාගේ ඉතාමත්ම බාහිරෙන් පිහිටා ඇති කෝෂය අන්නමය හෙවත් ආහාර රසයෙන් සැදි කෝෂය යි. එම කෝෂය ඇතුළත ප්‍රාණමය කෝෂය පිහිටා ඇත. ප්‍රාණමය කෝෂය ඇතුළත මනෝමය ද එයිනුදු අභ්‍යන්තරයෙහි විඥානමය කෝෂය පිහිටා ඇත. විඥානමය කෝෂය අභ්‍යන්තරයෙහි

ආනන්දමය කෝෂය පිහිටා ඇති බවත් ආදි වශයෙන් උපනිෂද් දාර්ශනිකයන් පුද්ගලයා පිළිබඳ පෙන්වා දී ඇත.

ආත්මන් සංකල්පය සේම උපනිෂද් දර්ශනය තුළ මුල් බැසගත් වැදගත් සංකල්පයක් බවට පත් වන්නේ බ්‍රහ්මන් සංකල්පයයි. උපනිෂදයන්හි උගන්වන පරම සත්‍යය හැඳින්වීම සඳහා බ්‍රහ්මන් පදය භාවිතා කර ඇත. පූර්ව කාලීන ව බ්‍රහ්මන් පදයෙන් යාඥාව, ගීය හා යාගයේ බලය අර්ථවත් විය. පසුව එම පදය පරම සත්ත්තාව සඳහා භාවිතා විය. ඕනෑම වස්තුවක ස්වභාවය වන්නේ හටගැන්ම, සුළු වේලාවක් හෝ පැවතීම හා විනාශයට පත් වීමයි. බ්‍රහ්මන්ගේ සූක්ෂම තත්ත්වය හා සර්වව්‍යාපී ගුණය පැහැදිලි කිරීම සඳහා නුග ඵලය, කළය හා ලුණු ආදිය උපමා භාවිත කර පැහැදිලි කර ඇත.

බෙහෙවින්ම මහත් ව වැඩෙන නුග ගස, නුග ඵලයෙහි පවතියි. එම ගස වැඩීමට අවශ්‍ය සූක්ෂම ශක්තිය එහි ඇත. එමෙන්ම බ්‍රහ්මන්ගේ සූක්ෂම ශක්තිය විශ්වාන්තර්ගත සියල්ලෙහි පවතින බව උපනිෂද් චින්තකයෝ අවබෝධ කරගත්හ. පොළොවෙන් නිර්මාණය කරගන්නා කළය නැවතත් පොළොව සමඟ ම එක්වෙයි. එපරිද්දෙන් විශ්වයේ ඇතිවන සියල්ල අවසන විශ්වාන්තර්ගත වෙයි. ලුණු දිය කළ කල්හි කුමන තැනකින් රස බැලුව ද එක ම ලුණු රසය දැනෙයි. එපරිද්දෙන් විශ්වයේ විවිධත්වයක් පැවතිය ද විශ්වාත්මය හා ඒකාත්මික වූ කල්හි එක ම අමෘත රසය බවට පත්වෙයි. මෙම බ්‍රහ්ම තත්ත්වය අන්නමය, ප්‍රාණමය, මනෝමය, විඥානමය හා අභ්‍යන්තරයෙහි වූ ආනන්දමය ආදි තත්ත්වයන් ලෙසද තෛත්තරීය උපනිෂදය පෙන්වා දෙයි. අජර වූ අමර වූ නිර්භය වූ තත්ත්වය බ්‍රහ්මන් ය. ඒ හා ඒකාත්මික වූ කල්හි ආත්මන් බ්‍රහ්මන් බවට පත් වෙයි. බ්‍රහ්මන් වනාහි විශ්වය පිළිබඳ යථාර්ථය හා උපනිෂද් චින්තකයන්ගේ අපේක්ෂිත පරම නිෂ්ඨාව බව උපනිෂද් දාර්ශනිකයන් සලකා ඇත.

විශ්වාරම්භය පිළිබඳ දක්වන උපනිෂද් ඉගැන්වීම් කොට්ඨාසයක් ද පවතී. ලෝකඋත්පත්තිය සොයාගැනීමට දැරූ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස සත් - අසත් සංකල්පය බිහි වී ඇත. ඒ හා බැඳි මතවාද තුනක් ගොඩනැගී ඇත. (Chandogya, VI : 2)

- **ලෝක මූලය අසත් තත්ත්වයකි. ඒ තුළ මතු ඇතිවන සත් තත්ත්වයේ බීජය විය.**
- **මේ බීජය ඇතැම් තැනක දෙයක් අජීවී ලෙසත් ඇතැම් තැනක කෙනෙකු ජීවී ලෙසත් නිරූපිතය.**
- **ඇතැම් තැනක ලෝක මූලය මහා පුරුෂයෙකු හෝ පියෙකු ලෙස නිරූපිතය. මොහුගේ යාගාත්මක ක්‍රියාවකින් නොහොත් මොහු රැගෙන දෙවියන් කරන යාගයකින් සියලු භූත තත්ත්ව හා තැනැත්තෝ හටගනිති.**

මෙලොව ඇති සියල්ල ඇතිවීම පිළිබඳ අදහස් දක්වන ඡාන්දොග්‍ය උපනිෂදය, සර්වව්‍යාපී වූ බ්‍රහ්ම තත්ත්වයෙන් මේ සියල්ල ම තැනී ඇති බවද, බෘහදාරණ්‍යක උපනිෂදයෙහි පූර්වයෙහි ලොව ජලය පමණක් වූ බවද දක්වා ඇත. මෙයින් පෙනී යන්නේ විශ්වාරම්භය පිළිබඳ උපනිෂද් දාර්ශනිකයන් තුළ පෘථුල අවබෝධයක් තිබූ බවයි.

යථෝක්ත සාකච්ඡා කරන ලද ආත්මන් හා බ්‍රහ්මන් අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිබද්ධ ව ඇතැයි යන සංකල්පය අද්වෛත වාදය ලෙස හඳුන්වයි. උපනිෂදයන්හි බොහෝ තැන්වල උක්ත අදහස තහවුරු කෙරෙන සාධක හමුවෙයි. ඇතැම් තැනක මේ දෙක එකට වර්ණනා කර ඇත. උපනිෂද් දාර්ශනිකයන් විශ්වයට ජීවත්වාරෝපණයක් සිදු කර ඇත. ඔවුන් විශ්වය

මහාපුරුෂයෙකුගේ ශරීරාංග ප්‍රත්‍යගාත්මයන් හෙවත් පුද්ගල ජීවිතයට සම්බන්ධ කිරීමට උත්සහ ගෙන ඇත. ඒ පිළිබඳ ඓතරේය උපනිෂදයෙහි බන්ධුතා ධර්ම සංකල්පයෙන් මෙසේ විවරණය කර ඇත. (වීරසිංහ, 1992: 22)

| **විශ්වාත්මය** | **ප්‍රත්‍යගාත්මයන්** |
|---|---|
| ගින්න | කථනය වී මුඛයට |
| වාතය | හුස්ම වී නාසයට |
| සූර්යා | දෘෂ්ටිය වී ඇසට |
| දිශා | ඇසීම වී කණට |
| ඕෂධීහු | රෝම වී හමට |
| චන්ද්‍රයා | මනස බවට පත් වී හදවතට |
| මෘත්‍යු | අපානය වී නාභියට |
| ජලය | රේතස වී ලිංගයට |

උපනිෂද් මුනිවරු මෙයින් අදහස් කරනුයේ විශ්වාත්මය ප්‍රභවය වූ ප්‍රත්‍යගාත්මය අවසන මූල පදාර්ථය වූ විශ්වාත්මය සමඟ එකතු වන බව යි. පරම යාථාර්තය ලෙස ඔවුන් හඳුන්වන්නේ ද මේ ඒකීයත්වය යි.

උපනිෂදයන් වලින් පිළිඹිබු වන කර්මය හා පුනරුත්පත්තිය යන දාර්ශනික ප්‍රවණතාවන්හි එන අදහස් බෞද්ධ දර්ශනය හා සම්බන්ධ වෙයි. කර්මය සාපේක්ෂවාදී දර්ශනයක් ලෙස උපනිෂද් කරුවෝ සැලකූහ. මරණින් මතු භවයන් තීරණය කිරීමට කර්මය බලපාන බව ඔවුහු විශ්වාස කළහ. ඒ අනුව හොඳ යහපත් කර්ම කරන්නා වූ පිරිස් මතු භවයකදී සුගතිගාමී ජීවිතයක් ලබන බවත්, නරක අයහපත් කර්ම කරන්නන් දුගතිගාමී භවයක පිහිටන බවත් ඔවුන් පිළිගෙන ඇත. යම් සේ ක්‍රියාවක් කරයි ද යම් සේ හැසිරෙයි ද එය සාපේක්ෂ වෙයි යන විශිෂ්ට දර්ශනයක හිඳ ඔවුන් කටයුතු කර ඇත.

උක්ත ආත්මන් පිළිබඳ කරුණු දැක්වීමේදී සඳහන් කළ අවස්ථා චතුෂ්කයෙන් තුරීය අවස්ථාව තුළ යෝගය නම් දාර්ශනික ප්‍රවණතාව විග්‍රහ කොට ඇත. උපනිෂද් ඉගැන්වීම තුළ යෝග ක්‍රමය දියුණුවත් සමඟ සුෂුප්ති අවස්ථාව ඉක්මවා ගොස් ආත්මය පිළිබඳ පරම තත්ත්වය හා පරම විමුක්තිය අවබෝධ කරගෙන ඇත. පුද්ගලයෙකුට පැමිණිය හැකි උසස්ම තත්ත්වය ''බ්‍රහ්ම'' තත්ත්වය යැයි උපනිෂද් දාර්ශනිකයෝ විශ්වාස කළහ. එමනිසා මෝක්ෂය පිළිබඳ උපනිෂද්හි එන ප්‍රධාන ඉගැන්වීම බවට පත්වන්නේ බ්‍රහ්ම සහභාව්‍යතාවය යි. උපනිෂද්වලට අනුව සියල්ලන්ගේ පරම අභිප්‍රාය විය යුත්තේ ''බ්‍රහ්මානන්දයට'' පත්වීම ය. ආත්මාර්ථකාමී හුදකලාවෙන් ඉවත් වී පෞද්ගලිකත්වය අතහැර සිය නාමරූපයන්ගෙන් ඉවත් වී පරමාත්මයෙහි නිමග්න වීම මෝක්ෂය යි. මෝක්ෂ ලාභියා නො නැසෙන උතුම් වූ ආත්මය සමඟ මිශ්‍ර වෙයි. හෙතෙම සර්වඥ වී සියල්ල බවට පත් වෙයි. බ්‍රහ්මන් කරා පැමිණි තැනැත්තා සදහට ම නිදහස් වෙයි. ඒ අනුව උපනිෂද්හි විද්‍යමාන මෝක්ෂය නම් බ්‍රහ්මන් සමඟ ඒකාත්මික වීමයි.

වේද ග්‍රන්ථයන්ගෙන් ආරම්භ වන වෛදික යුගයේ වෛදික දර්ශනය පිළිබඳ විචාරාත්මක අදහස් ඇති අවසාන යුගය උපනිෂද් යුගය යි. එම නිසා මෙකී උපනිෂද් වේදාන්ත ලෙස හඳුන්වයි. විශ්වය හා පුද්ගලයා පිළිබඳ තොරතුරු රැසක් හෙළි කරන හෙයින් පසු කාලීනව බිහි වූ ආගමික හා දාර්ශනික පදනම මෙයින් සපයා ඇති බව මොනවට අවබෝධ කරගත හැකිය.

**සමාලෝචනය**

මෙලොව වෙසෙන කවරෙකුටම පාහේ දර්ශනයක් තිබිය යුතුය. දර්ශනයෙන් තොර මිනිසාට යමක් කරගැනීමට හැකියාව නොලැබෙයි. භාරතීය දර්ශනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ආදිතම තතු හමුවන්නේ ඍග් වේද යුගයේ පටන්ය. කෙසේ වෙතත් උපනිෂද් යුගය වනාහි භාරතීය දර්ශනයේ නිලීන අවස්ථාව ලෙස හැඳින්විය හැකිය. මන්ද ආගමික තත්ත්වයෙන් එහා ගිය තාර්කික චින්තනය මත පදනම්ව පදාර්ථයන් පිළිබඳ ප්‍රවණතාවන් ගොඩනැගීමට උපනිෂද් දාර්ශනිකයන් වෙහෙසී ඇත. මේ ආකාරයට විමසා බැලීමේදී උපනිෂද් දර්ශනයේ ආධ්‍යාත්මික පසුබිම අතිශයින් ජනහිතකාමී වූවක් බව ප්‍රත්‍යක්ෂ වේ. ස්වභාව ධර්මයට අනුගත වෙමින් බාහිර අභියෝගයන් ජයගෙන පරම සත්‍ය හෙවත් මෝක්ෂය කරා ගමන්

කිරීම එහි මූලික අභිප්‍රායයි. උපනිෂද් දර්ශනය තුළ විවිධ සාධක මත පිහිටා ආධ්‍යාත්මික පැතිකඩවල් නිර්මාණය වී ඇත. බැලූ බැල්මට සමහර ආගමික මතයන් චින්තකයින්ගේ අඥානකම මත ගොඩනැගුනු ඒවා ලෙස පෙනෙයි.  නමුත් ඒවා සියුම් බුද්ධි පරීක්‍ෂණයකට යොමු කළහොත් එහි ඇති වටිනාකම මනාව පිළිබිඹු වෙයි. ඒවා ගැඹුරු බුද්ධියකින් ඉදිරිපත් කර ඇති අදහස් බවද පැහැදිලි වෙයි. බටහිර දේවවාදී ආගමික දර්ශනයන්ට වඩා ඉන්දියානු උපනිෂද් දර්ශනයේ ආගමිකත්වය ඉතා උසස්ය. එය ඉතා විමර්ශනශීලි බුද්ධිමය සංකල්පනාවන්ගෙන් පෝෂණය වූවකි. ස්වභාවධර්මය දේව සංකල්ප යාගය සාපේක්‍ෂකතාවය ආත්මය ශුන්‍යත්වය විඥානය මෝක්‍ෂය ආදී ගැඹුරු කරුණු මෙහිදී විමසුමට භාජනය වී ඇත. සමහර කරුණු සාමාන්‍ය බුද්ධියකින් අවබෝධ කරගත හැකි ඒවා නොවේ. තියුණු නුවණකින් යුක්තව විමර්ශනය කළ යුතු ඒවාය.

චින්තනයේ මස්තකය හෙවත් පරම නිෂ්ඨාව සෙවීම ඉතා සුවිශේෂී කර්තව්‍යකි. එය ඉතා බැරෑරුම් වූවකි. නමුත් උපනිෂද් චින්තකයින් බොහෝමයක් තම ඥානයට අනුව එය විග්‍රහ කිරීමට දැරූ උත්සාහයක් දැකිය හැක. සමහර අවස්ථාවලදී එක් කරුණක් පිළිබඳව නොයෙක් මත ඉදිරිපත් වී ඇත. එසේ වුවද අවසානයේ එක් මතයකට එළඹීමටද ඔවුන් සමත් වී ඇත. එම මත ඉදිරිපත් කිරීමේදී තත්කාලීන සමාජයෙන් පැන නැගුණු අභියෝග රාශියකට මුහුණ දීමටද ඔවුන්ට සිදු විය. ජනතාව අතර මුල් බැසගත් ආගමික මත ඛණ්ඩනය කොට නවමු අදහස්වලට ඔවුන් යොමු කරලීම තරමක් අසීරු කරුණක් විය. නමුත් එය ඉතා සාර්ථක ලෙස ජයගෙන ආධ්‍යාත්මික වශයෙන් සුවිශේෂී වූ ආගමික දර්ශනයක් බිහි කිරීමට උපනිෂද් දාර්ශනිකයින් සමත් වී ඇති බව මේ අනුව පැහැදිලි වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කළුපහන, ඩී.ජේ. (1963). **භාරතීය දර්ශන ඉතිහාසය.** කොළඹ ඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

කැකුළාවල, සුමන ලාල් (පරි). (1961). **කඨෝපනිෂදය.** කොළඹ ඃ ගුණසේන සහ සමාගම.

තිලකසිරි, ජේ. (1958). **වෛදික සාහිත්‍ය.** කොළඹ 10 ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (1999). **භාරතීය දර්ශනය .** කොළඹ 10 ඃ ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ. (1959). **වෛදික යුගයෙන් බෞද්ධ යුගයට.** දෙහිවල ඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රණසිංහ, සමන් චන්ද්‍ර. (1998). **ක්‍රිෂ්ණමූර්ති සහ භාරතීය දර්ශනය.** කර්තෘ ප්‍රකාශන.

රේවත හිමි, නවගමුවේ (සංස් හා පරි). (2009). **ප්‍රශ්නෝපනිෂද්.** කර්තෘ ප්‍රකාශන.

වීරසිංහ, එස්. ජී. එම්. වීරසිංහ. (1992). **උපනිෂද් දර්ශනය.** වැල්ම්පිටිය ඃ චතුර මුද්‍රණාලය.

සේනානායක, ජී. එස්. බි. (1955). **සංස්කෘත සාහිත්‍ය.** කොළඹ 10 ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

https:/archieve.org/download/Shankara.Bhashya-Chandogya.Upanishad-Ganganath.Jha.1942.English/Shankara.Bhashya-Chandogya.Upanishad-Ganganath.Jha.1942.English.pdf

# ධර්මකීර්තිපාදයන්ගේ ජීවන චරිතය සහ බෞද්ධ තර්ක ශාස්ත්‍රීය දායකත්වය

# Ven.Dharmakirti's Life and his Contribution to Buddhist Logic

*H.A.C.N. Wijerathna*

*Former Temporary Lecturer, Department of Philosophy, Faculty of Arts, University of Kelaniya*

## හැඳින්වීම

ක්‍රිෘව 1575 - 1634 අතර කාලයේ ජීවත් වූ ටිබෙට් ජාතික ''තාරානාථ'' නම් ඉතිහාසඥයාගේ විවරණයට අනුව බෞද්ධ දර්ශනය ප්‍රභාමත් කළ මහනීය රත්න හයෙන් එක් අයෙක් ලෙස ධර්මකීර්තිපාදයන් හඳුන්වා දී ඇත. නාගාර්ජුන, අසංග සහ දිග්නාග යන තිදෙනා සහ ආර්යදේව, වසුබන්ධු සහ ධර්මකීර්ති යන අටුවාචාරීන් තිදෙනා එම ෂට් මාණික්‍ය ලෙස ඔහු පෙන්වා දෙයි. (Silk, 2019, p. 156) ධර්මකීර්තිපාදයන් අටුවාචාරීන්ගේ වර්ගීකරණයට අන්තර්ගත කළ ද මෙම විවරණය මගින් ධර්මකීර්තිපාදයන් බෞද්ධ තර්ක ශාස්ත්‍රීය සාහිත්‍ය තුළ සුවිශේෂී ආස්ථානයක් හිමිකරගෙන ඇත. Dr. Stcherbatskyට අනුව ධර්මකීර්තිපාදයන් යනු ඉන්දියානු කාන්ට්ය. බෞද්ධ තර්කශාස්ත්‍රයඥයන්ගේ ධූරාවලියේ අත්‍යුත්කර්ෂයෙන් සාකච්ඡාවට භාජනය වන බෞද්ධ දාර්ශනිකයා ලෙස ධර්මකීර්තිපාදයන් හඳුන්වා දිය හැකිය. (Stcherbatsky, 1962, p. 35) ජීවන තොරතුරු පිළිබඳ  සප්‍රමාණික වූ සාක්ෂි සාධක අවම වීම හේතුවෙන් උන්වහන්සේගේ චරිතාපදානය විවිධ මිථ්‍යා තොරතුරුවලින් ආවෘතව ඇත. ටිබෙටීය සහ චීන මූලාශ්‍රයන්ට අනුව උන්වහන්සේ දකුණු ඉන්දියාවේ උපත ලබා අනතුරුව භාරතයේ අතිදීප්තිමත් විද්‍යාස්ථානයක් ලෙස සුප්‍රකටව පැවති නාලන්දා විශ්වවිද්‍යාලයට සම්බන්ධ වී එහි මහාචාර්යවරයකු ලෙස ද කටයුතු කර ඇත. දිග්නාගපාදයන්ගේ ශිෂ්‍යයකු ලෙස හඳුනා ගැනෙන ධර්මකීර්තිපාදයෝ යෝගාචාරික විඥානවාදී දාර්ශනික සම්ප්‍රදාය සහ සෞත්‍රාන්තික සම්ප්‍රදාය පදනම් කරගත් දාර්ශනික චින්තන ධාරාවක් ඉදිරිපත් කළහ. (Nakamura, 1980, p. 301) එමෙන්ම දිග්නාගපාදයන් විසින් හඳුන්වාදෙන ලද බෞද්ධ තාර්කශාස්ත්‍රය ඉතාමත් දියුණු අග්‍රස්ථානයකට පත් කිරීමට ද උන්වහන්සේට අවකාශ සැළසුණි.

## ධර්මකීර්තිපාදයන්ගේ ජීවන සමය

ධර්මකීර්තිපාදයන්ගේ ජීවන සමය පිළිබඳ උගතුන් අතර විවිධ මතවාද පවතී. ආචාර්ය සතිෂ්චන්ද්‍ර විද්‍යාභූෂණ පඬිවරයාට අනුව ක්‍රිෘව 627-697 දක්වා ජීවත් වූ ටිබෙට් ජාතික රජෙකු වන *'Sron-tsan-gam-po'* නම් රජු ධර්මකීර්තිපාදයන්ගේ සමකාලීනයෙකි. ඒ අනුව ඔහු ධර්මකීර්තිපාදයන් ක්‍රිෘව 635-650 අතර කාලයේ ජීවත් වන්නට ඇතැයි පිළිගනී. (Vidyabhusana, 1988, p. 305) එමෙන්ම ධර්මපාල නම් භික්ෂුව උන්වහන්සේගේ ගුරුවරයා බවත් ඔහු වැඩිදුරටත් දක්වා ඇත. *'Sron-tsan-gam-po'* රජු ටිබෙටයේ උගතුන් අතර මතභේදයට තුඩුදුන් පුද්ගලයෙකි. ඇතැම් කෙනෙක් ඔහු හත් වන සියවසට අයත් යැයි කරුණු දක්වන අතර තවත් අයෙක් ප්‍රකාශ කරන්නේ ඔහු අයත් වන්නේ හය වන සියවසට බවයි. භාරතීය

තර්කශාස්ත්‍රය බටහිර උගතුන්ගේ අවධානයට ලක්වීමට ප්‍රථමව සිට ධර්මකීර්තිපදයන් හත්වන සියවසේ පමණ ජීවත් වූ බව පිළිගැනී ඇත. රුසියානු ජාතික Wassiljew 1860 ප්‍රකාශ කරනු ලබන්නේ ධර්මකීර්තිපාදයන් අයත් වන්නේ හත් වන සියවසට බවයි. (Franco, 2015, p. 117) නමුත් විද්‍යාභූෂණ පඬිවරයාගේ වර්ෂ දැක්වීම දෝෂ සහගත බවත් එය කරුණු විමසා බලා පිළිගත යුතු බවත් Frauwallner පෙන්වා දෙයි. ඔහුට අනුව ධර්මකීර්තිපාදයන්ගේ ජීවන සමය වන්නේ ක්‍රිඃව 600- 660 පමණ වන කාලපරාසයයි. (Frauwallner, 1961, p. 125) විද්‍යාභූෂණ පඬිතුමා සහ Frauwallner යන දෙදෙනාම පාදක වන්නේ හියුංසියැං (Xuanzang) සහ ඉත්සිං (IChing) යන චීන ජාතික දේශාටන වාර්තාකරුවන්ගේ තොරතුරු මතය. ක්‍රිඃව 644 දී පමණ ඉන්දියාවෙන් නික්මී යන හියුංසියැංගේ දේශාටන වාර්තාවන්හි ධර්මපාල තෙරුන් පිළිබඳව සඳහන්ව ඇති නමුත් ධර්මකීර්ති පිළිබඳව සඳහන් නොවන අතර 671-695 අතර කාලයේ ඉන්දියාවේ සංචාරය කළ ඉත්සිංගේ වාර්තාවන්හි ධර්මකීර්ති යනු ශ්‍රේෂ්ඨ ආචාරයවරයකු බව දක්වා ඇත. හියුං සියැ ධර්මකීර්තිපාදයන් පිළිබඳ සඳහනක් නොකරන්නට ඇත්තේ ඔහු නාලන්දා විශ්වවිද්‍යාලයේ සංචාරය කරන අවධියේ දී ධර්මකීතර්තිපාදයන් කුඩා අවධියේ සිටි හෙයින් යැයි ඇතැම් වියතුන් උපකල්පනය කර ඇත.

ශාන්තරක්ෂිතපාදයන් විසින් කරන ලද අටුවාවක් සහිත වාදන්‍යාය කෘතිය සංස්කරණය කරමින් ඉදිරිපත් කළ රාහුල් සංකෘත්‍යායන පඬිතුමා උක්ත කරුණ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරයි. ඔහුට අනුව හියුං සියැං විසින් ස්වකීය වාර්තාවන්හි ධර්මකීර්තිපාදයන් පිළිබඳව සඳහන් නොකිරීමට පාදක වන්නට ඇතැයි උපකල්පනය කෙරෙන හේතු තුනක් පහත පරිදි සංක්ෂේපගත කර ඇත.

1. හියුං සියැං නාලන්දාවෙහි වාසය කරන සමය වන විට ධර්මකීර්තිපාදයන් අභාවප්‍රාප්තව සිටීම

2. හියුං සියැංට තර්කශාස්ත්‍රය පිළිබඳ ගැඹුරු අවබෝධයක් නොපැවතීම හේතුවෙන් ඒ පිළිබඳ එතරම් උනන්දුවක් නොදැක්වීම.

3. හියුං සියැංගේ ජීවන චරිතය සංග්‍රහ කළ පුද්ගලයින් විසින් හිතාමතාම ධර්මකීර්තිපාදයන් පිළිබඳ සඳහන් කිරීම මගහරින්නට ඇත. එයට හේතුව ධර්මකීර්තිපාදයන් පිළිබඳව උත්කර්ෂයෙන් වර්ණනා කිරීම හියුං සියැංගේ කීර්තියෙහි අඩුබව ඇති වීමට හේතු වේ යැයි සිතීම. (Sailkrtyayana, p. VI) යනුවෙනි.

එහෙත් මෙම උපකල්පනයන් සඳහා ප්‍රතිචාර දක්වන Frauwallner පහත පරිදි ඒවාට පිළිතුරු ලබා දී ඇත. (Frauwallner E. , 1961, pp. 138-139)

1. හියුං සියැං අභාවප්‍රාප්ත වෙනත් බොහෝ උගතුන් පිළිබඳව තොරතුරු වාර්තා කොට ඇති හෙයින් එකී පදනම මත ඔහු ධර්මකීර්තිපාදන්ගේ නම ඉවත් කළේ යැයි උපකල්පනය කළ නොහැක.

2. හියුං සියැං බෞද්ධ තර්කශාස්ත්‍රය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයකින් පසු වූ බව ඔහු විසින් ඉතා අපහසු මෙන්ම කුඩා නොවූ ග්‍රන්ථයක් වූ න්‍යායමුඛ නම් ග්‍රන්ථය පරිවර්තනය කිරීමෙන් පෙනී යයි. බෞද්ධ තර්කශාස්ත්‍රය පිළිබඳ දැනුම ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පසු වූ ඔහු මහාකෝසලයෙහි දී ප්‍රමාණසමුච්චය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත වූ එක්තරා බ්‍රාහ්මණ පඬිවරයෙකුගෙන් ඒ පිළිබඳ ඉගෙනීමට ද ගිය බව සඳහන් වේ. එමෙන්ම හියුං සියැං දිග්නාග වැනි තර්කශාස්ත්‍රඥයන් පිළිබඳව පමණක් නොව එකල ප්‍රසිද්ධව සිටි භද්‍රරුචි වැනි තාර්කිකයන් පිළිබඳව පවා තොරතුරු ඉදිරිපත් කොට ඇත. එමෙන්ම ඔහු

නැවත චීනයට යන විට තර්කශාස්ත්‍රය හා සම්බන්ධ කෘතීන් 36 ක් පමණ රැගෙන ගිය බව ද වාර්තාවේ. මේ අනුව පෙනී යන්නේ ඔහු තර්කශාස්ත්‍රය පිළිබඳ ඇල්මක් නොමැත්තෙකු නොවන බවයි.

3. හියුං සියැංගේ කීර්තිය අඳුරු වේය යන බියෙන් ධර්මකීර්තිපාදයන් පිළිබඳ සටහන් හියුං සියැංගේ වාර්තාවලින් ඉවත් කිරීමට එම වාර්තාවන් රචනා කළ කතුවරුන් යොමු වූයේ යැයි උපකල්පනය කිරීම විහිලු සහගත ය. අතීත සහ වර්තමාන බොහෝ උගතුන්ගේ තොරතුරු උත්කර්ෂයෙන් සහ ප්‍රසංසාත්මකව එම වාර්තාවන්හි අන්තර්ගතව තිබිය දී කීර්තිය නැතිවේය යන බියෙන් ධර්මකීර්තිපාදයන්ගේ නම පමණක් ඉවත් කිරීමට කිසිදු හේතුවක් හඳුනාගත නොහැක. යනුවෙන් ඔහු පෙන්වා දී ඇත. මේ අනුව මෙම උපකල්පනයන් ප්‍රාමාණික නොවන බවට Frauwallner තර්ක කරයි.

Frauwallner විසින් ධර්මකීර්තිපාදයන් පිළිබඳව ඉදිරිපත් කරන ලද දිනවකවානු නැවත Lindtner, Kimura වැනි වියතුන් විසින් විවේචනය කරනු ලබයි. Lindtner ට අනුව ධර්මකීර්තිපාදයන් ක්‍රි.ව 530-600 අතර කාලයේ ජීවත් වී ඇත. (Lindtner, 1980, pp. 32-33) කිමුරා ප්‍රකාශ කරන ආකාරයට ධර්මකීර්තිපාදයෝ 550- 620 කාලයට අයත්ය. ඔහු මෙම මතය සනාථ කිරීම සඳහා තර්ක තුනක් ඉදිරිපත් කරයි. 1. Huizhao ට අනුව Xuan zang ධර්මකීර්තිපාදයන්ගේ හේතුඵලවාදය වාචිකව උගන්වා තිබීම. 2. ධර්මපාල හිමි ස්වකීය ආලම්භනපරීක්ෂා වෘත්ති නම් කෘතියේ දී ධර්මකීර්ති හිමියන්ගේ නාමය දක්වා තිබීම. 3. ශිවරාම නම් ධර්මකීර්ති හිමියන්ගේ අටුවාකරුට අනුව සුබන්ධු නම් කවියා 612-615 අතර කාලයේ ලියවුණු යැයි සැළකෙන තම වාසවදත්තා නම් පද්‍ය කෘතියේ අලංකාරයන් කරන ලෙස ව්‍යංගයෙන් පවසා තිබීම. (Kimura, 1997, November, p. 213) යනුවෙනි. කෙසේ වෙතත් Ernst Steinkellner (1991) විසින් මෙම දෙදෙනාගේ ම මතයන් බැහැර කර ඇත.

කිමුරා විසින් ඉදිරිපත් කරන ලද උක්ත තර්ක තුනෙන් මුල් තර්කය පිළිබඳ එතරම් විරුද්ධත්වයක් නැතත් දෙවන සහ තෙවන තර්කයන් උගතුන්ගේ විවේචනයට භාජනය විය. ඒ අතර Funayama විසින් දෙවන තර්කය විවාදයට ලක් කරන අතර Tillemans විසින් තෙවන තර්කයෙහි පවත්නා ගැටලුකාරීත්වයන් පෙන්වා දී ඇත. (Silk, 2019, p. 157) තවද කිමුරා විසින් ධර්මකීර්තිපාදයන්ට සමකාලීන එහෙත් උන්වහන්සේට වඩා වැඩිමල් ධර්මපාල හිමියන් ආශ්‍රයෙන් ධර්මකීර්තිපාදයන්ගේ උක්ත දින වකවානු තහවුරු කිරීමට උත්සාහ දරා ඇත. ආලම්භනපරීක්ෂා නම් කෘතියෙහි දැක්වෙන *'fa-cheng'* යන පද දෙක ආශ්‍රයෙන් ස්වකීය තර්කණයන් ඉදිරිපත් කරන අතර ෆුනයාමා පෙන්වා දෙන පරිදි ඔහුට අමතරව KANAKURA Ensho විසින් ද මෙම අදහස දරා ඇත. නමුත් මෙම තර්කයන් ද ෆුනයාමා විසින් බැහැර කරනු ලබයි. (Funayama, 2001, p. 2) ඔහු ස්වකීය ලිපිය ආරම්භ කරනු ලබන්නේ Buddhist studies in Germany and Austria නම් කෘතිය රචනා කළ Eli FRANC විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයකිනි. එනම් යම් හෙයකින් ධර්මකීර්තිපාදයන් පිළිබඳව මේ වන විට ඉදිරිපත් වී ඇති දින වකවානු වෙනස් වන්නේ නම් ඒ හා බැඳුනු තවත් බොහෝ දිනයන් ද සංශෝධනය විය යුතු බව දක්වමිනි. කෙසේ වෙතත් මොහුගේ අදහස වන්නේ ධර්මපාල හිමියන්ගේ කෘතීන්හි ධර්මකීර්තිපාදයන්ගේ නම ඇතුලත් වන්නේ නම් ඒ භදන්ත ධර්මකීර්ති හෝ ආචාර්ය ධර්මකීර්ති යනුවෙන් ඇතුළත් විය යුතු බවයි. එමෙන්ම මෙම දෙදෙනාගේ යම් යම් අදහස් සහ තර්කයන්හි සාම්‍යතා විද්‍යමාන වුවද ඒ මත පදනම්ව

ධර්මකීර්තිපාදයන්ගේ කාල නිර්ණය නොකළ යුතු අතර ඒ වෙනුවට වෙනත් ප්‍රාමාණික සාදක සපයා ගත යුතු බවයි. (Funayama, 2001, p. 6)

මීට අමතරව Krasser විසින් ද ධර්මකීර්තිපාදයන්ගේ දින වකවානු පිළිබඳ අදහසක් ඉදිරිපත් කර ඇත. ඔහු හයවන සියවසට (500-570) අයත් යැයි සැලකෙන භාවවිවේක සහ ස්ථිරමති යන දෙදෙනාගේ කෘතීන්හි ධර්මකීර්ති හා කුමාරිලගේ අදහස්වලට පැහැදිලි සමානකම් ඇති බව පෙන්වා දෙයි. භාවවිවේක සහ ස්ථිරමති යන දෙදෙනා නිසැකයෙන්ම ධර්මකීර්පාදයන් දැන සිටි බව මොහුගේ අදහසයි. ඔහු ස්වකීය අදහස් දැක්වීම ආරම්භ කරනුයේ භාවවිවේකගේ මාධ්‍යමිකකහෘදයකාරිකා නම් කෘතිය සහ තර්කජ්වල යන කෘතින්හි සහ ධර්මකීර්තිපාදයන්ගේ ප්‍රමාණවාර්තික සහ ප්‍රමාණවිනිශ්චය යන කෘතීන්හි ඉදිරිපත් වන සත්ත්වානුමානය පිළිබඳව සහ සර්වඥතාඥානය, ආගම ග්‍රන්ථ හා වේදයන්හි අවිශ්වසනීයත්වය පිළිබඳ ඉදිරිපත් කෙරෙන අපෝහාත්මක ප්‍රකාශ පිළිබඳ දැක්වීමකිනි. (Krasser, 2012) විවිධ නිදර්ශන ආශ්‍රයෙන් තත් කාරණය තහවුරු කිරීමට ඔහු උත්සාහ දරන නමුත් ඔහුගේ එම අදහස් ද විවේචනයට භාජනය වී ඇත. ඒ අතර ප්‍රධාන ප්‍රතිතර්කයක් නම් එම දෙපාර්ශ්වයේ කෘතීන්ට පාදක වූ මූලාශ්‍රය හේතුවෙන් එම සාම්‍යතා දෙපාර්ශ්වයේම විද්‍යමාන විය නොහැකි ද යන්නයි. මොහුගේ අදහස් පිළිබඳව ද යම් යම් විවේචන ඉදිරිපත් වේ. එමෙන්ම ධර්මකීර්තිපාදයන් නාලන්දා විශ්වවිද්‍යාලයට ප්‍රවේශවීමත් සමග විඥානවාදී දාර්ශනිකයකු වූ ධර්මපාල හිමි හමුවේ. තත් කාරණය මත පදනම්ව Krasser සහ T. Tillemans යන දෙදෙනාම එකතුව නව කාල නිර්ණයක් ඉදිරිපත් කරයි.

## ධර්මකීර්තිපාදයන්ගේ ජීවන චරිතය

ධර්මකීර්තිපාදයන්ගේ ජීවන තොරතුරු බොහෝමයක් විවිධ මිථ්‍යාවන්ගෙන් සහ ජනකථාවන්නේ ආවෘතව ඇති හෙයින් එම තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳ විවිධ ගැටලු මතුව තිබේ. කෙසේ වෙතත් විවිධ ජනකථා සහ සාහිත්‍යාගත තොරතුරු උන්වහන්සේගේ ජීවන ස්වභාවය පිළිබඳ අවබෝධ කරගැනීමට යම් පිටුබලයක් සපයන බව පෙනී යයි. පවතින සාක්ෂිවලට අනුව ධර්මකීර්තිපාදයන් උපත ලබා ඇත්තේ දකුණු ඉනදියාවේ ත්‍රිමාලය (Trimalaya) නැතහොත් තිරුමුල්ල (Tirumalla) යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රදේශකයකය. එය චූඩාමණි (Cudamani) නම් වර්තමානයේ නාමමාත්‍රික රාජධානියක පිහිටා තිබුණි. (Chattopadhyaya, 1990, p. 228) පංචමසිහ සහ ප්‍රසන්න යන රජවරු ධර්මකීර්තිපාදයන්ගේ උපත සිදු වන සමයේ පාලකයන් බව තාරානාථ පෙන්වා දෙයි. බ්‍රාහ්මණ පවුලක ජන්මය ලද ඔහු කුඩා කල සිටම බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම් කෙරෙහි නැඹුරුතාවයකින් යුතුව ඉගෙනීමෙහි නියුක්ත විය. වාර්තාගත තොරතුරු අනුව මෙතුමන්ගේ පියා උගත් බ්‍රාහ්මණික දාර්ශනිකයකු හෙවත් තීර්ථකයකු ලෙස හඳුනාගැනේ. ඔහුගේ නම පරිබ්‍රාජක රෝරුනන්ද (Ro-ru-nanda) ලෙස සඳහන්වේ. (Chattopadhyaya, 1990, p. 229) ඔහුගේ පවුල දකුණු ඉන්දීය ශෛවාගමට නැඹුරුව සිටි හෙයින් මොහු කුඩා කල සිටම හින්දු ශාස්ත්‍රෝද්ග්‍රහණයේ නිරත විය. වේද වේදාංග, කලා, ව්‍යාකරණ ආදී සකල ශාස්ත්‍රයන්හි පරිණතභාවයට පත්විය. (Vidyabhusana, 1988, p. 304)

වයස අවුරුදු දහ අට පමණ වන විට සියලු තීර්ථ ඉගැන්වීම්හි දක්ෂභාවයට පත් ඔහු සමකාලීනයන් අතර ප්‍රාමාණික උගතකු ලෙස ප්‍රකටව සිටියේය. මෙසේ සිටින අතර තුර දිනක් බෞද්ධ භික්ෂුවක් විසින් සිදු කරන ලද ධර්ම දේශනයක් අසා එහි ඇති ගැටලු රහිත බව අවබෝධ වී ඒ කෙරෙහි පැහැදී බෞද්ධ දර්ශනය ඉගෙනීමෙහි රුචියක් ඇති කර ගත්තේය.[15] අනතුරුව ඔහු ගිහි උපාසකයකු ලෙසින් හැඳ බෞද්ධ විහාරස්ථානයන්ට ගොස් බෞද්ධ දර්ශනය ඉගෙනීමෙහි නිරත විය. මෙයින් කුපිත වූ බ්‍රාහ්මණිකයන් ඔහුව සිය කුලයෙන් ද නෙරපා දැමූ බව සඳහන් වේ. මෙසේ බෞද්ධ දර්ශනය කෙරෙහි නැඹුරු වූ ඔහු ක්‍රමානුකූලව එහි ගැඹුරු දාර්ශනික කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අතිශය කීර්තිමත් ප්‍රදේශයක් වී තිබුනු මගධ දේශයට යාමට ඔහුට හැකි විය. එයට ප්‍රධාන හේතුව නම් නාලන්දා විශ්වවිද්‍යාලයයි. මේ වන විට මෙම විශ්වවිද්‍යාලයේ කුලපතිධුරයේ වැඩසිටියේ ආචාර්ය ධර්මපාල තෙරුන් වහන්සේය. පැවිදි භික්ෂුවක් ලෙස ධර්මකීර්තිපාදයන් මෙම විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්නේ වසුබන්ධුපාදයන්ගේ විඥානවාදී දර්ශනය ඉගෙනීමේ අභිරුචියෙන්ය. එහෙත් මේ වන විට ඔහු අභාවප්‍රාප්තව සිටි හෙයින් ඉතා වයෝවෘද්ධ තත්ත්වයෙහි සිටි වසුබන්ධුපාදයන්ගේ ඍජු ශිෂ්‍යයෙක් වූ ආචාර්ය ධර්මපාල ආශ්‍රයෙහි පැවිදිව ඉගෙනීමට තීරණය කළේය. මොහු සමීපයේ සිට ත්‍රිපිටක ධර්මය හා සූත්‍ර 500ක් පමණ කටපාඩමින් ධාරණය කර ගනිමින් උසස් අන්දමින් අධ්‍යාපනය සිදු කළේය. (Vidyabhusana, 1988, p. 304)

මෙසේ අධ්‍යයනයෙහි නිරත ඔහුට තර්කශාස්ත්‍රය විෂයෙහි ප්‍රබල ඇල්මක් ඇති විය. ඒ සඳහා මේ වන විට කීර්තිමත්ම ආචාර්යවරයා වූයේ ආචාර්ය දිග්නාගපාදයන්ය. එහෙත් උන්වහන්සේ ද අපවත්ව සිටි හෙයින් ධර්මකීර්තිපාදයෝ ඊශ්වරසේන නම් දිග්නාගපාදයන්ගේ ඍජු ශිෂ්‍ය භික්ෂුව වෙත එළඹ උන්වහන්සේගේ ශිෂ්‍යභාවයට පත් වූහ. අනතුරුව දිග්නාගපාදයන්ගේ දර්ශනය මැනවින් හැදෑරීමට ඔහුට අවකාශ සැළසුණි. ඔහු ඊශ්වරසේන වෙතින් දිග්නාගපාදයන්ගේ ප්‍රමාණසමුච්ඡය ඉගෙන ගත්තේය. එය පළමු වර ඇසීමෙන් ඔහු ඊශ්වරසේන හා සමාන විය. දෙවන වර ඇසීමෙන් දිග්නාගපාදයන් හා සම විය. තෙවන වර ඇසීමෙන් ඔහු අවබෝධ කර ගත්තේ සවකීය ආචාර්යවරයා වූ ඊශ්වරසේන දිග්නාගපාදයන්ගේ ප්‍රමාණසමුච්ඡය තේරුම් ගෙන ඇත්තේ වැරදියට සහ අසම්පූර්ණව බවයි. (Chattopadhyaya, 1990, p. 229) ඊශ්වරසේන වරක් ප්‍රකාශ කර සිටියේ ධර්මකීර්තිපාදයන් තමන්ටත් වඩා හොඳින් දිග්නාගපාදයන්ගේ දර්ශනය ප්‍රගුණ කර ඇති බවත් එහි ඇති වැරදි අවබෝධයන් දුරු කිරීම සඳහාත් අටුවාවක් කරන ලෙසයි. මේ අනුව ස්වකීය ආචාර්යවරයාගේ ආරාධනයෙන් ධර්මකීර්තිපාදයෝ දිග්නාගපාදයන්ගේ ප්‍රධානම කෘතිය වන ප්‍රමාණසමුච්ඡය නම් කෘතියට අටුවාවක් රචනා කරන්නට වූහ. (Stcherbatsky, 1962, p. 34)

අනතුරුව ධර්මකීර්තිපාදයන්ගේ මනස යොමු වූයේ නැවතත් තීර්ථක දර්ශනය ඉගෙනීම කෙරෙහිය. එයට හේතුව මොහු බ්‍රාහ්මණයකුව සිටි අවධියේ දී තිර්ථක ඉගැන්වීම් පිළිබඳ අවබෝධයක්

---

[15] නිරන්තර වාදශීලි ස්වභාවයක් ගන්නා ධර්මකීර්තිපාදයන් බෞද්ධ භික්ෂුවක වීමට ප්‍රථම මීමාංසික දාර්ශනික සම්ප්‍රදායෙහි අනුගාමිකයකුව සිටි බවත් අනතුරුව එහි කුමාරිල නම් දාර්ශනිකයකු සමග ඇති කරගත් දාර්ශනික ගැටලුවක් පදනම් කර ගනිමින් එම දර්ශනය අතහැර බෞද්ධයකු වූ බවත් සඳහන් වේ.

ලැබුව ද එහි පවත්නා ගුහ්‍ය ඉගැන්වීම් නොදැන සිටීමයි. එහෙත් ඔහු බමුණන් විසින් සිය කුලයෙන් නෙරපා හැරීම හේතුවෙන් ඔහුට ඒ සඳහා ඍජුව අවකාශයක් ලබා ගැනීමට නොහැකි විය. මෙම හේතුව නිසා ඔහු වෙස්වලාගෙන මීමාංසක තිර්ථක දර්ශනගේ රහස් පිළිබඳ අධ්‍යාපනය ලැබීමට තීරණය කළේය. ඒ සඳහා ඔහු පැමිණෙන්නේ ස්වකීය මවුපසින් මාමා කෙනෙකු වූ ධර්මකීර්තිපාදයන්ට සමකාලීන කුමාරිල නම් මීමාංසක දාර්ශනිකයා වෙතය. (Chattopadhyaya, 1990, p. 230) මෙසේ ඔහු වෙත එළඹි ධර්මකීර්තිපදයෝ ඔහුගේ කෙත්වතු වල දාසයෙක් ලෙස සේවයට එකතු වූහ. එහි දී කුමාරිල ඔහුට තීර්ථක ඉගැන්වීම් සහ වාද කිරීමේ යම් යම් න්‍යායන් හා රහස් ඉගැන්වුව ද ඔහු සතුව පැවති ඉතා ප්‍රබල රහස් නොඉගැන්වීය. ඔහු ඒවා ඉගැන්වූයේ ඔහුගේ පුතාට සහ බිරිඳට පමණි. එහෙත් උපක්‍රමශීලී වූ ධර්මකීර්ති කුමාරිලගේ බිරිදට සහ පුතාට දැඩි හිතවත්කමකින් සේවය කිරීමෙන් එම රහස් ද ඉගෙන ගත්තේය. මෙනයින් කුමාරිලගෙන් තීර්ථක මීමාංසක දර්ශනය පිළිබඳ ප්‍රාමාණික ඥානයක් ලබා ගත් ධර්මකීර්ති ඔහුගෙන් ඊට වඩා දෙයක් ලබා ගත නොහැකි බව තේරුම් ගෙන නැවතත් මගධය බලා යාමට පිටත් විය.

ඔහු නැවත මගධය බලා එන අතරතුර **කාකගුහා** නම් ආර්රික මධ්‍යස්ථානයකට පිවිසියේය. එය ද්‍රමරිපු නම් රජුගේ රාජධානියයි. ධර්මකීර්තිපාදයෝ එහි ගේට්ටුවේ **"කාට හෝ වාද කිරීමට අවශ්‍යද?"** යන සටහනක් තැබූහ. එහි දී ධර්මකීර්තිපාදයෝ ස්වකීය තීර්ථක ධර්මය පිළිබඳ පැවති ඥානය තීර්ථක අනුගාමිකයන්ට මැනවින් පෙන්වා දුන්හ. කාණගුප්ත හෝ කණාදගුප්ත නම් වූ න්‍යාය දාර්ශනික කණාදගේ ගෝලයා සහ ෂට් දර්ශනයන්ට අයත් අනුගාමිකයෝ 500ක පමණ පිරිසක් රැස් වූහ. එහි දී ධර්මකීර්තිපාදයන් ඔවුන් හා වාද කළ අතර එම වාදය මාස තුනක පමණ කාලයක් පැවති බව සඳහන් වේ. අවසානයේ දී ධර්මකීර්තිපාදයෝ ඔවුන්ව පාරජයට පත් කළ අතර එම පිරිස බෞද්ධයන් බවට ද පත් කළහ. එමෙන්ම එම පිරිස අතරින් පනහක පමණ කණ්ඩයමක් තෝරා එම ප්‍රදේශයේ බෞද්ධයන් සඳහා මධ්‍යස්ථානයක් ද නිර්මාණය කළ බව දැක්වේ. (Chattopadhyaya, 1990, p. 231)

මෙම කථා ප්‍රවෘත්තිය අසන්නට ලැබුණු කුමාරිල එම ප්‍රදේශයට තවත් බමුණන් පන්සීයක් ද සමග පැමිණියේය. පැමිණ රජුගෙන් මෙසේ ඉල්ලා සිටියේය. එනම් මෙම වාදයෙන් යමෙක් පරාජය පත් වේ නම් ඔහුගේ ජීවිතය අවසන් කරන්න යනුවෙනි. එහෙත් මෙම යෝජනාවට ධර්මකීර්තිපාදයෝ අකමැති වූහ. කුමාරිලගේ මරණය අකමැති වූ ඔහු ප්‍රකාශ කර සිටියේ එම විවාදයෙන් කුමාරිල පරාජයට පත් වුව හොත් ඔහු තමන්ගේ ශ්‍රාවකයන් ද සමග ස්වකීය ආගම අතහැර බෞද්ධ ආගමට පැමිණිය යුතු බවයි. මෙම යෝජනාවට කුමාරිල එකඟ වීමත් සමග වාදයට පැමිණි කුමාරිල විසින් තීර්ථක මත සනාථ කරනු වස් තර්ක පන්සීයක් පමණ ඉදිරිපත් කළේය. නමුත් ධර්මකීර්ති තර්ක සියයකින් එම සියලු තර්කයන් ඛන්ඩනය කළේය. ඒ අනුව මෙම විවාදයෙන් කුමාරිල ඇතුලු පිරිස පරාජයට පත් වූහ. එහි දී, එම පිරිස බෞද්ධ දර්ශනය වැරදි රහිත නිවැරදි එකක් බව අවබෝධ කරගත් අතර බෞද්ධයන් බවට ද පත් වූහ. මෙම කථා ප්‍රවෘත්තියට අනුව ධර්මකීර්තිපාදයන්ට බොහෝ අනුගාමිකයන් සිට ඇති නමුත් ඓතිහාසික වාර්තාවලට අනුව එහි සත්‍යතාවයෙහි යම් ගැටලුකාරී ස්වභාවයක් දැකගත හැකිය.

මෙලෙස බොහෝ පිරිස් සමග වාද කරමින් විවිධ ජයග්‍රහණයන් ලබමින් විවිධ පිරිස් බෞද්ධයන් බවට පරිවර්තනය කරමින් සිටි ධර්මකීර්තිපාදයෝ භාවනා කිරීම සඳහා වනගත වූහ. මේ අතරතුර අවස්ථාවක ශංකර අචාර්යතුමා ශ්‍රී නලේන්ද්‍ර වෙත පණිවිඩයක් යවමින් ප්‍රකාශ කර සිටියේ තමන්ට වාදයක්

කිරීමට අවශ්‍ය බවයි. නමුත් නාලන්දාවෙහි භික්ෂූන් වහන්සේලා එය වසරක පමණ කාලයක් ධර්මකීර්තිපාදයන් පැමිණෙන තෙක් කල් දැමූහ. අනතුරුව විවාදය සඳහා කල් පැමිණි විට ප්‍රද්‍යෝත නම් රජු බෞද්ධයන්, බමුණන් සහ අනෙකුත් තීර්ථකයන් බරණැසට කැඳවීය. මෙලෙස විවාදය ආරම්භ කිරීමට ආසන්නයේ දී රජු ප්‍රමුඛ පැමිණ සිටි පිරිස ආමන්ත්‍රණය කොට ශංකරාචාර්යතුමා මෙසේ ප්‍රකාශ කළේය. ''මෙම විවාදයෙන් අප (ශංකර ඇතුලු පිරිස) ජයග්‍රහණය කළ හොත් පරාජිතයා වන ධර්මකීර්ති ගංගානම් ගඟට තල්ලු කිරීම හෝ ඔහු ස්වකීය ආගමට හරවා ගැනීම හෝ සිදු කළ යුතුය. එමෙන්ම ධර්මකීර්ති ජයග්‍රහණය කළහොත් නිසැකයෙන්ම තමා මෙම ගංගානම් නදියට පැන සිය දිවි නසා ගන්නේය.'' යනුවෙනි.

මෙලෙස විවාදය ආරම්භ වූ පසු ධර්මකීර්තිපාදයෝ නැවත නැවත් ශංකරව පරාජයට පත් කළහ. අනතුරුව ශංකර ගංගානම් නදියට පැනීමට සූදානම් වූ විට ධර්මකීර්ති ඔහුව නැවැත්වීමට නොයෙක් ආකාරයෙන් උත්සාහ ගත් නමුත් ඔහු එය නොපිළිගත්තේය. ඔහු තම ශිෂ්‍යයා වූ භට්ටාචාර්ය අමතා මෙසේ ප්‍රකාශ කළේය. ''ඔබ මුඩු හිසින් යුතු වූ මෙම පුද්ගලයා හා වාද කොට ඔහුව පරාජය කරන්න. ඔබට එය සිදු කිරීමට නොහැකි වුව හොත් මම ඔබේ දරුවෙකු ලෙස නැවත ඉපදී අප දෙදෙනා හා එක්ව මොහුව පරාජයට පත් කරමු'' යනුවෙනි. මෙසේ කියමින් ශංකර ගඟට පැන සිය දිවි නසා ගත්තේය.

මීට අමතරව මගධයේ පූර්ණ නම් වූ බ්‍රාහ්මණයෙක් සහ මථුරා ප්‍රදේශයේ පූර්ණභද්‍ර නම් බ්‍රාහ්මණයෙක් වාසය කළේය. මොවුන් දෙදෙනාම බොහෝ බලවත් මෙන්ම ප්‍රබල තාර්කිකයන් ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටියෝය. මෙම දෙදෙනා ද ධර්මකීර්තිපාදයන් සමග වාදයට එළඹී පරාජයට පත්ව බෞද්ධයන් බවට පත්වූ බව වාර්තාවේ. අනතුරුව මොවුන් දෙදෙනාද එක් අයෙක් පනහ බැගින් වූ මධ්‍යස්ථාන සියයක් මථුරාවේ සහ මගධයේ පිහිටවූ බව වැඩිදුරටත් සඳහන්වේ. මේ ආකාරයට ධර්මකීර්තිපාදයන්ගේ කීර්තිය සියලු දිශාවන්හි ව්‍යාප්ත වන්නට විය. මින් අනතුරුව ද උන්වහන්සේ මගධය සමීපයේ වූ ඍෂි මාතංග නම් වනයේ සිට භාවනාවේ නිරතව සිටි බව ද දැක්වේ.

ධර්මකීර්තිපාදයෝ වින්ධ්‍යා කඳුවැටියෙහි පිහිටි පුෂ්ප නම් රජුගේ පුතා වූ උත්පලපුෂ්ප නම් රජු විසින් පාලනය කළ ප්‍රදේශයට පැමිණියහ. එම රජු බොහෝ ගම්බිම් පාලනය කළ අතර විශාල ධනස්කන්ධයක හිමිකරු ද විය. එම ප්‍රදේශයට ධර්මකීර්තිපාදයන් පැමිණි විට රජු ඔහුගෙන් ''ඔබ කවුද?'' යනුවෙන් විමසීය. එහි දී ඔහු ධර්මකීර්තිපාදයන් බව දැන ඔහු වෙනුවෙන් මධ්‍යස්ථාන පනහක් පමණ ඉදි කරවීය. එසේම ධර්මකීර්තිපාදයන් ස්වකීය ප්‍රමාණ ශාස්ත්‍රය පිළිබඳ කෘති හතක් පමණ මෙම රාජ්‍ය තුළ සිටිමින් රචනා කළ බව වාර්තාවේ. තවද මෙම රජු ද්වාරයක මෙසේ සටහන් කොට තැබීය. **''යම් හෙයකින් ධර්මකීර්තිපාදයන්ගේ ඉගැන්වීම් නින්දට වැටුනොත් හෝ මැරුනොත් හෝ මිථ්‍යාදෘෂ්ටික මත එහි ඔබ්බවන තෙක් උන්වහන්සේගේ වචන සූර්යා මෙන් පායයි''** යනුවෙනි. මෙයින් අනතුරුව ඔහු ගුජරාට් ප්‍රදේශයට ගිය අතර එහි ගෝටපූරී නැතහොත් ගෞඩපූරී නමින් විහාරයක් කරවීය.

මෙකල නැවත උපන් ශංකර පෙරට වඩා තියුණු ඥානයකින් යුතුව වාදයෙහි අති නිපුණව පහළොස්වන වියෙහි පසු විය. ඔහු ධර්මකීර්තිපාදයන් සමග වාද කරනු කැමැත්තේ වාරාණසි දක්වා පැමිණියේය. ඔහු මහාසේන නම් රජු ලවා සියලු දිසාවන්හි මේ පිළිබඳ දන්වා අණබෙර යැවීය. මේ අනුව දක්ෂිණ ප්‍රදේශයේ සිට ධර්මකීර්තිපාදයන් පැමිණි අතර පන්දහසක් පමණ බමුණෝ රජු සමග එහි රැස්

වූහ. මෙහි දී ද පෙර පරිදි ම ඉතා තියුණු ලෙස විවාදය සිදු වූ අතර බරපතල ලෙස පරාජයට පත් වූ ශංකර පෙර ආත්මයේ පරිදිම ගංගා නම් නදියට පැන සිය දිවි නසා ගත්තේය.

කාෂ්මීර් ප්‍රදේශයෙන් විද්‍යාසිංහ, දේවවිද්‍යාකර සහ සේවසිංහ යනුවෙන් බ්‍රාහ්මණ පඬිවරු තිදෙනෙක් පැමිණ බෞද්ධ දර්ශනය පිළිබඳ සැක තැන් ධර්මකීර්තිපාදයන්ගෙන් විචාරා බුදු සමය කෙරෙහි පැහැදීමට පත්ව බෞද්ධ තර්කශාස්ත්‍රය සහ උන්වහන්සේගේ දර්ශනය මැනවින් ඉගෙන ගත්හ. අනතුරුව ඔවුහු ස්වකීය ප්‍රදේශයට නැවත ගොස් ධර්මකීර්තිපාදයන්ගේ තර්කශාස්ත්‍රය එහි ව්‍යාප්ත කරන්නට වූහ. මෙලෙස ධර්මකීර්තිපාදයෝ විවිධ විහාරයන් කරවමින් බොහෝ අන්‍ය තීර්ථකයන් බෞද්ධයන් බවට පත් කරමින් භාරතය පුරා බෞද්ධ දර්ශනයෙහි අත්‍යුත්කර්ෂයක් ඇති කළහ.

ධර්මකීර්තිපාදයන්ගේ අවසාන සමයේ ශංකර නැවත භට්ටාචාර්යගේ දෙවන දරුවා ලෙස පෙරටත් වඩා තීක්ෂණ ප්‍රඥාවකින් යුක්තව උපත ලැබීය. අනතුරුව දොළොස්වන වයසේ දී ධර්මකීර්තිපාදයන් සමග වාදයට යනු කැමති වූයේ අනෙක් බමුණෝ ඊට විරුද්ධ වූහ. ඔබට වාද කිරීමට අවශ්‍ය නම් වෙන කෙනෙකු සමග වාද කරන්න. එහෙත් ධර්මකීර්ති සමග වාද නොකරන්න යැයි කීහ. නමුත් ඔහු කෙසේ හෝ ධර්මකීර්තිපාදයන් හා වාදකිරීමට එළඹුණි. මෙවර ඔහු ධර්මකීර්තිපාදයන් සමග වාද කොට පරාජයට පත් වී බෞද්ධ උපාසකයෙක් බවට පත්විය. අවසන් වශයෙන් ධර්මකීර්තිපාදයෝ කාලිංග ප්‍රදේශයේ විහාරස්ථානයක් කරවා බොහෝ පිරිසක් බෞද්ධයන් බවට පත් කොට අපවත් වූහ. උන්වහන්සේගේ ශරීරය ඉතා උස් ආකාරයෙන් අදාහනය කළ අතර එම අවස්ථාවේ දී දිව්‍යමය මල් වැසි වැටුන බවත් එහි සුගන්ධය දින හතක් පුරා එම ප්‍රදේශයේ පැවති බවත් සඳහන්වේ.

ධර්මකීර්තිපාදයන්ගේ චරිත ස්වභාවය පිළිබඳ දැක්වෙන කථා ප්‍රවෘත්තියක් තාරානාථ විසින් වාර්තා කරයි. එයට අනුව උත්පලපුෂ්ඨ නම් රජුගේ රාජධානියෙහි සිට ධර්මකීර්තිපාදයන් ස්වකීය ප්‍රමාණ ශාස්ත්‍රයට අයත් ප්‍රමාණ ග්‍රන්ථයන් රචනා කරන සමයේ උන්වහන්සේ ඒ කෙරෙහි දැඩි අවධානයකින් පසු වූහ. බාහිර වෙනත් කිසිදු දෙයක් කෙරෙහි අවධානය යොමු නොකළහ. මෙය පරීක්ෂා කිරීම සඳහා රජතුමා ආහාරවලට තිත්ත එකතු කරන ලද මුත් එය උන්වහන්සේට නොදැනුනි. එයට හේතුව කුමක්දැයි රජු ධර්මකීර්තිපාදයන්ගෙන් විමසූ විට උන්වහන්සේ එයට පිළිතුර නිදර්ශනයක් ආශ්‍රයෙන් ප්‍රකාශ කළහ. රජතුමනි, මරණයට නියම වූ යම් පුද්ගලයෙක් ගෙන ඔහුට සුදු වත් අන්දවා ඔහුගේ හිසෙහි තෙල් පිරුනු කලයක් තබා අතෙහි අඩක් පිළිස්සූ දණ්ඩක් දී මෙසේ කියන්න. යම් හෙයකින් ඔබේ හිසෙහි තිබෙන කලයෙන් තෙල් බිඳක් හෝ වැටුනොත් හෝ දණ්ඩෙහි ඇති අගුරු වලින් ඔබේ ඇඳුම කිලිටි වුවහොත් එම මොහොතෙහි ම ඔබගේ හිස ගසා දමනු ලැබේ. මෙසේ පවසා අනතුරුව ඔහුගේ පසුපසින් තියුනු කඩුවක් ගත් අලුගෝසුවෙකු තබා ඔබ ඔහුට මාලිගය වටේ රවුමක් යන්නට අන කරයි. තවද ඔහු යන මාර්ගයේ දෙපස විවිධ නාට්‍ය සංදර්ශන, ගීත ගායනා, සංගීත සංදර්ශන ආදී නොයෙක් දෑ ඔහුට පෙනෙන්නට සළස්වයි. ඔහු තමන්ගේ ගමන ගොස් අවසන් වී පැමිණි විට ඔහුගෙන් ඔබ ඔහු ගමන් ගත් මාර්ගය දෙපස පැවති විවිධ දේ පිළිබඳ තොරතුරු විමසුවහොත් ඔහුට ඒවා නිවැරදිව කිව හැකිවේද? නැත. එයට හේතුව කුමක්ද? ඔහුගේ සිතුවිලි ඉතා දැඩිව පැවතියේ එක් දෙයක් ගැන පමණි. එනම් තමන්ගේ ජීවිතයයි. යනුවෙන් පිළිතුරු දුන්නේය.

මීට අමතරව බොහෝ වියතුන්ගේ සැකයට භාජනය වූ තවත් කථාප්‍රවෘත්තියක් හඳුනාගත හැකිය. එයට අනුව ධර්මකීර්තිපාදයෝ තමන්ගේ කෘතීන් හත රචනා කොට අවසන් වීමෙන් පසුව විවිධ

පණ්ඩිතයන්ට එය ලබා දුන්හ. එය කියවා බැලූ බොහෝ පන්ඩිතයන්ට ධර්මකීර්තිපාදයන්ගේ උත්තරානුභූතික ඥානවිභාගය තේරුම් ගැනීමට නොහැකි වූ අතර තේරුම් ගත් අය ධර්මකීර්තිපාදයන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් යුක්ත වන්නට වූහ. ඔවුන් ප්‍රකාශ කළේ මෙය එතරම් හොඳ එකක් නොවන බවත් මෙය බල්ලෙකුගේ වලිගයෙහි ගැට ගැසීමට සුදුසු බවත් ය. නමුත් ධර්මකීර්තිපාදයෝ ස්වකීය දර්ශනය පිළිබඳ මහත් විශ්වාසයකින් යුක්ත වූහ. ඒ අනුව විරුද්ධවාදීන්ගේ උක්ත ප්‍රකාශයට ධර්මකීර්තිපදයන් දුන් පිළිතුර නම් බල්ලා විවිධ වර්ගයේ මාර්ගවල ගමන් කරන්නාක් මෙන්ම තමන්ගේ දර්ශනය ද අනාගතයේ විවිධ ස්ථානවල ව්‍යාප්ත වන්නේය යනුවෙනි. ඔහු මේ පිළිබඳ ශ්ලෝකයක් ද තමන්ගේ කෘතියක ආරම්භයෙහි ඇතුළත් කළේය.

මෙම සිදුවීමෙන් අනතුරුව උන්වහන්සේ ස්වකීය කෘතීන් පිළිබඳව දේවේන්ද්‍රබුද්ධි සහ ශාක්‍යබුද්ධි යන දෙදනාට ඉතා සියුම් ආකාරයෙන් පැහැදිලි කොට, එහි පඤ්චිකාවෙහි ඉතිරි කොටස සම්පූර්ණ කරන ලෙස දේවේන්ද්‍රබුද්ධිට පැවරූහ. ඔහු එය පළමුවර නිමවා ධර්මකීර්තිපාදයන්ට පෙන්වීය. උන්වහන්සේ එය පළමුවර ජලයෙන් සේදූහ. දෙවන වර ඉදිරිපත් කළ විට ගින්නෙන් පිළිස්සූහ තෙවනවර ඔහු එය රචනා කොට මෙසේ එකතු කළේය. එනම් ''ප්‍රධාන වශයෙන් මෙය මගේ අවාසනාව. කාලය ගෙවී යයි. මා කෙටියෙන් කරන ලද මෙම පඤ්චිකාව හුදෙක් මාගේ පුහුණුව සඳහාය'' යනුවෙනි. මෙය ධර්මකීර්තිපාදයන්ට පිළිගැන්වීමෙන් අනතුරුව උන්වහන්සේ මෙසේ සඳහන් කළහ. ''මෙහි රචනා විලාශය පිළිබඳ සැලකීමේ දී වචනවල ගැඹුරු අර්ථ දැක්වීම තවමත් අසම්පූර්ණයි. එහෙත් සාමාන්‍ය අර්ථයෙන් ගත් විට මෙය ඉතාමත් සතුටුදායක මට්ටමක පවතී'' යනුවෙනි. තමන්ගේ දර්ශනය අනාගතයේ කිසිවෙකුත් නිවැරදිව තේරුම් නොගනීවි යනුවෙන් ඔහු සිතුවේය. එම නිසා ඔහු අටුවාවේ අගට මෙසේ ශ්ලෝකයක් එකතු කළේය. ''මාගේ කෘතීන්හි ගැඹුරු ප්‍රකාශ තේරුම් නොගන්නා කිසිවෙක් අනාගතයේ මාගේ තර්ක ශාස්ත්‍රය තේරුම් නොගනීවි. යම්සේ ගංගාවෝ මුහුදට සම්බන්ධව ගලා ගොස් අනතුරුව ඒවා මුහුදෙහි අතුරුදහන් වේ ද එමෙන්ම මාගේ ඉගැන්වීම් ද මා තුළම දියවී යාවි'' (Stcherbatsky, 1962, p. 36) යනුවෙනි.

ධර්මකීර්තිපාදයන්ගේ දර්ශනය පවත්වාගෙන යාම සඳහා එම දර්ශනය මැනවින් අවබෝධ කරගත් ශිෂ්‍යයකු උන්වහන්සේට හමු නොවුනබව ඓතිහාසික වාර්තාවන් පෙන්වා දෙයි. උන්වහන්සේගේ සමීපතම ශිෂ්‍යයකු ලෙස හඳුනාගැනෙන දේවේන්ද්‍රබුද්ධි උන්වහන්සේගේ ඉගැන්වීම්හි මතුපිට අර්ථය මිස එහි ගැඹුරු අරුත් අවබෝධ කර නොගත් බව ප්‍රමාණ වාර්තිකයට ලියන ලද අටුවාවව පිළිබඳව ධර්මකීර්තිපාදයන් ඉදිරිපත් කළ අදහසින් පෙනී යයි. දිග්නාගපාදයන්ට ද උන්වහන්සේගේ ඍජු ශිෂ්‍යයෙක් නොසිටියේය. ධර්මකීර්තිපාදයන් යනු ද දින්නාගපාදයන්ගේ ඍජු ශිෂ්‍යයකු වූ ඊශ්වරසේනපාදයන්ගේ මාර්ගයෙන් දින්නාගපාදයන්ගේ දර්ශනය උගත්තෙකි. එමෙන්ම ධර්මකීර්තිපාදයන්ගේ දර්ශනයේ ගැඹුරු අරුත් අවබෝධ කරගත් ශිෂයයා ලෙස හඳුනාගැනෙන ධර්මෝත්තරපාදයන් යනු ද ඔහුගේ දෙවන පරම්පරාවට අයත් ශිෂ්‍යයෙකි.

## ධර්මකීර්තිපාදයන්ගේ ශාස්ත්‍රීය දායකත්වය

භාරතීය බෞද්ධ තර්කශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයේ අතිප්‍රමුඛ තාර්කිකයෙකු ලෙස සැළකෙන ධර්මකීර්තිපාදයන්ගේ කෘතීන් පිළිබඳ විවිධ වාර්තාවන් විද්‍යමාන වේ. දිග්නාගපාදයන් විසින් ආරම්භ කරන ලද බෞද්ධ දර්ශන විෂය ක්ෂේත්‍රයේ තර්කශාස්ත්‍රීය උන්නතිය අපේක්ෂා කළ ධර්මකීර්තිපාදයෝ ශාස්ත්‍රීය වශයෙන් ප්‍රබල දායකත්වයක් ලබා දුන්හ. Stcherbatsky ප්‍රකාශ කරන ආකාරයට ධර්මකීර්තිපාදයන් තර්කශාස්ත්‍රීය මූල ග්‍රන්ථ 07 ක් පමණ රචනා කොට ඇත. (Stcherbatsky, 1962, p. 37) එම ග්‍රන්ථයන්ගෙන් සම්බන්ධපරීක්ෂා සහ සන්තානාන්තරසිද්ධි යන කෘතීන් දෙක හැර අනෙක් ග්‍රන්ථ පහ පිළිබඳවම කාලවකවානු පැහැදිලි ය. මෙහි දී Frauwallner විසින් රචනා කරන ලද Die Reihenfolge und Entstehung der Werke Dharmakīrti's නම් කෘතිය මගින් උන්වහන්සේගේ කෘතීන් පිළිබඳව පැවති බොහෝ ගැටලුකාරී ස්වභාවයන් සමථයකට පත් කර ඇති බව වියත් මතයයි. (Silk, 2019, p. 159) ඒ අනුව ධර්මකීර්තිපාදයන්ගේ නමට පැවරෙන කෘතීන් හත පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

1. ප්‍රමාණවාර්තික
2. ප්‍රමාණවිනිශ්චය
3. න්‍යාය බින්දු
4. හේතු බින්දු
5. වාදන්‍යාය
6. සම්බන්ධපරීක්ෂා
7. සන්තානාන්තරසිද්ධි

යනුවෙනි. මෙම කෘතීන් අතරින් බෞද්ධ තර්කශාස්ත්‍රයේ මූලික හරයන් ඇතුළත් මූල ග්‍රන්ථය වශයෙන් සැළකෙන්නේ ප්‍රමාණවාර්තිකයයි. අනෙක් කෘති හය එය පදනම් කරගනිමින් රචනා වී ඇත. ධර්මකීර්තිපාදයන් නමට පැවරෙන මෙම කෘතීන් හත නැවත කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය. ගසක කඳ සහ ශාඛා නිදර්ශන වශයෙන් ගනිමින් මෙම වර්ගීකරණය කර ඇත.

ප්‍රමාණවාර්තික
ප්‍රමාණවිනිශ්චය — කඳ (ප්‍රධාන කෘතීන්)
න්‍යාය බින්දු

හේතු බින්දු
වාදන්‍යාය — ශාඛා (ප්‍රධාන කෘතීන්ට අනුව සැකසූ අනුකෘතීන්)
සම්බන්ධපරීක්ෂා
සන්තානාන්තරසිද්ධි

දින්නාගපාදයන්ගේ ප්‍රමාණසමුච්ඡය කෘතිය විවරණය කරමින් රචනා කර ඇති මෙම ප්‍රධාන කෘති තුනෙන් මුල් කෘතිය වන ප්‍රමාණවාර්තිකය වඩාත් විස්තරාත්මක කෘතියකි. දෙවන කෘතිය වන ප්‍රමාණවිනිශ්චය තරමක් කුඩා වන අතර තෙවන න්‍යාය බින්දුව ඉතාමක් සංක්ෂිප්ත ග්‍රන්ථයකි. මෙම කෘති ත්‍රය මූලික ග්‍රන්ථ

වශයෙන් සැළකීමට හේතුව වන්නේ බෞද්ධ තර්කශාස්ත්‍රයට අයත් සමස්ත විෂය ක්ෂේත්‍රයම ආවරණය වන පරිදි මෙම කෘතීන් රචනා වී තිබීමයි. එහි දී තර්කශාස්ත්‍රයට අයත් ප්‍රධාන කරුණු 08 ක් මෙම කෘතීන් මගින් සාකච්ඡාවට භාජනය වේ.

එනම් -

- සත්‍ය අනුමාන ඥානය (Correct Inferential Cognition)
- අසත්‍ය අනුමාන ඥානය (False Inferential Cognition)
- සත්‍ය ප්‍රත්‍යක්ෂ ඥානය (Correct Direct Percieve)
- අසත්‍ය ප්‍රත්‍යක්ෂ ඥානය (False Direct Percieve)
- සත්‍ය භාෂාමය ප්‍රකාශන හෝ සංවාක්‍ය (Correct Proof Statement)
- අසත්‍ය භාෂාමය ප්‍රකාශ හෝ සංවාක්‍ය (False Proof Statement)
- සත්‍ය බහිෂ්කරණ (Correct Refutation)
- අසත්‍ය බහිෂ්කරණ (False Refutation)

යනුවෙනි. මෙහි මුල් හතර අයත් වන්නේ ස්වාර්ථය හෙවත් පුද්ගලික ඥානය උදෙසාය. අවසන් කරුණු හතර මගින් තමන් වෙත ලබා ගත් ඥානය අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒ අනුව උක්ත මූලික කෘති තුළ සාකච්ඡා වන්නේ තර්කශාස්ත්‍රයට අයත් මෙම කරුණු පිළිබඳව වන හෙයින් ඒවා ප්‍රධාන වශයෙන් සළකා ඇත. එහෙත් ශාඛාමය කෘතීන්හි මෙම සමස්ත තර්කශාස්ත්‍රීය ප්‍රධාන කරුණු විවරණය නොවන අතර ඇතැම් කොටස් පමණක් ඒවායෙහි පැහැදිළි කෙරේ. එමෙන්ම අනෙක් කෘතීන්හි බොහෝ දුරට විවරණය වන්නේ ප්‍රමාණවාර්තිකයෙහි ප්‍රථම, තෙවන සහ සිවුවන පරිච්ඡේද වලට උපකාරීවන කොටස් පිළිබඳවය. එහි දී **හේතු බින්දු** සහ **සම්බන්ධපරීක්ෂා** යන කෘති දෙක මගින් විවරණය වන්නේ හේතු පිළිබඳවය. එනම් නිවැරදි හේතු සහ උපකල්පන පිළිබඳව වන අතර එය ප්‍රමාණවාර්තිකයෙහි ප්‍රථම පරිච්ඡේදයට අනුග්‍රහ පිණිස රචනා වී ඇත. අන්‍යයන්ගේ මනස පිළිබද ගැටලුව සාකච්ඡා වන **සන්තානන්තරසිද්ධි** නම් කෘතිය ප්‍රමාණවාර්තිකයෙහි තෙවන පරිච්ඡේදයට උපකාරී වන අතර **වාදන්‍යාය** නම් කෘතිය උපකාරී වන්නේ සිවුවන පරිච්ඡේදයටයි.

## නිගමනය

උක්ත කරුණු සියල්ල අනුව පෙනී යන්නේ ධර්මකීර්තිපාදයන් බෞද්ධ තර්කශාස්ත්‍රීය සංවර්ධනය උදෙසා අතිමහත් සේවාවක් සිදු කර ඇති බවයි. එහි දී ප්‍රමාණවාර්තික නම් කෘතියට සුවිශේෂී ආස්ථානයක් හිමි වේ. එම කෘතිය මූලික කරගනිමින් බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායක් බිහිවීමට අවශ්‍ය පදනම සැකසී ඇති බව පෙනී යන කරුණකි. ධර්මකීර්තිපාදයන් විසින් බෞද්ධ තර්කශාස්ත්‍රය භාරතය තුළ පමණක් නොව වෙනත් දේශාන්තරයන්හි ද ව්‍යාප්ත වීමට අවශ්‍ය පදනම සකස් කොට ඇත. පසුකාලීනව ටිබෙට්, චීන වැනි රටවල් කේන්ද්‍ර කරගනිමින් එය ව්‍යාප්ත වී ඇති ආකාරය හඳුනාගත හැකිය. දිග්නාගපාදයන් විසින් ආරම්භ කරන ලද තර්කශාස්ත්‍රය දාර්ශනික පදනමකින් යුක්තව සංවර්ධනය කිරීම ධර්මකීර්තිපාදයන් අතින්ය සිදු වූ වැදගත්ම සේවය ලෙස පෙන්වා දිය හැකිය. එමෙන්ම විඥානවාදී සහ සෞත්‍රාන්තික යන

බෞද්ධ ගුරුකුල ද්විත්වය තුළ පැවති මතවාදයන් සංකලනය කරමින් නව්‍ය වූ පදනමක් තර්කශාස්ත්‍ර විෂයෙහි ඇති කිරීමට උන්වහන්සේ උත්සාහ දරා ඇති බව හඳුනාගත හැකිය. උක්ත කරුණු සියල්ල සමෝධානය කිරීමේ දී පෙනී යන්නේ බෞද්ධ තර්කශාස්ත්‍රය නම් විෂය ක්ෂේත්‍රයේ අද්විතීය සන්ධිස්ථානයක් ධර්මකීර්තිපාදයන් විසින් සළකුණු කර ඇති බවයි.

### ආශ්‍රිත ග්‍රන්ථ


Chattopadhyaya, D. (. (1990). *Tāranātha's History of Buddhism in India.* Motilal Banarsidass Publisher.

Franco, E. (2015). Xuanzang’s Silence and Dharmakīrti’s Dates. *Vienna Journal of South Asian Studies, 56*, 117-142.

Frauwallner, E. (1961). Landmarks in the History of Indian Logic. *Wiener Zeitschrift für die Kunde Süd- und Ostasiens*, 125-148.

Funayama, T. (2001). Two Notes on Dharmapāla and Dharmakīrti. *ZINBUN Volume 35*, 1-11.

Kimura, T. (1997, November). A New Chronology of Dharmakīrti. In Dharmakīrti’s Thought and its Impact on Indian and Tibetan Philosophy. *Proceedings of the Third International Dharmakīrti Conference*, (pp. 209-214). Hiroshima.

Krasser, H. (2012). Bhāviveka, Dharmakīrti and Kumārila. *Johannes Bronkhorst Felicitation Volume.*, 535-594.

Lindtner, C. (1980). Apropos Dharmakirti: Two New Works and a New Date. *Acta Orientalia Kobenhavn 41*, 27-37.

Malvania, P. (1959). *Svdrthdnumdna-pariccheda by Dharmakirti.* Varanasi: Hindu Vishvavidyalaya Nepal Rajya Sanskrit Series, vol. II.

Nakamura, H. (1980). *Indian Buddhism: A Survey with Bibliographical Notes.* Delhi: MOTILAL BANARSIDASS.

Sailkrtyayana, R. (n.d.). Dharmakirti's Vadanyaya with the commentary of Santara ita. *Appendix to JBORS, Vols. 21 & 22.*

Samkrtyayana, R. (1956). *Viswa Darsanangal (VD) Translated by PM Kumaran Nair.* PK Brothers Kozhikode-I, 805.

Sankrityayana, R. (1943). *Pramanavarttikam: svarthanumanaparicchedha svopajnavrttya Karígomiviracitya tattikaya.* Allahabad: Kitab Mahal.

Sāṅkṛityāyana, R. (1953). *Pramanavarttikabhashyam or Varitikalankarah of Prajnakaragupta* . Patna: Kashi Prasad Jayaswal Research Institute.

Silk, J. A. (2019). *Brill's Encyclopedia of Buddhism, Volume II.* London: Brill.

Stcherbatsky, F. T. (1962). *Buddhist logic.* Delhi: Motilal Banarsidass Publishers Privat Limited.

Vidyabhusana, S. C. (1909). *The History of the medieval school of Indian logic.* Calcutta: University of Calcutta.

Vidyabhusana, S. C. (1988). *A history of Indian logic: Ancient, mediaeval and modern schools.* Varanasi: Motilal Banarsidass Publishe.

හන්තාන දාර්ශනික කවය
Adversus Veritatem
Hanthana Philosophy Circle

# ගැඩමරියානු අර්ථ විවරණය සහ මහා වංශය

# Gadamerian Hermeneutics and Mahawamsa

***Darshana Ashoka Kumara***

*Senior Lecturer, Genaral Sir John Kotelawala Defence University, Rathmalana*

මෙම ලිපිය තුළ දී හාන්ස් ගියෝර්ග් ගැඩමර් (Hans-Georg Gadamer) (1900 – 2002) විසින් ඉදිරිපත් කෙරුණු දාර්ශනික අර්ථ විවරණය (Philosophical Hermeneutics) ශ්‍රී ලාංකේය සංදර්භය තුළ දී විවිධ ශාස්ත්‍රාලීය මතභේදයන්ට පාදක වී ඇති මහා වංශය වැනි කෘතියක් අර්ථ විවරණය කිරීම සඳහා යොදා ගන්නේ කෙසේද යන්නත් විමසීම සිදු වේ. දාර්ශනික අර්ථ විවරණය තුළ දී සිදු වන්නේ මිනිස් අවබෝධය ගැඹුරින් ප්‍රශ්න කිරීම සහ විග්‍රහ කිරීමකි. මහා වංශය වැනි කෘතියක් අර්ථ විවරණය කිරීමේ දී ගැඩමරියානු දාර්ශනික අර්ථ විවරණය වැදගත් වන්නේ ප්‍රායෝගික ප්‍රඥාව (*phronesis*) තුළින් එහි අර්ථයන් ප්‍රතිගවේෂණය කිරීමේ හැකියාවක් අත්පත් වන බැවිනි. පූර්ව අවබෝධය (pre-understanding), තත්සංවාදය, අවබෝධයේ ක්ෂිතිජයන් නිර්මාණය වීම වැනි දෑ මෙම ප්‍රතිගවේෂණ ක්‍රියාවලියේ මූලිකාංග වේ.

ජර්මනියේ මාර්බර්ග්හි දී උපත ලැබූ දාර්ශනිකයෙකු වූ ගැඩමර් කලක් මාර්බර්ග් විශ්වවිද්‍යාලයේ රෙක්ටර්වරයෙකු ලෙස ද කටයුතු කළ අයෙකි. ඔහු හයිඩෙගර්ගේ සිසුවෙකු වූ බැවින් ම හයිඩෙගරියානු දර්ශනයෙන් සෑහෙන තරම් පෝෂණයක් ලැබූ අතර එය 'අවබෝධය' සහ අර්ථ විවරණය සම්බන්ධයෙන් වන දාර්ශනික ප්‍රශ්නය වෙත ඔහු යොමු කරවන්නට විය. ගැඩමර් විසින් රචනා කරන ලද අග්‍රකෘතිය වශයෙන් Truth and Method සැලකෙන අතර ඔහුගේ දාර්ශනික අර්ථ විවණය එහි දී හොඳින් සංවර්ධනය කෙරී ඇත (වෛන්ෂයිමර්, 1985). හයිඩෙගර් විසින් ආරම්භ කරන ලද අර්ථ විවරණ සම්ප්‍රදායයට දිගුවක් ගෙන ඒමක් ලෙසින් දාර්ශනික අර්ථ විවරණය සැලකිය හැකිය. ගැඩමර් නව්‍ය-කාන්ට්වාදී දාර්ශනික ප්‍රවාහයෙන් ද ආභාසයක් ලැබූ අයෙකු වන අතර ඔහුගේ දාර්ශනික ප්‍රවාද ගොඩනැගීම කෙරෙහි එය බලපෑ අතර ගැඩමර් විසින් සංවාදාත්මක දාර්ශනික ප්‍රවේශයක් (dialogical approach) ගෙන එනු ලැබූ අතර අර්ථ විවරණාත්මක සංවාදය ( hermeneutical dialogue) ඔස්සේ මහා වංශය වැනි කෘතියක කරුණුමය පදනම (factual basis) ප්‍රශ්න කිරීම මෙම ලිපියේ දී සිදු කෙරේ.

ගැඩමර්ගේ දාර්ශනික ව්‍යායාමය හයිඩෙගරියානු දාර්ශනික සම්ප්‍රදායය මත පමණක් නොව ප්ලේටෝනියානු-ඇරිස්ටෝටලියානු දාර්ශනික සම්ප්‍රදායය මත ද පදනම් වී ඇති අතර අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලිය අදාළ ගැටලුව සම්බන්ධයෙන් ඇති කර ගන්නා එකගතාවක් මත පදනම් වන බව පෙනී යයි (බුර්ෂ්වා, 2007: 53). එබැවින්, මහා වංශය කියැවීම සඳහා ගැඩමරියානු අර්ථ විවරණය භාවිත කිරීම මහා වංශය සම්බන්ධයෙන් තිබෙන පූර්ණ අර්ථ විවරණයක් විසංයෝජනය

කිරීම සඳහා යොදා ගැනීමට හැකිවන්නේ මහා වංශය යනු මිථ්‍යා කථා, අතිශයෝක්ති, ආශ්චර්යවත් සිදුවීම් ආදියෙන් පිරුණු විශ්වාසයත් අවිශ්වාසයත් අතර දෝලනය වන ඉතිහාසය සම්බන්ධයෙන් ව්‍යාකූල අර්ථ සම්පාදනය කරන කාව්‍ය ග්‍රන්ථයක ලක්ෂණ පෙන්නුම් කරන්නක් ද වන බැවිනි. මෙයින් අදහස් වන්නේ ඉතිහාසය සංදර්භගත කිරීමේ දී මහා වංශය වැනි කෘතියක් වැදගත් නොවෙන්නේ යන්න නොවේ. එය වඩාත් විසංයෝජනාත්මක ලෙසින් සංදර්භගත කරන්නේ කෙසේද යන්න සොයා බැලීම ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර ගැඩමරියානු දාර්ශනික අර්ථ නිරූපණය ඉතා වැදගත් වේ.

මහා වංශය ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධයෙන් ක්‍රිස්තු පූර්ව 6 වැනි සියවසේ සිට මහසෙන් රජුගේ රාජ්‍ය සමය අවසානය වන තෙක් ඉතිහාසය පිළිබඳ සාකච්ඡා කිරීමට උත්සාහ දරන්නේ සීහළට්ඨකතා පාදක කර ගනිමින් නිර්මාණය වූ ආත්මීය ඉතිහාසයක් පාදක කර ගනිමින් බව කිසිවෙකුටත් බැහැර කළ නොහැකි කරුණකි. එබැවින් මහා වංශ ඉතිහාසය පාරඉතිහාසයක (metahistory) අයත් වන්නකි (වයිට්, 1973). මහා වංශය ඉතිහාසය සංගත කථාවක් (coherent story) වශයෙන් නිර්මාණය කරන්නේ පුළුල් පරාසයක් දක්වා දිවෙන උපාය මාර්ග, අර්ථ දැක්වීමේ තර්ක, දෘෂ්ටිවාදී අනුමිතීන් (ideological implications) ආදිය ඒ තුළට ඇතුළත් වී ඇති අතර මහා වංශය තේරුම් ගත යුත්තේ ආත්මීයත්වය සහ වෛෂයිකත්වය යන දෙඅන්තය ම අත්හැරීමෙනි. ගැඩමර් පෙන්වා දෙන ආකාරයට සම්ප්‍රදායය තුළ භාෂාත්මක වශයෙන් වන මැදිහත් වීමක් ඔස්සේ අර්ථ නිෂ්පාදනය වන ආකාරය දාර්ශනික අර්ථ විවරණය ඔස්සේ පැහැදිලි කර ගැනීමට හැකි වන අතර මහා වංශය තුළ ඇති භාෂාත්මක ප්‍රකාශන හුදු ප්‍රස්තුතයන් බවට ඌනනය කිරීමේ ප්‍රශ්නය ඉස්මතු කර දැක්වීම මෙම ලේඛනයේ මූලික අභිලාෂයකි. භාෂාව වෙත සියලු සත්තාව ලඝු කිරීම ප්‍රශ්න කළ යුත්තක් වේ.

ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී වංශ කතා සාහිත්‍යය කෙරෙහි විශාල බරක් තබා ඇති අතර ඒ අතරිනුත් මහා වංශයට හිමි වන්නේ සුවිශේෂත්වයකි. පාලි බසින් දීප වංශය, මහා වංශය, ථූප වංශය, ධාතු වංශය සහ දාඨා වංශය මෙරට වංශ කථාකරණයේ ඉමහත් ප්‍රසිද්ධියකට පත් ව ඇති අතර සිංහල බසින් ලියැවී ඇති පූජාවලිය, සිංහල ථූප වංශය, දළදා සිරිත, රාජවලිය ආදිය ද වැදගත් වංශ කථා වශයෙන් සැලකේ (ධම්මරතන, 2013). මීට අතිරේක වශයෙන් තවත් වංශ කථා කිහිපයක් දක්නට ලැබුණත් විජය නම් රජුගේ සිට මහසෙන් නම් රජු දක්වා වූ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දීත් නූතන සිංහල අනන්‍යතා නිර්මාණය කිරීමේ දීත් දේශපාලනික වශයෙන් මහා වංශය ඉටු කර ඇති කාර්යය සහ එහි ඇති දේශපාලනික සබලතාව නිසා එය අධ්‍යයනය කිරීම සඳහා මෙහි දී තෝරා ගනු ලැබිණ.

සම්ප්‍රදාය සහ භාෂාව පාදක කර ගනිමින් අර්ථයේ ක්ෂිතිජයන් නිර්මාණය වීම සම්බන්ධයෙන් වන ගැඩමරියානු ඉගැන්වීම මහා වංශය වැනි කෘතියට දේශපාලනික ඇඟවුම් හඳුනා ගැනීම කෙරෙහි මෙහි දී යොදා ගැනේ. මහා වංශය පාලි භාෂාවෙන් කාව්‍යාත්මක ස්වරූපයකින් ලියැවුණු වංශ කථාවක් වන අතර එය අර්ථ නිරූපණය කිරීමේ දී එක්තරා අතකින් වාස්තවිකකරණයක්

(objectification ) සිදු වී ඇති අතර අනෙක් අතින් විශ්වීය ඉතිහාසයක් (universal history) නිර්මාණය කෙරී තිබේ ( පීටර්ස් 1975). මේ ඔස්සේ සිදු වී ඇත්තේ අර්ථය සම්බන්ධයෙන් තනි ක්ෂිතිජයක් (single horizon) නිර්මාණය කිරීමයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ඇති ප්‍රබලතම ආඛ්‍යානයක් බවට පත් කර ගෙන ඇති මහා වංශයේ “පොරාණෙහි කතො පෙසො” යන්නෙන් ඉදිරිපත් කෙරෙන මූලික මූලාශ්‍රය වන සීහළට්ඨකතා මහා වංශය සම්බන්ධයෙන් අප කිසිවක් නොදැන අප අපගේ අර්ථය තනි ක්ෂිජතියක් ඔස්සේ නිර්මාණය කිරීම මහා වංශ ආඛ්‍යානය විශ්වීය ඉතිහාසයක් වශයෙන් ප්‍රති නිර්මාණය කිරීමට ගන්නා උත්සාහයේ දී මුලින් ම මතු වන ප්‍රධාන ම ගැටලුවක් වේ (ප්‍රඥානන්ද, 2005).

මහා විහාර පාර්ශ්වයේ හිමිවරුන් විසින් විවිධ ක්‍රම ඔස්සේ ලක්දිව ඉතිහාසය සම්බන්ධයෙන් විවිධ වාර්තා තබා ගෙන තිබූ අතර ක්‍රිස්තු වර්ෂ 5 වැනි සියවසේ පමණ ජීවත් වූ මහා විහාරවාසී මහානාම නම් හිමිනමක විසින් එම තොරතුරු රැස් කර මහා වංශය නමින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය ආඛ්‍යානගත කෙරිණ (සෙන්, 1999: 91) මහා වංශය මතු නොව දීප වංශය උදෙසා ද පාදක වූයේ ද සීහළට්ඨකතා මහා වංශය ම බව පෙනී යයි. මහා වංශය රචනා කිරීමේ දී රචකයාගේ ආත්මීයත්වය කෘතිය තුළට ඇතුළු වීම ඔහුගේ ම ප්‍රකාශයකින් පැහැදිලි වේ. මහා වංශය සඳහා පැරණි කෘති ඔස්සේ කරුණු ලබා ගැනීමේ දී අනවශ්‍ය තරම් දීර්ඝ විස්තර කෙටි කිරීම, සංක්ෂිප්ත ව දක්වා ඇති කරුණු අවශ්‍ය පමණට දීර්ඝ කිරීම, පුනරුක්තීන් බැහැර කිරීම යන ක්‍රම තමන් භාවිත කළ බවට මහා වංශ කතුවරයා සිය කෘතිය ආරම්භයේ දී ම පවසන අතර මෙමඟින් පොරාණ සීහළට්ඨකතා මහා වංශයේ අන්තර්ගත වූ කරුණුවලට මහා වංශ කතුවරයාගේ ආත්මීයත්වය විශාල වශයෙන් ඇතුළු වී ඇති බවත් සමකාලීන දේශපාලනික වුවමනාවන් එහි ගැබ් ව ඇති බවත් නිසැක වේ. මීට අතිරේක වශයෙන් සිය ආඛ්‍යානය නිර්මාණය කිරීමේ දී මහා වංශ කතුවරයා ජනප්‍රවාදවලින් ලත් තොරතුරු ද විශාල වශයෙන් ඇතුළත් කර ඇති බව මහා වංශ ටීකාව විමසීමේ දී පෙනී යයි (අමරවංස, 2001).

මේ අනුව, මහා වංශය සම්බන්ධයෙන් සංවෘත ක්ෂිතිජයන් (closed horizons) යටතේ අර්ථ සම්පාදනය කිරීම නොමඟ යවන සුළු වන අතර මහාවංශ කතුවර මහානාම හිමියන්ගේ පසුබිම, සංස්කෘතිය, සම්ප්‍රදාය, දේශපාලනය, ස්ත්‍රී/පුරුෂ සමාජභාවය, භාෂාව, අධ්‍යාපනය, සිරිත් විරිත් ආදී දේ පිළිබඳ විවිධ ක්ෂිතිජ ඔස්සේ හැදෑරීමකින් තොර ව සත්‍යයක් සොයා ගැනීමට දරන උත්සාහය මායාත්මක වේ. මහානාම හිමියන්ගේ ප්‍රාග්විනිශ්චය (prejudice) කුමන ආකාරයෙන් පැවතියේ ද යන්න දැන ගැනීමට හැකි වන්නේ තත්කාලීන ඉතිහාසය හා දේශපාලනය පිළිබඳ සාධාරණ ගවේෂණයක් කිරීමෙනි. මහා වංශය යනු හුදී ජනයාගේ පහන් සංවේගය උදෙසා රචනා කළ කෘතියක් යැයි මහානාම හිමියන් සෑම පරිච්ඡේදයක් අවසානයේ දී ම කරන ප්‍රකාශය ඔස්සේ පෙනෙන්නේ එම කෘතියේ දී වෛෂයික තොරතුරු කෙරෙහි පමණක් අවධානය යොමු වීමක් නොපවතින බවයි. ධාතුසේන රජු කුඩා කාලයේ දී හැදී වැඩුණේ මහා වංශ කතුවර මහානාම හිමියන්ගේ සරණේ දික්සඳ විහාරයේ ය (පිකරින්, 1879). මෙය ප්‍රශ්නකාරී අදහසක් වන්නේ මහා

වංශ කතුවර මහානාම හිමියන් පිළිබඳ තොරතුරු වංසත්ථප්පකාසිනියෙන් හැර මහා වංශයෙන් හමු නොවන බැවිනි. එහෙත්, මහා වංශය රචනා කළේ මහානාම හිමියන් බවට කොඩ්රිංටන් ඇතුළු ප්‍රධාන පෙළේ ඉතිහාසඥයන් පිළිගන්නා බැවින් එය ප්‍රශ්නගත ව හෝ අප මෙහි දී පිළිගන්නේ නම් ධාතුසේන රජුගේ මාමණ්ඩිය වන මෙම මහානාම හිමියන් තුළ පැවති දේශපාලනික වුවමනාව තේරුම් ගැනීමකින් තොර ව මහා වංශ පඨිතයේ ඇති අර්ථ විවරණාත්මක පරාවර්තනයන් (hermeneutic reflection) වෙත අත ගැසීම වරදක් වන අතර මහානාම හිමියන්ගේ දේශපාලනික සංවේදීතාව නිසා උන් වහන්සේට මඟ හැර යා නොහැකි ප්‍රාග්විනිශ්චයක් ඇති වේ. එබැවින්, මහානාම හිමියන්ගේ ඵලදායී ඓතිහාසික සවිඥානය (effective-historical consciousness) újrKh කිරීම වැදගත් වන්නේ උන් වහන්සේ මහා වංශය පඨිතය ඔස්සේ වීරයන් දෙදෙනෙකු ප්‍රධාන වශයෙන් ඉස්මතු කර දැක්වීමට දරන උත්සාහය හේතුවෙනි. ප්‍රාග්මහින්ද යුගයේ මෙරට ඉතිහාසය තුළ වීරයා වශයෙන් පණ්ඩුකාභය රජුත් පශ්චාත් මහින්ද යුගයේ වීරයා ලෙස දුටුගැමුණු රජුත් ආඛ්‍යානගත කිරීම කෙරෙහි මහානාම හිමියන්ගේ සවිඥානය යොමු වී තිබේ. මහානාම හිමියන් තම ආඛ්‍යානය ගොඩනගන්නේ ධාතුසේන බලයට ගෙන ඒමේ සදාචාරාත්මක (moral)" වාගාලංකාරාත්මක (rhetorical) සහ ප්‍රබන්ධාත්මක (fictive) සංයුජතාවන් (valences) ඔස්සේ වන අතර එම පඨිතය තුළ තමන් වරණාත්මක සැකැස්මක් (selective arrangement) නොවළහා පිළිගැනීම දාර්ශනික අර්ථ විවරණාත්මක අධ්‍යයනයක් සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

මහා වංශය සම්බන්ධ බොහෝ කරුණු අභිලේඛන සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි ඔස්සේ අභියෝගයට ලක් වී නැති නමුත්, මහා වංශය නූතන අනන්‍යතා සාධනය කිරීම සඳහා යොදා ගෙන ඇති ආකාරය ඉතා සිත්ගන්නා සුලු වේ. මහා වංශ කතුවරයා දුටුගැමුණු රජුගේ අනන්‍යතාව ගොඩනැගීමේ දී සිය දේශපාලනික අනුමිතීන් විශාල වශයෙන් යොදා ගෙන තිබේ. විජිතවාදීන් විසින් ඇති කර තිබූ බෙදුම් න්‍යායෙන් පාලනය කිරීමේ (divide and rule ) ක්‍රමය අනුව පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාව තුළ දෙමළ සහ සිංහල ප්‍රජාවන් අතර ඇති වූ තිබූ භේදනය සහ දෙමළ ප්‍රජාව කෙරෙහි විජිතවාදීන් විසින් දී ප්‍රමුඛත්වය ආපසු හැරවීමේ සිංහල බහුතරයට තිබූ වුවමනාව සමඟ ඉතා හොඳින් ගැළපුණු ඉතිහාස ආඛ්‍යානය ලෙස මහා වංශය පහසුවෙන් තෝරා ගැනීමට හැකි වූ අතර දෙමළුන්ට එරෙහි දුටුගැමුණු රජුගේ වීරත්වය නූතන සිංහල අනන්‍යතාව පෝෂණය කිරීම සඳහා සිංහල ජාතිකවාදී ව්‍යාපාර සාර්ථක ලෙස භාවිත කළේය. එහෙත්, මෙම අනන්‍යතා ගොඩනැගීමේ ව්‍යාපාරයේ දී කතුවරයා සතුව තිබූ ප්‍රාග්විනිශ්චයන් ගැන විචාරාත්මක සැලකිල්ලක් අවශ්‍ය නොවන්නේ ජාතිකවාදී දේශපාලනය සඳහා එවැන්නකට අවශ්‍ය වන්නේ පසුවෙන් ජනතාව ආකර්ෂණය කර ගැනීමේ ව්‍යාපාරයක් බැවිනි. මහා වංශය ඔස්සේ අප වත්මන් අනන්‍යතාව ගොඩනැගීමේ ව්‍යාපෘතියේ නිරත වන විට වත්මනේ ක්ෂිතිජය (horizon of the present) අතීතය සම්ප්‍රදාය සම්බන්ධයෙන් සිතීමකින් තොරව සිදු කිරීමට යෑම භීෂණකාරී වේ.

මහා වංශ කතුවර මහානාම හිමියන්ගේ ප්‍රාග්විනිශ්චය පිළිබඳ තේරුම් ගත යුත්තේ උන් වහන්සේගේ අර්ථ විවරණාත්මක පිහිටීම (hermeneutical situatedness) මත පාදක ව වන අතර යථාර්ථය පරිපූර්ණ දෙයක් වශයෙන් ගැනීමට අපගේ ඇති උනන්දුව එහි දී ප්‍රශ්න කිරීමකට ලක් වනු ඇත. වසභ රජුගෙන් ආරම්භ වන ලම්භකර්ණ වංශිකයන්ගේ පාලනය මහනාම රජුගෙන් අවසන් වී රට අරාජික තත්ත්වයකට පත් වන අතර මහානාම රජුගේ පුත්‍රයා වූ සොත්ථිසේන උදේ රජ වී සවස් වරුව වන විට මැරුම් කයි. ඒ ඔහුගේ ඡත්තගාහක නම් මස්සිනා විසින් වන අතර ඡත්තගාහකගේ පුත්‍රයා වන මිත්සෙන්ගේ කාලයේ දී ෂඩ් ද්‍රවිඩ ආක්‍රමණ එල්ල වන අතර පාණ්ඩු, පාරින්ද, කුද්ද පාරින්ද, තිරිතර, දාඨිය, පීඨිය නම් ද්‍රවිඩ රජවරුන් හය දෙනෙකුගේ පාලනය රට නතු වෙයි (ගයිගර් සහ මාබෙල්, 1953). ද්‍රවිඩ පාලනය දැඩි පීඩාකාරී වූ අතර දහස් සංඛ්‍යාත ඝාතන සිදු වූ අතර ඒ අතර මෙරට මුල් බැස ගෙන තිබූ බෞද්ධ ශාසානයට අයත් හිමිවරුන් මෙන් ම බෞද්ධ ප්‍රභූවරු ද වූහ. මෙවැනි තත්ත්වයක් හමුවේ රාජ්‍යයත්වය සඳහා සිංහල බෞද්ධයෙකු සූදානම් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය චිත්ත ධෛර්යය (morale) නිර්මාණය කිරීම උදෙසා දෘෂ්ටිවාදී ව්‍යාපාරයක් අවශ්‍ය වූ අතර අප මහා වංශය අවබෝධ කර ගත යුත්තේ මෙම දෘෂ්ටිවාදී ව්‍යාපාරය අභ්‍යන්තරයේ සිටයි.

ධාතුසේන යසලාලකතිස්සගෙන් අවසන් වූ මෞර්ය රාජවංශයට උරුමකම් කියන්නෙකු වූ අතර මහානාම හිමි තමන් යටතේ ධාතුසේන ඉතා කුඩා වියේ දී මහණ කර ගනු ලබන්නේ දේශපාලනික රැකවරණ භූමියක් වශයෙන් ශාසනය ඒ වන විට ක්‍රියාත්මක වෙමින් තිබූ හෙයිනි. මහානාම හිමියන් ද්‍රවිඩ පාලකයන්ගේ ආරක්ෂා කර ගැනීම සඳහා ධාතුසේනත් රැගෙන පළාතෙන් පළාතට පැන යමින් කාලය ගත කරන අතර තරුණ වියේ දී උපැවිදි කර හමුදාවක් නිර්මාණය කිරීමට සහයෝගය ලබා දීම සිදු කරන අතර මහා වංශය නිර්මාණය වන්නේ ද එම සමස්ත ව්‍යාපෘතිය තුළ දී බව අප වටහා ගත යුතු ය.

මහනාම හිමි පොරාණ සීහළට්ඨකතා කෙරෙහි දැක් වූ උපකල්පනය මෙන් ම අප මහා වංශය කෙරෙහි දක්වන උපකල්පනය සොයා ගැනීමෙන් තොර ව අවබෝධය කරා යා නොහැකි වන්නේ අපගේ ප්‍රාග් විනිශ්චයන් අපගේ පළමු අවබෝධ කර ගැනීම කෙරෙහි බලපාන බැවිනි. එබැවින් ශුද්ධ වූ අවබෝධයක් පිළිබඳ කථා කිරීම මායාවක් වන අතර මහා වංශය ශුද්ධ ලෙස අවබෝධ කර ගත්තා යැයි සිතා ඒ ඔස්සේ අනන්‍යතා දේශපාලනයේ යෙදීම අතිශය භයංකර වේ. එබැවින් අවබෝධය සෑම විට ම ගැටුම්වලින් සහ අප්‍රමාණවත්කම්වලින් පිරී ඇති අතර මහා වංශය දෙස අප බලන්නෙත් පොරාණ සීහළට්ඨකතා දෙස මහානාම හිමි බලන්නේත් අර්ථයක් ප්‍රක්ෂේපණය (meaning projection) කිරීමෙනි. එනම්, දාර්ශනික අර්ථ කථනයේ දී පඨිතය විසින් අර්ථ දක්වන්නා පිළිබඳ ප්‍රශ්නය සෑම විට ම නගනු ලැබේ (*a text always asks a question of the interpreter*) (ලෝන්, 2006). මහා වංශය වේවා, පොරාණ සීහළට්ඨකතා වේවා සියලු පඨිතයන් කිසියම් ප්‍රශ්නයක් කෙරෙහි දුන් විසඳුමක් වන අතර ප්‍රශ්නය එම පඨිතය තුළ නොමැති වීම විශේෂත්වයකි. අර්ථ දක්වන්නා විසින් ප්‍රශ්නේ ක්ෂිතිජය සෙවීම කළ යුතු වන අතර ගැඩමර් සිය

දාර්ශනික අර්ථ විවරණය පිළිබඳ න්‍යායාත්මක ගොඩනැගීමේ දී අපට පඨිතයක් අවබෝධ කර ගැනීමට නම් අදාළ පඨිතය විසින් උත්තර දෙමින් තිබෙන ප්‍රශ්නය කුමක්දැයි අවබෝධ කර ගත යුතු බව පෙන්වා දෙයි. ඒ සඳහා ඇරිස්ටෝටල් පෙන්වා දුන් ආකාරයේ ප්‍රායෝගික ප්‍රඥාවක් (*phronesis*) හෝ හයිඩෙගර් පෙන්වා දුන් ආකාරයේ ලෝකය තුළ පැවැත්ම (being-in-the world) අවශ්‍ය වේ (ගැඩමර් සහ ලෝරන්ස්: 2000)

සත්තාවේ පූර්වසංකල්පිත තත්ත්වයන් සම්බන්ධයෙන් අප වෙත මහාවංශය විසින් ඉදිරිපත් කරනු ලබන දෙය උපයෝගාත්මක අවබෝධයක් ඔස්සේ අත්පත් කර ගත යුතු වන බව මෙහි දී ප්‍රත්‍යක්ෂ වේ. සිංහල භාෂාවෙන් පැවති සිංහල රාජාවලිය සහ ඉතිහාසය සම්බන්ධ තොරතුරු පාලි භාෂාව හෙවත් තන්ති භාසා වෙත යොමු කෙරුණේ පස් වන සියවස පමණ වන විට පාලි භාෂා ලෝකය තුළ පැවති පබලතාව නිසා ම වන අතර ඒ වන විටත් කලාපීය රටවලින් ථේරවාදී භික්ෂූන් මෙරටට පැමිණෙමින් සිටීම නිසාත් වන්නට ඇත. ජාත්‍යන්තර වශයෙන් බෞද්ධත්වය, එහි ඉතිහාසය සහ ද්‍රවිඩ රජවරුන් නෙරපා එය නැවත පුනරුත්ථාපනයට ලක් කිරීම ප්‍රචලිත කිරීම උපයෝගාත්මක වශයෙන් සිය දේශපාලනික ව්‍යාපෘතියට නිසැක වශයෙන් ම මහානාම හිමියන්ට උපකාරී වූ අතර මෙම ව්‍යාපෘතිය තුළ දී මහානාම හිමියන් සිදු කළ වරණීය සැකසුම් හෙවත් අන්තර්ගතයන් තෝරා ගැනීම, විස්තාරණය කිරීම් ආදියට එම යුගයේ දී ම විරෝධතා එල්ල වූ බව මහා වංශ ටීකාවෙන් සනාථ වේ (අමරවංස, 2001). මහා වංශ ටීකාවට අනුව පාසානදීපවාසී උපතිස්ස තෙරුන් විසින් මහානාම හිමියන්ට විරෝධය පළ කෙරුණු අතර මහා වංශ පඨිතයේ තිබූ නව අර්ථ විවරණයන් සහ සංශෝධනයන් උන් වහන්සේගේ දෝෂ දර්ශනය ලක් විය

මේ අනුව, මහානාම හිමියන්ගේ ප්‍රාග්විනිශ්චයන් අර්ථ විවරණය තුළ දී නොසලකා හැරිය නොහැකි වන අතර එනම්, මහානාම හිමියන්ගේ පඨිතය තුළින් උන් වහන්සේගේ ප්‍රශ්නය තේරුම්ගත යුතුවේ. එබැවින්, අපට ගැඩමරියානු අර්ථ විවරණයක දී මහානාම හිමියන්ගේ ගැටලුව ප්‍රතිනිර්මාණය කිරීමට සිදු වන අතර එය ඉහතදී පැහැදිලි කළ ආකාරයට තත්කාලීන දේශපාලන සංදර්භය ඔස්සේ ගොඩනැගුණකි. ගැඩමර් විසින් සම්ප්‍රදායය සහ ප්‍රාග් විනිශ්චය වැනි යෙදුම් සාමාන්‍ය වහරේ ඇති අර්ථයට එහා ගිය අර්ථයකින් සිය දර්ශනය තුළ දී අර්ථ ගැන්වූ අතර සම්ප්‍රදායය පිළිබඳ අදහස ගෙන ඒමේ දී එය හුදෙක් තත්වාරක්ෂක ප්‍රවේශයක් ඔස්සේ සිදු නොකර විචාරාත්මක ප්‍රතිචාරයකින් යුක්ත ව ගොඩනගයි. ගැඩමර් සම්ප්‍රදායය යනු වෙනස් නොකළ හැකි දෙයක් වශයෙන් නොදකී. හබමාස්, පෝල් රිකර් වැනි අයගේ විවේචනය තුළ දී ගැඩමර් සම්බන්ධයෙන් වැරදි අර්ථ නිරූපණයක් ද ලැබුණේ මේ හේතුවෙනි. අප මහා වංශය අර්ථ විවරණය කිරීම වෙත යොමු වූවොත් එවැනි සම්භාව්‍ය කෘතියක් අර්ථ විවරණය කිරීමේ දී සම්ප්‍රදායය තුළින් හිමි වන ඥානය අර්ථ විවරණ ක්‍රියාවලියෙන් ඉවත් කිරීමට නොහැකි වේ. ඕනෑම අර්ථ විවරණයක් තුළ දී සම්ප්‍රදායයෙන් බැහැර වූ ස්ථානයක (tradition-free place) සිට ආරම්භ කිරීමට නොහැකි බව ගැඩමර්ගේ අදහසයි. ප්‍රශ්න කිරීම ද විචාරය ද ආරම්භ විය යුත්තේ සම්ප්‍රදායය තුළිනි (වොලස්, 1990: 29).

සම්ප්‍රදායය තුළ මහා වංශය අර්ථ නිරූපණය වීම මෙන් ම සම්ප්‍රදායය මහා වංශය වෙත ඇතුළු වීම හැදෑරීමෙන් තොර ව මහා වංශය අර්ථ විවරණය කිරීමට නොහැකිය. ගයිගර් පෙන්වා දෙන ආකාරයට මහා වංශයට ඇතුළත් වන විජයාවගමනය සම්ප්‍රදායයේ ද පුරාකතාවන්ගේ ද (tradition and legends) පූර්ණ මිශ්‍රණයකි (ග්‍රාන්ට් 2009:46). ගැඩමරියානු අර්ථ විවරණයට අනුව සම්ප්‍රදායය පිළිබඳ මෙම අදහස අක්‍රීය ලෙසින් පිළිගැනීම (passive acknowledgment of a tradition) සිදු නොවිය යුත්තකි. එවිට සම්ප්‍රදායය යනු සක්‍රීයත්වයක් කරා යොමු වන්නකි. සම්ප්‍රදායය යනු තත්වාරක්ෂණයට ලක් වන බලවේගයක් (conserving force) නොවන නමුත් අප පඨිතයක් අර්ථ විවරණය කර ගැනීමට යෑමේ දී සම්ප්‍රදායය විසින් ගෙන එන ලද ඓතිහාසික විඥානයෙන් ගැලවීමට නොහැකි වෙයි. එහෙත් සම්ප්‍රදායය වෛෂයිකත්වය කරා තල්ලු වීමට ඉඩ නොදීම ගැඩමර්ගේ දර්ශනයේ විශේෂත්වයයි. මහානාම හිමියන් මහා වංශ පඨිතය ගොඩනැඟීමේ දී සම්ප්‍රදායයේ පිළිසරණ කොතෙක් පතන්නේ ද යත් උන්වහන්සේ රජවරුන් සහ විවිධ පුද්ගලයන් පවත්වා ගෙන ආ රාජාඥා, රාජ්‍ය ලේඛන, පිංපොත්, ජනප්‍රවාද ආදිය ද සිය මූලාශ්‍ර වශයෙන් සපයා ගෙන ඇත. එහෙත්, මහානාම හිමියන් මෙම සියලු මූලාශ්‍ර ගොඩනගන්නේ කිසියම් දේශපාලනික ප්‍රශ්නයක් වෙත සම්මුඛ වෙමින් බව අප අමතක නොකළ යුත්තකි.

වංසත්ථප්පකාසිනිය සඳහන් කරන පරිදි මහා වංශයට උදෙසා ලියන ලද ගැටපදයක් ද තිබී ඇති අතර එහි දී මහා වංශයේ යෙදෙන ඇතැම් යෙදුම්වල අර්ථ පහදා දීමක් සහ සන්න ලිවීමක් සිදු විය. මෙයින් අදහස් වන කරුණ නම් මහා වංශය පඨිතයේ ග්‍රාහක ප්‍රජාව සිංහල බස දන්නා සාමාන්‍ය උගතුන් නොව පාලි බස දන්නා ජාත්‍යන්තර උගතුන් බවයි. සාමාන්‍ය මිනිසුන් කරුණු පහදා දීමේ අටියට වඩා කලාපීය ප්‍රවර කණ්ඩායම් අතර මෙරට ඉතිහාසයේ එක්තරා කාල පරිච්ඡේදයක ස්වරූපය කියා පෑම මහානාම හිමියන්ගේ දේශපාලන ප්‍රශ්නය සහ දේශපාලන වුවමනාව බව පෙනී යයි. මහා වංශය පඨිතය තුළ භාරතීය කාව්‍ය ශාස්ත්‍රයේ ලක්ෂණ ද පැවති අතර උගත් පාඨක ප්‍රජාවක් ම ඊට අරමුණු වී තිබීම එම පඨිතය පිළිබඳ ඓතිහාසික අවබෝධයේ (historical understanding) නව ක්ෂිතිජයක් විවෘත කරයි.

අප මහා වංශය කියවා ගැනීමේ දී ගැඩමරියානු දර්ශනයෙන් උකහා ගත යුතු ඉතා වැදගත් ම දෙයක් වන්නේ එයයි. මහා වංශය වාස්තවිකකරණයට ලක් කර එහි ඇති පූර්ණ අර්ථයක් මතු කොට දැක්වීමට ගත් සෑම උත්සාහයක් ම භීෂණකාරී වී ඇත. නමුත් ගැඩමර් පෙන්වා දෙන ආකාරයට එහි ඇති ඉතිහාසයේ පිහිටීම හෝ සම්ප්‍රදායයේ පිහිටීම සම්පූර්ණයෙන් බැහැර නොවන අතර අර්ථය සිද්ධියක් වශයෙන් අප වෙතට පැමිණෙයි. එහෙත්, අප මහා වංශය සඳහා යම් ක්ෂිතිජයක් තුළ දී අර්ථයක් ලබා දුන්න ද එය සීමා ගණනික් මායිම් වී ඇත. මෙවැනි ක්ෂිතිජයක් තුළ දී සිදු වන්නේ අර්ථ නිරූපණය කරන්නාගේ තථ්‍යාසන්න වට පිටාව සහ බැහැර විශාල ලෝකය (distant world-at-large) අතර මුහුවක් සිදු වීමයි. බැහැර විශාල ලෝකය ද පූර්ණ වූවක් නොවේ. එබැවින් මහා වංශය සම්බන්ධයෙන් අප මේ මොහොතේ ලබන අර්ථය එක්තරා ක්ෂිතිජයක ඉස්මතු වීමක් පමණි.

මහානාම හිමියන්ට තත් කාලීන වශයෙන් අවශ්‍ය වී තිබූ රණකාමීත්වය බුද්ධ චරිතය ප්‍රතිනිර්මාණය කිරීමේ දී පවා ඇතුළත් වී ඇති බව පෙනී යයි. මෙය දීප වංශය සහ මහා වංශය එකිනෙක සසඳා බැලීමේ දී පෙනී යයි. දීප වංශයේ දී සඳහන් වන්නේ බුදුන් වහන්සේ සීතලෙන් සහ අන්ධකාරයෙන් සිටි යක්ෂයන් වෙත උෂ්ණය සහ ආලෝකය පහළ කළ බවයි. මෙය වඩාත් ම රූපකාර්ථවත් යෙදුමක් වූ අතර යක්ෂයන් වෙත ආලෝකය ගෙන ඒම යනු බුද්ධිමය කාර්යයක් සඳහා වන රූපකයක් විනා යක්ෂයන් භෞතික වශයෙන් මැඩීමක් වශයෙන් පිළිගැනීමට නොහැකිය. මහාවංශය තුළ දී බුදුන් වහන්සේගේ මැදිහත් වීම කෙරෙහ රණකාමීත්වයක් ආරෝපණය කෙරෙන අතර එහි දී බුදුන් වහන්සේ ව යක්ෂයන් මර්දනයට කටයුතු කළ බව සඳහන් වෙයි. බුදුන් වහන්සේ සීතලත්, අන්ධකාරයත්, යොදා ගනිමින් යක්ෂයන් ගිරි දිවයින වෙත පළවා හළ බව මහා වංශය කියා සිටී. බුදුන් වහන්සේ අහසට නැගී පෙළහර පා මෙම වික්‍රමය කළ බව මහා වංශයේ දැක්වෙන අතර අන්ධකාරයක් මවා යක්ෂයන් බිය වැද්ද වූ බවත් දැක්වේ. යකුන් ගිරි දිවයිනට පළවා හැරීමෙන් පසු ලක්දිව මනුෂ්‍ය වාසයට සුදුසු ස්ථානයක් බවට පත් කළේ බුදු හිමියන් බව මහා වංශ කතුවරයා නිරූපණය කිරීමට උත්සාහ ගනී. මෙය දීප වංශයේ හෝ වෙනත් වංශ කථාවක දී සොයා ගැනීමට හමු නොවන්නකි.

මහා වංශයට අනුව බුදුන් වහන්සේ භයජනක වූ වර්ෂාවාකාන්ධකාරයක් මවා යක්ෂයන් භීතියට පත් කළ අතර ඉතා බයින් පීඩිත වූ එම යකුන් බුදුන් වහන්සේ වෙතින් අභය ඉල්ලා තිබේ. බුදුන් වහන්සේ සහ යක්ෂයන් අතර ඇති වූ සංවාදය මහා වංශ කතුවරයා ප්‍රති නිර්මාණය කර ඇත්තේ මෙසේය.

> “ඒ මහා යක්ෂ සමාගමයට පැමිණි සර්වඥතෙම එහි සමාගම මැද ඔවුන්ගේ හිස මතුයෙහි මහියංගනය ථූපයාගේ ස්ථානයෙහි අහස්කුස වැඩි සේක්. ඔවුන්ට භය ජනක වූ වර්ෂාවාතාන්ධකාරාදිය මැවූ සේක. බියෙන් පෙලුනා වූ ඒ යක්ෂයෝ නිර්භය වූ තථාගතයන් වහන්සේ ඉතා භයින් පීඩිත වූ ඒ යකුන්ට මෙසේ වදාළ සේක. යක්ෂයෙනි, තොපගේ මේ භය හා දුක් මම පහ කරන්නෙමි. තොපි සමගිව මෙතන්හි මට හිඳිනා තැනක් දෙන්නහුද? නොමදෙන්නහුද? නිදුකාණෙනි, නුඹ වහන්සේට මේ සියලුම ලක්දිව දෙම්හ. අපට අභය දුන මැනවැයි ඒ සියලුම යක්ෂයෝ තථාගතයන් වහන්සේට කිවූය. ඔවුන්ගේ බිය ද ශීත ද නසා ඒ දුන් භූමියෙහි පත්කඩ අතුට එහි වැඩ හුන් සර්වඥතෙම එතැනින් ඒ පත්කඩ අතුට එහි වැඩ හුන් සර්වඥතෙම එතැනින් ඒ පත්කඩ ගිනිගෙන දිලියෙන්නක් කොට හාත්පසින් විශාල කළ සේක. ග්‍රීෂ්මයෙන් පීඩිත වූ ඒ යක්ෂයෝ බියපත් ව (ලක්දිව) අන්තයෙහි හාත්පසින් සිටියෝය.” (මහානාම, 1883:2)

මෙහි දී මහානාම හිමියන්ට අවශ්‍ය වන්නේ බුදුන් වහන්සේ යනු යක්ෂයන් භීතියට පත් කළ හැකි බලවේගයක් බව පෙන්වීමටත් ලක්දිව් යක්ෂයන්ගෙන් මුදා ගෙන පිරිසිදු කළ හැකි විරුවෙක් බව

පෙන් වීමටත්ය. මහානාම හිමියන්ගේ අවිඥානය තුළ දී යක්ෂයන් ඒ වන විට ලක්දිව පාලනය කරමින් සිටි ද්‍රවිඩයන්ට සමාන වන බව පෙනී යන අතර බුදුන් වහන්සේ රූපකයක් වශයෙන් භාවිත කර යක්ෂයන්ගෙන් රට බේරා ගැනීම සහ ද්‍රවිඩයන්ගෙන් රට බේරා ගැනීම අතර සාම්‍යයක් ගොඩනැගීමේ ව්‍යාපෘතියක නිරතවන්නේ බුදුන් වහන්සේ ද භීතිය නිර්මාණය කරන අයෙකු බවට ස්ථාපනය කිරීමෙනි. මහානාම හිමියන්ගේ දේශපාලන වුවමනාව මෙහි දී නිරූපණය වන අතර එහි දී අනාථ නාථ වූ අවිහිංසාවාදී වූ බුදුන් වහන්සේ ද භීතිය පතුරුවන්නෙකු ලෙසින් පෙන්නුම් කරන්නේ තත්කාලීන දේශපාලනය තුළ දී ලක්දිව සුරක්ෂිත කර ගැනීම බුදුන් වුව ද භීතිය සහ වීරත්වය භාවිත කළ බව අගවමිනි. මෙහි දී මහානාම හිමියන් සහ තත්කාලීන පාඨකයන් අතර ඇති වන අර්ථ ක්ෂිතිජයත් අපගේ සමකාලීන ක්ෂිතිජයත් යන සියල්ල විමසා බැලීමෙන් මහා වංශ පඨිතය අර්ථ ගැන්වීමට හැකි වේ. මහා වංශය සම්බන්ධයෙන් ඉතිහාසය සහ දේශපාලනය අමතක කර පාරඓතිහාසික අවබෝධයක් (transhistorical understanding) ගොඩනැගීම පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ ජාතිකවාදයත් සමගින් වඩා හොඳින් සිදු වූ අතර එහි භීෂණකාරී බව මෙරට සිදු වූ ලේ වැගිරීම් ගණනාවකින් පෙනී ගියේය.

අපේ ඉතිහාසය සම්බන්ධයෙන් ඇති වැස්ම ඉවත් කිරීම හෝ පරම වෛෂයිකත්වයක් (absolute objectivity) කරා යොමු වීම හෝ භීෂණකාරී වන බව මහා වංශය ඇසුරින් ම අපට වටහා ගැනීමට හැකි වන අතර ගැඩමර් පෙන්වා දෙන පරිදි පඨිතය නිර්මාණය වීම කෙරෙහි බලපෑ ප්‍රශ්නය ප්‍රතිනිර්මාණය කිරීම (reconstruction of question) අර්ථ විවරණය තුළ දී අප සිදු කළ යුතු වෙයි. මේ අනුව මහනාම හිමියන්ගේ ප්‍රශ්නයේ දේශපාලන පැතිකඩ එවක ක්‍රියාත්මක වූ ද්‍රවිඩ පාලකයන් සමග ගැටගැසී තිබිණ. මහා වංශය සම්බන්ධ ඥාන මීමංසාව සඳහා වියුක්ත ක්‍රමවේදයක් නොමැති වන අතර ගැඩමර් පැවසූ ආකාරයට ක්‍රමික සහ පටිපාටිගත නීති (methodological procedural rules) මගින් දැනුම මගින් සොයමින් සිටින වාස්තවිකය භීෂණකාරී කෙරෙයි. එබැවින් ගැඩමර් පෙන්වා දෙන්නේ වඩාත් වෛෂයික ආකාරයෙන් ඥාන මීමංසාව ගවේෂණය කිරීමට යෑම භීෂණකාරී ක්‍රියාවක් වන බවයි. ගැඩමර්ට අනුව අවබෝධය සම්බන්ධයෙන් පැමිණිය හැක්කේ එක්තරා ගිවිසුමකටයි (*Sich verstehen*). එය ඥානමීමංසාත්මක අවබෝධය හෝ මුළුමනින් ප්‍රායෝගික වූ අවබෝධයෙන් වෙනස් වන නමුත් කර්තෘගේ අභිලාසයෙන් (*mens auctoris*) සම්පූර්ණයෙන් විතැන් වූවක් නොවේ. ගැඩමර්ට අනුව අවබෝධය ප්‍රධාන වශයෙන් නිෂේධනාත්මක (mostly negative) වන අතර අවබෝධය සඳහා ක්ෂණික විසඳුමක් නොමැත. අවබෝධය පිළිබඳ ගැටලුව සෘණ වුව ද එය ශූන්‍ය නොවන අතර ඉගෙන ගැනීමට දෙයක් පවතී. ගැඩමර්ගේ අර්ථ විවරණ තුළ ක්‍රමවේදයක් හෝ තාක්ෂණයක් නොමැති අතර අවබෝධය අපගේ ආසන්න සත්තාව සමඟින් කටයුතු කරන ආකාරය ගැන පමණක් විශ්ලේෂණය කෙරේ. අර්ථ විවරණය සම්බන්ධයෙන් ඇති නිශ්චයාත්මක ප්‍රශ්නය (critical question of hermeneutics) විසඳා ගැනීමට හැක්කේ කාලික දූරස්ථභාවය (temporal distance) ඔස්සේ පමණකි (Taylor and Mootz, 2012: 91). ප්‍රාග්විනිශ්චයන් (prejudices)

සම්බන්ධයෙන් ඇති සත්‍යාසත්‍යතාවන් පිළිබඳ නිශ්චයාත්මක උත්තරයක් දීමට හැක්කේ කාලික දුරස්ථභාවය ඔස්සේ ම පමණකි.

මේ අනුව අවබෝධය යනු අත්‍යවශ්‍යක වශයෙන් විවෘත (essentially open) වූවකි. එම විවෘතභාවය තුළ ම අවධානම ද නොමැත්තේ නොවේ. අර්ථ නිරූපණය සම්බන්ධයෙන් ඇති උපන්‍යාසයන් යාවකාලික (provisional) වන අතර නිරන්තරයෙන් ප්‍රතිශෝධනයට ලක් කළ යුත්තක් ලෙසින් ගැඩමර් දකින බැවින් සාංදෘෂ්ටික චක්‍රීයත්වයට (existential circularity) අභියෝගයක් එල්ල කරයි. ගැඩමර් අවබෝධයේ කිසියම් සැබෑ මාදිලියක් (“authentic” mode of understanding) පිළිබඳ අදහසකට ළංවීමට සූදානම් නොවන අතර කෙසේවෙතත්, එවැන්නක් ඔහුගේ දාර්ශනික ව්‍යායාමය තුළ සම්පූර්ණයෙන් අහෝසි නොවේ. හයිඩෙගර් මෙන් අර්ථය අනාගතය තුළින් ගැනීමට ගැඩමර් මැළි වන අතර නොදන්නා අනාගතය අතීතයට වඩා ප්‍රමුඛ විය නොහැකි බැවින් අර්ථයේ පදනම අතීතය විය යුතු බවට තර්ක කළේය.

අර්ථ නිරූපණය සද්භාවාත්මක වශයෙන් ව්‍යුත්පන්න වී ඇති අතර සත්‍යය බොහෝ දුරට ඕනෑම ක්‍රමයකින් ස්වාධීන වන බවත් ඇත්ත වශයෙන්ම මිනිසා අර්ථකථනය පාදක කර ගත් ජීවියෙකු වන බවත් ගැඩමර් විශ්වාස කළේය. මේ අනුව ලෝකය තුළ සිටීම පිළිබඳ හයිඩෙගර්ගේ ඓතිහාසිකත්වය Daseinගේ පෙර ව්‍යුහය ලෙස ඔහු පිළිගත්තේය. අප ප්‍රක්ෂේපණය වී ඇත්තේ සංදර්භයන් මඟින් අපව හැඩගස්වන අපගේ පරිකල්පනය සීමා කරන ලෝකයකට ය. අපගේ මූලික පැවැත්ම යනු අපගේ අතීතය අර්ථ නිරූපණය කිරීමේ ක්‍රියාවලියක් වන අතර එය අප වෙත ප්‍රක්ෂේපණය කර තිබිය දී අප ප්‍රතිචාර දක්වන්නේද අතීතයෙන් ප්‍රක්ෂේපණය වූ දෙයටය. මේ අනුව, අර්ථ නිරූපණය යනු පෙළ සහ අර්ථ නිරූපකයා අතර අන්තර්ක්‍රියාකාරිත්වයේ පොදු කලාපය වන අතර , අර්ථ නිරූපකයා සහ පෙළ අතර සම්බන්ධය අනිශ්චිත ලෙසින් බැඳී ඇත.

දුටුගැමුණු සම්බන්ධයෙන් දීප වංශ කතුවරයා ගාථා 13ක් පමණක් යොදා ගත්ත ද මහා වංශය පරිච්ඡේද 11ක් ම ඒ සඳහා යොදා ගනිමින් දුටුගැමුණුගේ ජීවිත කථාව මහත් අභිරුචියෙන් සහ වීරත්වයෙන් වර්ණනා කෙරේ. ඔබේසේකර (2015) දක්වන පරිදි මහා වංශයේ කතා ශෛලිය මහා භාරත කාව්‍යයෙන් උපුටා ගත්තක් විය හැකිය. මහා වංශයට අනුව එළාර පැරදවීමෙන් හා බොහෝ දෙමළුන් ඝාතනය කිරීමෙන් දුටු ගැමුණු සතුටට පත් ව නැති අතර ඔහුගේ පශ්චාත්තාපය සංසිඳුවීම සඳහා බෞද්ධ මූලධර්ම ද සංශෝධනය කර ගැනීමට මහානාම හිමි සිය ආඛ්‍යානය තුළ දී කටයුතු කරයි. තම වීර කාව්‍යය ඔස්සේ මහානාම හිමියන් දුටුගැමුණු රජු වෙත සපථ කරන්නේ ඔහු ඝාතනය කළ මිනිසුන් එකහමාරක් බවයි. එනම්, ඔහුගේ මනුෂ්‍ය ඝාතනය පාපය පුද්ගලයන් එකහමාරකට ඌනනය කිරීම ආඛ්‍යානමය උපක්‍රමයක් විනා බෞද්ධ දර්ශනය සාධාරණ ආකාරයකින් අර්ථ දැක්වීමක් වශයෙන් දැකීමට නොහැකිය. “ස්වාමීනි, යම් හෙයකින් මා විසින් අක්ෂෞහිණී මහා සේනා ඝාතනය කරවන ලද්දේ නම් එසේ වූ මට කෙසේ ආශ්වාසයෙක්

වන්නේදැ''යි වශයෙන් දුටුගැමුණු විසින් පුවගු දිවයිනෙහි වැඩ සිටි රහතුන්ගෙන් විමසීමේ දී උන් වහන්සේ පවසන්නේ

"ඒ කර්මයෙන් තොපට ස්වර්ග මාර්ගාන්තරායෙකුත් නැත්තේය. ජන ශ්‍රෙෂ්ඨය: මරණ ලද මිනිසුන් එකෙක් හා අඩක් වන්නේය: තිසරණ පිහිටි එකෙක, තිසරණ පන්සිල් පිහිටි අනිකෙක, සෙසු මරණ ලද්දාහු මිත්‍යා දෘෂ්ඨ දුස්සීල වූ සිවුපාවන් සමයෝ ය."
යනුවෙනි (මහානාම, 1883: 110).

මේ අනුව, මහානාම හිමියන් අතින් රණකාමීත්වය සාධාරණීකරණය කිරීම සඳහා බුද්ධ දර්ශනය විරෝධාභාසාත්මක ලෙස නැවත නැවතත් අර්ථ ගැන්වෙන ආකාරය මෙහි දී පෙනී යයි.

මහානාම හිමියන්ගේ මෙම භාෂාව අප තේරුම් ගත යුත්තේ සත්තාවේ පූර්ණ ව්‍යුහයක් (encompassing structure of being) වශයෙන් වන අතර අර්ථ විවරණාත්මක ආත්මය (interpreting subject) පෙරමුණට පැමිණෙන ඉසව්වක් (event) වශයෙන් අර්ථ විවරණය නොකළ යුතුය. ගැඩමර්ට අනුව ගැටලුව ඇත්තේ අප කරන්නේ කුමක්ද හෝ කළ යුත්තේ කුමක්ද යන්න නොවේ. අපගේ කැමැත්තට සහ අපගේ ක්‍රියාවට එපිටින් ඇත්තේ කුමක්ද යන්න අපට ඇති ප්‍රශ්නයයි. ගැඩමර්ගේ තර්කය වන්නේ අර්ථ විවරණයේ විශ්වීයත්වය කරා යොමු විය හැක්කේ නූතන චින්තාවෙන් නිර්මාණය වූ ක්‍රමවේදවාදයෙන් (methodologism ) නිදහස් වීමෙන් පසු ව ය. එබැවින්, මෙම ක්‍රමවේදාත්මක මර්යාදාවෙන් ගැළ වී මහා වංශය භාෂාවෙන් නිර්මිත ලෝකය (linguistically constituted world) තුළට ඇතුළත් කළ යුතු වේ. මේ අනුව මහා වංශයේ භාෂාව යනු ගැඩමරියානු අර්ථයෙන් අර්ථයන් පිළිබිඹු කරන රාමුවක් වන අතර එය තවදුරටත් ක්‍රමවේදාත්මක මෙවලමක් නොවේ. මහානාම හිමියන් ඇඳ වැටෙන අර්ථයන් බැඳුණු ලෝකය තෝරා ගැනීමට හැක්කේ භාෂාව නිරීක්ෂණය කිරීමෙන් වන අතර එම ඔස්සේ ලෙළ දෙන රණකාමීත්වය සමස්ත ආඛ්‍යානය තුළ ම ස්ඵුට වෙයි. අප මහා වංශය අවබෝධ කර ගන්නා ආකාරය අනුව අපට අපගේ ඓතිහාසික ජීවිතය සම්බන්ධයෙන් ස්වරූපයක් (gives the 'form' of our historical life) හිමි වෙයි.

මේ අනුව හයිඩෙගර් අනුව යමින් ගැඩමර් ද පිළිගන්නේ අපගේ පැවැත්ම කරුණුමයභාවය මත රඳා පවතින බවයි. මහානාම හිමියන්ගේ පැවැත්ම හෝ සත්තාව උන්වහන්සේගේ කරුණුමයභාවයෙන් ගළවා ගැනීමට නොහැකිය. එවිට අපගේ ක්ෂිතිජය සහ මහා වංශ පඨිතය අතර ක්ෂිතිජ ඡේදනය සොයා ගැනීම සඳහා හයිඩෙගර් විසින් ගෙන එන ලද කරුණුමයභාවය පිළිබඳ අර්ථ විවරණය (hermeneutics of facticity) වැදගත් වන අතර මෙම දාර්ශනික සම්ප්‍රදායය ගැඩමර් අතින් පමණක් නොව ලෙවිනාස් මගින් ද වැඩි වර්ධනය වූවකි. අන්තර් ඥානය හෝ නිරූපණය වෙනුවට වාසය (habitation ) මත ලෝකය පිළිබඳ අපගේ අර්ථ නිෂ්පාදනය විය යුතු බවට ගැඩමර් වෙත අදහස එන්නේ හයිඩෙගරියානු ප්‍රපංචවේදයෙනි.

ප්‍රායෝගික වශයෙන් ලෝකය සමග අප කරන ගනුදෙනුව අප ලෝකය සම්බන්ධයෙන් හෙළනු ලබන න්‍යායාත්මක දැක්මට වඩා සද්භාවී වශයෙන් පෙරටුව පවතින්නකි. අපගේ සියලු ප්‍රස්තුතයන් සහ සංකල්ප පදනම් වන්නේ ඒ ඔස්සේ ය. උදාහරණයක් වශයෙන් අප මෙම අධ්‍යයනයේ දී ප්‍රස්තුතය වශයෙන් ගනු ලබන මහා වංශයේ එන නාගයන් යනු සර්පයන් විශේෂයක් ලෙසින් ගන්නා න්‍යායික දැක්මට එරෙහි ගැඩමරියානු අර්ථ විවරණයේ දී අපට ප්‍රායෝගික භාවිතය මගින් අර්ථය නිෂ්පාදනය කර ගැනීමටයි. "එකල්හි මහත් සෘද්ධි ඇති ඒ මහෝදර නම් නාග තෙමේ මුහුද පන්සියයක් යොදුන් අයමි. නාග භවනයෙහි රජ වී" ආදී වශයෙන් ලක්දිව නාග දීපයේ තිබූ නාග ජනපද සහ නාග රජවරුන් පිළිබඳ කරන ප්‍රකාශ ප්‍රායෝගික භාවිතයෙන් තොර ව අර්ථ විවරණ නොවීම ඔස්සේ සිදු වන්නේ සද්භාවික වශයෙන් පෙරටුව පවතින න්‍යායික යමක් ඒ ලෙසින් ම ආපසු කැඳවා ගෙන ඒමයි. මහා වංශයට එරෙහි ව විතැන් වූ කාලික නිරීක්ෂකයෙකු (disengaged punctual observer) නිර්මාණය වීමෙන් සිදු වන්නේ වාච්‍යාර්ථයෙන් එහා යමක් අර්ථ විවරණය තුළින් ලබා ගැනීමට නොහැකි වීමයි.

පඨිතයක් වශයෙන් මහා වංශය සම්බන්ධයෙන් ගනුදෙනු කිරීමේ දී ආචාර ධාර්මිකභාවය ද පාදක කර ගැනීමට හැකි වන අතර අප විසින් කිසියම් පඨිතයක් තේරුම් ගැනීම ආරම්භ කළ යුත්තේ එහි ඓතිහාසික සහ සංස්කෘතික තත්ත්වය පිළිබඳ අවධානය යොමු කරමිනි. කිසියම් පඨිතයක් තේරුම් ගැනීම සෑම විට ම පරිස්ථානීය සහ අනිශ්චිත (local and contingent ) වේ. (කුපෙව්ස්කි, 2004). මේ හේතුවෙන් කිසියම් පඨිතයක අන්තර්ගතය සංකල්ප හෝ ප්‍රවර්ගවලට ඌනනය කළ නොහැකි වන අතර අපට යමක් පූර්ණ වශයෙන් හා සරල ලෙස තේරුම් ගැනීමේ හැකියාවක් නොමැත. යමක් ස්ථාවර ලෙස ද නොපවතී. උදාහරණයක් වශයෙන් මහා වංශයේ දී නාගයන් සම්බන්ධයෙන් කරන විග්‍රහය සම්බන්ධයෙන් අපට පූර්ණ වශයෙන් දැන ගැනීමට හැකියාවක් නොමැති අතර සංකල්පීය අර්ථ ඒ ආකාරයෙන් ම ලබා ගැනීම ඥානකේන්ද්‍රීය (logocentric) භීෂණකාරී බල සම්බන්ධයක් පමණක් ගොඩනගයි. එබැවින් මෙහි දී අර්ථය යනු සෑම විට ම පරිමිත (finite) ව පවතින්නක් බව පසක් වේ.

මහා වංශය වැනි සම්භාව්‍ය කෘතියක් සෑම විට ම ඒ තුළ ඇති ප්‍රාග්විනිශ්චයන් (prejudices) සම්බන්ධයෙන් විචාරාත්මක ආලෝකයක් ඉල්ලා සිටී. ඊට හේතු වන්නේ එවැනි කෘතියක් තුළ සෑම විට ම සම්ප්‍රදායය ඇති බැවිනි. මෙම සම්ප්‍රදායය පවතින්නේ අපගේ ධාරිතාවට එපිටිනි. ධාරිතාව අඩු කම හේතුවෙන් ම පූර්ණ අර්ථය පිළිබඳ විශ්වාස කිරීම මිථ්‍යාවකි. ගැඩමර් විසින් සත්තාව (Being) ලබා දෙන අර්ථය තුළ දී ඉතිහාසය සහ සම්ප්‍රදායය සඳහා ප්‍රමුඛත්වය දෙන අතර සත්තාව කෙරෙහි ඇති සංකල්ප සහ න්‍යායන් කෙරෙහි ඒ හැටි වැදගත්කමක් නොදෙයි. අවබෝධය සම්බන්ධයෙන් මෙවැනි ආත්ම මූලික ප්‍රවේශයක් (subjectivist account) ලෙවිනාස් තුළ ද දැක ගැනීමට ලැබුණු අතර මහා වංශය වැනි සම්භාව්‍ය කෘතියක් අවබෝධ කර ගැනීමේ දී ගඩමරියානු ආත්ම මූලික ප්‍රවේශය ඔස්සේ ලැබෙන ඉතිහාසය සහ සම්ප්‍රදායය කෙරෙහි වන

සොයා බැලීම ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙසින් ලක්දිවට විජය නම් රජෙකු පැමිණ ජනාවාස ඇති කිරීම සම්බන්ධයෙන් ඇති ප්‍රවාදය සංකල්පීය සහ න්‍යායික වශයෙන් කියවීමකට වඩා එහි ඇති ඉතිහාසය සහ සම්ප්‍රදාය පිළිබඳ ගැඩමරියානු අර්ථ නිරූපණයකට යෑම ඉතා වැදගත් වනු ඇත. මහා වංශයේ විජයගේ ප්‍රවාදය පිළිබඳ අර්ථ දැක්වීම බාහිරින් එල්ල කරනු ලබන සවිඥානිකත්වයක් (consciousness) වශයෙන් ගැනීමට නොහැකි වන අතර කෙනෙකු මහා වංශය දෙස බලන වාස්තවික දැක්ම ඔස්සේ සිදු වන්නේ මහා වංශය තමා ගෙන් බැහැර වූ වාස්තවිකයක් ලෙසින් පැවතීමයි. එනම් එහි ඇති භාෂාත්මක දෙය පූර්ණ සත්‍යයක් ලෙසින් පැවතීමයි. එබැවින් තත්ත්වයක් තුළ දී විජයාගමනය වැනි ප්‍රවාදයක් ප්‍රශ්නගත කිරීමට නොහැකිය.

සිංහල ජාතියේ මුල් ගැන මහා වංශය කියන කතාව, දීප වංශයෙන් ද හියුං සාං වැනි වෙනත් දේශාටකයන්ගේ වාර්තාවලින් ද වෙනස් වේ. දීප වංශයේ නව වැනි පරිච්ඡේදයේ දී සඳහන් වන්නේ සිංහයෙකුගේ පුත්‍රයා වූ සිංහබාහුට පුත්‍රයන් තිස් දෙදෙනෙකු වූ බවත් ඔවුන්ගෙන් එක් කුමරෙකු වූ විජය කුමරු ලක්දිවට පැමිණ සිංහල ජන වර්ගය ගොඩනැගූ බවත් ය. මෙහි දී විජය යනු ඔහුගේ නම බව දැන ගැනීමට හැක්කේ අනුමානයෙනි. එහෙත් මහා වංශය කරා එන විට එය ස්ථාවර අදහසක් බවට පත් වී ඇති අතර මහා වංශය රචනා වී වසර සියයකටත් පසු ව රචනා කෙරෙන හියුං සාංගේ දේශාටන වාර්තාවල දීත් විජය නමැති පුද්ගලයෙකු සම්බන්ධයෙන් සටහනක් නොකරයි. විජය නමැති සංකල්පය ද වඩාත් ස්ථාවර කරන්නේ සිංහලත්වය සම්බන්ධ ආඛ්‍යානය වඩාත් සංවිධිත සහ ධීර කිරීමේ අරමුණිනි. විජයගේ පැමිණීම සහ බුදුන් වහන්සේ පරිනිර්වාණය එක ම දිනයකට සමපාත කිරීමේ අත්භූත සිද්ධිය ද මහා වංශ කතුවරයා සිය ආඛ්‍යානයට ඇතුළත් කරන්නේ බෞද්ධත්වය සහ සිංහලත්වය අතර සාම්‍යය වඩාත් තහවුරු කිරීමේ අටියෙන් බව සිතිය හැකිය.

මේ අනුව, මහා වංශය විශ්වීය ප්‍රවර්ගයක් (universal category) වශයෙන් කරන ඉතිහාස අවබෝධය විසංයෝජනය විය යුතු වන අතර එහි ඇති භාෂාව වඩා ලිහිල් ව සහ විවෘත ව විමර්ශනය කළ යුතුය. මහා වංශකරුවා විසින් සිංහලත්වයත් බෞද්ධත්වයත් සංයෝජනය කරමින් ඒ සඳහා අවශ්‍ය මානසික පසුබිම කාව්‍යාත්මක සහ සංචලනාත්මක (manipulatively) ලෙස ගොඩනගමින් කරන ව්‍යාපෘතිය තුළ දී ඥාන මීමංසාත්මක සම්බන්ධතාවන් ඉතිහාස විරෝධී (ahistorical) සහ ඥානකේන්ද්‍රීය හෝ ශුද්ධ වූ දෙයක් වීම වැළැක්වීම අර්ථ නිරූපණ කාර්යයේ දී ප්‍රමුඛ විය යුතු වේ. මහානාම හිමිගේ සිංහල ජාතියේ වීරත්වය පිළිබඳ ශුද්ධ අදහසේ පරිපූර්ණත්වය දුටු ගැමුණු ඔස්සේ නිරූපණය වන අතර මහා වංශය නමැති කාව්‍යාත්මක කෘතිය රචනා වූයේ ඇයි ද යන ප්‍රශ්නය මෙම ලියුම්කරු පමණක් නොව මහා වංස ටීකාකරු ද සියවස් ගණනකට උඩ දී ප්‍රශ්න කර තිබේ. ටීකාකරු විමසන්නේ පැරණි හෙළටුවා මහා වංසය තිබිය දී ත් මෙම පද්‍ය පදෝරු වංශය (මහා වංශය) රචනා කරන්නේ ඇයි ද යන්නයි (පෝරාණේ සීහලට්ඨකථා මහාවංසෙ විජ්ජමානෙපි කස්මා ආචරියො ඉමං පද්‍ය පදොරුවංසං අකාසි) (අමරවංස 2001). එබැවින්, මහානාම හිමිගේ පූර්ව නිගමනය පිළිබඳ හැඟීමක් මහා වංශ ටීකාකරුට පවා සමකාලීන

යුගයේ දී පැවතී ඇති අතර එහි දේශපාලනික අර්ථය වඩාත් දාර්ශනික අර්ථ විවරණයකට ලක් කිරීමට නොහැකි වූ බව පෙනී යයි. මෙනයින්, සිංහලත්වය නව අර්ථයක් හා වීරත්වයක් යටතේ ආඛ්‍යාන ගත කළ යුතු බවට මහානාම හිමියන්ට ඇති වී තිබූ පූර්ව නිගමනය හඳුනා ගැනීම දේශපාලනික වශයෙන් ඉතා වැදගත් වන්නකි.

ගැඩමර්ට අනුව අවබෝධය පූර්ව නිගමනයන්ගෙන් තොර දෙයක් (presuppositionless) වීමට නොහැකි බැවින් අපගේ අවබෝධය කෙරෙහි සෑම විට ම චෝදනාත්මක ප්‍රකාරයක් (accusative mode) පවතින අතර ඒ තුළ වගකීමක් ද පවතී. ගැඩමර් පවසන්නේ අවබෝධය සෑම විට ම යම් මෙහෙයුමක් සඳහා අඩ ගසන බවයි. මහා වංශය සම්බන්ධයෙන් කුමක් ද මෙම මෙහෙයුම? එම මෙහෙයුම නම් මහා වංශය පිළිබඳ අවබෝධය විසංයෝජනය කිරීමයි. උදාහරණයක් ලෙස විජය සිංහයෙකුගෙන් පැවත එන්නේය යන තෝටමායන (totemistic) අදහස පිළිබඳ මහා වංශ අවබෝධය කෙරෙහි මෙහෙයුමක් සිදු කිරීම අපට මඟ හැරිය නොහැක්කක් බවට පත් වෙයි. මෙම මෙහෙයුම තුළ දී සවිඥානයක ප්‍රතිමානාත්මක, ප්‍රකාශනාත්මක හෝ විධානාත්මක ස්වෛරීත්වයක් (nominative, declarative, or imperative sovereignty of a consciousness) පිළිගැනීම ප්‍රශ්න කළ යුතු වන අතර එනයින් මහා වංශයේ වාච්‍ය ප්‍රකාශනය කෙරෙහි හෙළන සවිඥානික සහ න්‍යායාත්මක දැක්ම සම්පූර්ණයෙන් අර්බුදයට යයි. (ක්‍රුජෙව්ස්කි, 2004).

මහා වංශය වාච්‍යාර්ථයෙන් තේරුම් ගැනීම සහ එහි ඉතිහාසය අමතක කර තේරුම් ගැනීම තුළ පිරිමුදනාත්මක ආර්ථිකයක් (redemptive economy) පවතී. එබැවින්, එවැනි කෘතියක් තේරුම් ගැනීම සඳහා දෛලක්තික ප්‍රවේශයක් අවශ්‍ය වේ. මහා වංශයේ අවසාන අර්ථය එහි වචනයේ ඇත යන න්‍යායික විඥානය (theoretical consciousness) මෙහි දී විනාශ වන අතර මහා වංශයේ විජයාවගමනය පිළිබඳ අර්ථය තව බොහෝ සංසිද්ධීන් සමගින් බැඳී ඇත. මේ නිසා ප්‍රායෝගික ප්‍රඥාවක් (practical wisdom ) ලෙස එය අවබෝධ කර ගැනීම විනා වෙනත් පිළිතුරක් නොමැත. මහා වංශයට කිසිදු විශ්වීය අර්ථයක් නොමැත. එහෙත් ගැඩමර්ට අනුව අර්ථය ශුන්‍යයකින් ආරම්භ නොවේ. හයිඩෙගරියානු අර්ථයෙන් මෙය ලෝකයට සම්බන්ධ වූවකි (belonging to the world).

එහෙත්, ගැටලුව වන්නේ මහා වංශ කර්තෘ මහානාම හිමියන්ගේ ලෝකය කුමක්දැයි අපට දැන ගැනීමට ක්‍රමයක් නොමැති වීමයි. එබැවින් මහා වංශයේ සත්තාව කුමක්දැයි අපි නිවැරදි ලෙසින් නොදන්නෙමු. අපට කළ හැක්කේ එය ප්‍රශ්නගත කිරීමක් පමණකි. ලෙවිනාස්ට අනුව සත්‍යයේ කොටස් දෙකක් තිබීමට පුළුවන. එකක් නම් අනන්‍යතාවේ සත්‍යය වන අතර එමඟින් ප්‍රස්තුතයන් නිර්ණය කෙරෙයි. මෙහි දී සත්‍යය යනු නිරූපණයේ සහ ප්‍රජානනයේ සත්‍යයයි. විවිධ වූ විසමතා ආකලනය කර දේවල්හි අනුපිළිවෙළ (order of things ) සකස් කරනු ලබන්නේ මෙම සත්‍යයයි. සංකල්පීය පද්ධතියක් (conceptual scheme) තුළ ස්ථානය තහවුරු කරන්නේ මෙම අනන්‍යතාවේ සත්‍යයයි. සත්‍යයේ අනිත් පැතිකඩ වන්නේ අත්දැකීමයි. අත්දැකීමේ සත්‍යය යනු පළමු ව කී අනන්‍යතාවට ඌනනය කිරීමේ සම්පූර්ණ අනෙක් පසයි.

ලෙවිනාස්ට අනුව අත්දැකීම යනු අපගේ ස්වභාවය සංස්ථාපිත කරන දෙයට (what constitutes our nature) එපිටට යන්නකි. එබැවින් සැබෑ අත්දැකීම සෑම විට ම ලෝකෝත්තර (transcendence ) වෙයි. මෙහි දී සිදු වන්නේ අප දන්නා දෙයෙහි අන්තර්භාවයෙන් (immanence) එපිටට යෑමයි. එනම්, සවිඥානයෙන් එපිටට ගිය සවිඥානයෙන් අර්ථ දැක්වීමට නොහැකි යථාර්ථයක් කරා යොමු වෙයි. අනන්‍යතාවෙන් බැහැර වූ දෙයක් (nonidentical) බවට එය පත් වෙයි. අනන්‍යතාවේ සත්‍යය අත්දැකීමේ සත්‍යයෙන් එලෙස වෙනස් වෙයි. මෙහි දී මාගේ ස්ව-අත්කර ගැනීම තුළට අනෙකා (other ) පැමිණෙන අතර මගේ ලෝකය තුළ අනෙකා හීලෑ වීමක් (domestication) සහ සමීප වීමක් සිදු වෙයි (වෙට්ෆල්, 2008: 125 ). මේ අනුව, මහා වංශයේ ආඛ්‍යානය බිහි වූ ආකාරය මෙන් ම ආඛ්‍යානය කියැවීම යන දෙක ම අනෙකාගේ පැමිණීමට මෙන් ම අපගේ වටපිටාවෙන් ලෝකෝත්තර වූ යමක් කරා එසැවේ. මහා වංශ කර්තෘ මහානාම හිමියන් සිය අත්දැකීම තුළින් ලබන සත්‍යය ලෝකෝත්තර වී ඇති අතර එය කුමක්දැයි දැන ගැනීමේ හැකියාවක් අපට නොමැති අතර අපට මහා වංශය කියැවීමෙන් ලැබෙන අත්දැකීම ද ලෝකෝත්තර වේ.

ථෙරපුත්තාභය නම් යෝධයා යුද්ධයෙන් පසු නැවත පැවිදි වීම සහ මිරිස වැටි පූජාව ඔස්සේ ද මහා වංශකරු සංඥාකරණය කරන්නේ සිංහලත්වයත් ඒ හා බැඳුණු බෞද්ධත්වය තද බල ලෙස එකට බැඳ තැබීමත් එය ශුද්ධ අනන්‍යතාවක් දක්වා ඌනනය කිරීමත් දීපවංශය වැනි පෙර පැවති වංශ කතාවල පැවති සංකීර්ණතාවන් සරල කිරීමත් බව පෙනී යයි. යුද ජයග්‍රහණයෙන් පසු රජතුමා යෝධයන්ට තානාන්තර දෙන අවස්ථාවේ දී ථෙරපුත්තාභය තනතුරු බාර ගැනීමට අකමැති වන අතර නැවත පැවිදි වීම තෝරා ගනී. කෙළෙස් නමැති සොරුන් ජය ගැනීමේ තවත් යුද්ධයක් ඇති බැවින් තමන් මහණකමට යොමු වන බව ඔහු කියා සිටී. මෙයින් සංකේතවත් කරන්නේ බෞද්ධත්වයේ ශුද්ධ බව වන අතර එය දෘෂ්ටිවාදී වශයෙන් ස්ථාපිත කිරීමේ වැදගත්කමයි. තවත් වරක දී දුටු ගැමුණු රජු සංඝයා වෙත කොටසක් පූජා කිරීමෙන් තොර ව රසවත් මිරිස් ගුලියක් අනුභව කරන අතර එය බලවත් වරදක් ලෙසින් දකින ඔහු ඒ වෙනුවෙන් මිරිසවැටි විහාරය ඉඳි කරයි. මේ ඔස්සේ ද බෞද්ධත්වය කොතරම් ශුද්ධ වූ දෙයක් ද යන අනන්‍යතාව ස්ථාපිත කෙරෙන අතර එය දෘෂ්ටිවාදී පදනම සඳහා ඉතා මැනවින් භාවිත කෙරෙයි.

ගැඩමරියානු අර්ථ නිරූපණයට අනුව අර්ථය පිළිබඳ කථිකාව ඇති විය යුත්තේ කිසියම් ආත්මයක ස්වරූපයෙන් නොව ප්‍රශ්නය සහ පිළිතුර අතර අනෙකත්වය (alterity) නිර්මාණය වන බිම්-මට්ටමේ චලනයකිනි. කිසියම් සංසිද්ධියක් කෙරෙහි පුද්ගලයාගේ ඇති විවෘතත්වය භව්‍යතාවක් (possibility) බවට පත් වන අතර මෙම විවෘතභාවය තාර්කික මෙන් ම ආචාර ධාර්මික ද විය යුතු ය (බුර්ෂ්වා, 2007: 61). එබැවින් පුද්ගලයාට අර්ථ නිරූපණයේ දී තිබිය හැක්කේ සංවාදාත්මක ආත්මයක් (dialogical subject) විනා අනෙකක් නොවේ .

දාර්ශනික සංවාදය සහ ඓතිහාසික සබැඳියාව සම්බන්ධයෙන් ගැඩමර්ගේ ඇති අර්ථ විවරණාත්මක කැපවීම (hermeneutical commitment) ආත්මයෙන් සහ වෛෂයිකත්වයෙන්

එපිටට නිතැතින් ඇදී යයි. එහෙත් ගැඩමර්ගේ දාර්ශනික අර්ථ විවරණය පවතින්නේ අර්ථ විවරණාත්මක පරිමිතත්වය (hermeneutics of finitude) තුළයි. මේ හේතුවෙන් අර්ථය සඳහා ලැබිය හැකි සියලු විඥානවාදී නිරූපණය අහෝසි වී යයි. එබැවින් ම අර්ථය තුළින් සමස්තය සහ සම්පූර්ණත්වය (totality and completion) අහිමි වන අතර මහා වංශය වැනි කෘතියක් ගත් විට එය සමස්තකරණය කිරීමට සහ පරිපූර්ණ කිරීමට ගන්නා උත්සාහය භීෂණකාරී වේ.

මෙහි දී අර්ථ විවරණාත්මක ප්‍රයුක්තනය ඔස්සේ ඕනෑම පඨිතයක් තේරුම් ගත යුතු වන අතර එහි ඇති ඓතිහාසික ප්‍රපංචීයත්වය අමතක කිරීමට නොහැකි වේ. අර්ථ විවිරණාත්මක ප්‍රයුක්තනය ඔස්සේ භාෂාවේ ඇති ප්‍රායෝගික බව පැහැදිලි ලෙසින් හඳුනා ගැනෙන අතර එහි ප්‍රායෝගික සන්නිවේදන කාර්යය කිසි විටෙකත් අමතක කළ නොහැකි වේ.

පැරණි සාංදෘෂ්ටිකවාදය අනුව වුව ද මහා වංශය පඨිතයක් ලෙස ගත් විට ඒහි සත්තාව අවබෝධ කර ගැනීමට සිදු වන්නේ ඓතිහාසික සහ සංස්කෘතික පදනම් යටතේය. පැරණි සාංදෘෂ්ටිකවාදය තුළ දී සත්තාව (Being) නිශ්චිත වූවක් වෙයි. එහෙත් ගැඩමර් අතින් සිදු වූයේ අර්ථය සම්බන්ධයෙන් ඇති සත්තාව රැඩිකල්කරණයට ලක් වීමක් වන අතර තවදුරටත් අර්ථය සඳහා නිශ්චිතත්වයක් නොතිබේ. මේ අනුව, මහා වංශය සම්බන්ධයෙන් ද නිශ්චිත වූ අර්ථයක් නොමැති අතර එහි අර්ථය එහි භාෂාව තුළින් ඉස්මතු වන්නක් බවට පත් වෙයි. භාෂාව නොමැති ව අවබෝධයක් ද නොමැති බව ගැඩමරියානු අර්ථ විවරණය අනුව පෙනී යන අතර අර්ථය උපදින්නේ භාෂාවේ ම ප්‍රතිඵලයක් වශයෙනි. මෙහි දී අමතක නොකළ යුතු කරුණ වන්නේ භාෂාව යනු ඉතිහාසයේ සහ සංස්කෘතියේ නිෂ්පාදනයක් (language is a product of history and culture) වන බවයි (වොල්හොෆ්, 2017: 24).

**සමාලෝචනය**

මහා වංශය වැනි සම්භාව්‍ය කෘතියක අර්ථය පිළිබඳ සොයා බැලීමට යෑමේ දී කිසියම් නිශ්චිත අර්ථයක් සොයා ගැනීම කරා යොමු වීමට නොහැකි වන අතර ගැඩමර් පෙන්වා දෙන්නේ අර්ථය මෙන් ම අවබෝධය යන කරුණු දෙක ම වස්තු (objects) වශයෙන් නොපවතින නමුත් ඒවා මඟ හැර යා නොහැකි ප්‍රපංචයන් වේ. මේ අනුව අවබෝධය යන්න ගත යුතු වන්නේ සද්භාවී (ontological) වශයෙනි. මෙම සද්භාවීත්වය වටහා ගත යුත්තේ මිනිසාගේ ක්‍රියාවලියක් වශයෙනි. මහා වංශයේ දෙවන පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් ගෙනෙන විස්තරයේ දී ඔහු දෙවැනි පරාක්‍රමබාහු රජු විසින් සමස්ත ලංකාද්වීපය ම පාණ්ඩ්‍යයන්ගෙන් බේරා ගත් අතර ශ්‍රී ලංකාව පූර්ණ රාජධානියක් (absolute monarch) වශයෙන් දෙවන පරාක්‍රමබාහු රජු යටතේ පැවති බවයි. එහෙත්, දකුණු ඉන්දීය ශිලා ලේඛන සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව ඒ සමය වන රජවරුන් කිහිප දෙනෙකු අතින් පාලනය වී ඇති බවයි.

මේ අනුව මහා වංශයේ අර්ථය නමැති වස්තුව සෑම විට ම අභියෝගයට ලක් වී ඇති අතර අර්ථය නමැති ප්‍රපංචයට අප විවර වී ඇති බවයි. එබැවින් මෙම අර්ථය ලබා ගැනීම සඳහා කිසිදු නිර්දිෂ්ට අර්ථ විවරණ ක්‍රමයක් (prescriptive method) නොමැති අතර අවබෝධය යනු කුමක්ද යන්න හා එය පැවැත්මක් වන්නේ කෙසේද යන සද්භාවාත්මක ප්‍රශ්නය නැගීම පමණක් අප වෙත ඉතිරි වනු ඇත. දාර්ශනික අර්ථ විවරණයේ දී අප අර්ථය සම්බන්ධයෙන් කළ යුත්තේ කුමක්ද යන ක්‍රමවේදාත්මක කරුණ වැදගත් නොවේ. මෙහි දී ගැඩමර් පෙන්වා දෙන්නේ අපට කිරීමට අවශ්‍ය දේ හෝ අප කරමින් සිටින දේ නොව අපට සිදු වෙමින් තිබෙන දෙය පිළිබඳ අවබෝධ කර ගත යුතුය. අවබෝධය පවතින්නේ එතැනයි. අප මහා වංශය කියැවීමේ දී මහා වංශය ඔස්සේ අපට සිදු වෙමින් පවතින්නේ කුමක්ද යන්න අවබෝධ කර ගැනීම අපගේ අවශ්‍යතාව වෙයි.

මිනිසුන් කෙරෙහි පවතින ඓතිහාසික වශයෙන් නිර්මාණය වූ සවිඥානය (*wirkungsgeschichtliches Bewußtsein*) කිසියම් නිශ්චිත ඉතිහාසයක් සහ සංස්කෘතියක් තුළ ගැප් වී ඇති අතර අපගේ පැවැත්මට ප්‍රතිපක්ෂ ලෙසින් නිර්මාණය වන වස්තුවක් වශයෙන් එය හඳුනා ගැනීමට නොහැකිය (තේට් 2013: 295). එම ඓතිහාසික සවිඥානය යනු අප සහභාගී වෙමින් සිටින ගලා යමින් සිටින ධාරාවක් වේ. එබැවින් අපගේ අවබෝධය ඒ ඔස්සේ නිර්මාණය වේ. මහා වංශය පිළිබඳ අවබෝධය අපට ලබා ගැනීමට හැකි වන්නේ අපගේ ඉතිහාසය සහ සංස්කෘතිය ඔස්සේ අප සහභාගී වීමත් සමඟින් වන අතර අපට එහි දී සියලු ප්‍රාග් විනිශ්චයන් අහෝසි කර දැමීමට සිදු වේ.

මේ අනුව මහා වංශයේ ඇති ඕනෑම සංසිද්ධියක් සම්බන්ධ පූර්ණ සත්‍යයක් නැති අතර ක්ෂිතිජයන්ගේ මුහු වීමක් පමණක් සිදු විය හැකිය. අර්ථ විවරණාත්මක අත්දැකීම සෑම විට ම සංවාදාත්මක වන අතර එය ඉදිරියට ගමන් කරමින් සිටී. එබැවින් මහා වංශයේ ඇති දෙයක් සම්බන්ධයෙන් අද ඇති අර්ථය හෙට වන විට වෙනස් වීමට ඉඩ ඇති අතර අර්ථය යනු මහා වංශයේ පඨිතය තුළ ඇති දෙයක් නොවන බව තහවුරු වේ. මහා වංශයේ අර්ථය යනු නිරන්තරයෙන් වෙනස් වන වරින් වර අලුත් අර්ථ මතු වන්නකි.

**විමර්ශන**

**ධම්මරතන, උතුරාවල. 2013. පාලි සාහිත්‍ය ඉතිහාසය (1) වංසකථා. නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.**

**ප්‍රඥානන්ද, යගිරල. 2005. මහාවංසෝ. කොළඹඃ සමයවර්ධනය.**

**අමරවංස, අකුරටියේ. 2001. වංසත්ථප්පකාසිනී : මහාවංශ ටීකාව. කොළඹඃ ගොඩගේ.**

**මහානාම, 1883. මහාවංස. කොළඹඃ රජයේ මුද්‍රණාලය**

ඔබේසේකර, ගණනාථ. 2015. දුටුගැමුණුගේ හෘද සාක්ෂිය accessed February 02, 2021. https://kathika.lk/2015/12/18/

Bourgeois, Jason Paul. 2007. *The aesthetic hermeneutics of Hans-Georg Gadamer and Hans urs von Balthasar*. New York: Peter Lang.
Bourgeois, Jason Paul. 2007. *The aesthetic hermeneutics of Hans-Georg Gadamer and Hans urs von Balthasar*. New York: Peter Lang.

Carr, Thomas K. 1996. *Newman and Gadamer: toward a hermeneutics of religious knowledge*. Atlanta, Ga: Scholars Press.

Dostal, Robert J. 2002. *The Cambridge companion to Gadamer*. Cambridge: Cambridge University Press.

Gadamer, Hans Georg, and Richard E. Palmer. 2007. *The Gadamer reader: a bouquet of the later writings*. Evanston, Ill: Northwestern Univ. Press.

Geiger , Wilhelm. "The Trustworthiness of the Mahavamsa." Accessed November 1, 2020. http://ccbs.ntu.edu.tw/FULLTEXT/JR-ENG/gei.htm.

Geiger, Wilhelm, and C. Mabel Rickmers. 1953. *Cūlavamsa: being the more recent part of the Mahāvamsa*. Colombo, Sri Lanka: Ceylon Govt. Information Dept.

Gjesdal, Kristin. 2009. *Gadamer and the legacy of German idealism*. Cambridge, UK: Cambridge University Press.

Grant, Patrick. 2009. *Buddhism and ethnic conflict in Sri Lanka*. Albany: SUNY Press.

Haig, David. 2020. *From Darwin to Derrida: selfish genes, social selves, and the meanings of life*. Massachusetts : The MIT Press.

Krajewski, Bruce. 2004. *Gadamer's repercussions: reconsidering philosophical hermeneutics*. Berkeley, Calif: University of California Press.

Lawn, Chris, and Niall Keane. 2011. *The Gadamer Dictionary*. London: Bloomsbury Publishing.

Lawn, Chris. 2006. *Gadamer: a guide for the perplexed*. London: Continuum.

McCarthy, George E. 2003. *Classical horizons: the origins of sociology in ancient Greece*. Albany: State University of New York Press.

Peters, Ted. "Truth in History: Gadamer's Hermeneutics and Pannenberg's Apologetic Method." *The Journal of Religion* 55, no. 1 (1975): 36-56. Accessed March 2, 2021. http://www.jstor.org/stable/1202071.

Schmidt, Lawrence Kennedy. 1985. *The epistemology of Hans-Georg Gadamer: an analysis of the legitimization of the Vorurteile*. Frankfurt am Main: Lang.

Sen, Sailendra Nath. 1999. *Ancient Indian history and civilization*. New Delhi: New Age International.

Taylor, George H., and Francis J. Mootz. 2012. *Gadamer and Ricoeur: critical horizons for contemporary hermeneutics*. London: Bloomsbury Academic.

Thate, Michael J. 2013. *Remembrance of things past?: Albert Schweitzer, the anxiety of influence, and the untidy Jesus of Markan memory*. Tübingen: Mohr Siebeck.

Walhof, Darren. 2017. *The Democratic Theory of Hans-Georg Gadamer*. Cham : Springer International Publishing.

Wallace, Mark I. 1990. *The second naiveté: Barth, Ricoeur, and the new Yale theology*. Macon, GA: Mercer.

Weinsheimer, Joel C. 1985. *Gadamer's hermeneutics a reading of "Truth and method"*. New Haven: Yale University Press.

Westphal, Merold. 2008. *Levinas and Kierkegaard in dialogue*. Bloomington: Indiana University Press.

White, Hayden V. 1973. *Metahistory: the historical imagination in nineteenth-century Europe*. Baltimore: Johns Hopkins University Press.

# බුදු සමයෙන් නිරූපිත දාර්ශනික පැතිකඩ පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක්

# A Brief Analysis of the Philosophical Aspects of the Buddha from Time to Time

***K.I.Hasara***

*Department of Pali and Buddhist, Faculty of Arts, University of Peradeniya*

මානව ජීවිතය අර්ථ සම්පන්න කර ගැනීමට නම් ජීවිතය පිළිබඳ මෙන්ම ජීවිත පැවැත්මට උපකාරී වන ද්‍රව්‍යාත්මක ලෝකය පිළිඳුව ද අවබෝධයක් ලබා ගත යුතු ය. මෙම කාර්යයේ දී දාර්ශනික චින්තනය මිනිසාට භෞතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ගොඩනගාලීම ට අවශ්‍ය පසුබිම සකස යි. භෞතික අංශය කෙසේ වෙත් ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා ආගමික දර්ශනය මිනිසාට වඩාත් සමීප වී ඇත. ආධ්‍යාත්මික සංවර්ධනය මෙන්ම භෞතික සංවර්ධනය ද මානව සමාජයෙහි පැවැත්ම උදෙසා ඉහත උභය අංශ සමබරව තුලනය විය යුතුයි.

බටහිර දර්ශනයත් සමඟ බුදු සමය තුලනය කරන පෙරඅපර දෙදිග ඇතමෙක් බුදුසමය හුදු ආගමක් වශයෙන් ක්‍රියාත්මක වන ආචාරවාදී විග්‍රහයක් අන්තර්ගත චින්තනයක් ලෙස දක්වත්. මේ අනුව යම් නිගමන ස්වරූපයක් ඉස්මතු කිරීමේදී ගම්‍ය වනුයේ බුදුසමය දර්ශනයක් වනුයේ අධිභෞතික ප්‍රශ්න කෙරෙහි විවෘත නොවූහෙයින් නොව එහි ප්‍රබල ජීවන දර්ශනයක් අන්තර්ගත හෙයිනි. බුදුසමය ජීවන දර්ශනයක් වශයෙන් අගය කිරීමේදී යථාර්ථය පිළිබඳ දර්ශනයට ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. බුදුසමයේ දාර්ශනික පදනමට මුඛ්‍ය වශයෙන් පහත දාර්ශනික ප්‍රවණතා බලපා ඇත.

1. ත්‍රිලක්ෂණය
2. පඤ්චස්කන්ධය
3. ඥාන විභාගය
4. ඉන්ද්‍රිය ඥානය
5. අතීන්ද්‍රිය ඥානය
6. පටිච්චසමුප්පාදය

ආදිය පිළිබඳ අවධාරණය කළ හැකි අතර බුදු දහමේ ජීවන දර්ශනයේ ප්‍රභේදයන් ගත් විට ඥාන විභාගය, ලෝක විභාගය, ආචාර ධර්ම, සමාජ දර්ශනය, දේශපාලන ආර්ථික දර්ශනය ද බුදුසමයේ ජීවන දර්ශනය තුළ යථාර්ථ විග්‍රහය, මිනිසා පිළිබඳ දර්ශනය, ලෝකය පිළිබඳ දර්ශනය, බුදුසමයේ ජීවන දර්ශනය අන්තර්ගත පෘථුල පරාසයක් බුදු දහම හා දර්ශනයත් අතර එකිනෙකට පරාධීන අන්‍යොන්‍ය බැඳියාවක් උසුලයි.

දර්ශනයක් ලෙස අදහස් වනුයේ ප්‍රඥාවට පමණක්ම ගෝචර වන අතිශයින්ම ගැඹුරු විශිෂ්ටතම දැක්මකි.දර්ශනයකින් ආගමක් වෙනස් වන්නේ එම දර්ශනයේ ඇති නොයෙක් අංගයන් විවේචනය

කිරීමේ හැකියාව , විමර්ශනය කිරීමේ හැකියාව මෙන්ම අන්ධ වූ භක්තියකින් තොරව ඇදහීම යන අංගයන් තුළිනි. බුදු දහම සැබැවින්ම ආගමික පැතිකඩට වඩා දාර්ශනික පැතිකඩට නැඹුරු වුවකි. බුදු දහමේ ඇති දාර්ශනික පැතිකඩ මෙම සාධක තුලින් ගම්‍ය කල හැකිය. එනම්,

(01) නිර්වාණය වැනි ගැඹුරු ධර්මතා විමසීම තුළදි ආගමික පැතිකඩට වඩා දාර්ශනික පැතිකඩට ඉතා ඉහළ අගයක් ලබාදිම.

(02) ''පඤ්ඤවන්තස්ස අයං ධම්මො'' බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය අදාළ වන්නේ විමසා බැලීමේ හැකියාව ඇති ප්‍රඥාවන්තයින්ට පමණි. නිදසුන් නම් බුදුදහම තුළ ඇති ගැඹුරු ධර්ම අවබෝධය ආගමික තත්වයකට වඩා දාර්ශනික අංශයට නැඹුරුතාවයක් ගනී. එහිදී උචිත නිදසුන් නම් කෙනෙකු බුදුන් වහන්සේ උදෙසා මල් පූජා කිරීම ගත්විට එහිදී ඇතැමෙකු පින් උදෙසාද තවත් විට බුදුන් වහන්සේ කෙරෙහි ඇති භක්තියද මත පදනම් වේ. නමුදු ඉන් පිළිබිඹු වෙන යථාර්ථමය දාර්ශනික පැතිකඩ නම් නියමාර්ථයෙන් අධ්‍යයනය කිරිමේදි අපට හමුවේ එය මෙසේය "මේ මල් පරවී මැලවෙන බව මට සිහි වේවා - මේ මල් මෙන්ම මගේ කය ද පරවෙන බව සිහි වේවා''

03) චතුරාර්ය සත්‍යය ඉගැන්වීම් මගින් පුද්ගලයා මුහුණ දෙන දුකත් එයට පුද්ගලයාගේ ඇති බැඳීමටත් එම දුකෙන් මිදීමට පුද්ගලයාට ඇති ශක්‍යතාව දාර්ශනික පදනමකින් ඉදිරිපත් කිරීම.

04) බුදු දහම තුළ දක්වා ඇති කලා ශිල්ප තුළින් වුවද එනම් සඳකඩ පහණ, ස්ථූප, කැටයම් ,මූර්ති අදී දේ තුළින් වුව ද එය බෞද්ධ ආගම ලෙස ආගමික සන්දර්භයක් නිරූපණය මතුපිටින් දෘෂ්ටියට ග්‍රහණය වුවද එහි අභ්‍යන්තරයේ ගැබ් වී ඇති දාර්ශනික දෘඪ ස්වරූපයක් පෙන්වයි. නිදසුන් ස්තූපය නිර්මාණය තුල බුදුන් වහන්සේගේ ධර්මයන්හි අර්ථයන් නිරූපනය කිරීම. නිදසුන් නම් පාදම = ශ්‍රද්ධාව, තුන්මහල් පේසාව =ත්‍රිවිධ රත්නය, ගර්භය = සත්තිස් බෝධිපාක්ෂිකධර්ම, හතරැස් කොටුව = චතුරාර්ය සත්‍යය, චූඩාමාණික්‍යය = නිර්වාණය, ආදී ලෙස සැඟවුණු දාර්ශනික අර්ථකතන ලබා දී ඇත.

05) සියලුම දේ සංස්කාරක මත පදනම්ව ඇතිවීමක්ද සංස්කාර අනිත්‍ය ස්වරූපයෙන් දැක්වීම. එය බුද්ධ දේශනය තුළ මෙලෙස දක්වයි "අනිච්චාවත සංඛාරා උප්පාද වයං ධම්මිනෝ උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති.....'' සංස්කාරයන් ඒකාන්තයෙන්ම අනිත්‍යයයි. සංස්කාරක ඒකාන්තයෙන්ම ඇතිවීම සහ නැතිවීම ස්වභාව කොට ඇත්තාහ.

06) බුදු දහමේහි දර්ශනික පැතිකඩ තුල දක්වනුයේ තමන්ගේ පිහිට තමාමය. අන් කවරේකු නොවන බවය "අත්තානං අත්තනෝ නාථෝ කෝහි නාථෝ පරෝසියා''

(07) බුදු දහම තුල ඒහිපස්සිකෝ හෙවත් ඇවිත් බැලිය යුතු දේශනාවක් වන අතර නුවණැත්තන් විසින් සිය පෞද්ගලික අවබෝධය මත "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහෝති'' ප්‍රත්‍යක්ෂ ලෙස තේරුම් ගත යුතුය. ආගම පුද්ගලබද්ධ වුවත් දර්ශනය බුද්ධිගෝචර බව මින් ගම්‍ය වේ

ත්‍රිලක්ෂණ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම. පංචස්කන්ධය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම, ඥානවිභාගය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම, ඉන්ද්‍රිය ඥානය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ,අතීන්ද්‍රිය ඥානය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම යන මෙම කරුණු සාධනය දෙස අවධානය යොමු කිරීමේ දී බුදු දහම තුළ සෑම අංශයක් තුළම දාර්ශනික සන්දර්භයක් ඇත. ඒ බව ඉහත දැක්වූ අදහස් තුළින් සන්නිදර්ශනව පැහැදිලි වේ. බුදු සමයෙන් නිරූපිත දාර්ශනික පැතිකඩ පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් මේ අයුරින් දැක්වීමට උචිතය.

ඕනෑම ආගමික චින්තන ධාරාවක් තුළින් ම යම් අන්තර්ගතය ට කැටි වූ ස්වභාවයක් උසුලයි. ආගමික චින්තාවන් සමයාන්තරවාද, ආත්මවාදය හා අදේව අනාත්මවාද වශයෙන් දාර්ශනික පැතිකඩයන් ඔස්සේ වර්ග කිරීමට ලක්වන අතර ඒ තුළින් බුදු සමය ශීල, සමාධි, ප්‍රඥා මත ගොඩනැගුණු අනුපූර්ව ප්‍රතිපදාවක් හඳුන්වා දෙන චින්තන ක්‍රමයකි. බෞද්ධ චින්තන ධාරාව ඔස්සේ ගොඩනැගෙන ප්‍රධාන ලෝක ආගමක් වශයෙන් ගොඩනැගුණු පසුබිමක් මෙහි ඇත. සුවිශේෂ වූ පොදු ලක්‍ෂණයන් රහිත බවත් බුදුදහම ආගමක් ලෙස නිර්වචනය කිරීමට උචිත ද? එසේත් නැතිනම් එය දාර්ශනික සන්දර්භයක් උසුලන්නේ ද යන්න විමසිය යුතු නොවේද?

ආගම යන්න ම.නි සන්දක සූත්‍රයෙහි බ්‍රහ්මචරිය (බ්‍රහ්මචරියං) යන්න විග්‍රහාත්මක නොවූ නාමකරණයක් ලද වූවත් ගුණපාල මලලසේකර හා මහාචාර්ය කේ.එන් ජයතිලක යන විද්වතුන් දෙදෙනා විසින් ආගමෙහි ස්වරූපය පදනම් කරගත් පුළුල් අර්ථ කථනයක් සපයා ඇති අතර එය පහත පරිදි දැක්විය හැකිය.

''භක්තිය, ප්‍රණාමය හා අවනීතිය ගම්‍ය කරන ආගම්වාදී මතයන් බැහැර කරන බුදු සමය ආගමක් වශයෙන් ගත්යුත්තේ එමඟින් විශ්වය තුළ මිනිසාගේ ජීවිතය හා සංසාරයේ කෙළවර පිළිබඳ කරුණු ඉදිරිපත් කළේ යැයි සැළකෙන ප්‍රමේය පද්ධතියක් පිළිගැනීම නිසා නිපදවා ගනු ලබන දිවිපෙවතක් ඇති හෙයින් යැයි ප්‍රකාශ කරයි.''

''ආගම, ලබ්ධිය, භක්තිය'' (ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, ජී.පී මළලසේකර 1997.)

''ස්වභාවධර්මය හා මිනිස් ජීවිතය පාලනය කරා මෙහෙයවන්නේ යැයි සැලකෙන මිනිසාට වඩා උත්තරීතර බලයක් තමා කෙරෙහි පහදවා ගැනීමේ කාර්යය ක්‍රමය ආගම නම් වේ.''(මහාචාර්ය ප්‍රෙසර්)

''ආගම යන්නට යටත් පිරිසෙයින් දිය හැකි නිර්වචනයක් වශයෙන් ආගම වූ කලී අතිමානුෂ අද් භූතයන් කෙරෙහි ඇති විශ්වාසයයි. එහෙත් විශ්වාසය පමණක් නොව පිළිවෙත් ක්‍රම හා හැඟීම් ද

ආගමට අන්තර්ගත වන බව කිව යුතුය.'' (සිංහල විශ්වකෝෂය-සිද අතට කොටස, කේ එන් ජයතිලක)

''පැවැත්මේ හැකියාව පිළිබඳ හැඟීම ආගමයි. මෙම හැකියාවන්හි උල්පත ආගම යි.''(ජෝන් ඩේවිට්)

''කිසිම ආකාරයකින් ග්‍රහණයට හසු නො වන ආකාරයේ සියලු දේ අවබෝධ කර ගැනීමට හැකියාවක් ලබා ගෙන තිබෙන මිනිස් මනසේ ඇති කොටස් ආගම යි.'' (මැක්ස් මුලර්)

දර්ශනයත් ආගමත් එකම මූලයකින් උත්පාදනය වූ එකිනෙකට වෙනස් සංසිද්ධි ද්විත්වයකි. විශ්වය ආරම්භය හා ස්වභාවය මෙන්ම මිනිසාගේ ආරම්භය හා ස්වභාවයත් විශ්වයේ මිනිසාට හිමි තැනත් පිළිබඳ චින්තනය මෙහයවීමේ ප්‍රතිඵලයක් ලෙස ආගමේ ප්‍රභවය සිදු විය. මෙසේ ගත්විට අපරදිග දර්ශන ලෝකය මූලිකකොට ගත් අරමුණු කොටගත් චින්තනයක් සමතුලිත වූ අතර බාහිර ලෝකයට වඩා තමා පිළිබඳ සිතීම පෙරදිග චින්තනයේ විශේෂ ලක්‍ෂණයක් විය. මේ අනුව ගත්කල නූතන ලෝකය තුළ පවතින්නේ ආගමික මූලයකින් උපන් දෘෂ්ටි දර්ශනය හා ජීවන දර්ශනය යි. යම් ආගමක් ආධානඥානහිත්වයෙන් මිදී විද්‍යාත්මක හා දාර්ශනික චින්තනයකට නැඹුරු වී විශ්වය පිළිබඳ මෙන්ම මිනිසා පිළිබඳව වූ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්නේ නම් එය බුද්ධිගෝචර පදනමකින් යුත් ආගමකි. දාර්ශනික සන්දර්භයක් ආගමට මුසුවීම තුළින් ම එය එබඳු සංකීර්ණ බුද්ධිමය ක්‍රියාවලියක් පුද්ගලයා තුළ සක්‍රීය කරයි. මේ අනුව බුදු දහම සැබෑ ලෙසම බුද්ධිගෝචර පදනමකින් යුතු ආගමකි. මෙය තවදුරටත් ගම්‍ය වනුයේ ගෞතම බුදුන් වහන්සේ පොදුජනයාගේ අවබෝධය සඳහා වූ ධර්මයක් මිස ආගමක් දේශනා නොකළ බව පාලි ත්‍රිපිටක සාහිත්‍යයෙන් මනාව පැහැදිලිය.

- ධම්ම (අධිගතො බො මයායං ධම්මො)
- ධම්ම චක්ක (එවං ධම්මචක්කපවත්තනං)
- සද්ධම්මං (සද්ධම්මස්ස ඨිතියා)
- ධම්ම විනය (ධම්ම විනය දෙසීයමානො)
- සාසන (එතං බුද්ධාන සාසනං)
- පාවචන (අතීතසත්ථුකං පාවචන)
- විමුක්ති මග්ග (එස මග්ගො උජුමග්ගො)

යන ආදී ඉදිරිපත් කිරීම්වලින් ධර්ම සංකල්පය තවදුරටත් සනාත වන්නේ එනම් ධම්ම, ධම්ම විනය, මග්ග හා බ්‍රහ්මචරියාව හැඳින්වීම් තුළින් යථාර්ථය පිළිබඳ බෞද්ධ න්‍යාය හා ජීවිතය පිළිබඳ යථාර්ථය බුදුදහමේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග ඉස්මතු කරයි. මේ අනුව බෞද්ධ දර්ශනයත් නිර්දිෂ්ට වූ නිවනත් සාක්‍ෂාත් කර ගැනීම මත බුදු සමය දාර්ශනික වූත් ආචාරවාදී වූත් ආගමක් ලෙස ප්‍රකාශ කිරීම නිවැරදිය. ආගමක් සරල ලෙස අර්ථ ගැන්වුවහොත් මිනිසාගේ හැකියාවන්

ස්වතන්ත්‍ර ක්‍රියාවෙහි යෙදවීමට අවහිර කරමින් දෙවියන් හා එක්වීමට මිනිසා පොළඹවනු ලබන විශ්වාස හා පුද පිළිවෙත් අන්තර්ගත ක්‍රියාවලියකි. මේ අනුව ගත්විට දේව නිර්මාණවාදයත්, පාරභෞතිකවාදයත් යන සංකල්ප බුදුදහමින් බැහැර වන අතර ඒ අනුව බුදුසමය ඉහත අර්ථයන්ට අනුව ආගමක් නොවන බව පසක් වෙයි. නූතන ලෝකය තුළ ආගම වශයෙන් දක්වනුයේ දේවධර්මය හෝ දේහාත්මවාදය මූලික කරගත් හේතු කොටගත් චින්තන පද්ධතියකි.

මුල් යුගයේ ආගමෙහි මූලික පදනම සැකසෙන්නේ වෛදික ධර්මය පදනම් කරගෙනය. එහිදී ආර්ය වර්ගයාගේ මුල් ආගමික පිළිවෙත් තුළින් ඔවුන් තුළ ආගමික පදනම පිළිබඳ උද්දීපනයක් ඇති වීමත්, යම් අවබෝධයක් මතු වීමට පෙර භාරතීය ජනයා ලෝකය හා ජීවිතය පිළිබඳ විමසිලිමත් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ය. එහි ස්වභාය ආගමික සන්දර්භයට මුසු කිරීම තුළ ආගමික මූලික අඩිතාලම ගොඩනැඟී පැවතුණි.

බුද දහමේ ඒකායන අරමුණ සංසාරගත සත්වයා අනවරාග්‍ර වූ සංසාර දුකින් අත් මුදවා ගැනීමයි. ලෝකය දුක මත පිහිටීමත් (දුක්ඛො ලෝකෝ පටිබ්බතො) මෙහි වූ සදාතනික යථාර්ථය වටහාගත් බුදුන්වහන්සේ සංසාරික දුක සත්වයාට අවබෝධ කරලීමත් එමඟින් සත්වයා මුදවා ගැනීමත් ය.

භෞතික වූත් අභෞතික වූත් සමස්ථ විශ්වය තුල නිසල වූ හෝ ස්ථිර වූ කිසිවක් නැත. සියලු පදාර්ථ වල ප්‍රාථමික වූ ලක්‍ෂණය වන්නේ අස්ථිර බවයි. හේතුප්‍රත්‍ය රහිතව හටගත් කිසිඳු ද්‍රව්‍යයක් හෝ ධර්මයක් ලෝකය තුළ විද්‍යමාන නොවේ. එම නිසා සමස්ථ විශ්වයම සංස්කාර ධර්මයන්ගේ ආකාරය බව පැහැදිලි වෙයි. සංස්කාරයන්ගේ ස්වභාවය නම් ත්‍රිලක්‍ෂණයයි. සංස්කාරය පිළිබඳ අපට ග්‍රහනය කරගත හැකි මූලක ලක්‍ෂණ තුනක් පවතී. එනම්, ඉපදීම, පැවතීම හා විනාශය යි. උප්පාද, ඨිති, භංග ලෙස එය හඳුන්වයි. මේ සංස්කාර ධර්මයන් අනිත්‍ය. දුක්ඛ, අනාත්ම වශයෙන් යථාභූත ලෙස හෙවත් ඇත්ත ඇතිසැටියෙන් ම දැනීම විදර්ශනා ඥානය යි. මෙම විදර්ශනා උපදවා ගැනීම හා එයට මග පෙන්වීම බුදු දහමේ ඒකායන මාර්ගය හා ක්‍රියා පිළිවෙත යි.

බෞද්ධ දර්ශනය යනුවෙන් අප හඳුනා ගන්නා බුදු දහම තුළ උගන්වන ප්‍රධන මූලධර්ම කිහිපයක් පවතී.

- චතුරාර්ය සත්‍ය
- පටිච්ච සමුප්පාදය
- ත්‍රිලක්‍ෂණය
- කර්මය හා පුනර්භවය
- ආර්ය අෂ්ටාංගික මාර්ගය

යනාදිය ඒ අතර ප්‍රමුඛත්වයක් ගනී. බුදු දහමේ පදනම වඩාත් නැඹුරු වී ඇත්තේ චතුරාර්ය සත්‍යයට යි. නමුදු බුදු දහම ඉතා ගැඹුරින් විශ්ලේෂණය කරන්නෙකුට වඩාත් ගම්‍ය වනුයේ බුදු දහමේ මූලික ඉගැන්වීම් එකිනෙකට මුතු පොටක මුතු මෙන් එකට ඒකාබද්ධ වූ බවකි. එනමුත් එම සියලු ධර්මයන්හි මූලධර්මය නම් හේතුඵල වාදය වන අතර එය බුදු දහම තුළ ඉදිරිපත් කරන ආකෘතිය මෙසේ දක්වා ඇත.

**''ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං උප්පාදං ඉදං උප්පජ්ජති**
**ඉමස්මිං අස්ති ඉදං න හෝති - ඉමස්ස නිරෝධං ඉදං නිරුජ්ඣති''**

(මෙය ඇති කල්හි මෙය වෙයි. මෙය ඉපදීමෙන් මෙය උපදියි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වෙයි.)

සෑම ධර්මයකම භෞතික වස්තුවකම ලෝකයේ ස්වභාවය මෙය වන්නේ ය. මෙම මූලධර්මයේ ස්වභාවය තුළ බුදු දහම දාර්ශනික වශයෙන් සංකීර්ණ සන්දර්භයක් උසුලයි. මෙම හේතුඵලවාදී මූලධර්ම තුළින් ගම්‍ය වන සුවිශේෂි කරුණ නම්, අනිත්‍යතා දර්ශනය යි.

බෞද්ධ ඥානවිභාගය තුළ ඇති දාර්ශනික පදනම නම් අපගේ ඥානය හෙවත් දැනුම ගොඩනැගනුයේ අනුභූතියෙන් බව බුදු දහමේ විවරණයයි. බටහිර අනුභූතිවාදය භෞතික සීමවේ ස්වරූපයක් ගත් නමුදු බෞද්ධ අනුභූතිය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ද ඉක්ම වූවකි. බාහිර ලෝකය සමග මිනිසා සම්බන්ධ වනුයේ ඇස, කණ, නාසය, දිව, ශරීරය ආදී වූ ඉන්ද්‍රියන් මගිනි. මෙම ඉන්ද්‍රියන්ට ගෝචර වන විෂය වස්තූන් බාහිර ලෝකය තුළම පවතින අතර බාහිර ලෝකයෙන්ම ඇති වූවකි. ඒ අනුව ඇසට ගෝචර වන්නේ රූපයන්ය. කණට ශබ්ද ය. නාසයට ගඳ සුවඳ. දිවට රස. ශරීරයට ස්පර්ශ. ආදි වශයෙන් එම විෂය වස්තු විද්‍යමාන වෙයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වශයෙන් බාහිර ලෝකය වර්ගීකරණය කොට හඳුනා ගන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙනි.

ඉහත දැක්වූ දාර්ශනික විමර්ශනයට අනුව බුදුදහමට පමණක් ආවේණික වූ සුවිශේෂත්වය කුමක් ද යන්න විමසීමේදී ආදි බුදු දහමෙහි දැක්වෙන අනාත්ම දර්ශනය සුවිශේෂ විය. එය කෙසේ ද යත් බුදු දහමට සමගාමීව අන්‍ය ආගම් තුළ දක්වා ඇති ආත්ම වාදයත් උච්ඡේදවාදයත් යන දෘෂ්ටීන් බුදු දහමෙහි අනාත්ම දර්ශනයත් සමග සැසඳීමේදී වෙනස් මූලධර්ම දෙකකි.

